# සිංහල

## 12 ශ්‍රේණිය

### ගුරු මාර්ගෝපදේශය

(2017 සිට ක්‍රියාත්මක වේ)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල
## ගුරු මාර්ගෝපදේශය

# 12 ශ්‍රේණිය

(2017 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිංහල**

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්,
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.




## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

ශ්‍රී ලාංකේය ළමා පරපුරට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම අරමුණු කර ගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීමට ගුරුවරුන්ගෙන් ලැබෙන දයකත්වය ප්‍රබලය. ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජයක නූතන ප්‍රවණතාවන්ට හා අභියෝගවලට මුහුණ දිය හැකි පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා ගුරුවරයාගේ වගකීම සුවිශේෂ වූවකි.

කාලීන අවශ්‍යතා මත පදනම් ව යාවත්කාලීන වන විෂය නිර්දේශ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සුසාධ්‍යකරණය සඳහා ගුරුවරයාට පිටුබල සපයන ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපනයේ වැදගත් මෙවලමකි. ගෝලීය අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා රජය ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ පන්ති කාමරය තුළ ගොඩ නැගෙන ප්‍රබෝධය ඔස්සේ ය. ඒ සඳහා ගුරුවරයා ශක්තිමත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය නිබඳව කටයුතු කරයි.

දැනුම පුපුරා යන සමාජයක නව දැනුම ගවේෂණයට පෙලඹවීමක් ඇති කරමින් සාම්ප්‍රදයික ඥානයේ හර පද්ධතිවල පදනම මත, පිරිපුන් සමබර පෞරුෂයකින් යුක්ත අනාගත පරපුරක් ගොඩනැගීමට ඉටු කරන මෙහෙවර උදෙසා ගුරුවරුන්ට හිස නමා ආචාර කරමි. අපේ මවුබිම ලොව ප්‍රබල රාජ්‍යයන් සමග තරග කළ හැකි දරුවන්ට කෙම් බිමක් කිරීමට ගුරුවරුන්ගේ සහාය නිරන්තරයෙන් අපේක්ෂා කරමි.

මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනයට කැපවීමෙන් කටයුතු කළ බාහිර විද්වත් මණ්ඩලවලට ද ජාතික අධ්‍යාපන ආයතනයට ද, මගේ ප්‍රණාමය පිරිනමන අතර මෙය මුද්‍රණය සහ බෙදහැරීම සඳහා දයක වූ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ද මාගේ ප්‍රශංසාව හිමි වේ.



**අකිල විරාජ් කාරියවසම්**

**අධ්‍යාපන අමාත්‍ය**

## අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිශන් සභාව විසින් නිර්දිෂ්ට ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වාදීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍යප්‍රිය විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදාගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරාගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි. නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහිලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ උසස්පෙළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශය මුද්‍රණය කර බෙදාහැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මෙම ගුරු මාර්ගෝපදේශය, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**ඩබ්ලිව්. ඩී. පද්මිණී නාලිකා**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2018.03.28

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

ඉගැනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගැනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොටගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගන්නා ලද අසම්මත බැහැර කිරීමට ද සුභාවිතයන් මඟින් නව ලොවක් නිර්මාණය කරගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගැනුම යි.

ඉගැනුම සඳහා වටිනා යමක් ද, ඉගැනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකාරකයන් ඉගැනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මඟින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගැනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගැනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මඟින් ඉගැනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කරගැනීමට සුසාධ්‍යකාරකයන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළපොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකාරකයන් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කරගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි,
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂයමාලා කමිටුව**

**උපදේශකත්වය හා අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** : රුවනි සිසිජා ජයකොඩි,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**විෂය විශේෂඥ උපදේශ** : විශ්‍රාමික මහාචාර්ය රත්න විජේතුංග,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

සේවාර්ජිත මහාචාර්ය ජේ.බී. දිසානායක,
කොළඹ විශ්වවිද්‍යාලය.

මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි,
කොළඹ විශ්වවිද්‍යාලය.

මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණ විශ්වවිද්‍යාලය.

**අධීක්ෂණය :** එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම,
අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

එම්. ජී. මුණසිංහ,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

රුවනි සිසිජා ජයකොඩි,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**බාහිර ලේඛක මණ්ඩලය :** එස්. ඕ. ප්‍රනාන්දු,
විශ්‍රාමික අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය,

එච්. පී. සුසිල් සිරිසේන,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.

ඩබ්ලිව්. කරුණාරත්න,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරු, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම.

අජිත් ක්‍රිෂාන්ත ද සේරම්,
හිටපු කථිකාචාර්ය, වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, බිංගිරිය.

ජේ. සෙනවිරත්න,
විශ්‍රාමික විදුහල්පති, ශ්‍රී සීලානන්ද ම. වි., කිරිමැටියාන.

ඩබ්ලිව්. එම්. නිශ්ශංක බණ්ඩාර,
ගුරු සේවය I, බප/ගම්/ දොම්පේ මහා විද්‍යාලය, දොම්පේ.

**භාෂා සංස්කරණය :** ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ අරියවංස හිමි,
රුහුණ විශ්වවිද්‍යාලය.
ක. ක. ගනුෂ්ක රන්දුල,
තාවකාලික කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2017 වර්ෂයේ දී අ. පො. ස. (උසස් පෙළ) සිංහල නව විෂය නිර්දේශය පාසල් පද්ධතියට හඳුන්වා දීමත් සමඟ ඊට අනුරූප ව සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය ද ඔබ අතට පත් වේ. නව විෂය නිර්දේශයේ 12 ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය මෙමඟින් ආවරණය කෙරේ.

දැනට පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වනුයේ නිපුණතා පාදක විෂයමාලාවකි. මෙහි ඇතුළත් සියලු පාඩම් සැලසුම් ඉදිරිපත් කර ඇත්තේ ඊට අනුරූප වන පරිදි ය. නිපුණතාව, නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතයට අදාළ කාලච්ඡේද සංඛ්‍යාව හා ඉගැනුම් පල ද ඒ අනුව ඇතුළත් කර තිබේ. පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ද, භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් ද, ඇගයීම හා තක්සේරුකරණය සඳහා වන උපදෙස් ද ඉදිරිපත් කර ඇත්තේ නිපුණතා සංවර්ධනය සඳහා ඉවහල් වන පරිද්දෙනි. ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය ඒ ඒ වාරවලට අනුව බෙදා දක්වන ලද සටහනක් ද මේ සමඟ ඉදිරිපත් කර ඇත්තේ ගුරු භවතාගේ පහසුව පිණිස ය.

මාර්ගෝපදේශයෙහි උපදෙස් අනුව එදිනෙදා ඉගැන්වීම් කාර්යය සඳහා උචිත පාඩම් සැලසුම් ගුරුභවතාගේ අභිමතය පරිදි සකස් කරගත යුතු ය. මෙහි දී ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය වන පරිදි හා නිපුණතා සාක්ෂාත් වන පරිදි නිර්මාණශීලී ඉගැනුම් අවස්ථා සම්පාදනය කර ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථ සම්පන්න බවට පත් කිරීම ඔබගේ යුතුකම වන්නේ ය. ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුවරයාගේ පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති පොතපත ඉවහල් කරගෙන ශිෂ්‍ය ඉගෙනුම් අද්දැකීම් තව දුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වනු ඇත. ඔබට විවිධ ගුරු භූමිකා හෝ විවිධ ක්‍රමවේද හෝ භාවිත කළ හැකි ය. එහෙත් අර්ථසම්පන්න ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරයෙහි නිර්මාණය කිරීම ඔබගේ කාර්යය යි.

ශිෂ්‍යයන්ගේ ඔබ හඳුනාගත් නිර්මාණශීලී කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීමේ දී මෙහි නිර්දේශ කර ඇති දේශන, වාද විවාද, සාකච්ඡා ආදිය ද අවස්ථානුකූල ව යොදාගත හැකි ය. ඉගැනුම් ක්‍රියාවලිය තාක්ෂණය හා බද්ධ කරගැනීම කාලෝචිත වනු ඇත. එනිසා හැකි සෑම අවස්ථාවක දී ම එවැනි තාක්ෂණික ඉගැනුම් ආධාරක හෝ මෙවලම් හෝ භාවිත කිරීම මඟින් ඔබගේ ඉගැන්වීම් කාර්යයෙහි ගුණාත්මක බව වර්ධනය කරගත හැකි ය. සෑම පාඩම් සැලසුමක් අවසානයේ දී ම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ඉගෙනුම් කාර්යය සඵල වනවා මෙන් ම ශිෂ්‍ය සාධන මට්ටම් ද ඉහළ යනු ඇත. භාෂා විෂයයේ වැදගත් ක්ෂේත්‍ර වන ශ්‍රවණ හා කථන කුසලතා මැනෙන පරිදි වාචික පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ද භාෂා අධ්‍යයනය වඩාත් ඵලදායී වීමට හේතු වනු ඇත.

මෙම මාර්ගෝපදේශයෙහි අන්තර්ගත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ට උචිත පරිදි නිර්මාණශීලී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට අවකාශ සලසා ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමෙන් ඔබගේ ඉගැනුම් ඉගැන්වීම් කාර්යය සාර්ථක කරගැනීමට හැකි වේවා යනු අපගේ ප්‍රාර්ථනය යි.

ව්‍යාපෘති නායක

## 12 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය
## ක්‍රියාකාරකම් අනුක්‍රමය

| වාරය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 1 | 01 | 2.0 | 2.1 | පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාසනය | 10 |
| | 02 | 6.0 | 6.1 | කවිය හඳුනා ගැනීම, නූතන සිංහල කාව්‍යයෙහි ආරම්භය හා විකාසනය | 10 |
| | 03 | 5.0 | 5.1 | නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා | 10 |
| | 04 | 1.0 | 1.1 | පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය | 10 |
| | 05 | 3.0 | 3.1 | නවකතාව නම් සාහිත්‍යාංගයේ විශේෂතා | 10 |
| | 06 | 4.0 | 4.1 | කෙටිකතාව හා කෙටිකතා මූලිකාංග හඳුනා ගැනීම | 10 |
| | 07 | 7.0 | 7.1 | භාෂණය හා ලේඛනය අතර වෙනස හඳුනා ගැනීම | 05 |
| | 08 | 7.0 | 7.2 | අක්ෂර මාලාව හැඳින්වීම සහ අක්ෂර වර්ගීකරණය | 10 |
| | 09 | 8.0 | 8.1 | නාම හා නාම ප්‍රභේද | 10 |
| | 10 | 9.0 | 9.1 | වාක්‍ය රචනය | 05 |
| | 11 | 9.0 | 9.5 | විවිධ ලේඛන වර්ග හඳුනා ගැනීම | 10 |
| 2 | 12 | 2.0 | 2.2 | ගුත්තිල කාව්‍යයේ පසුබිම හඳුනා ගැනීම | 06 |
| | 13 | 6.0 | 6.2 | නූතන සිංහල කාව්‍ය රස වින්දනය හා විචාරය (ආනන්ද රාජකරුණා සිට සාගර පලන්සූරිය තෙක්) | 13 |
| | 14 | 5.0 | 5.2 | සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය | 06 |
| | 15 | 1.0 | 1.2 | පුරාතන ගද්‍ය-අර්ථාවබෝධය හා රස වින්දනය (මට්ටකුණ්ඩලී වස්තුව හා අනුරුද්ධ කුමාර කථාව) | 13 |
| | 16 | 3.0 | 3.2 | සිංහල නවකතාවේ ආරම්භ හා විකාසනය | 08 |
| | 17 | 4.0 | 4.2 | සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය | 08 |
| | 18 | 7.0 | 7.3 | අක්ෂර වින්‍යාසය | 08 |

## 12 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය
## ක්‍රියාකාරකම් අනුක්‍රමය

| වාරය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | 19 | 7.0 | 7.4 | නිෂ්පන්න, තත්සම, තද්භව, | 08 |
| | 20 | 7.0 | 7.5 | සන්ධි විධි | 15 |
| | 21 | 8.0 | 8.1 | ක්‍රියා හා ක්‍රියා ප්‍රභේද | 10 |
| | 22 | 9.0 | 9.4 | අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ) | 05 |
| | 23 | 2.0 | 2.3 | ගුත්තිල කාව්‍යය - රසවින්දනය හා විචාරය (91 - 147 කවි) | 12 |
| | 24 | 6.0 | 6.2 | නූතන සිංහල කාව්‍ය රසවින්දනය හා විචාරය (මීමන ප්‍රේමතිලක සිට මානවසිංහ තෙක්) | 09 |
| | 25 | 5.0 | 5.3 | නාට්‍ය ප්‍රවර්ග හඳුනා ගැනීම හා 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීම | 08 |
| 3 | 26 | 1.0 | 1.2 | පුරාතන ගද්‍ය-අර්ථාවබෝධය හා රසාස්වාදය (චන්දකින්නර ජාතකය සහ ස්වර්ණතිලකා වස්තුව) | 12 |
| | 27 | 3.0 | 3.3 | 'බැද්දේගම' නවකතාවේ පසුබිම හඳුනා ගැනීම | 04 |
| | 28 | 4.0 | 4.3 | කෙටිකතා රසවින්දනය හා විචාරය (මාර්ටින් වික්‍රමසිංහ සිට සයිමන් නවගත්තේගම තෙක්) | 17 |
| | 29 | 8.0 | 8.1 | නිපාත හා උපසර්ග | 07 |
| | 30 | 8.0 | 8.1 | විශේෂණ පද | 05 |
| | 31 | 8.0 | 8.1 | සමාස | 08 |
| | 32 | 8.0 | 8.1 | ප්‍රත්‍යයාර්ථ නාම (තද්ධිත නාම හා කෘදන්ත නාම) | 08 |
| | 33 | 8.0 | 8.2 | උක්ත අනුක්ත භේදය (වාක්‍ය රීති) | 06 |
| | 34 | 9.0 | 9.2 | සාරාංශකරණය | 04 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය | III |
| අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | IV |
| පෙරවදන | V |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | VI |
| විෂයමාලා කමිටුව | VII |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | VIII |
| 12 ශ්‍රේණිය ක්‍රියාකාරකම් අනුක්‍රමය | IX - X |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | XIII-LX |
| ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | |
| - පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාසනය | 2-7 |
| - කවිය හඳුනා ගැනීම, නූතන සිංහල කාව්‍යයෙහි ආරම්භය හා විකාසනය | 8-29 |
| - නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා | 30-33 |
| - පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය | 34-39 |
| - නවකතාව නම් සාහිත්‍යාංගයේ විශේෂතා | 40-44 |
| - කෙටිකතාව හා කෙටිකතා මූලිකාංග හඳුනා ගැනීම | 45-48 |
| - භාෂණය හා ලේඛනය අතර වෙනස හඳුනා ගැනීම | 49-54 |
| - අක්ෂර මාලාව හැඳින්වීම සහ අක්ෂර වර්ගීකරණය | 55-64 |
| - නාම හා නාම ප්‍රභේද | 65-68 |
| - වාක්‍ය රචනය | 69-72 |
| - විවිධ ලේඛන වර්ග හඳුනා ගැනීම | 73-93 |
| - ගුත්තිල කාව්‍යයේ පසුබිම හඳුනා ගැනීම | 94-97 |
| - නූතන සිංහල කාව්‍ය රසාස්වාදය හා විචාරය | 98-103 |
| - සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය | 104-106 |
| - පුරාතන ගද්‍ය-අර්ථාවබෝධය හා රස වින්දනය | 107-110 |

- සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය 111-115

- සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය 116-118

- අක්ෂර වින්‍යාසය 119-120

- නිෂ්පන්න, තත්සම, තද්භව, 121-124

- සන්ධි විධි 125-130

- ක්‍රියා හා ක්‍රියා ප්‍රභේද 131-135

- අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ) 136-139

- ගුත්තිල කාව්‍යය - රස වින්දනය හා විචාරය (91 - 147 කවි) 140-142

- නූතන සිංහල කාව්‍ය - රස වින්දනය හා විචාරය 143-145

- නාට්‍ය ප්‍රවර්ග හඳුනා ගැනීම හා 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීම 146-149

- පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රස වින්දනය 150-153

- 'බැද්දේගම' නවකතාවේ පසුබිම හඳුනා ගැනීම 154-156

- කෙටිකතා - රස වින්දනය හා විචාරය 157-159

- නිපාත සහ උපසර්ග 160-162

- විශේෂණ පද 163-165

- සමාස 166-168

- ප්‍රත්‍යයාර්ථ නාම (තද්ධිත නාම හා කෘදන්ත නාම) 169-171

- උක්ත අනුක්ත භේදය (වාක්‍ය රීති) 172-173

- සාරාංශකරණය 174-176

# සිංහල

## විෂය නිර්දේශය

## 12 -13 ශ්‍රේණි

**(2017 සිට ක්‍රියාත්මක වේ.)**

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**
www.nie.lk

සිංහල

12, 13 ශ්‍රේණි

විෂය නිර්දේශය

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල info@ nie.lk

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | XVI |
| හැඳින්වීම | XVII |
| ජාතික පොදු අරමුණු | XVIII |
| මූලික නිපුණතා | XIX-XX |
| විෂය අරමුණු | XXI |
| ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | XXII |
| විෂය නිර්දේශය | XXIII-LIV |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | LV |
| තක්සේරුව හා ඇගයීම | LVI |
| නිර්දිෂ්ට ග්‍රන්ථ | LVII-LIX |
| විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | LX |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවෙහි අ.පො.ස (උසස් පෙළ) සිංහල විෂය සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදිත ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම විෂය නිර්දේශය පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වීමට නියමිත ව ඇත්තේ 2017 වර්ෂයේ සිට ය.

මෙම නව විෂය නිර්දේශය සම්පාදනයේ දී දේශීය මෙන් ම විදේශීය භාෂා විෂයයන් සඳහා වූ විෂය නිර්දේශ අප විසින් අධ්‍යයනය කරන ලද අතර කාලීන සමාජීය හා දේශපාලනික ප්‍රවණතා හේතුවෙන් පැන නැඟෙන ආධ්‍යාපනික අවශ්‍යතා කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එහි දී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වීම සඳහා ශිෂ්‍යයා සූදානම් කිරීම මෙම විෂය නිර්දේශයේ එක ම අරමුණ ලෙස නො සැලකිණි. ගැඹුරු භාෂා ඥානයක් ශිෂ්‍යයාට ලබා දෙන අතර රසවින්දනාත්මක හා විචාරාත්මක කුසලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමත් භාෂා භාවිතයේ ප්‍රායෝගික පරිචය අත් පත් කර දීමත් එමගින් නිර්මාණකරණයට යොමු කිරීමත් මෙම විෂය නිර්දේශයේ අරමුණු අතර වෙයි.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත ය. විභාග කඩඉම ජය ගන්නා අතර ම භාෂා ඥානයෙන් හා පරිචයෙන් පිරිපුන් වීමට මෙම විෂය නිර්දේශය විද්‍යාර්ථීන්ට අත්වැලක් වේවා! යනු අපගේ පැතුම යි.

විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

# හැඳින්වීම

සිංහල භාෂාව ලෝකයේ ඇති සුබනම්‍ය ජීව භාෂාවලින් එකකි. වසර දහස් ගණනක් තිස්සේ ඉතිහාසයේ විවිධ කඩඉම් පසු කරමින් විකාසනය වූ සිංහල භාෂාව සාරගර්භ සාහිත්‍යයකට ද හිමිකම් කියයි. සිංහල භාෂාව වහරනුයේ ලෝක ජනගහනයට සාපේක්ෂ ව කුඩා පිරිසක් වුව ද සාරවත් බවින් හෙළ බස ලෝකයේ සෙසු කවර බසකට වුව දෙවැනි වෙති යි සිතිය නොහේ. වර්තමාන ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන  මාධ්‍ය භාෂාව වන්නේ ද සිංහල භාෂාව යි.  පාසල් අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍යයා සිංහල භාෂාව විධිමත් ලෙස හැදෑරීම ආරම්භ කරනුයේ පාසලේ පළමු වැනි ශ්‍රේණියේ පටන් ම ය. පාසලේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන අවස්ථාව වන විට ශිෂ්‍යයා ස්වකීය මවු බස පිළිබඳ යම් පරිචයක් අත් පත් කරගෙන සිටී.

මෙම මූලික භාෂා පරිචය සහිත ව කලා විෂය ධාරාවෙන් අ.පො.ස (උසස් පෙළ) හැදෑරීම සඳහා පිවිසෙන ශිෂ්‍යයා තමාට තෝරාගැනීමට ඇති විෂය රාශියක් අතුරෙන් 'සිංහල' විෂයය තෝරාගැනීම කෙරෙහි හේතු කිහිපයක් බලපෑ හැකි ය. සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ස්වකීය දැනුම සහ අවබෝධය තව දුරටත් පුළුල් කරගැනීම එක් අරමුණක් විය හැකි ය. අනාගත රැකියා ලෝකය ජය ගැනීම තවත් අරමුණක් වනු ඇත. හුදෙක් භාෂාව හා සාහිත්‍යයට ඇති ඇල්ම නිසා ම මෙම විෂය තෝරා ගන්නා ශිෂ්‍ය පිරිස් ද සිටීමට ඉඩ ඇත.



එනයින් නව විෂය නිර්දේශය සකස් කිරීමේ දී ඉහත කී සෑම අරමුණක් කෙරෙහි ම අවධානය යොමු කරන ලද බව කිව යුතු ය. සිංහල භාෂාවේ ගැඹුර මෙන් ම මිහිර ද අත්විඳීමේ අවස්ථාව විද්‍යාර්ථීන්ට අත් පත් කර දෙන අතර ම භාෂාව නිවැරදි ව හා මැනවින් හැසිරවීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීම අපගේ අපේක්ෂාව යි.

නිපුණතා පාදක වූ මෙම විෂය නිර්දේශය පුරාතන හා නූතන ගද්‍ය, පද්‍ය සාහිත්‍යය, නාට්‍ය, ව්‍යාකරණ හා ප්‍රායෝගික භාෂා කුසලතා යන විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන පරිදි සකස් කර ඇත. එකී නිපුණතා සාක්ෂාත් වන පරිදි හා විෂය සන්ධාරය ආවරණය වන අයුරින් සුදුසු ඉගැනුම් - ඉගැන්වීම් අද්දැකීම් සංවිධානය කරගැනීමේ නිදහස ගුරුවරයා සතු ව පවතී. සිංහල භාෂාව හා සාහිත්‍යය කෙරෙහි මනා ඇල්මකින් යුත්, භාෂා පරිචයෙන් පිරිපුන් ශිෂ්‍යයකු බිහි කරලීමට මෙම නව විෂය නිර්දේශය පිටුබලයක් වනු ඇතැයි අපේක්ෂිත ය.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලියෙහි දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිශන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිශන් වාර්තාව, 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය මඟින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා, ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කරගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කරගනී

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගැනීමේ දී ද සේවා පරිශ්‍රයක දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කරගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අද්දැකීම්

(VII) "ඉගැනීමට ඉගැනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවාගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙනගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිශන් වාර්තාව, 2003)

## විෂය අරමුණු

01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනාගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කරගැනීම

02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබාගැනීම

03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කරගැනීම, අත්පත් කරගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කරගැනීම

04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම

05. වර්ධනය වන්නා වූත්, ව්‍යාප්ත වන්නා වූත්, සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහාගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම

06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මඟින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කරගැනීම

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනාගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කරගැනීම | | | | | √ | | | |
| 02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබාගැනීම | | | | | | | | |
| 03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කරගැනීම, අත්පත් කරගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කරගැනීම | | | | | | | | |
| 04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම | | | | | | | | |
| 05. වර්ධනය වන්නා වූත්, ව්‍යාප්ත වන්නා වූත්, සාහිත්යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම | | | | | | | | |
| 06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මගින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කරගැනීම | | | | | | | | |

## අ.පො.ස (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශය 2017
## 12 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල් කරගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විකාසනය පැහැදිලි කරයි. | • පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය.<br>• ඒ ඒ අවධිවල පුරෝගාමී ගද්‍ය කර්තෘවරුන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවය අගය කිරීම | • පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සිංහල ගද්‍ය සාහිත්‍යයේ වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පුරාතන ගද්‍ය කෘති හා කර්තෘවරුන් නම් කරයි.<br>• පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 1.2 නිර්දිෂ්ට කෘතිවල විශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රසවිඳිමින් විමසුමට ලක් කරයි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල කතුවරුන්, කාලය, සාහිත්‍ය පසුබිම හා සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය, සාහිත්‍යික අගය හඳුනා ගැනීම හා රස වින්දනය<br>නිර්දිෂ්ට පුරාතන ගද්‍ය<br>• සද්ධර්ම රත්නාවලිය<br>මට්ටකුණ්ඩලී වස්තුව<br>• පූජාවලිය<br>අනුරුද්ධ කුමාර කථාව<br>• ජාතක කතා<br>චන්දකින්නර ජාතකය<br>• සද්ධර්මාලංකාරය<br>ස්වර්ණතිලකා වස්තුව | • නිර්දිෂ්ට කෘතිවල පසුබිම පිළිබඳ තොරතුරු වගු ගත කරයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් කියවයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.1 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය විස්තර කරයි. | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය<br>• ඒ ඒ අවධිවල පුරෝගාමී කවීන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවාව | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි වෙන් කොට දක්වයි.<br>• පුරාතන පද්‍ය කෘති හා කතුවරුන් නම් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 2.2 නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතිය අර්ථාවබෝධයෙන් යුතු ව කියවා එහි ආකෘතිය, ස්වභාවය හා සමාජ සංස්කෘතික පසුබිම පැහැදිලි කරයි. | • නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• ගුත්තිල කාව්‍යයේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>• පුරාතන පද්‍ය කෘතියේ රචනා රීතිය හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට පද්‍යවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය**<br>• **ගුත්තිල කාව්‍යය වෑත්තෑවේ හිමි (91 - 147 කවි)** | • ගුත්තිල කාව්‍යයෙහි කර්තෘවරයා, කාලය හා සමකාලීන සාහිත්‍ය පසුබිම විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි නිර්දිෂ්ට කවිවල අර්ථ පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● පෙරදිග කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>● සාහිත්‍ය නිර්මාණයක් රස වින්දනයේ දී පාදක කර ගත යුතු මූලික කරුණු හඳුනා ගැනීම<br>● කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය<br><br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය**<br>● **ගුත්තිල කාව්‍යය වැත්තෑවේ හිමි (91 - 147 කවි)** | ● පෙරදිග කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍යික අගය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.1 නවකතාව නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග විස්තර කරයි. | • නවකතාව යනු කුමක් දැයි නිර්වචන ඇසුරින් පැහැදිලි කිරීම<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග හඳුනා ගැනීම<br>• නවකතාංග<br>  • තේමාව<br>  • කතාව හා කතා වින්‍යාසය<br>  • දෘෂ්ටි කෝණය<br>  • චරිත නිරූපණය<br>  • චෛතසික නිරූපණය<br>  • අවස්ථා හා සිද්ධි නිරූපණය<br>  • පසුබිම් නිරූපණය<br>  • සංකේත නිරූපණය<br>  • භාෂා ලක්ෂණ<br>  • ජීවන දෘෂ්ටිය | • නිර්වචන ඇසුරින් නවකතාව යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ විස්තර කරයි.<br>• පරිශීලනය කළ නවකතා ඇසුරින් නවකතාංග සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍යික වටිනාකමක් සහිත නවකතා තෝරා ගෙන කියවීමට පෙළඹෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි. | • දේශීය නවකතාවෙහි ආරම්භය හා විකාසනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා)<br><br>- ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදීම<br>- ප්‍රථම සිංහල නවකතාව<br>- සිංහල නවකතාවේ පුරෝගාමී කර්තෘවරු<br>- සිංහල නවකතාවේ විවිධ තේමා සහ ව්‍යුහාත්මක ලක්ෂණ<br>- සිංහල නවකතාවේ ප්‍රවණතා | • සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදුණු ආකාරය විස්තර කරයි.<br>• සිංහල නවකතාවේ පුරෝගාමී කර්තෘවරුන් හා ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.<br>• පුරෝගාමී කර්තෘවරුන්ගෙන් සිංහල නවකතාවට සිදු වූ සේවාව අගය කරයි.<br>• සිංහල නවකතාවේ විවිධ තේමා හා ව්‍යුහාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• සිංහල නවකතාවේ ප්‍රවණතා පිළිබඳ විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නවකතාවේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br><br>නිර්දිෂ්ට නවකතාව<br>• බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය) | • නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.1 කෙටිකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා කෙටිකතා මූලිකාංග පැහැදිලි කරයි. | ● කෙටිකතා සාහිත්‍යාංගය හඳුනා ගැනීම<br>● කෙටිකතාව නිර්වචනය කිරීම<br>● කෙටිකතා විචාර මූලිකාංග හා කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම<br>- කථා ප්‍රවෘත්තිය<br>- කථා වින්‍යාසය<br>- චරිතාංග නිරූපණය<br>- චෛතසික නිරූපණය<br>- පසුබිම් නිරූපණය / පරිසර වර්ණනා<br>- යථාර්ථ නිරූපණය<br>- සංකේත භාවිතය<br>- දෘෂ්ටි කෝණය<br>- ජීවන දෘෂ්ටිය<br>- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ<br>- ඒකාබද්ධතාව | ● කෙටිකතාව යනු කුමක් දැයි හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● පරිශීලනය කළ කෙටිකතා ඇසුරින් කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>● කෙටිකතා විචාර මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව කෙටිකතා කියවයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| XXX | 4.2 සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි. | • සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා) හඳුනා ගැනීම<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කර්තෘවරුන් හා ඔවුන්ගේ නිර්මාණ හඳුනා ගැනීම<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා හඳුනා ගැනීම | • සිංහල කෙටිකතාවේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කර්තෘවරුන්ගේ නිර්මාණ අගය කරයි.<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා පිළිබඳ පැහැදිලි කරයි.<br>• විවිධ තේමා සහ ආකෘති සහිත කෙටිකතා කියවීමට පෙලඹෙයි. | 08 |
| | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය<br>නිර්දිෂ්ට කෙටිකතා<br>• වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ<br>• වෙසක් පහන - ජී. බී සේනානායක<br>• දිසොන්විනාහාමි - ගුණදාස අමරසේකර<br>• නොනිමි සිත්තම - කේ. ජයතිලක<br>• නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර<br>• අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර<br>• ස්නේහය - සයිමන් නවගත්තේගම | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 17 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 5.1 නාට්‍යය යනු කුමක් දැයි හඳුනා ගෙන එහි ලක්ෂණ පැහැදිලි කරයි | • නාට්‍යය යනු කුමක් දැයි නිර්වචනය කිරීම<br>• නාට්‍ය ප්‍රභේද හා විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගැනීම<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ අතර වෙනස හඳුනා ගැනීම<br>• නාට්‍ය නිර්මාණයක, පෙළෙහි සාහිත්‍යික අගය හඳුනා ගැනීම | • නිර්වචන ඇසුරින් නාට්‍ය යනු කුමක් දැයි විස්තර කරයි.<br>• නාට්‍ය ප්‍රභේද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ වෙන් වෙන් ව රස විඳිය හැකි අයුරු පැහැදිලි කරයි. | 10 |
| | 5.2 සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි. | • සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය හඳුනා ගැනීම | • සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී සිංහල නාට්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී නාට්‍යකරුවන්ගෙන් දේශීය නාට්‍යයට සිදු වූ සේවාව අගය කරයි.<br>• විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙළඹෙයි. | 06 |
| | 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>- පෙරදිග<br>- අපරදිග<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නාට්‍යයේ තේමාව හා කතා වස්තුව හඳුනා ගැනීම<br><br>**නිර්දිෂ්ට නාට්‍යය**<br>• **පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | • පෙර අපර දෙදිග නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 08 |

## අ.පො.ස (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශය 2017
## 12 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.1 කවිය නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි. | • කවිය යනු කුමක් දැයි නිර්වචනය කිරීම<br>• කවියෙහි මූලිකාංග හඳුනා ගැනීම<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගැනීම | • නිර්වචන ඇසුරෙන් කවිය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නූතන කාව්‍යයේ මූලිකාංග විස්තර කරයි.<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 05 |
| | 6.2 නූතන කාව්‍ය සාහිත්‍යයේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි. | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාසනය හඳුනා ගැනීම<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගැනීම<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගැනීම<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ සමාරම්භය හා විකාසනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගෙන විස්තර කරයි.<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නූතන කාව්‍ය රස වින්දනය හා විචාරය<br><br>**නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණ**<br>• **කොළඹ කවියේ ප්‍රථම තරංගය**<br>  • **ආනන්ද රාජකරුණා -සමනලයා**<br>  • **ඇස්. මහින්ද හිමි -ලක් මවුනි මගේ**<br><br>• **කොළඹ කවියේ ද්විතීය තරංගය**<br>  • **පී. බී. අල්විස් පෙරේරා -පැසුණුපැණ**<br>  • **සාගර පලන්සූරිය -ඉගිලෙන සිහින**<br>  • **මීමන ප්‍රේමතිලක -අඩසඳ**<br>  • **විමලරත්න කුමාරගම -වන්නියේ හැන්දෑව**<br>  • **එච්. එම්. කුඩලිගම -තවමත් ඔබ මගේ ය**<br>  • **ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ -ළඳරු හැඟුම්** | • නූතන කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 භාෂාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි. | 7.1 භාෂාවේ සම්මත ව්‍යවහාරය හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • භාෂාව දෙයාකාරයකින් භාවිත වන බව හඳුනා ගෙන<br>- භාෂණය (ශ්‍රව්‍ය ගෝචර සංකේත)<br>- ලේඛනය (දෘශ්‍ය ගෝචර සංකේත) | • භාෂා භාවිතයේ ස්වරූප දෙක හඳුනා ගෙන විස්තර කරයි.<br>• භාෂණ ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් විස්තර කරයි.<br>• ලේඛන ව්‍යවහාරය හා භාෂණ ව්‍යවහාරය වෙන් වෙන් ව භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි. | 05 |
| | 7.2 සිංහල අක්ෂර මාලාව පිළිබඳ දැනුම පාදක කරගෙන අක්ෂර විචාරය කරයි. | • සිංහල අක්ෂර මාලාව හැඳින්වීම හා අක්ෂර වර්ගීකරණය<br>• අක්ෂර මාලාවේ අන්තර්ගත, ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට පැමිණි හා නොපැමිණි අක්ෂර<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු, අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු<br>• සිංහල 'අ'කාරයේ සංවෘත-විවෘත භේදය<br>• විදේශීය වචන උච්චාරණය හා සිංහල අකුරෙන් ලියන ආකාරය<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර<br>• යංශය, රකාරාංශය හා රේඵය භාවිතය | • සිංහල අක්ෂර විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• සිංහල අක්ෂර නිවැරදි ව නම් කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු, අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු පැහැදිලි කරයි.<br>• සිංහල 'අ'කාරයේ සංවෘත -විවෘත භේදය හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියා දක්වයි.<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර මොනවා දැයි පැහැදිලි කරයි.<br>• යංශය, රකාරාංශය හා රේඵය නිවැරදි ව භාවිත කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගැනීම සහ භාවිතය | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 08 |
| | 7.4 අනුරූප පද සංයෝගය, නිවැරදි භාෂා ව්‍යවහාරය සඳහා යොදා ගනියි. | • නිෂ්පන්න, තත්සම, තද්භව, පද හඳුනා ගැනීම<br><br>• අනුරූප ලෙස පද සංයෝග කිරීම | • අනුරූප පද සංයෝගය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නිෂ්පන්න, තත්සම, තද්භව පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිෂ්පන්න, තත්සම හා තත්භව පද අනුරූප ලෙස සංයෝග කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනුරූප පද නිවැරදි ලෙස සංයෝග කරමින් භාවිත කරයි. | 08 |
| | 7.5සන්ධි විධි භාවිත කරමින් භාෂාව සුඛනම්‍ය ලෙස හසුරුවයි. | • සන්ධි විධි<br>i. ලෝපය<br>ii. ආදේශය<br>iii. ආගමය<br><br>(ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන්) | • 'සන්ධි' යනු කුමක් දැයි නිර්වචනය කරයි.<br>• උදාහරණ දක්වමින් සන්ධි විධි පැහැදිලි කරයි.<br>• සුඛනම්‍ය භාෂා භාවිතය සඳහා සන්ධිවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● සන්ධි ප්‍රභේද<br>- පූර්ව ස්වර ලෝප සන්ධි<br>- පර ස්වර ලෝප සන්ධි<br>- ස්වර සන්ධි<br>- ස්වරාදේශ සන්ධි<br>- ගාත්‍රාදේශ සන්ධි<br>- පූර්ව රූප සන්ධි<br>- පර රූප සන්ධි<br>- ගාත්‍රාක්ෂර ලෝප සන්ධි<br>- ආගම සන්ධි<br>- ද්විත්ව රූප සන්ධි<br><br>● මිශ්‍ර සිංහල සන්ධි<br>- සමාන ස්වර දීර්ඝ සන්ධි<br><br>- | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි. | 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● නාම<br>★ නාම ප්‍රකෘති<br>★ නාමයකින් ප්‍රකෘතිය වෙන් කර ගැනීමේ ක්‍රම<br>★ නාම පදයක මූලික ලක්ෂණ<br>★ වචන භේදය (ඒක, බහු)<br>★ ලිංග භේදය (පුල්ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග)<br>★ සචේතන - අචේතන භේදය<br>★ නියත - අනියත භේදය<br>● නාම ප්‍රභේද (නාම නාම, සර්ව නාම, සංඛ්‍යා නාම, ප්‍රත්‍යයාර්ථ නාම, සමාස නාම)<br>★ නාම නාම (ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා)<br>★ සර්ව නාම (පුරුෂ භේදය, ලිංග භේදය, වචන භේදය)<br>★ සංඛ්‍යා නාම<br>● නාම වරනැඟීම<br>★ විභක්ති<br>- ප්‍රථමා<br>- කර්ම<br>- කර්තෘ<br>- කරණ<br>- සම්ප්‍රදාන<br>- අවධි<br>- සම්බන්ධ<br>- ආධාර<br>- ආලපන | ● නාම ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● නාම පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● නාම පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● නාම ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නාම ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නඟමින් නාම විභක්තිවල වරනඟයි. | 48 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● ක්‍රියා<br>★ ධාතු ප්‍රකෘති<br>★ ක්‍රියාවකින් ප්‍රකෘතිය වෙන් කර ගැනීමේ ක්‍රම<br>★ ක්‍රියා පදයක මූලික ලක්ෂණ<br>- වචන භේදය<br>- පුරුෂ භේදය<br>- කාල භේදය (අතීත, අනතීත)<br>★ ක්‍රියා වරනැඟීම<br>★ ක්‍රියා ප්‍රභේද<br>★ අවසාන ක්‍රියා<br>- ආඛ්‍යාත, කෘදන්ත ක්‍රියා, නාම ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, (ප්‍රාර්ථනා ක්‍රියා)<br>- විධි ක්‍රියා<br>- ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>★ අනවසාන ක්‍රියා<br>- පූර්ව ක්‍රියා<br>- අපර ක්‍රියා<br>- මිශ්‍ර ක්‍රියා<br>- අසම්භාව්‍ය ක්‍රියා | ● ක්‍රියා ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● ක්‍රියා පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● ක්‍රියා පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ක්‍රියා ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් ක්‍රියා පද වරනඟයි.<br>● අවසාන ක්‍රියා සහ අනවසාන ක්‍රියා යන්න පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● **විශේෂණ**<br>- නාම විශේෂණ<br>- ක්‍රියා විශේෂණ | ● නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යනු මොනවා දැයි පැහැදිලි කරයි.<br>● නාම විශේෂණ සඳහා නිදසුන් දක්වයි.<br>● ක්‍රියා විශේෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● විශේෂණ පද උචිත පරිදි භාෂාවේ භාවිත කරයි. | |
| | | ● **සමාස**<br>- අව්‍යය සමාස<br>- විභක්ති සමාස<br>- විශේෂණ සමාස<br>- අන්‍යාර්ථ සමාස<br>- ද්වන්ද්වාර්ථ සමාස | ● සමාස යනු කුමක් දැයි විස්තර කරයි.<br>● සමාස ප්‍රභේද සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● සමාස භාවිතයේ ප්‍රයෝජන විස්තර කරයි. | |
| | | ● **ප්‍රත්‍යයාර්ථ නාම**<br>- තද්ධිත නාම<br>- කෘදන්ත නාම | ● ප්‍රත්‍යයාර්ථ නාම යනු මොනවා දැයි විස්තර කරයි.<br>● තද්ධිත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● තද්ධිත නාමයක ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කොට දක්වයි.<br>● විවිධ අර්ථ ගෙන දෙන තද්ධිත ප්‍රත්‍ය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● කෘදන්ත ප්‍රභේද හඳුනා ගෙන උදාහරණ දක්වයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිපාත | • නිපාත හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිපාත විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• නිපාත වෙන් කොට ලිවිය යුතු බව පැහැදිලි කරයි.<br>• භාෂා භාවිතයේ දී නිපාත උචිත පරිදි යොදා ගනියි. | |
| | | • උපසර්ග | • උපසර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• උපසර්ගවලින් ඉටු වන විවිධ කාර්යයන් සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• භාෂා භාවිතයේ දී උපසර්ග අර්ථවත් ලෙස යොදා ගනියි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | ● උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- උක්ත - අනුක්ත භේදය<br>- උක්ත - අනුක්ත භේදය පිළිබඳ වාක්‍ය රීති | ● උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● වාක්‍ය වින්‍යාස රීති නිවැරදි ව භාවිතයේ වැදගත්කම විස්තර කරයි.<br>● උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති නිවැරදි ව අනුගමනය කරමින් වාක්‍ය ලියයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතා ප්‍රදර්ශනය කරමින්, විචාරශීලී ව කරුණු සංවිධානය කරමින් ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | • ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය වැනි විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | • මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>• මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩ නඟයි.<br>• රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 05 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම | • සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>• ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 05 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | • විවිධ ලේඛකයන්ගේ ලේඛන ඇසුරෙන්<br>- ලේඛන ආකෘතිය<br>- භාෂා ශෛලිය<br>- ලේඛන රීතිය<br>- ලක්ෂ්‍යගත පාඨකයා හඳුනා ගැනීම<br>• **නිර්දිෂ්ට ලේඛන**<br>**හෙළ හවුලේ ලේඛන**<br>**විද්‍යා ලේඛන**<br>**ශාස්ත්‍රීය ලේඛන**<br>**ජන මාධ්‍ය ලේඛන**<br>**භාෂණ ව්‍යවහාරය පදනම් කර ගත් ලේඛන**<br>• උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම<br>- පුවත්පත් වාර්තා රචනය | • විවිධ ලේඛනවල ආකෘති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විවිධ ලේඛකයන්ගේ භාෂා රටා හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ ලේඛන සඳහා උචිත භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>• ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.<br>• පුවත්පත් වාර්තාවක ස්වරූපය විස්තර කරයි.<br>• උචිත ආකෘතියට අනුව නිවැරදි ව භාෂාව හසුරුවමින් පුවත්පත් වාර්තා රචනා කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබාගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල් කරගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.2 නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම හා රස වින්දනය<br><br>නිර්දිෂ්ට පුරාතන ගද්‍ය<br><br>• සද්ධර්ම රත්නාවලිය<br>කුණ්ඩලකේසීගේ වස්තුව<br><br>• පූජාවලිය<br>ජීවක වෛද්‍යවරයාගේ කථාව<br><br>• ජාතක කතා<br>චුල්ලධනුද්ධර ජාතකය<br><br>• සද්ධර්මාලංකාරය<br>නන්දිවාණිජ වස්තුව | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල සාහිත්‍යික අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 නිර්දිෂ්ට කථා වින්දනාත්මක ව පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම හා සමාජ හර පද්ධතීන් භාවිතයට ගනියි. | ● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ පරිශීලනය කොට පුරාතන ගද්‍ය සාහිත්‍යය මඟින් ප්‍රකට වන මානව ගුණධර්ම, හර පද්ධති හඳුනා ගැනීම හා ප්‍රායෝගික භාවිතය<br>● සාහිත්‍ය නිර්මාණකරණයට යොමු වීම | ● පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම විස්තර කරයි.<br>● මානව ගුණධර්ම හා හර පද්ධති ඇසුරෙන් චරිත සංවර්ධනය ගොඩනඟා ගත යුතු බව පැහැදිලි කරයි.<br>● අත්පත් කර ගත් මානව ගුණධර්ම සුරකිමින් සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන, නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය<br><br>නිර්දිෂ්ට පුරාතන පද්‍ය<br>• **ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (148 - 317 කවි)** | • පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරෙන් වෙනත් කාව්‍ය නිර්මාණ රස වින්දනයට පෙළඹෙයි. | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.3 නවකථාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නවකථාංග පිළිබඳ අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස වින්දනයට හා විචාරයට ලක් කිරීම<br><br>**නිර්දිෂ්ට නවකතාව**<br>• **බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)** | • නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකථාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | 28 |

# අ.පො.ස (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශය 2017

## 13 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0.කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය<br>**නිර්දිෂ්ට කෙටිකතා -**<br>**● කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ**<br>**● මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි**<br>**● කරත්තය - සෝමරත්න බාලසූරිය**<br>**● කළු සපත්තු - ජයතිලක කම්මැල්ලවීර**<br>**● කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති**<br>**● ගස් - නිශ්ශංක විජේමාන්න**<br>**● හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති**<br>**● නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ** | ● නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>● නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 29 |
| | 4.4 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවබෝධයෙන් යුතු ව කෙටිකතා නිර්මාණකරණයේ යෙදෙයි. | ● විවිධ කෙටිකතා පරිශීලනය කිරීම<br>● කෙටිකතාවලට පාදක වූ අද්දැකීම් හඳුනා ගැනීම<br>● විවිධ අද්දැකීම් පාදක කර ගෙන කෙටිකතා නිර්මාණය කිරීම | ● කෙටිකතාවලට පාදක වූ විවිධ අද්දැකීම් හඳුනා ගෙන විස්තර කරයි.<br>● කෙටිකතා නිර්මාණය සඳහා සුදුසු අද්දැකීම් තෝරා ගනියි.<br>● සාර්ථක කෙටිකතාවක මූලික ලක්ෂණ සහ අද්දැකීම් පදනම් කොට ගෙන කෙටිකතා නිර්මාණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය රස විඳිමින් විචාරය කරයි. | 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● නාට්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳීම හා විචාරය<br><br>**නිර්දිෂ්ට නාට්‍යය -**<br>● **පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | ● නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 16 |
| | 5.4 නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | ● විවිධ නාට්‍ය පිටපත් පරිශීලනය කිරීම<br>● නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම<br>● නාට්‍ය පිටපත් රචනා කිරීම | ● නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හා නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● විවිධ නාට්‍ය පෙළවල ඇතුළත් කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.<br>● විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙළඹෙයි.<br>● සාර්ථක නාට්‍ය පෙළක මූලික ලක්ෂණ හා නාට්‍යෝචිත අවස්ථා පාදක කර ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර සංකල්ප අනුව නිර්දිෂ්ට නූතන කාව්‍ය රස වින්දනය හා විචාරය<br><br>**නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණ**<br><br>• හෙළ හවුල් කවිය<br>  • කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල<br>  • රැ. තෙන්නකෝන් - හැවිල්ල<br>  • අරීසෙන් අහුබුදු - මඟුල් ගීය<br><br>• නිදහස් කවියේ ප්‍රථම තරංගය<br>  • ජී. බී. සේනානායක - දෙවියන් මැරීම<br>  • සිරි ගුනසිංහ - අබිනික්මන<br>  • ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි<br>  • මහගම සේකර - මාර යුද්ධය<br>  • විමල් දිසානායක - නාගල කන්ද | • නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිදහස් කවියේ ද්විතීය තරංගය<br>• පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්<br>• මොනිකා රුවන්පතිරණ - පොඩි දුව<br>• දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු<br>• බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු<br>• රත්න ශ්‍රී විජේසිංහ - පරමල්<br>• නන්දන වීරසිංහ - ආදරණීය පාසල<br>• ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර<br>• ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව<br>• ලාල් හෑගොඩ - සතුට | | |
| | 6.4 නූතන කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කිරීම<br>• කාව්‍ය නිර්මාණයට උචිත අද්දැකීම් ගොනු කර ගැනීම<br>• විවිධ තේමා හා ආකෘති ඔස්සේ කාව්‍ය නිර්මාණකරණයේ යෙදීම | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කර විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ කාව්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් විස්තර කරයි.<br>• කාව්‍ය නිර්මාණයට උචිත තේමා හා අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ ආකෘතින්ට අනුව කාව්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | ● උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- වාක්‍ය රීති<br><br>● කාරක භේදය<br>- කර්තෘ කාරක වාක්‍ය<br>- කර්ම කාරක වාක්‍ය<br><br>● ප්‍රකෘති කථනය, විකෘති කථනය | ● උක්ත ආඛ්‍යත පද සම්බන්ධ රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● කාරක භේදය පිළිබඳ රීති පැහැදිලි කරයි.<br>● කාරක භේදය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.<br>● වාක්‍ය රීති නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>● ලේඛනයේ දී උක්ත ආඛ්‍යත පද සම්බන්ධ රීති නිවැරදි ව භාවිත කරයි.<br>● ප්‍රකෘති කථනය හා විකෘති කථනය හඳුනා ගෙන නිවැරදි ව විස්තර කරයි.<br>● ප්‍රකෘති කථනය හා විකෘති කථනය නිවැරදි ව යොදමින් වාක්‍ය ලියයි. | 50 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කර ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | • ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය යන විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | • මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>• මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩ නඟයි.<br>• රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 11 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම | • සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 11 |
| | 9.3 භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියයි. | • භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ සමකාලීන (අද්‍යතන) සිංහලයට නංවා ලිවීම | • භාෂණ ව්‍යවහාරයෙන් හා ලේඛන ව්‍යවහාරයෙන් ඇති පාඨ අතර වෙනස හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් පවතින බව පිළිගනියි.<br>• භාෂණ ව්‍යවහාරය අද්‍යතන ලිඛිත ව්‍යවහාරයට හරවා ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 අනිර්දිෂ්ට පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>● ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>● අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>● අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 06 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | ● උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම<br>- විශේෂාංග ලිපි<br>- තීරු ලිපි<br>- ශාස්ත්‍රීය ලිපි | ● විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>● විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>● තීරු ලිපියක විශේෂතා විස්තර කරයි.<br>● ශාස්ත්‍රීය ලිපි යනු මොනවා දැයි පැහැදිලි කරයි.<br>● ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භෂා ශෛලිය තෝරා ගනියි.<br>● නිර්මාණශීලී ලෙසත් නිවැරදි ලෙසත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි. | 21 |

## (ඇ) පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

කිසියම් විෂයකට අදාළ විෂය නිර්දේශයක් සකස් කරනුයේ එම විෂය හදාරන ශිෂ්‍ය ප්‍රජාවට පොදුවේ ගැළපෙන පරිදි ය. එසේ වුවත් පන්ති කාමර මට්ටමෙන් එම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පවත්නා භෞතික පරිසරය මෙන් ම එක් එක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කායික, මානසික ස්වභාවය කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදු වනු ඇත. සිංහල විෂය සම්බන්ධ ව ද මෙය පොදු තත්ත්වයකි.

එබැවින් සිංහල විෂයට අදාළ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පාසලේ පවතින පහසුකම් අනුව ගුරුවරයා විසින් සුදුසු පරිදි සැලසුම් කරගනු ලැබිය යුතු ය. තව ද පන්ති කාමරයට පමණක් සීමා නො වූ ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා වෙත ද ශිෂ්‍යයා යොමු කළ යුතු ය. භාෂාව හා සාහිත්‍යය පිළිබඳ දැනුම, අවබෝධය මෙන් ම රසවින්දනය ද ශිෂ්‍යයා තුළ වර්ධනය වීමට තුඩු දෙන විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් මේ සඳහා ඉවහල් කරගත හැකි ය.

- දේශන
- සාකච්ඡා
- කේවල හා කණ්ඩායම් ක්‍රියාකාරකම්
- රස වින්දන වැඩසටහන්



ආදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද මෙන් ම,

- බිත්ති පුවත් පත් හා සඟරා
- සාහිත්‍ය සංගම්/උත්සව
- පුස්තකාල පරිහරණය
- ක්ෂේත්‍ර චාරිකා
- නාට්‍ය
- භාෂා තරග
- භාෂා දින වැඩසටහන්/ප්‍රදර්ශන
- ජන මාධ්‍ය

ආදිය ද ඵලදායී අයුරින් යොදාගෙන ශිෂ්‍යයාගේ කුසලතා වර්ධනයට අත්වැලක් ලබා දිය හැකි ය.

## (ඈ) තක්සේරුව හා ඇගයීම

අ.පො.ස. (උසස් පෙළ) විෂය මාලාවේ 12 සහ 13 ශ්‍රේණි යටතේ වසර දෙකක කාල සීමාවකින් අනතුරු ව අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දීමට ශිෂ්‍යයාට සිදු වෙයි. උක්ත විභාගය මෙම විෂය නිර්දේශයට අදාළ ජාතික මට්ටමේ ඇගයීම වශයෙන් සැලකිය හැකි ය. මේ හැරෙන්නට පන්ති කාමර මට්ටමෙන් ක්‍රියාත්මක වන දෛනික ඇගයීම් වැඩපිළිවෙළක් සහ වාර අවසාන හා වර්ෂ අවසාන විභාග ක්‍රමයක් පාසල විසින් උචිත පරිදි සැලසුම් කර ගනු ලැබිය යුතු ය. පාසල් පාදක ඇගයීම් වශයෙන්;

- කේවල පැවරුම්
- කණ්ඩායම් පැවරුම්
- වාචික අභ්‍යාස
- ලිඛිත අභ්‍යාස

ආදිය යොදා ගත හැකි ය.

නිපුණතා මට්ටම් 1.3 යටතේ ඇති සාහිත්‍ය නිර්මාණකරණය, 6.4 යටතේ ඇති කාව්‍ය නිර්මාණකරණය, 4.4 යටතේ ඇති කෙටිකතා නිර්මාණකරණය, 5.4 යටතේ ඇති නාට්‍ය පිටපත් රචනා කිරීම, 9.5 යටතේ ඇති පුවත්පත් වාර්තා රචනය, විශේෂාංග ලිපි රචනය, තීරු ලිපි රචනය හා ශාස්ත්‍රීය ලිපි සකස් කිරීම යන විෂය කොටස් පාසල් පාදක ඇගයීම් යටතේ ඇගයීමට ලක් කළ හැකි ය.

## (ඉ) නිර්දිෂ්ට ග්‍රන්ථ

### පුරාතන ගද්‍ය

- සද්ධර්මරත්නාවලිය (ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම සංස්.)
  - කුණ්ඩලකේසීගේ වස්තුව
  - මට්ටකුණ්ඩලී වස්තුව

- පූජාවලිය (ඒ. වී. සුරවීර සහ තවත් අය සංස්.)
  - අනුරුද්ධ කුමාර කථාව - ''කපිලවස්තු පුරයෙහි ශුද්ධෝදන රජ්ජුරුවන් මල්..'' යන තන්හි සිට ''... අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ යැයි මේ නමින් ප්‍රසිද්ධ වූ සේක'' යන තැනට
  - ජීවක වෛද්‍යවරයාගේ කථාව - ''විශාලා මහ නුවර අම්බපාලී නම් ගණිකාවක් ඇත'' යන තැන සිට ''.. තමන්ගෙන් ජීවකයන්ට ප්‍රසාද දුන්හ'' යන තැනට

- ජාතක කතා පොත
  - චන්දකින්නර ජාතකය
  - චුල්ල ධනුද්ධර ජාතකය

- සද්ධර්මාලංකාරය (බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය සංස්.)
  - ස්වර්ණතිලකා වස්තුව
  - නන්දිවාණිජ වස්තුව

### පුරාතන පද්‍ය

- ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන සංස්.)
  91 - 317 කවි (කවි 226ක්)

### නවකතා

- බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)

## කෙටිකතා

- වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ
- වෙසක් පහන - ජී. බී සේනානායක
- දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර
- නොනිමි සිත්තම - කේ. ජයතිලක
- නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර
- අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර
- ස්නේහය - සයිමන් නවගත්තේගම
- කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ
- මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි
- කරත්තය - සෝමරත්න බාලසූරිය
- කළු සපත්තු- ජයතිලක කම්මැල්ලවීර
- කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති
- ගස් - නිශ්ශංක විජේමාන්න
- හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති
- නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ



## නාට්‍ය

- ප්‍රේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර

## නූතන කාව්‍ය නිර්මාණ

- **කොළඹ කවියේ ප්‍රථම තරංගය**
  - ආනන්ද රාජකරුණා - සමනලයා
  - ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ

- **කොළඹ කවියේ ද්විතීය තරංගය**
  - පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ
  - සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින
  - මීමන ප්‍රේමතිලක - අඩසඳ
  - විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව
  - එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය
  - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැඟුම්

- **හෙළ හවුල් කවිය**
  - කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල
  - රැ. තෙන්නකෝන් - හැවිල්ල
  - අරීසෙන් අහුබුදු - මඟුල් ගීය

- **නිදහස් කවියේ ප්‍රථම තරංගය**
  - ජී. බී. සේනානායක - දෙවියන් මැරීම
  - සිරි ගුනසිංහ - අබිනික්මන
  - ගුණදාස අමරසේකර - අඳුර අපේ දූක නිවාවි
  - මහගම සේකර - මාර යුද්ධය
  - විමල් දිසානායක - නාගල කන්ද

- **නිදහස් කවියේ ද්විතීය තරංගය**
  - පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
  - මොනිකා රුවන්පතිරණ - පොඩි දුව
  - දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු
  - බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු
  - රත්න ශ්‍රී විජේසිංහ - පරමල්
  - නන්දන වීරසිංහ - ආදරණීය පාසල
  - ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර
  - ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව
  - ලාල් හෑගොඩ - සතුට

## (ඊ) විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

අභ්‍යන්තර

- එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එම්. ජී. මුණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- මංගල ගුණරත්න, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- රුවනි සිසිජා ජයකොඩි, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.



බාහිර

- සේවාර්ජිත මහාචාර්ය විමල් ජී. බලගල්ලේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- සේවාර්ජිත මහාචාර්ය ජේ. බී. දිසානායක, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- විශ්‍රාමික මහාචාර්ය රත්න විජේතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- විශ්‍රාමික මහාචාර්ය තිස්ස ජයවර්ධන, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හර්සන් ඩයස්, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
- මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- මහාචාර්ය රත්නසිරි අරංගල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- එස්. ඕ. ප්‍රනාන්දු, විශ්‍රාමික අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය, හාපිටිගම් අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.

# ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1.

# පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 2.1 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය විස්තර කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි වෙන් කොට දක්වයි.
- පුරාතන පද්‍ය කෘති හා කතුවරුන් නම් කරයි.
- පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.
- පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

i **පෙර සූදානම** (පාඩමට පිවිසීමට පෙර)

- පුරාතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ පොත්පත් ඇසුරින් තොරතුරු රැස් කරගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ සහ ඇමුණුම 1 ද ඉවහල් කර ගත හැකි ය.
- එහි දී පහත සඳහන් මාතෘකා පිළිබඳ අවධානය යොමු කරන්න.
  - * පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි
  - * එක් එක් අවධියේ ලියවුණු කෘති හා ඒවායේ කතුවරුන්
  - * සිංහල පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ

**ii ප්‍රවේශය**

- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

*උදා :* * හෙළ ගීයක් අසා සැට නමක් රහත් වූ පුවත දක්වෙන **ලෝවැඩ සඟරා** කවිය ඉදිරිපත් කිරීම

දහමට සරි කොට එළුවෙන් පෙර කී
කවියට සිත පහදා සිට නිසැකී
සිහි කොට කඳ පිළිවෙළ දොස් නොයෙකී
නිවනට සපැමිණි සඟ සැට නමෙකී

- ලෝවැඩ සඟරාව -

* සීගිරි ගීයක් හෝ වෙනත් එවැනි පැරණි පද්‍ය කොටසක් ඉදිරිපත් කිරීම

* පුරාතන පද්‍ය සාහිත්‍යය ආශ්‍රයෙන් ප්‍රතිනිර්මාණය වූ නූතන කවි පෙළක්/ගීතයක් ඉදිරිපත් කිරීම (වෙස්සන්තර ජාතකය, මඛාදේව ජාතකය, කුස ජාතකය වැනි)

* පුරාතන පද්‍ය සාහිත්‍යය පිළිබඳ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ඇසුරෙන් කෙටි විස්තරයක් ඉදිරිපත් කිරීම

(මේ අතරින් සුදුසු එක් ප්‍රවේශයක් යොදා ගත හැකි ය.)

**iii ඉගෙනුම සංවර්ධනය**

- පුරාතන පද්‍ය සාහිත්‍යය හැදෑරීමට හා රසවින්දනයට ශිෂ්‍යයන් පොලඹවනසුලු සාකච්ඡාවක් මෙහෙයවන්න. එහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.

  * **පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි හඳුනා ගැනීම**

  - අනුරාධපුර
  - පොලොන්නරු
  - දඹදෙණි
  - ගම්පොළ
  - කුරුණෑගල
  - කෝට්ටේ
  - සීතාවක
  - මහනුවර

  * **එක් එක් සාහිත්‍ය අවධියට අයත් පද්‍ය කෘති හා ඒවායේ කතුවරුන් හඳුනා ගැනීම**
  (මේ සඳහා ඇමුණුම 1, 2 උපයෝගි කර ගන්න.)

  * **පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ හඳුනා ගැනීම.**

1. සන්දර්භීය ලක්ෂණ - මහාකාව්‍ය, ඛණ්ඩ කාව්‍ය, කෝෂ කාව්‍ය, චම්පු කාව්‍ය
2. විරිත් - ගී, සිවුපද, සිලෝ
2. අන්තර්ගතය
   - ජාතක කතා ඇතුළත් කාව්‍ය - *උදා :* සසදාවත, මුවදෙව්දාවත
   - බුදුගුණ ඇතුළත් කාව්‍ය - *උදා :* බුදුගුණ අලංකාරය
   - සන්දේශ කාව්‍ය - *උදා :* පරෙවි, හංස, ගිරා
   - ප්‍රශස්ති කාව්‍ය - *උදා :* පැරකුම්බා සිරිත
   - උපදේශ කාව්‍ය - *උදා :* ලෝවැඩ සඟරාව, සුභාෂිතය, ලෝකෝපකාරය
3. පුරාතන පද්‍ය කෘති රචනා කිරීමේ අරමුණු
   - බුදු සිරිත වර්ණාත්මක ව නිරූපණය කිරීම. (''පෙදෙන් බුදු සිරිතැ බසින් වත් සිරිත් ඈ'' යනුවෙන් සියබස්ලකරෙහි සඳහන් නිර්දේශය අනුගමනය කිරීම මෙයට හේතු විය.)
   - චතුර් වර්ග ඵල සම්පත්තිය (ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ) ළඟා කරගැනීම
   - ශ්‍රද්ධාව වර්ධනය කර ගැනීම
4. වර්ණනා මාර්ගය - සියබස්ලකරින් අනුදත් අලංකාරවාදී වර්ණනා මාර්ගය සහ ජන කාව්‍ය සම්ප්‍රදාය
5. භාෂාව
   - මධ්‍ය සිංහල යුගයේ දී මහාප්‍රාණාක්ෂරයන්ගෙන් තොර කෝමල පද මාලාවක් සහිත සුකුමාර බස් වහරක් පද්‍ය සඳහා වෙසෙසින් භාවිත කර ඇත. (සිදත් සඟරා වර්ණමාලාවේ ඇතුළත් අක්ෂර උපයෝගි කරගත් අමිශ්‍ර සිංහල ව්‍යවහාරය)
   - පසු කාලීන ව පාලි සංස්කෘත වචන මිශ්‍ර ව්‍යවහාරය උපයෝගි කරගෙන ඇත.

- **පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ අගය කිරීම**

  පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණවල,

  * අනුදත් කාව්‍ය සම්ප්‍රදාය
  * අන්තර්ගතය
  * අරමුණු
  * විවිධ කාව්‍ය ආකෘති

  ආදිය සැලකිල්ලට ගනිමින්, එම කෘති සාහිත්‍යික වශයෙන් අගය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න. එම නිර්මාණවල ඓතිහාසික, සංස්කෘතික, සමාජීය වටිනාකම් කෙරෙහි ද ශිෂ්‍ය අවධානය යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම් ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- පාඩම අවසානයේ ඇගයීම සඳහා,
  * පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි, ප්‍රධාන සාහිත්‍ය කෘති සහ කතුවරුන් ඇතුළත් වගුවක් සකස් කිරීමට යොමු කිරීම (ඇමුණුම 2) (මෙම සම්පූර්ණ නාමාවලිය ගුරුවරයාගේ දැනුම සඳහා පමණි. තරු ලකුණු යොදා ඇති පද්‍ය කෘති පිළිබඳ තොරතුරු පමණක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.)
  * එක් එක් අවධිවල පද්‍ය සාහිත්‍යයේ විශේෂ ලක්ෂණ පිළිබඳ කෙටි සටහන් ලිවීමට ලබාදීම
  * සිංහල පද්‍ය සාහිත්‍යයේ විශේෂතා පිළිබඳ සංවාදයක නිරත කරවීම
  * ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

  වැනි විවිධ ක්‍රම යොදා ගත හැකි ය.

මුඛ්‍ය පද **(Keywords)**

* **පද්‍ය කාව්‍ය** — පද්‍ය කාව්‍යය වනාහි මහාකාව්‍යය, ඛණ්ඩකාව්‍යය, කෝෂකාව්‍යය යනුවෙන් වර්ගත්‍රයකට බෙදේ. මීට අමතර ව චම්පු කාව්‍යය නම් තවත් කාව්‍ය විශේෂයක් වෙයි.

  සූරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 127 පි.

* **මහාකාව්‍ය** — පද්‍ය කාව්‍ය ප්‍රභේදයකි. මහාකාව්‍යයක ඇතුළත් විය යුතු අංග කවරේ දැයි සංස්කෘත කාව්‍යාදර්ශයෙහි මෙන් ම සිංහල සියබස්ලකරෙහි ද විස්තර වේ. ඒ ලක්ෂණ මෙසේ යː

  1. සර්ග බන්ධනයෙන් යුක්ත වීම
  2. ප්‍රණාම, ආශීර්වාද, වස්තු නිර්දේශ යන විධිත්‍රයයෙන් එකකින් කාව්‍යය ආරම්භ කිරීම
  3. කථාවස්තුව ඓතිහාසික හෝ සජ්ජන හෝ චරිතයක් වීම
  4. කාව්‍යයෙන් චතුර්වර්ග ඵල ප්‍රතිබිම්බිත වීම

5. කාව්‍ය නායකයා දක්ෂ, උදාර, ගුණයුක්ත පුද්ගලයෙකු වීම
6. නගර, සාගර, පර්වත, ඍතු, චන්ද්‍රෝදය, සූර්යෝදය, උයන් කෙළි, දිය කෙළි, මධුපාන සහ සුරතෝත්සව, විප්‍රලම්භ, විවාහ, කුමාරෝදය, මන්ත්‍ර, දූත, යුද්ධගමන්, සංග්‍රාම, නායකාභිවෘද්ධි යනාදි වර්ණනා ඇතුළත් වීම
7. ඒ ඒ සර්ග කුඩා නොවන සේ, විස්තර සහිත ව රස භාව අන්තර්ගත කොට බන්ධනය කළ යුතු අතර සර්ග සංඛ්‍යාව ද ප්‍රමාණවත් වීම (සර්ග 8 හා 30 අතර විය යුතු බව කියවේ.)
8. අන්‍යෝන්‍ය සම්බන්ධය ක්‍රමික ව ඇති වන සේ ශ්‍රැතිරම්‍ය වෘත්තවලින් කථාව ගළපා තිබීම
9. සර්ගාන්ත පද්‍ය භින්න වෘත්තවත් වීම

මේ ලක්ෂණවලින් යුක්ත වන්නේ මහාකාව්‍ය යි.

කව්සිළුමිණ, කාව්‍යශේඛරය සිංහල සාහිත්‍යයේ දක්නට ලැබෙන සම්භාව්‍ය මහාකාව්‍ය ද්වය යි.

සූරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 160 පි.

* **ඛණ්ඩ කාව්‍යය** - එක් විෂයක් ආශ්‍රයෙන් ලියවුණ (ඒකාර්ථ ප්‍රතිපාදක වූ) පද්‍ය සමූහය ඛණ්ඩ කාව්‍යය නම් වේ ... කාලිදාස මහා කවියාගේ මේඝදූතය, ඍතුසංහාරය වැනි කෘති ඛණ්ඩ කාව්‍ය වේ. මුවදෙව්දාවත, ගුත්තිල කාව්‍යය ආදිය සිංහලයේ ඛණ්ඩ කාව්‍ය වර්ගයට උදාහරණ යි.

සූරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 82 පි.

* **කෝෂ කාව්‍ය** - එකිනෙක සම්බන්ධයක් නැති, සජාතීය කරුණු සංග්‍රහ කිරීම් වශයෙන් බන්ධනය කළ ශ්ලෝක සමූහය කෝෂ කාව්‍ය නම් වේ. අමරකෝෂ ආදිය ඊට නිදසුන් ය.

සූරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 80 පි.

* **චම්පු කාව්‍ය** - ගද්‍ය පද්‍ය මිශ්‍රණයෙන් ලියවුණු ශ්‍රව්‍ය කාව්‍ය විශේෂයකි... මේ කාව්‍ය විශේෂය සිංහල සාහිත්‍යයෙහි විරල ය.

සූරවීර, ඒ. වී. ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 90 පි.

* **කව් ලැකි** - කාව්‍ය ව්‍යවහාරය, කාව්‍ය රචනාවකින් ගත් නිදසුන, කාව්‍ය සම්ප්‍රදාය

විජයතුංග, හරිස්චන්ද්‍ර ***ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය,*** කොළඹ, 2012, 492 පි.

* **ලෙව් ලැකි** - කථා ව්‍යවහාරයෙන් ලබා ගත් නිදර්ශනය, ලෝකයාගේ ලක්ෂ්‍යය

විජයතුංග, හරිස්චන්ද්‍ර, ***ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය,*** කොළඹ, 2012, 1532 පි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඇසුරෙන් ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ඒ ඒ අවධිවලට අයත් පුරාතන පද්‍ය සාහිත්‍ය කෘති, කර්තෘවරුන් හා අන්තර්ගතය පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- පුරාතන පද්‍ය සාහිත්‍ය කර්තෘවරුන් අනුගමනය කළ කාව්‍ය සම්ප්‍රදායයේ ලක්ෂණ පැහැදිලි කරයි.
- පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණවල ඓතිහාසික, සංස්කෘතික, සමාජීය හා සාහිත්‍යික වටිනාකම් විස්තර කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| අමරවංශ හිමි, කොත්මලේ | - | **සිංහල සාහිත්‍ය ලතා** |
| කුලසූරිය, ආනන්ද | - | **සිංහල සාහිත්‍යය 1** |
| ගම්ලත්, සුචරිත | - | **සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ විකාශනය** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **සිංහල සාහිත්‍යයේ නැගීම** |

ඇමුණුම 2

**විවිධ අවධිවලට අයත් පුරාතන සිංහල පද්‍ය සාහිත්‍ය කෘති**

*(එක් අවධියකට අයත් කෘති දෙකක් හෝ තුනක් පිළිබඳ මූලික අවබෝධයක් ශිෂ්‍යයාට ලබා දීම ප්‍රමාණවත් ය. ඒ සඳහා තරු ලකුණු යොදා ඇති කෘති උපයෝගී කර ගන්න. කෝට්ටේ අවධිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සුදුසු යි.)*

| | | | |
|---|---|---|---|
| • අනුරාධපුර අවධිය | : * සීගිරි ගී | | |
| | * සියබස්ලකර | - | සලමෙවන් රජතුමා (1 සේන රජු) |
| • පොළොන්නරු අවධිය | : * මුවදෙව්දාවත | - | කර්තෘ අඥාත යි |
| | * සසදාවත | - | කර්තෘ අඥාත යි |
| • දඹදෙණි අවධිය | : * කව්සිළුමිණ | - | කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත දෙවන පැරකුම්බා නිරිඳු |
| | * එළු සඳැස් ලකුණ | - | හද්‍ර නම් තෙර නමක් |
| | ලකුණුසර | - | කර්තෘ අඥාත යි |
| • ගම්පොළ අවධිය | : * මයූර සන්දේශය | - | කවීශ්වර නම් කිවිඳෙක් |
| | * තිසර සන්දේශය | - | කර්තෘ අඥාත යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| • කුරුණෑගල් අවධිය | : | * | සඳකිඳුරු දා කව | - | විල්ගම්මුල මාහිමි (ඇතැම් වියත්හු මෙය මහනුවර යුගයට අයත් කාව්‍ය කෘතියක් බවට මත පළ කරති.) |
| • කෝට්ටේ අවධිය | : | | පරෙවි සන්දේශය | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | * | සැලළිහිණි සන්දේශය | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | * | කාව්‍යශේඛරය | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | | ලෝවැඩ සඟරාව | - | වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | * | බුදුගුණ අලංකාරය | - | වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | දහම් ගැටමාලාව | - | වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | හංස සන්දේශය | - | වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | කෝකිල සන්දේශය | - | දෙවිනුවර තිලක පිරුවන්පති |
| | | | ගිරා සන්දේශය | - | කර්තෘ අඥාත යි |
| | | | පැරකුම්බා සිරිත | - | කර්තෘ අඥාත යි |
| | | * | ගුත්තිල කාව්‍යය | - | වැත්තෑවේ හිමි |
| • සීතාවක අවධිය | : | * | සුභාෂිතය | - | අලගියවන්න මුකවෙටි |
| | | | සැවුල් සන්දේශය | - | අලගියවන්න මුකවෙටි |
| | | | කුස්තන්තීනු හටන | - | අලගියවන්න මුකවෙටි |
| | | | දහම්සොඬ දා කව | - | අලගියවන්න මුකවෙටි |
| | | * | කුස ජාතක කාව්‍ය | - | අලගියවන්න මුකවෙටි |
| • මහනුවර අවධිය | : | | සෙංකඩගල විස්තරය | - | කර්තෘ අඥාත යි. |
| | | * | වෙස්සන්තර කාව්‍යය | - | කර්තෘ අඥාත යි. |
| | | * | වියොවගරත්නමාලය | - | පත්තායමේ ලේකම් |
| | | | කව්මිණි මල්දම | - | කටුවානේ දිසානායක |

සැ. යු.

- ඇතැම්හු සීතාවක අවධිය කෝට්ටේ අවධියේ ම අපර (පසු) කොටසක් ලෙස සලකති.

- ''මාතර කවිය'' යනුවෙන් විශේෂ කාව්‍ය සම්ප්‍රදායක් ඇති නමුත් එය අවධියක් වශයෙන් නො පිළිගැනේ. එය මහනුවර අවධියේ ම අපර කොටස ලෙස සැලකේ.

# 2

# කවිය හඳුනාගැනීම, නූතන සිංහල කාව්‍යයෙහි ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 6.0 නූතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන, කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතු ව, නිර්දිෂ්ට පද්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.1 කවිය නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.

6.2 නූතන පද්‍ය සාහිත්‍යයේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- නිර්වචන ඇසුරෙන් කවිය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- නූතන කාව්‍යයේ මූලිකාංග විස්තර කරයි.
- නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නූතන සිංහල කාව්‍යයේ සමාරම්භය හා විකාසනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නූතන කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගෙන විස්තර කරයි.
- නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පුරෝගාමී නූතන කවීන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i **පෙර සූදානම**

- කවිය පිළිබඳ නිර්වචන එක්රැස් කරගන්න. (ඇමුණුම 01)
- නූතන කවීන් කාව්‍යකරණයට එළඹෙන පසුතලය හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කරගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.

ii **ප්‍රවේශය**

- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

*උදා :* * අද්‍යතන කවියෙකුගේ හරවත් කුඩා නිර්මාණයකින් ප්‍රවේශය ලබා ගැනීම

* කවිය යනු කෙබඳු සාහිත්‍යාංගයක් දැයි ශිෂ්‍යයන්ගේ අදහස් විමසීම

* නූතන කවි කිහිපයක් කියවීමට අවස්ථාව ලබා දීම

* කවිය පිළිබඳ නිර්වචන (ඇමුණුම 1) ලියූ කාඩ්පත් ශිෂ්‍යයන්ට ලබා දී ඒවා අහඹු ලෙස තෝරා ගෙන කියවීමට අවස්ථාව ලබා දීම

**ii ඉගෙනුම සංවර්ධනය**

- කවිය පිළිබඳ ව ඇති නිර්වචන පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කර සාකච්ඡාවක් මෙහෙයවන්න. (ඇමුණුම 01)
- අනෙකුත් සාහිත්‍යාංගවලින් කවිය වෙනස් වන ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳ ව ශිෂ්‍යයන් උගත් කරුණු පදනම් කර ගනිමින් පුරාතන පද්‍යයෙන් අද්‍යතන කවිය වෙනස් වන ආකාරය සාකච්ඡා කරන්න.
- නූතන කවියෙහි ආරම්භය සිදු වූ කාලවකවානුව පිළිබඳ ව ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දෙන්න.
- නූතන කවියෙහි ආරම්භය 20 වන සියවසේ ආරම්භයත් සමග සිදු වූ බව පැහැදිලි කරන්න.
- නූතන පද්‍ය සාහිත්‍යය පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකි බව පෙන්වා දෙන්න.
    - i. කොළඹ කවියේ ප්‍රථම තරංගය
    - ii. කොළඹ කවියේ ද්විතීය තරංගය
    - iii. හෙළ හවුල් කවිය
    - iv. නිසඳැස්/නිදහස් කවියේ ප්‍රථම තරංගය
    - iv. නිසඳැස්/නිදහස් කවියේ ද්විතීය තරංගය
- එක් එක් තරංගයට/අවධියට අයත් කාව්‍ය රචකයන් පිළිබඳ සාකච්ඡා කරන්න. (ඇමුණුම 02)
- නූතන පද්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා, අදාළ පද්‍ය රචකයන්ගේ නිර්මාණ ඇසුරෙන් පෙන්වා දෙන්න. (ඇමුණුම 03)

**iii තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම කත්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- කවිය කෙබඳු සාහිත්‍යාංගයක් දැයි හඳුන්වාදීම සඳහා ඉදිරිපත් කර තිබෙන වෙනත් නිර්වචන එක්රැස් කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට බෙදා, නූතන පද්‍ය සාහිත්‍යයේ එක් එක් අවධි නියෝජනය කරන කවීන් හා ඔවුන්ගේ නිර්මාණ නම් කිරීමටත් ඒවායේ සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කිරීමටත් පවරන්න. (මේ සඳහා පුස්තකාල පරිහරණයට යොමු කරන්න.)
- ශිෂ්‍යයන් සොයාගත් තොරතුරු ඇසුරෙන් කුඩා පොතක් සකස් කරවන්න.
- නූතන කවීන්ගේ නිර්මාණ එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඩම අවසානයේ ඇගයීම සඳහාඃ
    - * නූතන පද්‍ය සාහිත්‍යයේ අවධිවල නිර්මාණ සහ කර්තෘවරුන් ඇතුළත් වගුවක් සකස් කිරීමට යොමු කිරීම
    - * එක් එක් අවධිවල පද්‍ය සාහිත්‍යයේ විශේෂ ලක්ෂණ පිළිබඳ කෙටි සටහන් ලියවීම,
    - * නූතන පද්‍ය සාහිත්‍යයේ විශේෂතා යන මැයෙන් පුවත්පත්/සඟරා ලිපියක් සකස් කිරීමට යොමු කිරීම

වැනි විවිධ ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

මුඛ්‍ය පද **(Keywords)** :

- කාව්‍යය **(Poetry)** - මේ විෂය සම්බන්ධයෙන් නිර්වචන සැපයීමේ දී සහ පැහැදිලි කිරීමේ දී පෙරදිග සහ අපරදිග සාහිත්‍යධරයන් විසින් ඉදිරිපත් කරන ලද මත එක් සමාන නොවන්නේ ය.

(i) පෙරදිග මත

භාමහ නම් විචාරකයා පැවසූ පරිදි ''ශබ්දාර්ථෞ සහිතෞ කාව්‍යම්'' යන පාඨයෙහි අර්ථය නම් ''සහිත වූ හෙවත් මනා ව ගැළපුණු ශබ්ද, අර්ථ යන දෙක කාව්‍යය වේ,''යනු ය. මේ විවරණය අනුව පෙනෙන්නේ කාව්‍යය සම්පූර්ණ වීම සඳහා ශබ්ද, අර්ථ යන අංග දෙකක් තුබුව මනා බව ය. සාහිත්‍යදර්පණයෙහි කාව්‍යය විවරණය කර ඇත්තේ රසාත්මක වාක්‍යය (වාක්‍යං රසාත්මකං කාව්‍යම්) යනුවෙනි. 'රමණීය අර්ථ ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යය වේ.'' යනු ජගන්නාථයන්ගේ විවරණය යි. මේ හැම විවරණයකින් ම පෙනෙනුයේ පෙරදිග අර්ථය අනුව කාව්‍යය සම්බන්ධයෙන් එදා ගද්‍ය පද්‍ය යනාදි විශේෂයක් නොපැවති බවකි. එදා කාව්‍යය යන පදය වර්තමාන 'සාහිත්‍යය' යන අර්ථය බලා ගෙන භාවිත කළ බව සිතිය හැකි ය. බටහිර සාහිත්‍යය පිළිබඳ තත්ත්වය ද එසේ ම වූ බව අපි දනිමු. ඉහත කී නිර්වචන අනුව පද්‍යයෙන් හෝ ගද්‍යයෙන් හෝ රචිත වීමෙන් පමණක් කාව්‍යයක් සම්පූර්ණ නොවේ. රසාත්මක වීම, රමණීය අර්ථ ප්‍රතිපාදනය වැනි අංගයන්ගෙන් ද කාව්‍යය සම්පූර්ණ වුවමනා ය. පද්‍යයේත් කාව්‍යයේත් වෙනස මේ අනුව තේරුම් ගත හැකි වේ.

කාව්‍යය වූ කලි ගද්‍ය, පද්‍ය, මිශ්‍ර යනුවෙන් කොටස් තුනකට බෙදේ. බුත්සරණ ගද්‍ය කාව්‍යයකි. කව්සිළුමිණ පද්‍ය කාව්‍යයකි. ශ්‍රව්‍ය කාව්‍යය, දෘශ්‍ය කාව්‍යය යයි කාව්‍යය ද්විභේද කොට දැක්වීමක් ද වෙයි. ශ්‍රවණය කිරීමෙන් රස විඳිය යුතු කාව්‍යය ශ්‍රව්‍ය කාව්‍යය යි. බලා රස විඳිය යුතු කාව්‍යය දෘශ්‍ය කාව්‍ය යි.

ගද්‍ය, පද්‍ය, චම්පූ කාව්‍ය ග්‍රන්ථ ශ්‍රව්‍ය කාව්‍ය ගණයෙහි ලා ඇතුළත් වෙයි. දෘශ්‍ය කාව්‍ය ගණයට අයත් වන්නේ ගද්‍ය හා පද්‍ය මිශ්‍ර කොට යෙදූ රචනා විශේෂයකි. එය රඟදක්වා ප්‍රේක්ෂකයන්ට පෙන්වීම අපේක්ෂා කෙරේ.

(ii) අපරදිග මත

කාව්‍යය පිළිබඳ අපරදිග සම්මතය ද පෙරදිග සම්මතයට එතරම් වෙනස් නො වී ය.

''අපේ මාතෘකාව වූ කලි සාමාන්‍ය වශයෙන් කාව්‍ය කලාව මෙන් ම එහි විවිධ වර්ග සහ එක් එක් වර්ගයේ විශේෂ කාර්යය ද සාකච්ඡා කිරීම ය. වීර කාව්‍යය, ශෝකෝත්පාදකය, හාස්‍යෝත්පාදකය, වෘන්ද ගායන කාව්‍යය, නළාව හා වීණාව ආශ්‍රිත සංගීතය යන මේ සියල්ල ම මූලික වශයෙන් අනුකරණ ස්වරූපය දරයි''

මෙසේ ආරම්භ කෙරෙන කාව්‍ය ශාස්ත්‍රය *(Poetics)* නම් කෘතිය සම්පාදනය කරන ඇරිස්ටෝටල්ගේ අවධානය යොමු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් නාට්‍යය වෙත බව අපි දනිමු.

කිසියම් ප්‍රබල වින්දනයක් අන්තර්ගත වන හෝ සම්ප්‍රේෂණය කෙරෙන හෝ පරිදි ගද්‍යයෙන් වේවා පද්‍යයෙන් වේවා ගද්‍ය පද්‍ය මිශ්‍රණයෙන් වේවා රචිත කෘතිය කාව්‍යයක් සේ සලකනු ලැබේ. කාව්‍යය (Poetry) යන පදයට ඇති නිර්වචන විභාග කිරීමෙන් ද මේ කරුණු සනාථ වේ.

''කාව්‍යය වනාහි හොඳ ම වචන හොඳ ම පිළිවෙළට යෙදීම යි.''

- එස්. ටී. කෝල්රිජ්.

''කාව්‍යය නම් නිරායාසයෙන් ගලා එන ප්‍රබල හැඟීම් ය.''

- විලියම් වර්ඩ්ස්වර්ත්.

එහෙත් ගද්‍ය රචනයකට හෝ නාට්‍යයකට හෝ වඩා සූක්ෂ්ම ලෙසත්, සුපරීක්ෂාකාරී ලෙසත් වචන ගැළපීම අවශ්‍ය වනුයේ කාව්‍ය නිර්මාණයේ දී බව පිළිගැනෙන හෙයින් කල් යත් යත් කාව්‍යය යන්න විශේෂ අර්ථයකින් ම සැලකෙන්නට වූයේ ය. මේ අනුව අද කාව්‍යය ලෙස සැලකෙනුයේ ගද්‍ය රචනා, නාට්‍ය ආදියෙන් වෙනස් පාද වෙන් කොට රචිත (නිදහස් කාව්‍ය ඇතුළු) නිර්මාණ විශේෂයකි.

''අන් කිසිම ආකාරයකින් දනවිය නොහැකි අරුත් ප්‍රකාශ කිරීම පිණිස වචන යොදනු ලබන විශේෂ ආකාරය කාව්‍යය නම්'' යන සී. ඩේ ලුවිස්ගේ විවරණයෙන් ඒ බව පැහැදිලි වෙයි. කවියාගේ කාර්යය වන්නේ අපූරු අද්දැකීමක් හෙවත් වින්දනයක් පාඨකයා වෙත ගෙන එමින් ඒ මඟින් චමත්කාරයක් දනවීම ය. මේ සඳහා කාව්‍ය රචනයේ දී භාෂා භාවිතය ම ප්‍රධාන වෙයි. කාව්‍යයේ දී 'භාෂාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම' යන්නෙන් අදහස් කෙරෙනුයේ වචන හෝ වචන සංයෝග මඟින් ව්‍යංග්‍යාර්ථ දනවීම ය. උපමා, රූපක, සංකේත, සංකල්පරූප ආදිය අවශ්‍ය වන්නේ ද මේ සඳහා ම ය. ''ගද්‍ය හා නාට්‍ය රචනාවල දී ද මේ සියල්ල ම උපයෝගි කෙරෙතත් එහි උච්චාවස්ථාව දක්නට ලැබෙන්නේ කාව්‍යයේ දී ය.''

දැන් පෙර අපර දෙදිග ම 'කාව්‍යය' (Poetry) යන්න නවකතා, කෙටිකතා ආදි ගද්‍ය රචනා සහ නාට්‍ය යන සාහිත්‍යාංගයන්ගෙන් වෙන් කොට විශේෂාර්ථයකින් සැලකෙන බව කිව හැකි ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 72-75 පිටු

- **නිදහස් කාව්‍යය (සිංහල)** - ජී. බී. සේනානායක 1949 දී පළ කළ පළිගැනීම නම් කෙටිකතා සංග්‍රහයට ඇතුළත් කළ කාව්‍ය විශේෂයක් විචාරකයන් විසින් හඳුන්වනු ලැබුයේ 'නිසඳැස් කාව්‍ය' නමිනි. ඒ ව්‍යවහාරය පසු කාලයේ දී 'නිදහස් කාව්‍ය' යි භාවිත විය. මේ කාව්‍ය නිර්මාණයන්ගේ ආරම්භය කෙරෙහි ඉංග්‍රීසියේ Blank Verse, Free Verse යන පද්‍ය ක්‍රමයන්ගේ ආභාසය ලැබෙන්නට ඇත. ජී. බී. සේනානායක ඒ කාව්‍ය විශේෂ හැඳින්වූයේ මෙසේ ය:

''මේ පොතෙහි පද්‍යාවලීන්ගේ විලාසයෙන් එන නිබන්ධ මා සලකන්නේ ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක් වශයෙනි. ඒවා කියවිය යුත්තේ ගද්‍යය කියවන ලෙස ය. එහෙත් කියවීමේ දී ශබ්ද සංඝටනාවෙහි මාධූර්යය කෙරෙහි දක්වන සැලකිල්ල ගද්‍ය කියවීමේ දී ඒ අරබයා දක්වන සැලකිල්ලට වැඩි විය යුතු ය.''

ඉනික්බිති, සිරි ගුනසිංහ, ගුණදාස අමරසේකර, මහගම සේකර ආදි කවීන් අතින් මේ කාව්‍ය ක්‍රමය පෝෂණය වූයේ ය. මේ කාව්‍ය ක්‍රමය 'නිදහස් කාව්‍ය නමින්' හඳුන්වනු ලැබුව ද ඒ තුළ අවශ්‍යයෙන් ම කිසියම් රිද්මයක් අන්තර්ගත වන බවට මහගම සේකර තර්ක කරයි.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005,118 පි.

- අද්භූතවාදය/රොමෑන්ටික්වාදය **(Romanticism)** - දහඅටවැනි සියවසේ අග භාගයේ දී පමණ ජර්මනිය, ප්‍රංසය, එංගලන්තය ආදි යුරෝපීය රටවල පැතිර ගොස් සාහිත්‍යකලා ක්ෂේත්‍රයේ බලපැවැත්වූ සංකල්පයකි. කලාකරුවන්ගේ තර්ක මාර්ගයට වඩා පරිකල්පනයට වැඩි නිදහසක් ලැබුණු මෙහි දී ස්වභාව සෞන්දර්යය, ආදරයේ මහිමය, මනුෂ්‍ය ස්වභාවයේ ගූඪත්වය, සන්ත්‍රාසය ආදි විෂය අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට අවස්ථාව සැලසිණ. ප්‍රකෘති චින්තනයට ග්‍රහණය කරගත නොහැකි විෂයයන් ගැන 'නිර්මාණාත්මක ස්වප්න' දැකීමට මෙයින් කලාකරුවා ඉඩකඩ ලබාගත්තේ ය.

  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 11 පි.

- හයිකු කාව්‍යය **(Haiku)** - ජපානයේ භාවිත වන කාව්‍ය විශේෂයකි. ඒ කාව්‍ය ක්‍රමයේ ආරම්භය නිශ්චය වශයෙන් දැක්විය නොහැකි වෙතත් දහතුන් වන සියවස තරම් ඈත දී පවා හයිකු කාව්‍ය ලියැවුණ බව කියනු ලැබේ. දහසය වන සියවසේ ආරම්භය තෙක් මේ කාව්‍ය එතරම් ප්‍රචලිත වූ බවක් නොපෙනෙතත්, එතැන් පටන් මෑත භාගය තෙක් ම හයිකු කාව්‍ය ලියනු ලැබේ. ...

  ජපන් හයිකු කාව්‍යයේ විශේෂ ලක්ෂණය නම් අතිශයින් සංක්ෂිප්ත වීම සහ ඒ මඟින් වාක්චිත්‍රයක් ඉදිරිපත් කිරීම ය. ඒ අනුව මුළු කාව්‍ය නිර්මාණය ම මාත්‍රා සතළොසකට සීමා කෙරේ. ඇතැම් විට පද්‍යයේ ආකෘතිය ද අභිප්‍රේත වාක්චිත්‍රයට ම අනුකූලතා දක්වනු පෙනේ. හැකිතාක් අරපරිස්සමින් ධ්වනිතාර්ථවත් වචන භාවිත කිරීම හයිකු කාව්‍යයේ තවත් විශේෂත්වයකි.

  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 249 පි.

- සිවුපද - සිවුපද යන්නෙහි අර්ථ දෙකක් ඇත. එහි ප්‍රධාන අර්ථය නම් සතරපාද පද්‍ය යනු යි.

  එහි පාද සතරෙහි ම සමාන එළි, විරාම හා සමාන මාත්‍රා ඇති වීම අපේක්ෂා කෙරේ. සිවුපදයෙහි ගණ හෝ ලඝු - ගුරු හෝ විෂම ව පැවතිය හැකි වුව ද මාත්‍රා ගණන සමාන වුව මනා ය.

මේ සිවුපද එළිසම සහිත හෝ රහිත හෝ විය හැකි ය. සිවුපද මේ අනුව ගී, එළිසම පද්‍ය යි කොටස් දෙකකට බෙදේ.
මාත්‍රා දෙකේ සිට පණස් දෙක දක්වා වූ සිවුපද, සිංහලයේ දක්නා ලැබේ. එළුසඳස්ලකුණ දක්වා ඇත්තේ දිග ම සිවුපද විරිතට මාත්‍රා විසිඅටක් ඇති බව ය. එහෙත් ඊට අධික මාත්‍රා ගණන් ඇති සිවුපද පසු කාලයේ දී ලියවී ඇත. උදාහරණ වශයෙන් රාජසිංහ සිරිත නම් ප්‍රශස්ති කාව්‍යයේ මාත්‍රා පණස් දෙක බැගින් යුක්ත සිවුපද දක්නා ලැබේ. ...
ගැමි වහරේ යෙදෙන 'සීපද' යන පද්‍ය ගායනා විශේෂයට ද 'සිවුපද' යි ව්‍යවහාර වේ. මේ සීපද/සිවුපද නම් සාමාන්‍යයෙන් සතර පාද සහිත, එළිසම පද්‍ය ලෙස ගැනෙතත් සතර පාද එළිසම පද්‍යයෙන් අන්‍යතර 'ජනකවි' ද ඊට අයත් වේ.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 239-240 පි.

- **සංකල්පරූපය (Image/ Imagery)** - භාෂාව නොහොත් තම නිර්මාණය සඳහා භාවිත කෙරෙන වචන සංයෝග මඟින් පාඨකයාගේ මනසෙහි චිත්‍රයක් මැවීම නිර්මාණ ලේඛකයාගේ කාර්යය වන්නේ ය. සංකල්පරූපය නම් වචන මඟින් ඉදිරිපත් කෙරෙන වාග් චිත්‍රයයි. එය වාග් චිත්‍රයක් වන්නේ වචන ආශ්‍රයෙන් මවන චිත්‍රයක් නිසා ය.
  කාව්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සංකල්පරූප පුරාණයේ පටන් සලකන ලදි. කාව්‍යාලංකාර භාවිත කෙරෙන්නේ ද මේ අරමුණ ඇති ව ය. උපමා, රූපක, දීපක, යමක යන අලංකාර සතරක් ගැන භරතමුනිහු සඳහන් කළහ. රූපකාර්ථ සහිත පද යෝජනය සාර්ථක කාව්‍යයේ ලක්ෂණයක් ලෙස ඇරිස්ටෝටල් සඳහන් කර ඇත. ජපන් හයිකු කාව්‍යයේ දී ද සංකල්පරූප කෙරෙහි විශේෂාවධානය යොමු කෙරේ. සාහිත්‍ය නිර්මාණයක භාවිත කෙරෙන සෑම ශිල්ප විධියක ම මූලික අරමුණ වන්නේ සංකල්පරූපයක් ජනිත කිරීම ය. කාව්‍යය, නාවකතාව ආදි හැම සාහිත්‍ය නිර්මාණයක ම සංකල්පරූප හෙවත් වාග් චිත්‍ර දක්නට ලැබේ. සාහිත්‍ය කෘතිය සංකල්පරූප සංයෝජනයක් විය හැකි ය. සමස්ත කෘතිය එක ම සංකල්පරූපයක් ද විය හැකි ය.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 207 පි.

**ගුණාත්මක යෙදවුම් :**

- කවිය පිළිබඳ නිර්වචන එකතුවක්
- නූතන කවීන්ගේ කාව්‍ය නිර්මාණ/කාව්‍ය ග්‍රන්ථ කිහිපයක්
- නූතන කවීන්ගේ ඡායාරූප/ආලේඛ්‍ය රූප හා ජීවන තොරතුරු

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නිර්වචන ඇසුරෙන් කවිය හඳුන්වා දෙයි.
- නූතන කවියේ ප්‍රභේද දක්වමින් ඒ එක් එක් ප්‍රභේදයට අයත් කවීන් නම් කරයි.
- නූතන කවීන්ගේ නිර්මාණ පෙළ ගස්වයි.
- නූතන කවීන්ගේ නිර්මාණවල විශේෂ ලක්ෂණ හා ප්‍රවණතා ඉදිරිපත් කරයි.
- විවිධ ප්‍රභේදවලට අයත් නූතන කවීන්ගේ නිර්මාණ එකතුවක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| අමරසේකර, ගුණදාස | - | **භාව ගීත** |
| ආරියරත්න, සුනිල් | - | **නූතන පද්‍ය කාව්‍ය සංහිතා** |
| කරුණාරත්න, අශෝක | - | **සාහිත්‍ය විවේචනය** |
| දිසානායක, විමල් | - | **ගිරිකුල හා සඳ මඬල** |
| දිසානායක, විමල් | - | **නවකවි සරණිය** |
| දිසානායක, විමල් | - | **නිර්මාණය හා විචාරය** |
| පලන්සූරිය, සාගර | - | **පද්‍යාවලී** |
| ප්‍රේමතිලක, මීමන | - | **නවීන පද්‍ය රචනා** |
| මුනිදාස, කුමාරතුංග | - | **පිය සමර** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **නව පද්‍ය සිංහලය** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - | **කල්පනා ලෝකය** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - | **සාහිත්‍ය විද්‍යාව** |
| සුරවීර, ඒ. වී. | - | **නිර්මාණ පසුබිම** |
| සුරවීර, ඒ. වී. | - | **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා** |

ඇමුණුම 1

- **පෙරදිග මතය**
  - * '' රසවත් වූ වැකිය කාව්‍යය යි.

    - විශ්වනාථ
  - * ''රමණීය වූ අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යය යි.''

    - ජගන්නාථ
  - * ''අර්ථ රසයේත්, ශබ්ද රසයේත් මනා සුසංයෝගය කාව්‍යය යි.''

    - රුද්‍රට

- **අපරදිග මතය**
  - * ''කවිය යනු නිරුත්සාහක ව ගලා එන ප්‍රබල හැඟීම් සමුදාය යි.''

    - විලියම් වර්ඩ්ස්වර්ත්
  - * ''කවිය යනු හොඳ ම වචන හොඳ ම පිළිවෙළට යෙදීම යි.''

    - එස්. ටී. කොල්රිජ්
  - * ''කාව්‍යය වනාහි සමස්ත ඥාන සම්භාරයේ පෘථුලත්වය හා සූක්ෂ්මාර්ථය වේ.''

    - ග්‍රැහැම් හෆ්
  - * ''අන් කිසි ම ආකාරයකින් දැනවිය නොහැකි අරුත් ප්‍රකාශ කරනු පිණිස වචන යොදනු ලබන විශේෂ ආකාරය කාව්‍යය නම්.''

    - සී. ඩේ ලුවිස්

ඇමුණුම 02 නූතන කවියෙහි විවිධ අවධි

- **කොළඹ කවියේ ප්‍රථම තරංගය (මුල් පරපුර)** -
  * පියදාස සිරිසේන
  * ආනන්ද රාජකරුණා
  * ඇස්. මහින්ද හිමි
  * ජී. එච්. පෙරේරා

- **කොළඹ කවියේ ද්විතීය තරංගය (දෙවන පරපුර)** -
  * පී. බී. අල්විස් පෙරේරා
  * සාගර පලන්සූරිය
  * මීමන ප්‍රේමතිලක
  * කපිල ඊ. සෙනෙවිරත්න
  * විමලරත්න කුමාරගම
  * චන්ද්‍රරත්න මානවසිංහ
  * එච්. එම්. කුඩලිගම

- **හෙළ හවුල් කවීහු** -
  * කුමාරතුංග මුනිදාස
  * රැයිපියෙල් තෙන්නකෝන්
  * හියුබත් දිසානායක
  * අමරසිරි ගුණවඩු
  * අරීසෙන් අහුබුදු

- **නිසඳැස්/නිදහස් කවියේ ප්‍රථම තරංගය** -
  * ජී. බී. සේනානායක
  * සිරි ගුනසිංහ
  * ගුණදාස අමරසේකර
  * මහගම සේකර
  * විමල් දිසානායක

- **නිසඳැස්/නිදහස් කවියේ ද්විතීය තරංගය**
  * පරාක්‍රම කොඩිතුවක්කු
  * මොනිකා රුවන්පතිරණ
  * දයාසේන ගුණසිංහ
  * ධර්මසිරි රාජපක්ෂ
  * බර්ටි බී. කුඩාහෙට්ටි
  * රත්න ශ්‍රී විජේසිංහ
  * නන්දන වීරසිංහ
  * ආරියවංශ රණවීර
  * බුද්ධදාස ගලප්පත්ති
  * කෝ. ආනන්ද හිමි
  * කුමාර හෙට්ටිආරච්චි
  * සෙනරත් ගොන්සල්කෝරාළ
  * දර්ශන මේදිස්
  * යමුනා මාලනී පෙරේරා
  * එරික් ඉලයප්ආරච්චි

**ඇමුණුම 3 විවිධ අවධිවලට අයත් කවිවල ලක්ෂණ**

**i. කොළඹ කවියේ ප්‍රථම තරංගයට අයත් නිර්මාණවල ලක්ෂණ**

**වස්තු විෂය** -
* දේශාභිමානය හා ජාත්‍යනුරාගය
* සමාජ සංශෝධනය/සදුපදේශ
* ළමා සිතුම් - පැතුම්
* ස්වභාව සෞන්දර්ය වර්ණනා
* ආගමික චරිත/බොදු බැතිය

**භාෂාව** -
* පුරාතන පද්‍ය කාව්‍ය භාෂාවෙහි ආභාසය
* ආවේගාත්මක බස්වහර
* කටවහරට නැඹුරු වූ බස්වහර
* ළමා ලෝකය හා සම්බන්ධ සරල හා සුබනම්‍ය බස්වහර

**සංකල්ප රූප** -
* පැරණි කවිසමය ඇසුරෙන් සංකල්ප රූප ගොඩනැඟීම
* ළමා පද්‍ය නිර්මාණයේ දී ළමා මනසට ගෝචර වන ආකාරයෙන් නව සංකල්ප රූප භාවිතය

**ආකෘතිය** -
* පුරාතන පද්‍ය කාව්‍ය සම්ප්‍රදායේ ආභාසය
* ළමා පද්‍ය සඳහා සරල ආකෘති යොදාගැනීම

**නිදර්ශන කාව්‍ය නිර්මාණ**

**අනුස්මරණය**

දුටුතැන් අප මුතුන් සිරි ලක පමණ නැති
සඳකැන් සෙලින් කොත් බඳිනට සුදුසු වෙති
දැක ගත් නට මඟක් දැන් අප හට නොමැති
එ බැවින් සිතින් වත් බුහුමන් කරමු නිති

තණ කන මු වා නොවිද ම එලවන්ට සිතු
ගුණනැණ ලොවාසින්හට දැක්වූ අමුතු
පින වන දෙ වා සුර බඹ සත් කිත් දිමුතු
සිතු දින ප වා සැපතකි මුත්තන් මෙ යුතු

ලෝවැඩ නොකොට සියතට පත් දේ කැම
ඒ ජ ඩ මිනිස් ගතියක් බව කිවු පේම
පෑ දි ඩ තෙද විකුම් දැරූ පැරකුම් නාම
දී හ ඬ තුති වදන් පවසමු හැම දාම

ම සු ර න්   දහක් දෙන ලෙස බත් මුලට   එක
සි ර සි න්   පිදූව සිහලෙක් විසුවේ ය   ලක
මෙලෙසින්   තෙද විකුම් සහ සත් ගුණ   අදික
ස ත ති න්   සිහි කරමු මුත්තන් ලෙස   සැපෙක

දියනෙත   සසුන් වැඩූ මුත්තන් දැවූ   තැන
ද ත යු ත   මෙතනයයි අප හට කියන   මෙන
වනපෙත   ගිරා පරපුටු   සැලළිහිණි යන
තුරු මත   හඬන හඬ'සා තුටු වෙමු   නිතින

සු ග ත්   සසුන් රැක සිය දිවි දෙවෙනි   ලෙස
ම හ ත්   වැඩ සැලසූ යස කිරණ සඳ   රැස
ප ස ත්   මුතුන් සිහි කර සිහලුන්   විලස
අ පි ත්   රැක ගනිමු මෙම සිංහල   නිවෙස

**පියදාස සිරිසේන**

**දරු නැළවිල්ල**
**හෙවත්**
**ජාතික තොටිල්ල**

දොයි දොයි දොයි දොය්ය   බබෝ
බ යි බ යි බ යි බ ය්ය   බබෝ

මුනි සිරිපා සිඹිමි   න්නේ
සමනොළ ගිරි පෙදෙසි   න්නේ
මඳ සුළඟ යි මේ එ   න්නේ
මගේ පුතා නිදිය   න්නේ

නිදහස මහ මුහුදක්   වේ
එහි උල්පත පුත නුඹ   වේ
ඒ බව සිහි කොට මෙ ලො   වේ
යුතුකම ඉටු කළ යුතු   වේ

විජයතුමා තම්මැන්   නේ
පිරිවර සෙන් සමගින්   නේ
සිටි සැටි දූන් සිහි වෙන්   නේ
මගේ පුතා නැළවෙන්   නේ

දෙන දිවි මුත් රට වෙනු   වෙන්
ජාතික දරුවන් ලැබු   වෙන්
මිදී නොයෙක් සතුරු මු   වෙන්
ලක් මවු විසුවා ය සු   වෙන්

තවුසකු සේ ඇඳ පැළඳා
පඬුවස්දෙව් මහ නිරිඳා
මා කඳුරින් ගොඩ බට දා
මඟුලක් වී ලක මුළු දා

දෙව් පුර මෙන් දෙවිය න්නේ
සිරි ලක්දිව බබළ න්නේ
එහි සක්දෙව් රජ මෙ න්නේ
මගේ පුතා ලොකු වෙ න්නේ

ලස්සන මෙන් මහ පොළො වේ
අනුරාපුර ඉදි කෙරු වේ
දොරමඬලේ කුමරිඳු වේ
උඹට පුතේ සුව එළ වේ

ජාතික රණ දෙරණ ම තේ
ගැටී වැටී මළ මොහො තේ
සුන්දර සුරඹුන්ගෙ අ තේ
නැළවෙන බව සිතනු පු තේ

සිරි මහබෝ සිඹිමි න්නේ
මහමෙවුනා පෙදෙසි න්නේ
සුළං දූලක් මේ එ න්නේ
මුටසිව් රජු සිහි වෙ න්නේ

ලක් වැසියන් කෙරෙහි නැ මී
අරහත් මහ මිහිඳු හි මී
පෙවුවෙ උතුම් සදහම් මී
පුත නුඹටත් පොවමි එ මී

එදා පටන් මෙ සිරි ල කේ
සම්මා සම්බුදු මැණි කේ
දම් එළියෙන් අඳුරු මැ කේ
මිසදිටු විස කටු නො රැ කේ

**ඇස්. මහින්ද හිමි**

(ඉහත කවි පන්තිය කවි 98කින් සමන්විත වේ. මෙහි ඇතුළත් වන්නේ මුල් කොටසේ කවි 12ක් පමණි.)

ii. **කොළඹ කවියේ දෙවන තරංගයේ නිර්මාණවල ලක්ෂණ**

**වස්තු විෂය** -
* ප්‍රේමය
* ස්වභාව සෞන්දර්යය
* සමාජ අසාධාරණය
* ගැමි දිවිය
* කතා පුවත් කවියට නැඟීම

**භාෂාව** - * සරල, වාර්තා ස්වරූපී බස්වහර
* සෞන්දර්යාත්මක බස් වහර
* ජන කවීන්ගේ බස් වහර

**සංකල්ප රූප** - * නවතම සංකල්ප රූප
* රොමැන්ටික් (Romantic) කවීන්ගේ නිර්මාණ ආභාසයෙන් සකස් කරගත් සංකල්ප රූප

**ආකෘතිය** - * සිවුපද ආකෘතිය
* දෙපද ආකෘතිය
* ගී ආකෘතිය

**නිදර්ශන කාව්‍ය නිර්මාණ**

**ළය මානය**

හිඳෙන වැව් හෝ වියලි වන්නිය පළාතට වැහි වලාවක් වෙමි
ලවන රහ මුසු වෙරළ ගම් වෙත මිහිරි ඇල්දිය තලාවක් වෙමි
අඳුරු හදවත් එළිය කරවන හඳක් හෝ මල් නිලාවක් වෙමි
කලාකාමය කලාවට දිය කරන පිරිසිඳු කලාවක් වෙමි

අලුත ඉපදී කෙළින කෙළිබර සොඳුරු වහු පැටවුන්ගෙ නෙත්වල
පාන්දර මඳ සුළඟ විදිමින් නටන පිනි ඇති නෙළුඹු පත්වල
මිටින් හැකිළී තිබෙන කිරි දරුවන්ගෙ සියුමැලි සිනිඳු අත්වල
නිදා ගන්නෙමි හවස හිරුරැස මැකෙන තුරු සෑ පළිඟු කොත්වල

කිරි බුරුළු ළඟ රෑට නිදිගත් බොළඳ වස්සන් අවදි කරවමි
පිපෙන්නට තැත් කරන හැම කැකුළකම කෙමියෙහි සුවඳ පුරවමි
බිළිඳු තොල් පෙති හීන මැද්දෙන් මුවග තනපුඩු දෙසට හරවමි
කුරුලු බෙණ මැද ටිකිරි කෙඳිරිලි මකා එහි ගී රස ඉහිරවමි

පුසුඹ ගුලිවල බැමි ලිහන්නෙමි පාන්දර ගහ උඩ මලක් වී
නෙළුම් යායම හෙමින් හොලවමි සිහිල් නිල් දිය පිරි විලක් වී
හිසින් හපුබණ්ඩාර දොවොලක් කරමි ඇතුගල මෙන් ගලක් වී
උදේ රෑ තේවාව අරඹමි කැලෑවක් මැද පන්සලක් වී

මිහිරි අඹු සැමි පෙමින් උතුරන ගමේ පැල්පත්වලට වැදිලා
එකතු කර ගත් සිනා මලු ගෙන මහා මන්දිර අසල රැඳිලා
විසි කරන්නෙමි රැගෙන දෝතින් යන්ට හැම තැනකටම බෙදිලා
ඇඹුල් ගෙඩිවල පවා පැණිරහ හැලෙයි එතකොට හොඳට ඉදිලා

ගැඹුරු මූදේ කිඳුරු නිදහන් තුළින් මුතු ගෙන තිබෙන හංගා
හඳේ නො පෙනෙන එහා පැත්තේ රිදී මල්වතුවලට රිංගා
තාරකාවල මැණික් මාලිග මුදුන දේදුනු කොඩිය නංගා
ඔබේ නින්දට රැගෙන එන්නෙමි මගේ සිතිවිලි සිහින ගංගා

දවල් ගිනිගත් මගක යනවිට වලාවක් වී සෙවන දෙන්නම්
ඇඟෙන් ඩහදිය ගලන මොහොතක සුළඟ වීමෙන් වැළඳ ගන්නම්
ඈත අහසේ පුංචි තරුවක් බවට පත් වී හිනා වෙන්නම්
මූදු වෙරළේ සිටිනු දුටු විට පෙරළි පෙරළී ළඟට එන්නම්

හැලෙන සුසුමෙන් බලන බැල්මෙන් මුළු ලොවම පා ළඟට නේවා
තවත් ඉවසා ඉඳිනු හැකිනම් කඳුළු මල් පුදසුනෙහි ගාවා
සුසුම් මැද්දෙන් හිනා මැද්දෙන් දුලබ කවිකම අවදි වේවා
මගේ හදවත එළිය නො අඩුව ඔබේ නිල් ඇස් මැදට ඒවා

කරේ ඔලගුව ඉරී තිබුණත් හිතේ ආඩම්බරය ඇත්තේ
සැපත් සැපයකි දුකක් සැපයකි වැටෙන සෙවණැලි ලකුණු මත්තේ
ඈහෙන් වපුරා හිතෙන් දිය දී දිවෙන් අස්වනු ඇහිඳ ගත්තේ
කොටා බැලුවෙමි පොළා බැලුවෙමි අනේ ඇයි! මළු පිරෙනු නැත්තේ

ළයට කොතරම් රිදුම් දැනුනත් ඉතා අවිහිංසක ව ඉන්නෙමි
කයට බිඳුවක් සවිය නැතිවත් යෝදයකු මෙන් වැඩ කරන්නෙමි
පයට පෑගෙන මලක් වාගේ දුබල තණපත් යට එබෙන්නෙමි
ණයට ගත් දේ පිනට දෙන්නෙමි හිඟගෙන ආ දේ රකින්නෙමි

**පී. බී. අල්විස් පෙරේරා**

**ආරච්චිරාල**

අලියා වැටුණු වැව ආරච්චි රාලට
මුව මස් ඌරු මස් හිඟ නොමැත කෑමට
මුළු ගං ගොඩ ම හිටියත් ඔහුගෙ වාලට
ඔහු වැඩිපුර ම බය ලොකු සයිබු නානට

වට්ටක්කා වැලකි ඒ ගෙයි වහල මත
එරඬු වැටේ වැඩිපුර ලොකු කපොලු නැත
කුරහන් බිස්ස යට බල්ලට සෙවණ ඇත
ඔහුගේ ගෙදර මට හොඳට ම මතක ඇත

පස් බානක් ම ඔහු හට හොර හරක් ඇත
ගමනට පැදුරු දැමූ බර බාගයක් ඇත
නියඟක් අවත් ඉන් වැඩිපුර බයක් නැත
වැව කිට්ටුවට වෙල ''ඉස්සර'' හයක් ඇත

ඉඳිකඩ ළඟ ම සිට ගත් මහලු පලු ගසේ
පොඩි පෙට්ටියක පානට මැසි පොකුරු නැසේ
එළියක් දුටිමි ඒ එළියෙන් ඔහුගෙ හිසේ
මට මේ ලියන විට තව ඒ එළිය දිසේ

රජයේ සේවයෙන් කෙහෙ පැදුණු තට්ටේ
පොල් තෙල් ගෑ වැනිය අමු පොලයක කට්ටේ
තැවරුණ බවක් පවසන ගොම මුසු මැට්ටේ
කොණ්ඩය කුහුඹු ගුලියකි පොලයක නැට්ටේ

කෙස් නැති හිසට නැග ගන්නට බලන මෙනී
කම්මුල දෙසට රළු උඩු රැවුල කැරකුණී
හතරට බිඳුණු බැම රළු ලොම් ගන ව ගනී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු දනී

රජයේ සේවයට දිවි කැප කරන මෙනී
රෑ දාවලේ යයි ගංගොඩ දෙසට වැනී
කන බොන වෙලාවට අඹුවට හොඳට බනී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු දනී

වී බුසලකට සිතුවොත් කුඹුරකුදු ගනී
රුපියල් දෙකක් දෙන විට පස් වරක් ගනී
සමහර විටදි ඉඳිකඩ වැට උඩින් පනී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු දනී

මොහුගේ රාජකාරියෙ ඇති මහගු ගුණේ
ගැමියන් මුහුණ බැලුවොත් හොඳ හැටි ම පෙනේ
අසරණ අහිංකයන්ගේ කුඹුරු අනේ !
මොහුට ය කොහොම හරි කෙළවර ගොදුරු වුණේ

මොහුගේ මහගු සේවයෙ හැටි මෙයට වැඩී
යම්කිසි විටෙක හරකකු තැබූ පඳු ව වෙඩී
නැගගෙන හරක් හොරුගේ කර උඩට දැඩී
පස්සා කකුල් දෙක ඔහුගේ ගෙයට වඩී

රැළි යුතු නළල පළලින් අඩු විය බෝ සේ
මුගටියකුගෙ පැහැය ඇත වළ වූ දෑසේ
සුදුමැලි දෙතොල උඩ බැලු කොට මොට නාසේ
දිග ඇති පළල් කට කම්මුල සහ පෑසේ

මුළු රෑ ලැගී හිඳ පලු ගහක මැස්සක
ලැබ ගෙන අහිංසකයකු පිඳුව මස් ටික
වළඳා අදට වූවත් වසර විස්සක
පුදුමයි බලන්නට අද ඔහුගෙ රැස් ටික

කිසිවෙක් නො වේ කෙරුමට මොහු සමග හබේ
වෙහෙසක් නැති ව යල මහ අස්වනු ද ලැබේ
කුරහන් වියෙන් බිහි තුන ඉදිමුණ ද ඉබේ
යම් කිසි බියක් ඔහුගේ නෙත් අතර තිබේ

දවසින් දවස වන පෙත ගංගොඩෙහි හැපේ
ඔහුගේ ගෙදර ළඟ කළුවර බුරුත කැපේ
ගැමියන් පිහිට ලැබ ගිනි ඇවිළුණ ද ළිපේ
හැම ගැමියෙක් ම ඔහුගේ පාමුලෙහි හැපේ

**විමලරත්න කුමාරගම**

iii. **හෙළ හවුලේ නිර්මාණවල ලක්ෂණ**

**වස්තු විෂය** -
* දේශාභිමානය
* ජාත්‍යනුරාගය
* ඓතිහාසික ප්‍රවෘත්ති
* ළමා ලෝකය
* මවුපිය ගුණ

**භාෂාව** -
* නුමුසු හෙළ බස

**සංකල්ප රූප** -
* පැරණි කවි සමයේ ආභාසය
* ජනකවි ආභාසය

**ආකෘති** -
* සිවුපද ආකෘතිය
* ගී කාව්‍ය ආකෘතිය
* සිලෝ ආකෘතිය

**නිදර්ශන පද්‍ය නිර්මාණ**

**දරු සුරතල්**

මගෙ පුතා මගෙ දැතට එන්නැ මේ
ඇති ද රෝස මලේ අගයෙක් ඉතින්
දැකැ ඔබේ මුහුණේ සුරතල් සිනා
මැලැවුණේ මෙ මල යි පිපුණෙම් මම යි

සඳ කැලුම් දෙවියන් ගෙ අමා දියෙන්
මැඬැ සමන් කුසුමන් පතැ ලා සෙමෙන්
සිය වරක් පුලුනේ පෙඳ'ගින් පෙළැ
ඇඳැ තිබී ද බඹා ඔබගේ සිනා

පුත, ම-මූණ ඔබේ කොම'ළත් දෙකින්
අම රෙසෙන් තෙමනා කලැ මේ ලෙසින්
කුමට මම් පතනෙම් සුව දෙව් ලොවේ
එ සුව මේ නොලබන්නනටැ'යි සිතම්

පත - පොතේ නැති මුත් ඔබ ගේ වදන්
එබඳු මීරි කවක් තැනුවෙක් නො වේ
කිම ද ගී බඳනා දන වත් එවන්
රස යෙදීම නොදන්නෙ උගත් නමුත්

මහ තොසින් කිපෙමින් ඇස'ගින් බලා
කොමළ අත් පොඩියක් ඔසවා එයින්
ම-සිත දුක් ගිරි මත් හෙණ පාර දී
පළ කරන්න විකුම් බල බාලයන්

පය තුබු හඬිනුත් දනැ මා එතී
හැරැ සියල්ල නඟා පිය නාදයක්
දණ ගගා අවුදින් පැනලා ගෙලේ
ලණු නොගත් අතිනුයි බැඳලන්නෙ මා

පිය වදන් බෙණෙමින් සැණෙකින් අවුත්
සනසමින් දෙ අතින් ඇරැ ගත් සෙමේ
බලනු වස් මගෙ ආදරයේ තරම්
වියළි - නෙත් හැඬුමක් නොහඬන්නෙ ඇයි ?

''සපනෙකැ'' යි කියුමෙන් කට නෑ ඉඩෙක්
පය නඟන්නට ඇයි සැක මේ තරම්
ඉගැනුමෙක් කො ද වී තොර වැයමින්
ඇඟිලි අක් ගෙන වත් නැඟිටින්නැ මා

රිසි ලෙසින් මැ දිවීම පිනීම ඈ
පුරුදු සෝවුරියන් දෙදෙනා හටත්
ඔබ වටා දණ ගා යන ලෙස් මෙසේ
කිම උගන්වනුයේ පෙරළා යළිත්

පුතැ බලන් ඔබ පෙම්බර මැණියෝ
ලකුණු දුන් මුහුණේ පොඩි මේ දතින්
මට අගේ කොටැ පාති හිසත් සලා
උනට ඇයි වැඩියෙන් මට ආදරේ ?

සැම මැහුම් ගෙතුමැ දුරැ ලා ඔබේ
ගතෙහි දූලි පිසුන් කැරැ-ගත් ඇඳුම්
සුළු මවුන් සනසා තෙදැගිල්ල පෑ
පුත උගන්වව දූන් මැ අනා කලත්

සියලු දෑ තනි වී කෙරෙමින් පෙළී
හිඳිත මයිලණුවන් අසුනේ අවුත්
නැත ඔවුන් ළය මත් එහි යම් ඉඩක්
ඔබ නොගත් සිතිවිල්ලකටත් නො දෙන්

සතර පස් දෙනකුන් කටයුත්තෙහිත්
නොමැලි අත් දෙක මිත්තණියන් ගෙ දූන්
යෙදෙනු කුස් පුරවන්නට මැ යි ඔබේ
පුත මුදන් සැමියන් මළ සෝකයෙන්

මගෙ පියා ගෙ අගේ දැනැගත්තෙ මා
පුත ඔබෙන් යැ ඔබත් ගුරු වෙත් එයින්
මෙ බඳු වී ද මගෙන් ඔහු ලත් සැපත්?
කවුරු දූන් මට ඒ පවසත්, අහෝ

නො වෙ ද කාලිදසුන් ගෙ වදන් සැබෑ
පැලැඳුමුත් ඇඳුමුත් තුඹුණත් කෙතෙක්
පෙර පිනේ පල නම් ඔබ ගේ ගතේ
දූහුලියෙන් මගෙ ගත් සැරැසීම මැ යි

**කුමාරතුංග මුනිදාස**

මුහුද

සුළඟත් සමඟ වැදැ වැදැ සෙද කිසි කවන
රළ අත් දිදී ගැලැවෙන්නට පොර බදන
පෙණදත් පෑ පෙරළ-පෙරැළී සිනා සෙන
බලමින් මහ මුහුද හඬමින් ගොඩ හැපෙන

දිය කඳයි රළ ගොඩ යි
නිල් පැහැයි බිය වවයි
උඩ පනියි බිමැ වැටෙයි
හති දමයි පෙණ හළයි
\- මූද මේ

පෙරට එයි ගොඩ හැපෙයි
විහිදූ යෙයි දඟ වැඩි යි
යළි දිවෙයි මුර නඟයි
යළි දූ එයි මැළි නොවෙයි
\- මූද මේ

ලුණු හදයි මාළු දෙයි හුළඟ හයියෙන් පිඹියි
අවු බලයි ගිම තදැයි දිය පොවයි වැහි එවයි
ගං පුරයි උතුරවයි රැකැ සිටියි නැවැතැ බොයි
පණ යතියි ඉල්ලුවයි මේ බොවයි දිය නො දෙයි
\- මූද මේ

පෙරළ පෙරළා බලන නැවැතත්
උගත යුතු නිසි දසුන් නන'රුත්
ලැබෙන පිටු කෙළ සුවහසක් යුත්
මුහුද වැනි මහ පොතෙක් වෙන නැත්

අහසේ පැහැ දැකැ මොහොතින් මොහොතට
පෙරළන නිසි පැහැ සිය ගත් සිඳු පිට
පෙරැළෙන රට දැකැ පෙරැළෙන එ ලෙසට
සම කළ හැකි මෙහි දෙස්පලු පිලකට

හැපෙත හැපෙත ගල් පරවලැ
කවරෙක් තව තව නටා ද?
නැවැත නැවැතැ විත් එහි වැදූ
සිඳෙන බිඳෙන රිසි මැ දේ ද?
අනත වෙහෙස ගණන් නො ගෙනැ
සුදින් හොඳින් සිනාසේ ද?
සිරිත මෙ බඳු ඇතියෙක් ලොවැ
මුහුද මැ මිසැ වෙන ලැබේ ද?

මහ මඬ පතුලෙහි සඟවා ඉන්නේ
ඒ බව නෑ නොවැ පිටට පවින්නේ
කෙලෙසුන් යට කළ කුහු තවුසන්නේ
සිරිත යි මහ මුහුදත් පවසන්නේ

කලක් කොමල දරුවන් ලද
කලක් ගෙවෙත මහලු නො වෙද
කෙළක් මසුන් සුතන් ලද ද
මවක් යොවුන් මෙ වන් ඇති ද?

**අරීසෙන් අහුබුදු**

iv.**නිදහස්/නිසඳැස් කවියේ ප්‍රථම තරංගයේ නිර්මාණවල ලක්ෂණ**

**වස්තු විෂය** -
* ප්‍රේමය
* පුද්ගල මනෝභාව (තනිකම, පාළුව)
* යථාර්ථ නිර්මාණ
* සමාජ විවරණ
* චරිත විනිවිද දැකීම
* සමාජ විපර්යාසය
* බෞද්ධ දර්ශනයේ සංකල්ප

**භාෂාව** -
* සංක්ෂිප්තභාවය
* සංකේතාර්ථවත් භාෂාව
* රූපකාර්ථවත් භාෂාව
* ව්‍යවහාර භාෂාව මිශ්‍ර කාව්‍යාත්මක බස්වහර
* වස්තු විෂයට උචිත පරිදි භාෂාවේ විවිධත්වයක් පළ කිරීම
* නව්‍ය කාව්‍යෝක්ති භාවිතයට ගැනීම
* ප්‍රබල සංකල්ප රූප මැවීමට සමත් භාෂාවක් භාවිත කිරීම

**සංකල්පරූප** -
* සංකල්ප රූප නව්‍යත්වයක් සහිත ව යොදා ගැනීම
* නිදහස් කාව්‍ය ආකෘතියක් භාවිත කිරීම
* ඇතැම් පද්‍ය නිර්මාණවල සඳැස් කාව්‍ය ලක්ෂණ දක්නට ලැබිම
* නිදහස් කාව්‍ය ආකෘති භාවිත කරන අතර සිවුපද කාව්‍යය ද දක්නට ලැබීම

**නිදර්ශන කාව්‍ය නිර්මාණ**

**නිශ්ශබ්දතාව**

දෑත බිම ඔබා,
පස්සට වාරු වී,
නිසල ව හුන්
ඇගේ ලිහිල්
කෙස් රොදක්,

නිහඬ ව හමන
සුළඟින්
එසවී,
මා මුහුණෙහි
හැපෙත් ම,
ඇගේ රන්වන්
මුහුණ දෙස
බැලූ මම
ඇසීමට දිගු කලක්
පුළ පුළා සිටි
කිසිවක් ඇසීමට
සිතීමි.
මසකු හඬ නගා දෑගලූයෙන්,
ගං ඉවුර අස
පන් ගසින් යුත්
නොගැඹුරු බොර දිය
කැලඹිණ,
ඈත ඉවුරෙහි
උස් ව වැඩුණු
මහ උණ පඳුරින්
අහසට නැඟුණු
කොබෙය්යෙක්
කෑ ගාගෙන
පියාඹා ගියේ ය.
ඉක්බිති ව
මහා නිශ්ශබ්දතාවයක් පැතිරිණ.
ඇගේ රන්වන් දිගටි මුහුණ දෙස බැලූ මම
ඇසීමට දිගු කලක් පුළ පුළා සිටි
කිසිවක් ඇසීමට
යළිත් සිතීමි.
නිශ්ශබ්දතාවය දෑඩි විය
පෙදෙස වසාගෙන පැතුරුණු
නිහඬ බවින් මිරිකුණු මම
ඇයගේ
රන්වන්,
දිගටි,
නිසල
මුහුණ දෙස බලා
කරබා ගතිමි.

**ජී. බී. සේනානායක**

**සොබා මහගම සේකර**

ඉරට මුවාවෙන් ඉඳගෙන
ඉස පීරනවා
සඳට මුවාවෙන් ඉඳගෙන
සළු පළඳිනවා
දීප චන්ද්‍ර රේඛාවෙන් මූණ බලනවා
වලාකුළෙන් අහස් තලෙන් බිමට වඩිනවා

පායන තරු ඇස් ඇරලා
බලා සිටිනවා
පීදෙන මල් පෙති විදහා
මුකුළු කරනවා
සුළං රොදින් ඇදී ඇවිත්
ඇගේ වෙළෙනවා
ගහකොළ සෙලවෙන තාලෙන්
රහස් කියනවා

මේඝ මැදින් විදුලිය මෙන්
නටා දිවෙනවා
සීතල පොද වරුසාවෙන්
කුසුම් සලනවා
ඇල දොල ගං දිය ඉහලා
ගිමන් නිවනවා
මගේ හදට සදා සතුට
ඔබෙන් ලැබෙනවා

**මහගම සේකර**

v. **නිදහස්/නිසඳැස් කවියේ දෙවන තරංගයේ නිර්මාණවල ලක්ෂණ**

**වස්තු විෂය** -
* ප්‍රේමය
* පාළුව, තනිකම, කලකිරීම වැනි මනෝභාව
* සංකීර්ණ සමාජ යථාර්ථය හා බැඳුණු අද්දැකීම්
* සමාජ අසාධාරණය
* පරිසරය

**භාෂාව** -
* සංක්ෂිප්ත භාවය
* ධ්වනිතාර්ථවත් භාවය
* නව කාව්‍යෝක්ති උපයෝගි කර ගැනීම
* වස්තු විෂයයට ගැළපෙන මිශ්‍ර බස් වහර

**සංකල්ප රූප** -
* අද්දැකීමට උචිත සංකල්ප රූප මැවීම
* පැරණි සංකල්ප නව පරිසර තත්ත්වයන්ට උචිත ලෙස ගළපා ගැනීම

**ආකෘති** -
* නිසඳැස් ආකෘතිය
* සංයුක්ත කවි ආකෘතිය

**නිදර්ශන පද්‍ය නිර්මාණ**

**අම්බලමේ පිනා**

අම්බලමේ පිනා
වළං කදක් ගෙනා
ඒක බිඳපි ගොනා
ඒකට ඇයි හිනා?

හිරුගෙන් ගිනි ඇරන්
පතලෙන් මැටි ඇරන්
කැලෙන් පාට ඇරන්
හදා වඩන වළන්

ඇස්වල දුම් හැපේ
අත්වල පොතු කැපේ
කඹුරාගේ ලිපේ
වළං කැකුළු පිපේ

''හුරුබුහුටිට මනා
තෝඩු දෙකක් තමා
හිතේ හීන තනා
අම්බලමේ පිනා

පය බුරුලින් තියා
කද අරගෙන ගියා

අම්බලමේ පිනා
වළං කදක් ගෙනා
ඒක බිඳපි ගොනා
හීන පාලු උනා

කටු ටික කද දමා
පිනා ගෙදර ගියා
හිස් අත් වන වනා...
හිස් අත් වන වනා...

පිනාගෙ පොඩි ළමා
මිදුලට දුව එනා
බිඳුන හීන බලා
කද ළඟ ගොලු උනා!

**පරාක්‍රම කොඩිතුවක්කු**

**පටු පාරකට හැරුණ මිත්‍රයෙක්**

සිව්වසක් අපි ආමු එකම මග
කටුක ගල් බොරළු මත
දෙපා බුරුලින් තබා
ගාටමින් ආ ඔබ
එක දිනක
ආ මගින් ඉවත පැන
කාන්ට් පිළිරුව ළඟින් (දකුණට)
පටු පාරක් දිගේ
ආපසු දුවන්නට විය
සත් මහල් මැදුරක
සත් වසක් නිදාගත්
සුරූපී කුමරියක්
ඇහැ ඇරුණ බව අසා
අභිෂේක ලබන්නට
සත් වසක් සුසානේ
නිදාගත් ගැහැනියක්
සදා කල් නිදනු මිස
කිසි දිනක නැගිටී ද?

**බර්ටි බී. කුඩාහෙට්ටි**

# 3

# නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා

**නිපුණතාව** : 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා විචාර සංකල්ප අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 නාට්‍යය යනු කුමක් දැයි හඳුනා ගෙන එහි ලක්ෂණ පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- නිර්වචන ඇසුරින් නාට්‍යය යනු කුමක් දැයි විස්තර කරයි.
- නාට්‍ය ප්‍රභේද පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නාට්‍යය හා නාට්‍ය පෙළ වෙන් වෙන් ව රස විඳිය හැකි අයුරු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම** (පාඩමට පිවිසීමට පෙර)

- නාට්‍ය කලාවේ විශේෂතා පිළිබඳ ව කරුණු අන්තර්ගත පොත්පත් ඇසුරින් අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.
- නාට්‍ය කලාව පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ තොරතුරු/ඡායාරූප/සංයුක්ත තැටි රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
  1. නාට්‍ය යනු කුමක් ද?
  2. විවිධ නාට්‍ය ප්‍රභේද (සුඛාන්ත, දුඃඛාන්ත)
  3. විවිධ නාට්‍ය ලක්ෂණ (ශෛලිගත/ස්වාභාවික/මිශ්‍ර ආදි)
  4. නාට්‍ය කලාවේ විශේෂ ලක්ෂණ

ii. **ප්‍රවේශය**

- උචිත ප්‍රවේශයක් සහිත ව පාඩම ආරම්භ කරන්න.

  *උදා :* * ශෛලිගත හෝ ස්වාභාවික හෝ නාට්‍ය ගීයක් ඉදිරිපත් කිරීම
  
  * නාට්‍යයක කොටසක් (මිනිත්තු 02 - 03) සුදුසු ක්‍රමයක් භාවිත කර නැරඹීමට අවස්ථාව ලබා දීම
  * නාට්‍ය පෙළකින් උපුටා ගත් සංවාද ඛණ්ඩයක් ගුරුවරයා විසින් ඉදිරිපත් කරනු ලැබීම හෝ ශිෂ්‍යයකු/ ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ලවා ඉදිරිපත් කරවීම
  * අනිර්දිෂ්ට නාට්‍ය පෙළකින් උපුටා ගත් සංවාද ඛණ්ඩයක් ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ලවා රංගනයෙන් ඉදිරිපත් කරවීම

iii. **ඉගෙනුම සංවර්ධනය**

- නාට්‍ය යනු කුමක් ද යන්න පිළිබඳ ප්‍රවේශය ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩ නඟන්න.
- නාට්‍ය කලාව පිළිබඳ පහත සඳහන් අංශ යටතේ පුළුල් අවබෝධයක් ලබා දීමට නිර්මාණශීලී ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

01. නාට්‍යය යනු කුමක් ද?
    - * භරතමුනිගේ පෙරදිග විග්‍රහය (නිර්වචනය කෙටියෙන්)
    - * ඇරිස්ටෝටල්ගේ අපරදිග විග්‍රහය (නිර්වචනය කෙටියෙන්)
    - * නාට්‍ය කලාවේ සුවිශේෂතා (සජීව භාවය/සතර අභිනය භාවිතය/සාමූහික භාවය/ප්‍රේක්ෂකයන් සහ රංගභූමි භාවිතය ඇතුළු කරුණු කෙටියෙන්)

02. නාට්‍ය ප්‍රභේද සහ විශේෂ ලක්ෂණ
    - ලෝකධර්මී (ස්වාභාවික) නාට්‍යවල මූලික ලක්ෂණ (*උදා* : කැලණි පාලම)
    - නාට්‍ය ධර්මී (ශෛලිගත) නාට්‍යවල මූලික ලක්ෂණ (*උදා* : සිංහබාහු)
    - මිශ්‍ර/අර්ධ ශෛලිගත නාට්‍යවල ලක්ෂණ (*උදා* : නරිබෑණා)
    - එම නාට්‍ය ප්‍රභේදවලට අදාළ නාටකීය ශ්‍රව්‍ය/දෘශ්‍ය උදාහරණ මඟින් විශේෂ ලක්ෂණ පැහැදිලි කිරීම

03. නාට්‍යය හා නාට්‍ය පෙළ අතර වෙනස හඳුනා ගැනීම
    - නාට්‍ය පෙළෙහි අන්තර්ගතය (සංවාද/ගී/රංග විධාන ආදි වශයෙන්)
    - පෙළ සජීවීකරණය හෙවත් නාට්‍ය නිෂ්පාදනයේ සාමූහික වගකීම (සතර අභිනය භාවිත කරමින් අධ්‍යක්ෂවරයා ඇතුළු පිරිසගේ කාර්යභාරය මඟින් පෙළ රඟ දැක්වීමෙන් නාට්‍යය බිහි වීම)

04. නාට්‍ය පෙළෙහි සාහිත්‍යික අගය හඳුනා ගැනීම (මෙම කොටසට වැඩි අවධානය යොමු කළ යුතු ය.)
    - වෙනත් සාහිත්‍යාංග අතර නාට්‍ය පෙළක ඇති විශේෂත්වය
    - නාට්‍ය පෙළෙහි ආකෘතිය හා ශෛලියේ සම්බන්ධතාව
    - නාට්‍ය පෙළෙහි සාහිත්‍යික ගුණාංග (දැක්ම/නාට්‍යමය භාෂාව/ශෛලිය)

- ඉහත කරුණු පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තව දුරටත් තහවුරු කිරීමට උචිත කේවල/කණ්ඩායම් ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ශිෂ්‍යයන් විසින් එක්රැස් කරන ලද තොරතුරු සහ ගුරු උපදෙස් මෙහි දී ඉවහල් කරගන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්, විෂය අන්තර්ගතයට අනුකූල ව විග්‍රහයට ලක් කරමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- මෙතෙක් උගත් කරුණු පිළිබඳ ව අවසන් සමාලෝචනයක් සිදු කරන්න.
- නාට්‍ය කලාවේ විශේෂතාවන්ට අදාළ වැඩිදුර තොරතුරු ගවේෂණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

iv. **තක්සේරුව සහ ඇගයීම**

- ප්‍රාථමික සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/තේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- නාට්‍ය කලාවේ විශේෂතා පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත් ඔවුන්ගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

*උදා* : 1. නාට්‍යය යනු කුමක් දැයි සඳහන් වන විවිධ නිර්වචන එක්රැස් කිරීම

2. නාට්‍ය ප්‍රභේදවල විශේෂ ලක්ෂණ වගු ගත කිරීම
3. විවිධ නාට්‍ය ප්‍රභේද අයත් නාට්‍යවල නම්, නිර්මාණකරුවන්, නාට්‍ය ඡායාරූප එක්රැස් කර පොත් පිංචක් සකස් කිරීම
4. නාට්‍ය ගීත (පද රචනා) එක්රැස් කිරීම
5. විවිධ ප්‍රභේදවලට අයත් නාට්‍යවල පෙළ එක්රැස් කිරීම
6. විවිධ ශෛලිවලට අදාළ ව පෙළ රචනයට හා නාට්‍ය පෙළ ඇසුරින් නාට්‍ය නිෂ්පාදනයට යොමු කිරීම

මුඛ්‍ය පද **(Keywords)** :

- නාට්‍යය **(Drama)** - යම් කතා පුවතක් රැඟුමක් ලෙසින් ප්‍රේක්ෂකයා ඉදිරියේ ප්‍රදර්ශනය කිරීම. භාරතීය සම්ප්‍රදාය අනුව යම් රැඟුමක් නාට්‍යයක් වන්නේ ආංගික, වාචික, ආහාර්ය සහ සාත්වික යන සිවුවැදැරුම් අභිනය ඇති කල්හි ය. නාට්‍යයක් සම්පූර්ණ වන්නේ ලේඛකයෙකු විසින් රචිත නාට්‍ය පෙළ, නළු නිළි පිරිසක් විසින් ඊට අවශ්‍ය සංගීතඥයන්, වේශ නිරූපකයන්, ආලෝකන ශිල්පීන්, රංග භූමි ශිල්පීන් ආදි පිරිස්වලට අයත් කාර්ය සාධනයෙන් යුක්ත ව ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රඟපා ප්‍රදර්ශනය කරනු ලැබූ කල්හි ය.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 117 පි.

- ශෛලිගත නාට්‍යය
  **(Stylised Drama)** - පුරාණයේ පටන් නාට්‍යය සම්බන්ධයෙන් රංගක්‍රම දෙකක් පැවතිණ. ඒ දෙක අද ව්‍යවහාර කෙරෙනුයේ ශෛලිගත නාට්‍ය සහ යථානුරූපී නාට්‍ය යනුවෙනි. භරතමුනින් විසින් නාට්‍යධර්මී, ලෝකධර්මී යනුවෙන් නම් කරනු ලැබුවේ ද මේ මාර්ග දෙක ය. එහෙත්, පෙර'පර දෙදිග ම මුල දී ප්‍රචලිත වූයේ නාට්‍යධර්මී හෙවත් ශෛලිගත නාට්‍ය බව කිව හැකි ය. ශෛලිගත නාට්‍යයේ ලක්ෂණයක් නම් එය සම්පූර්ණයෙන් ම හෝ බොහෝ දුර හෝ කාව්‍යමය ස්වරූපයක් දැරීම ය.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 203 පි.

- යථානුරූපී/ස්වාභාවික නාට්‍යය
  **(Realistic Drama)** - මෙය භරතමුනින් විසින් හඳුන්වනු ලැබූ ලෝක ධර්මී මාර්ගයට සමාන ය. යථානුරූපී නාට්‍යය ක්‍රමයෙන් විකාශනය වී දියුණු අවස්ථාවට පැමිණියේ පුනරුද යුගයෙහි ඉතාලියේ දී බව කියනු ලැබේ. එහි දී

'ප්‍රොනීසියම්' නමින් හැඳින්වෙන රංග භූමියක ඒ නාට්‍ය රඟ දැක්විණ. ඉක්බිති, බටහිර රටවල ඉබ්සන්, චෙකොව්, ස්ට්‍රයින්බර්ග්, බර්නාඩ් ෂෝ ආදි ලේඛකයන් අතින් යථානුරූපී නාට්‍යය පෝෂණය වූයේ ය. සමකාලීන සමාජ ප්‍රශ්න වස්තු කර ගැනීම යථානුරූපී නාට්‍යයේ විශේෂත්වයකි. එහෙත් මෙම නාට්‍ය ක්‍රමයේ දී ද හැම දෙයක් ම සැබෑ ජීවිතයට අනුකූල විය යුතු යැයි අපේක්ෂා නො කෙරේ. නාට්‍ය රචකයන්ගේ අපේක්ෂාව වන්නේ නාට්‍යෝචිත අවස්ථා මඟින් ප්‍රේක්ෂකයා වෙත ප්‍රබල වින්දනයක් ඇති කරලීම ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 165 පි.

**ගුණාත්මක යෙදවුම්**

- නාට්‍යය පිළිබඳ නිර්වචන
- විවිධ නාට්‍ය පෙළ
- නාට්‍ය ගීත
- විවිධ නාට්‍ය ප්‍රභේදවලට අදාළ නාට්‍යවල අවස්ථා ඇතුළත් ඡායාරූප, නිර්මාණකරුවන්ගේ ඡායාරූප

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නිර්වචන ඉදිරිපත් කරමින් නාට්‍යය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- විවිධ නාට්‍ය ප්‍රභේදවල ලක්ෂණ වගු ගත කර දක්වයි.
- විවිධ නාට්‍ය පෙළ කියැවීමට පෙලඹෙයි.
- නාට්‍ය පිටපත් රචනා කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**


කරුණාතිලක, කේ. ජී. (අනුවාදක) - **මැක්බත්**

නවගත්තේගම, සයිමන් - **සුබ සහ යස**

නිශ්ශංක, පියදාස (අනුවාදක) - **මැටි කරත්තය**

තිලකසිරි, ජයදේව - **සංස්කෘත නාට්‍ය සාහිත්‍යය**

ධර්මකීර්ති, රන්ජිත් - **නාට්‍ය ප්‍රවේශය**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහල ගැමි නාටකය**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **වෙස්මුහුණ ද සැබෑ මුහුණ ද**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **මනමේ**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහබාහු**

සුබසිංහ, සෝමලතා - **විකෘති**

## 4

# පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබාගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල්කර ගනිමින් භාෂා පරිචය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 1.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විකාසනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සිංහල ගද්‍ය සාහිත්‍යයේ වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පුරාතන ගද්‍ය කෘති හා කර්තෘවරුන් නම් කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම** (පාඩමට පිවිසීමට පෙර)
- පුරාතන ගද්‍ය සාහිත්‍යය පිළිබඳ පොත්පත් ඇසුරින් තොරතුරු රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.
- එහි දී පහත සඳහන් මාතෘකා පිළිබඳ අවධානය යොමු කරන්න.
  1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි
  2 එක් එක් අවධියේ ලියවුණු කෘති හා ඒවායෙහි කතුවරු
  3 සිංහල ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ

ii **ප්‍රවේශය** (පන්තිකාමරයේ දී)
- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  *උදා :* * නාලාගිරි දමනය (බුත්සරණ) වැනි පැරණි ගද්‍ය කොටසක් ශ්‍රැතිගෝචර ශෛලියෙන් ඉදිරිපත් කිරීම
  * පුරාතන ගද්‍ය සාහිත්‍යය ආශ්‍රයෙන් ප්‍රතිනිර්මාණය වූ කවියක්/ගීතයක් ඉදිරිපත් කිරීම
  * පුරාතන ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සකස් කරගත් බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ඉදිරිපත් කිරීම

iii **ඉගෙනුම සංවර්ධනය**
- පුරාතන ගද්‍ය සාහිත්‍යය හැදෑරීමට හා රස වින්දනයට ශිෂ්‍යයන් පොලඹවනසුලු සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිංහල සාහිත්‍යය හා සම්බන්ධ විවිධ සාහිත්‍යාංග පිළිබඳ වර්ගීකරණයක් ඉදිරිපත් කරන්න.
  * පුරාතන ගද්‍ය
  * පුරාතන පද්‍ය
  * නූතන ගද්‍ය

* නූතන පද්‍ය
* නාට්‍ය

- පුරාතන සිංහල ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
  * මිහිඳු හිමියන් ගෙන ආ පාලි අට්ඨකථා හෙළටුවා දක්වා විකාසනය වීම (ක්‍රි. පූ. 3 වන සියවසේ සිට), හෙළටුවා පාලියට පරිවර්තනය වීම (ක්‍රි. ව. 5, 6 සියවස්)
  * පාලි අටුවා ඇසුරින් සිංහල ගද්‍ය සාහිත්‍යයක් බිහි වීම (ක්‍රි. ව. 9 - 10 සියවස්)
  * හෙළටුවා නාම ශේෂ වීම
  * පාලියට නඟන ලද අටුවා සඳහා පරිකථා, ගැට පද, සන්න ලිවීම
  * සෙල් ලිපි
  * වංස කථා
- අනුරාධපුර අවධියේ සිට කෝට්ටේ අවධිය දක්වා ලිය වී ඇති, දැනට ශේෂ ව පවත්නා පුරාතන ගද්‍ය ග්‍රන්ථ හා කතුවරුන් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න. (ඇමුණුම 1) (මෙම ග්‍රන්ථ පිළිබඳ කෙටියෙන් හඳුන්වා දීම ප්‍රමාණවත් ය.)
- පුරාතන සිංහල ගද්‍ය සාහිත්‍ය කෘතිවල පොදු ලක්ෂණ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
  * පාලි අටුවා ග්‍රන්ථ මූලාශ්‍රය කොට ගැනීම
  * බුදු සිරිත හා ශ්‍රාවක චරිත පාදක කොට ගැනීම
  * ජාතක කථා විෂය කර ගැනීම
  * පූජනීය වස්තුවල ඉතිහාසය අළලා ලියැවුණු වංස කථා
  * ශ්‍රැතිගෝචර ධර්මදේශනා රීතිය
  * ගැඹුරු ජීවන ප්‍රශ්න විවරණය කිරීම
  * ජන ජීවිතයට සමීප අද්දැකීම් යොදා ගැනීම
  * සමාජයේ යහ පැවැත්මට අදාළ සදුපදේශ ඉදිරිපත් කිරීම
  * මිශ්‍ර භාෂා ලක්ෂණ
- බුදු සමය ඇසුරින් ගොඩ නැගුණු, අපේ පුරාතන ගද්‍ය සාහිත්‍යය, ජන ජීවිතය කෙරෙහි බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම :**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් උපකරණ යොදාගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

  *උදා :* * ඇමුණුම 2හි සඳහන් වගුව සම්පූර්ණ කිරීමට ලබා දීම (එක් අවධියකට අයත් කෘති 3ක තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.)

  * පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳ තොරතුරු ඇතුළත් පුවත් පත් ලිපියක්/බිත්ති පුවත් පත් කලාපයක් සකස් කිරීමට අවස්ථාව ලබා දීම

මුඛ්‍ය පද **(Keywords)** :

- **මගධ අටුවා** - තුන්වන ධර්ම සංගායනාවේ දී සංග්‍රහ කරන ලද ත්‍රිපිටක ග්‍රන්ථ සඳහා මාගධී භාෂාවෙන් සකස් කරන ලද අටුවා ග්‍රන්ථ මගධ අටුවා ලෙස හැඳින්වේ. මිහිඳු හිමියෝ ත්‍රිපිටකය සමඟ එම මගධ අටුවා මෙහි රැගෙන ආහ.

- **හෙළ අටුවා** — මගධ අටුවා මෙරටට ගෙන ඒමෙන් පසු සිංහල ආචාර්යවරු ඒවා සිංහල භාෂාවට පරිවර්තනය කළහ. එසේ පරිවර්තනය කරන ලද මහා අට්ඨකථා, මහා පච්චරිය අට්ඨ කථා, කුරුන්දි අට්ඨකථා යන අටුවා ග්‍රන්ථ හෙළ අටුවා ලෙස හැඳින්වේ.

- **ගැටපද සහ සන්න** — සූත්‍රාදි යම්කිසි බුද්ධ වචනයක අර්ථය අප්‍රකට ව, අවිශද ව නො දත හැකි වී නම් එය ගැට මුසු පදයකි. එබඳු ගැටලු සහිත පදවල අර්ථ පැහැදිලි කිරීම හා විවරණ සැපයීම සඳහා ලියන ලද ග්‍රන්ථ ගැටපද (ග්‍රන්ථි පද/ගණ්ඨි පද) ලෙස හැඳින්වේ. *උදා :* ධම්පියා අටුවා ගැටපදය
- **පරිකථා** — මූල ග්‍රන්ථයක දුරවබෝධ පද තෝරා ගෙන, එම පද සඳහා විස්තර විවරණ සපයමින් ලියූ ග්‍රන්ථ පරිකථා නම් වේ. උදා : ධර්මප්‍රදීපිකා නම් වූ මහා බෝධි වංස පරිකථාව
- **වංස කථා** - වංස යන පදයෙන් ඉතිහාසය, පරම්පරාව, අනුපිළිවෙළ කතාව යන අරුත් දෙයි. බුද්ධ වංසය, අනාගත වංසය, දීපවංසය, මහා වංසය, බෝධි වංසය, දාඨා වංසය, එළු අත්තනගලු වංසය ආදි ග්‍රන්ථ උදාහරණ යි.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1 හා 2හි සඳහන් වගු
- ප්‍රවේශය සඳහා යොදා ගන්නා බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ
- පුරාතන ගද්‍ය කෘතියක ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවන ලද කොටසක් ඇතුළත් හඬ පටයක්

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුවේ යෙදෙන්න.

- පුරාතන ගද්‍ය සාහිත්‍යය ඒ ඒ අවධීන් අනුව වර්ගීකරණය කරයි.
- එක් එක් අවධියේ ලියැවුණු ගද්‍ය ග්‍රන්ථ හා ඒවායේ කතුවරුන් වගු ගත කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණවල ඓතිහාසික, සංස්කෘතික, සමාජීය හා සාහිත්‍යික වටිනාකම් විස්තර කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**


අමරවංශ හිමි, කොත්මලේ - **සිංහල සාහිත්‍ය ලතා**

කුලසූරිය, ආනන්ද - **සිංහල සාහිත්‍යය 1, 2, 3, 4**

වික්‍රමසිංහ, මාර්ටින් - **සිංහල සාහිත්‍යයේ නැගීම**

ඇමුණුම 1 **සිංහල ගද්‍ය සාහිත්‍යය**

| සාහිත්‍ය අවධිය | කෘති හා කර්තෘවරු | අවධියේ සාහිත්‍ය ලක්ෂණ |
|---|---|---|
| අනුරාධපුර අවධිය | • සෙල්ලිපි<br>• ධම්පියා අටුවා ගැටපදය - අබාසලමෙවන් කසුබ් මහරජ<br>• සිබවළඳ හා සිබවළඳ විනිස - කර්තෘ අඥාත යි | • බෞද්ධාගමික සාහිත්‍යයක් වීම<br>• සිංහල ප්‍රාකෘත භාෂා අන්තර්ගත වීම<br>• ලෞකික විෂයයන් පිළිබඳ ලියැවුණු පොතපත (සීගිරි ගී හැරුණු කොට) හමු නොවීම |
| පොලොන්නරු අවධිය | • ධර්මප්‍රදීපිකාව (මහා බෝධි වංස පරිකථාව) - ගුරුළුගෝමී<br>• අමාවතුර - ගුරුළුගෝමී<br>• බුත්සරණ - විද්‍යා චක්‍රවර්ති<br>• දහම් සරණ - කර්තෘ අඥාත යි<br>• සඟ සරණ - කර්තෘ අඥාත යි | • බෞද්ධාගමික සාහිත්‍යයක් වීම<br>• සංස්කෘත හා පාලි තත්සම පද බහුල භාෂා රීතියෙන් ග්‍රන්ථ රචනා වීම<br>• බුද්ධ චරිතය හා ශ්‍රාවක චරිත වස්තු විෂය වීම |
| දඹදෙණි අවධිය | • සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි<br>• පූජාවලිය - මයූරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර හිමි<br>• විශුද්ධිමාර්ග මහා සන්නය - දෙවන පැරකුම්බා රජතුමා<br>• පියුම්මල් නිඝණ්ඩුව - කර්තෘ අඥාත යි | • ලෞකික විෂයයන් පිළිබඳව ද පොත පත ලියවීම<br>• බණකතා පොත් බහුල වීම හා ධර්ම දේශනා ශෛලියෙන් පොත පත ලියවීම<br>• සංස්කෘත හා පාලි භාෂා මිශ්‍ර සිංහල භාෂා ශෛලියක් ඇති වීම |
| කුරුණෑගල් අවධිය | • සිංහල ථූප වංසය - සකල විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත<br>• දඹදෙණි අස්න - කර්තෘ අඥාත යි<br>• උම්මග්ග ජාතකය - කර්තෘ අඥාත යි<br>• සිංහල ජාතක පොත - බහු කර්තෘක ග්‍රන්ථයකි<br>• දළදා සිරිත - දෙව්රද දම්පසඟිනාවෝ<br>• සිංහල බෝධි වංසය - විල්ගම්මුල මහා ස්ථවිර<br>• අනාගත වංසය - විල්ගම්මුල මහා ස්ථවිර | • පාලි පොත්වල පරිවර්තන කෘති බහුල වීම<br>• වෘත්තගන්ධි ශෛලියෙන් පොත් ලියවීම<br>• මිශ්‍ර සිංහල භාෂා ලක්ෂණ අන්තර්ගත වීම |

| සාහිත්‍ය අවධිය | කෘති හා කර්තෘවරු | අවධියේ සාහිත්‍ය ලක්ෂණ |
|---|---|---|
| ගම්පොළ අවධිය | • එළු අත්තනගලු වංසය - කර්තෘ අඥාත යි<br>• නිකාය සංග්‍රහය - දෙවන ධර්මකීර්ති මාහිමි<br>• බාලාවතාර සන්නය - දෙවන ධර්මකීර්ති මාහිමි<br>• සද්ධර්මාලංකාරය - දෙවන ධර්මකීර්ති මාහිමි | • පාලි සංස්කෘත නොදත් හුදී ජනයා සඳහා පොත් ලියවීම<br>• ධර්ම දේශනා සඳහා පොත් ලියවීම<br>• ගද්‍ය සාහිත්‍යයේ පරිහානි ලක්ෂණ පෙන්නුම් කිරීම |
| කෝට්ටේ අවධිය | • කුවේණි අස්න - උතුරුමුල මහ තෙරිඳු<br>• සද්ධර්ම රත්නාකරය - විමලකීර්ති ධම්මදින්න හිමි<br>• පඤ්චිකා ප්‍රදීපය - තොටගමුවේ රාහුල මාහිමි<br>• එළු අත්තනගලු වංසය - වීදාගම හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක් | • ගද්‍ය සාහිත්‍ය කෘති අඩු වීම<br>• පරිවර්තන කෘති බහුල වීම |
| සීතාවක අවධිය | • ගද්‍ය කෘති කිසිවක් හමු නො වේ. | • ගද්‍ය කාව්‍ය කෘති බිහි නො වීම |
| මහනුවර අවධිය | • රාජාවලිය - කර්තෘ අඥාත යි<br>• සාරාර්ථ සංග්‍රහය - වැලිවිටියේ සරණංකර සංඝරාජ මාහිමි<br>• සාරාර්ථ දීපනී - ,, ,,<br>• දළදා පූජාවලිය - කර්තෘ අඥාත යි<br>• සිංහල දළදා වංසය - කර්තෘ අඥාත යි | • බෞද්ධාගමික චරිත කතා මෙන් ම ධර්ම ග්‍රන්ථ ද ලියවීම<br>• පරිවර්තන කෘති බිහිවීම<br>• රාෂ්ට්‍ර පාලන අර්බුද හා ශාසනික අර්බුද නිසා සාහිත්‍යය පිරිහී යාම<br>• සිංහල සාහිත්‍යයට ද්‍රවිඩ ආභාසය ලැබීම |

* *එක් අවධියට අයත් ගද්‍ය කෘති දෙකක් හෝ තුනක් පිළිබඳ දළ අවබෝධයක් ශිෂ්‍යයාට ලබා දීම ප්‍රමාණවත් ය.*

ඇමුණුම 2 පැවරුම - එක් යුගයකට අයත් කෘති තුනක තොරතුරු ඇතුළත් කරමින් වගුව සම්පූර්ණ කරන්න.

**සිංහල ගද්‍ය සාහිත්‍යය**

| | **අවධිය** | **කෘති** | **කර්තෘ** | **අවධියේ සාහිත්‍ය ලක්ෂණ** |
|---|---|---|---|---|
| 01. | අනුරාධපුර අවධිය | | | |
| 02. | පොලොන්නරු අවධිය | | | |
| 03. | දඹදෙණි අවධිය | | | |
| 04. | කුරුණෑගල් අවධිය | | | |
| 05. | ගම්පොළ අවධිය | | | |
| 06. | කෝට්ටේ අවධිය | | | |
| 07. | මහනුවර අවධිය | | | |

# 5

# නවකතාව නම් සාහිත්‍යාංගයේ විශේෂතා

**නිපුණතාව** : 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 නවකතාව නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකථාංග විස්තර කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- නිර්වචන ඇසුරින් නවකතාව යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ විස්තර කරයි.
- පරිශීලනය කළ නවකතා ඇසුරින් නවකථාංග සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.
- සාහිත්‍යමය වටිනාකමක් සහිත නවකතා තෝරා ගෙන කියවීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- සිංහල නවකතාව පිළිබඳ ලියැවුණු පොතපත ඇසුරින් නිපුණතාවට අදාළ තොරතුරු එක්රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.
- කලාත්මක නවකතා කිහිපයක් නම් කර ඒවා කියවා ගෙන ඒමට ශිෂ්‍යයන් යොමු කරන්න.

ii. **ප්‍රවේශය**
- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

  *උදා :* * ශිෂ්‍යයන් කියවා ඇති නවකතා ඇසුරින් නවකතාව පිළිබඳ සාකච්ඡාවක නිරත වීම
  * නවකතාවක කොටසක් කියවීම
  * නවකතාව පිළිබඳ කෙටි හැඳින්වීමක්, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය/ පිටු පෙරළනය ඇසුරෙන් ඉදිරිපත් කිරීම

ii. **ඉගෙනුම සංවර්ධනය**
- නවකතාව යනු කුමක් දැයි පැහැදිලි කිරීම සඳහා ශිෂ්‍යයන් සමග බුද්ධි කලම්බන සාකච්ඡාවක් පවත්වන්න. පහත සඳහන් කරුණු එහි දී පාදක කර ගන්න.
  * ගද්‍යයෙන් ලියා ඇති බව
  * කල්පිත කතාවක් වීම
  * ජීවිත විවරණය කිරීම
  * කලාත්මක බව
  * දීර්ඝ කාල පරාසයක් පුරා ගලා යෑම
- නවකතාව යන්නට ඉදිරිපත් කර ඇති නිර්වචන පිළිබඳ ව සාකච්ඡාවක නිරත වන්න. (ඒ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.)
- නවකතා කිහිපයක් උදාහරණ ලෙස ගෙන මේ පිළිබඳ සාකච්ඡා කරන්න. ශිෂ්‍යයන් කියවා ඇති දේශීය/විදේශීය නවකතා මේ සඳහා යොදා ගත හැකි ය.
- නවකතාව පිළිබඳ නිර්වචන එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

- කලාත්මක කතාව, ප්‍රබන්ධය (Fiction) සහ නවකතාව (Novel) යන සාහිත්‍යාංග පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න. ඒ සඳහා මුඛ්‍ය පද යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරු ඉවහල් කර ගන්න.
- පහත සඳහන් කරුණු ඔස්සේ නවකතා ලක්ෂණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
  * තේමාව
  * කථාව හා කථා වින්‍යාසය
  * දෘෂ්ටිකෝණය
  * චරිත විග්‍රහය/නිරූපණය
  * චෛතසික නිරූපණය
  * සිද්ධි හා අවස්ථා නිරූපණය
  * පසුබිම් නිරූපණය
  * සංකේත නිරූපණය
  * භාෂා ලක්ෂණ
  * ජීවන දෘෂ්ටිය
- පහත සඳහන් නවකතා කෙරෙහි අවධානය යොමු කරන්න.
  * ගම්පෙරළිය - මාර්ටින් වික්‍රමසිංහ
  * චරිත තුනක් - කේ. ජයතිලක
  * මහල්ලා සහ මුහුද - අර්නස්ට් හෙමිංවේ (පරිවර්තනය සිරිල් සී. පෙරේරා)
- එම නවකතාවලින් උදාහරණ ඉදිරිපත් කරමින් මේ පිළිබඳ සාකච්ඡා කරන්න.
- විවිධ නවකතා කියවා, නවකතා ලක්ෂණ තවදුරටත් හඳුනා ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න.

iv. **තක්සේරුව හා ඇගයීම :**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදාගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර පහත සඳහන් මාතෘකා යටතේ සටහන් සකස් කිරීමට යොමු කරන්න.
  * නවකතාව යනු කුමක් ද?
  * නවකතාවක ප්‍රධාන ලක්ෂණ
  * නවකතාවේ කලාත්මක ලක්ෂණ
  * විශිෂ්ට නවකතාකරුවන් පිළිබඳ විස්තර

**මුඛ්‍ය පද (Keywords) :**

- **ප්‍රබන්ධකථාව/කල්පිත කථාව (Fiction)**

ප්‍රකර්ෂයෙන් බන්ධනය කෙරුණු කථාව යන අර්ථ යි. ''සද්ධර්මරත්නාවලී නම් ප්‍රබන්ධයක් කරම්හ. පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි '' යනුවෙන් සද්ධර්මරත්නාවලී ආදි සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථ සඳහා පෙර දවස 'ප්‍රබන්ධ' යන පදය යෙදිණ. සම්භාව්‍ය ග්‍රීක සහ රෝම සාහිත්‍යයන්හි ද ප්‍රබන්ධකථා දක්නට ලැබේ.

වර්තමාන සාහිත්‍යයෙහි ප්‍රබන්ධ/ප්‍රබන්ධකථා යන පද යෙදෙනුයේ 'අමුතුවෙන් ගොතනු ලැබූ හෙවත් ප්‍රබන්ධ කරනු ලැබූ කථාව' යන අර්ථයෙනි. නවකතාව ද ප්‍රබන්ධකථාවක් වන අතර ප්‍රබන්ධකථාව යන්න යෙදෙනුයේ වඩාත් පුළුල් ක්ෂේත්‍රයක් ඊට අන්තර්ගත වන පරිදි ය. උදාහරණ වශයෙන් 'Pilgrim's Progress' යන කෘතිය ප්‍රබන්ධකථා ගණයට අයත් වන අතර එය නවකතාවක් ලෙස නොසැලකේ.

එසේ ම, අයිසෙක් ද සිල්වාගේ 'වාසනාවන්ත පවුල සහ කාලකණ්ණි පවුල' ප්‍රබන්ධකථා ගණයට අයත් වන අතර එය නවකතාවක් ලෙස නොසැලකේ. ගම්පෙරළිය ප්‍රබන්ධකථාවක් මෙන් ම නවකතාවක් ද වෙයි. ප්‍රබන්ධකථාවේ දී කල්පිත කථාවට වැඩි අවධානයක් ලැබේ. ප්‍රබන්ධකථාවේ දී කථාන්තරයට මුල් තැන ලැබෙන අතර නවකතාවේ දී චරිත නිරූපණය ඉස්මතු වන්නේ ය. ප්‍රබන්ධකථා ගණයට ම අයත් වන නවකතාවෙහි දී කථාවින්‍යාසය, චරිත නිරූපණය ආදි අංග කෙරෙහි මෙන් ම ජීවිත විවරණය කෙරෙහි ද විශේෂාවධාන දැක්වේ.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 143-144 පි.

### නවකතාව (Novel)

මුල දී Giovanni Boccaccio නම් ලේඛකයාගේ (1313-75) Decameron (ඩිකැමරන්) නම් කෘතියේ එන කල්පිත කථාන්තර ආශ්‍රයෙන් ප්‍රබන්ධ කථාවත්, ඉක්බිති නවකතාවත් සකස් වූ බව කියනු ලැබේ. ''නවකතාව වනාහි ජීවිතය හා ආශ්‍රිත මිනිස් ස්වභාවය නිරූපණය කෙරෙන සේ, යම් කාල පරිච්ඡේදයක් තුළ මානව වර්ගයාත් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයත් විවරණය කෙරෙන කල්පිත ගද්‍යමය ආඛ්‍යානය''යි යනුවෙන් නිර්වචන කෙරේ. ''කිසියම් වෙනස් වීමකට තුඩු දෙන චරිත සමූහයක අන්‍යෝන්‍ය සම්බන්ධය ප්‍රකාශ වන්නා වූ ද එක වරෙක දී දිගට ම කියවා අවසන් කළ නොහැකි තරම් ප්‍රමාණයකින් යුක්ත වූ ද දීර්ඝ, එහෙත් ඒකාබද්ධතාවකින් යුක්ත වූ ද කථාව'' ලෙසින් මැල්කම් කව්ලි තවත් නිර්වචනයක් දෙයි. (*Coroline Gorden, How to Read a Novel. p. 17 (Quote*). එහෙත් නවකතාව යන සාහිත්‍යාංගය සඳහා පූර්ණ නිර්වචනයක් සැපයීම අපහසු බව විචාරක මතය යි. නවකතාව ද ප්‍රබන්ධකථා ගණයට ම අයත් වේ. එහෙත් හැම ප්‍රබන්ධ කථාවක් ම නවකතාවක් නො වේ. ප්‍රබන්ධ කතාවට අදාළ නොවන, එහෙත් නවකතාවේ විශේෂත්වය ලෙසින් මිනිස් ස්වභාවය නිරූපණය කිරීම යන කරුණ වැදගත් වෙයි. මේවා සාක්ෂාත් කරගැනීම සඳහා මනා සේ සකස් කරගනු ලැබූ කථාවින්‍යාසයක් තිබීම මෙන් ම චරිත එකක් හෝ කීපයක් මැනවින් නිරූපණය කිරීම ද අවශ්‍ය නවකතා නම් සාහිත්‍යාංගයේ තවත් විශේෂත්වයක් නම් චරිත නිරූපණය යි. චරිත නිරූපණයෙන් තොර නවකතාවක් ඇති විය හැකි නොවන බව කියනු ලැබේ.

අටළොස්වන සියවස්හි පමණ නවකතා සාහිත්‍යාංගය පහළ වීමට පෙරාතු ව පැවති ගද්‍ය ආඛ්‍යාන, කාව්‍ය, නාට්‍ය ආදි සාහිත්‍යාංගයන්හි ද ජීවිත විවරණයත් චරිත නිරූපණයත් දැකිය හැකි ය. එහෙත් ඒ කෘතීන්හි සාමාන්‍යයෙන් දක්නට ලැබෙනුයේ මිනිසා පිළිබඳ පෞද්ගලිකත්වය නොව ජීවිතය පිළිබඳ සාමාන්‍ය හෙවත් පොදු ධර්මතා වේ. නවකතා සාහිත්‍යයේ විශේෂත්වය නම් මිනිසා නිශ්චිත පසුබිමක් මත, නිශ්චිත කාලපරිච්ඡේදයක් සහිත, නිශ්චිත ඉඩහසරක් තුළ පිහිටුවා ඔහුගේ ප්‍රත්‍යෙක තතු විවරණය කිරීම ය. නවකතාවේ සංග්‍රහ වන ගැටලු සහ චරිත ඇසුරෙන් විවරණය වනුයේ මිනිසා පිළිබඳ පොදු නොහොත් සාධාරණ තතු පමණක් නො වේ. එක් එක් මිනිසා පිළිබඳ සංකීර්ණ ගැටලු ද නවකතාවෙන් විවරණය කෙරේ. නවකතාවේ දී පුද්ගල චරිත විශ්ලේෂණය කෙරෙහි වැඩි අවධානයක් දක්වනුයේ එබැවිනි. කලින් පැවති ප්‍රබන්ධ කථාවෙන් නවකතාව වෙන් කෙරෙනුයේ මෙහි ඇති යථාර්ථවත් ලක්ෂණ මුල් කරගෙන බව කියනු ලැබේ.

නවකතාව පිළිබඳ නිශ්චිත නිර්වචනයක් නොමැත්තා සේ ම පළමු ව ලියැවුණු නවකතාව කුමක් ද යන්න පිළිබඳව ද විවිධ අදහස් පළ කෙරේ. එකොළොස්වන සියවස්හි ජපානයේ විසූ මුරසකි ආර්යාව ලියූ ගෙන්ජි කථාන්තරය (ගෙන්ජි මොනොගතරි, *The Tale of Genji*) ප්‍රථම නවකතාව ලෙස අයෙකු සලකන අතර එංගලන්තයේ සැමුවෙල් රිචඩ්සන් ලියූ පමෙලා (*Pemela, 1740*) පළමු නවකතාව බව තවත් අය පවසති.

නවකතා සාහිත්‍යාංගයට ලැබී ඇති නාමයට අනුකූල ව ම එහි විශේෂත්වය වන්නේ අන්තර්ගත මෙන් ම නිර්මාණ ලක්ෂණ අතින් ද නවතාවක් හජනය කිරීම ය. මේ හේතුව නිසා ම එහි ස්වභාවය ද කලින් කල වෙනස් වෙමින් පවතී. කෙසේ වෙතත් නවකතාව ගැන කෙරෙන සාකච්ඡාවක දී අන්තර්ගතය, කථාවින්‍යාසය, චරිත නිරූපණය, දෘෂ්ටි කෝණය යන කරුණු කෙරෙහි අවධානය දැක්වුව මනා වෙයි.

නවකතාව යනු සිංහලට අලුත් වචනයකි. ඒ. සයිමන් ද සිල්වාගේ විමලා නම් කෘතිය සම්බන්ධයෙන් 1892.03.22 දින සරසවි සඳරැස සංග්‍රහයේ පළ කෙරුණ මතු දැක්වෙන ඛණ්ඩයෙන් ද ඒ බව ගම්‍යමාන වේ.

''නොවල්ස් නම් පොත් කිරීම සිංහලයන්ට තව ම පරිචිත නුවූ යුරෝපීය ජාතිකයන්ගේ කර්තව්‍යයකි. සිංහලෙන් නොවල්ස් ලීම ඇල්බට් මහත්මයා විසින් බෝ කරන්නට යන අභිනව යත්නයකි.''

සයිමන් ද සිල්වා ආදි මුල් සිංහල ලේඛකයන් ඉංග්‍රීසි Novel යන්න බලාගෙන යොදා ඇත්තේ 'අමුතු කථා' යන නාමය යි. පියදාස සිරිසේන තමාගේ මුල් කෘති හැඳින්වීම සඳහා යෙදුවේ 'ප්‍රබන්ධ කථා' යන නම ය. නවකතාව යන අර්ථයෙහි 'නව ප්‍රබන්ධ' යන්න ද භාවිත කෙරිණ.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 114-115 පිටු.

### දෘෂ්ටි කෝණය (Point of View)

දෘෂ්ටි කෝණය යන්නෙන් අදහස් කෙරෙනුයේ පාඨකයා වෙත කථාවක් ඉදිරිපත් කිරීමේ දී ලේඛකයා රැඳී සිටින ස්ථානය යි; නැතහොත් කථාව සහ ලේඛකයා අතර පවත්නා සම්බන්ධය යි. ස්වකීය අභිමතය ඉෂ්ට කර ගැනීම සඳහා කථාව කවර දෘෂ්ටි කෝණයකින් නොහොත් කවරෙකුගේ මෙහෙයවීම යටතේ ඉදිරිපත් කළ මනා දැයි තීරණය කරනුයේ ලේඛකයා ය. නවකතා, කෙටිකතා යන සාහිත්‍යාංග සඳහා මෙය විශේෂයෙන් අදාළ වන අතර කවර කථාවක දී වුව මෙය වැදගත් වෙයි.

''නවප්‍රබන්ධ නිර්මාණයෙහි ලා අතිශය දුෂ්කර ගැටලුව රැඳී පවත්නේ දෘෂ්ටි කෝණය මත ය. එනම්, කථකයා (ලේඛකයා) සහ කථාව අතර පවත්නා සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය යි,'' යනු පර්සි ලුබොක්ගේ මතය යි. (*The Craft of Fiction* p.251)

පැරණි කථාවල දී මෙන් ම නවකතාවල දී සහ කෙටිකතාවල දී ද බොහෝ විට දක්නට ලැබෙනුයේ ලේඛකයා කථකයාගේ ස්ථානය ගෙන කථාව ඉදිරිපත් කිරීම ය. මේ මාර්ගය ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් කථාව ඉදිරිපත් කිරීම යනුවෙන් හැඳින්වේ. ''එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක්...'' යනාදි වශයෙන් කථාව පැවසෙනුයේ කථකයාගේ තත්වයට පැමිණි ලේඛකයා විසින් ම ය. මේ ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය අදත් බොහෝ ලේඛකයන් විසින් භාවිත කරනු ලබන අතර ඊට අමතර ව ලේඛකයා කථාවෙන් බැහැර වීමේ අවශ්‍යතාව ද ඉස්මතු වී ඇත්තේ ය.

මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කරන කථකයා විවිධ කෝණ ඔස්සේ කථාව ඉදිරිපත් කරයි. කථාව ඉදිරිපත් කිරීමේ දී ඒ කථාව පිළිබඳ ව, චරිත පිළිබඳ ව සියලු දෑ දන්නේ කථකයා වන හෙයින් ඔහු සර්වවේදී තත්වයට පත් වෙයි. එසේ ක්‍රියා කරන අතර ම ශිල්පීය වශයෙන් සලකන කල ඔහුට කථාව විවිධාකාරයෙන් ඉදිරිපත් කළ හැකි බව පැහැදිලි වෙයි. ඒ අනුව ප්‍රථම පුරුෂ සර්වවේදී දෘෂ්ටි කෝණයේ ප්‍රභේද කීපයක් ඇති බව පෙනී යනු ඇත. ඒ මෙසේ ය.

(1) ප්‍රථම පුරුෂ සර්වවේදී - බාහිර (Omniscient Personal)

මෙහි දී කථාව ඉදිරිපත් කෙරෙනුයේ පිටතින් සිට බලන්නෙකුගේ දෘෂ්ටියට හසු වන ප්‍රමාණයට ය. මාර්ටින් වික්‍රමසිංහගේ 'මඟුල් ගෙදර' නම් කෙටිකතාව මේ දෘෂ්ටි කෝණයෙන් රචිත කථාවකට උදාහරණ යි.

(2) ප්‍රථම පුරුෂ සර්වවේදී කේන්ද්‍රගත (Omniscient Central Intelligence)

මෙහි දී කථකයා කථාව හා චරිත පිළිබඳ සියලු දෑ දන්නා අතර සර්වවේදී බාහිර දෘෂ්ටි කෝණයෙන් නොකරන දෙයක් කිරීමට ද ඉඩ සලසා ගනී. ඒ අනුව කථාවේ එන එක් චරිතයක් පමණක් තුළට පිවිස ඒ චරිතයේ අභ්‍යන්තර - බාහිර සියලු තතු විවරණය කරයි. මෙහි දී ප්‍රධාන චරිතය කේන්ද්‍රගත කර ගෙන සම්පූර්ණයෙන් විග්‍රහ කරන අතර ඒ තුළින් අනෙක් චරිත දෙස බැලීමට කථකයාට ඉඩ ලැබේ. ගුණදාස අමරසේකරගේ 'ධර්මසේන' නම් කෙටිකතාව උදාහරණයකි.

(3) ප්‍රථම පුරුෂ සර්වවේදී - පූර්ණ (Omniscient Impersonal)

මෙහි දී සියලු චරිත පිළිබඳ සියලු දෑ දන්නා අයෙකු ලෙස කථකයා කථාව ඉදිරිපත් කරයි. ගම්පෙරළිය උදාහරණයකි.

කථාවක් ඉදිරිපත් කිරීමේ අනෙක් මාර්ගය නම් උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය යි. මෙහි විශේෂත්වය නම් කථාව ඉදිරිපත් කෙරෙනුයේ කථාවට ම සහභාගි වන හෙවත් කථාව තුළ ම සිටිනා චරිතයක් මඟින් වීම ය. මේ අනුව, 'මා' ශබ්දකාරක එක් චරිතයකට කථාව ඉදිරිපත් කළ හැකි වෙයි. ප්‍රථම පුරුෂ සර්වවේදී දෘෂ්ටි කෝණයකින් කථාව ඉදිරිපත් කරන කල්හි මෙන් නො ව මෙහි දී පාඨකයා වෙත වඩාත් සමීප වීමටත් විශ්වසනීයත්වය ඇති වීමටත් ඉඩ සැලසේ. උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයේ ප්‍රධානතම සීමාව වන්නේ 'මා' ශබ්ද කාරකයාට සර්වවේදී තත්වයක් ආරෝපණය කරගත නොහැකි වීම ය. මෙම දෘෂ්ටි කෝණයේ ද ප්‍රභේද කීපයක් පවතී. ඒ මෙසේ යඃ

(1) මම - ප්‍රධාන චරිතය කථාව ඉදිරිපත් කිරීම

(2) මම - අප්‍රධාන චරිතයක් කථාව ඉදිරිපත් කිරීම

(3) මම - චරිත කීපයක් කථාව ඉදිරිපත් කිරීම
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005,108-110 පිටු

**ගුණාත්මක යෙදවුම්**

- පැවරුම් පත්‍රිකාව
- ඇමුණුම 1

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නවකතාවක ප්‍රධාන ලක්ෂණ පහක් උදාහරණ සහිත ව වගු ගත කරයි.
- නවකතාව යනු කුමක් දැයි නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරයි.
- නවකතාවක කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- සාහිත්‍යික වටිනාකමක් ඇති කලාත්මක නවකතා කියැවීමට පෙලඹෙයි.
- නූතන නවකතාවල ඇති සුවිශේෂතා හඳුනා ගෙන විස්තර කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| ජයතිලක, කේ. | - | **නවකතාව හා සමාජය** |
| දිසානායක, විමල් | - | **ගිරිකුල සහ සඳමඬල** |
| වික්‍රමසූරිය, සරත්චන්ද්‍ර | - | **නවකතා විවරණය** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - | **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය** |
| සුරවීර, ඒ. වී. | - | **නවකතා නිර්මාණය හා අවබෝධය** |
| සුරවීර, ඒ. වී. | - | **නිර්මාණ පසුබිම** |
| සේනානායක, ජී. බී. | - | **නවකතා කලාව** |

ඇමුණුම 1 **නවකතාව පිළිබඳ නිර්වචන**

- ''කලාත්මක ව නිර්මාණය කරන ලද දීර්ඝ ගද්‍ය ප්‍රබන්ධයක්, යථාර්ථ නිරූපණයක්.''

  \- හෙන්රි ජේම්ස් -

- ''මානව ජීවිතය විවරණය කරන ගද්‍යමය කල්පිත ආඛ්‍යානයක්''

  \- අර්නස්ට් බේකර් -

- ''නවකතාව යනු ජීවිතය හා ආශ්‍රිත මිනිස් ස්වභාවය නිරූපණය කරන සේ යම් කාල පරිච්ඡේදයක් තුළ මානව වර්ගයාත්, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයත් විවරණය කෙරෙන කල්පිත ගද්‍යමය ආඛ්‍යානයකි.''

  \- බොකැෂියෝ -

# 6
# කෙටිකතාව හා කෙටිකතා මූලිකාංග හඳුනා ගැනීම

**නිපුණතාව** : 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 කෙටිකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා කෙටිකතා මූලිකාංග පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- කෙටිකතාව යනු කුමක් දැයි හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පරිශීලනය කළ කෙටිකතා ඇසුරින් කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.
- කෙටිකතා විචාර මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව දේශීය හා විදේශීය කෙටිකතා කියවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- පරිශීලනය සඳහා දක්වා ඇති පොතපත කියවා කෙටිකතාව හා කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවශ්‍ය කරුණු එක්රැස් කර ගන්න.
- කෙටිකතාව පිළිබඳ ව ඉදිරිපත් වී ඇති නිර්වචන කාඩ්පත්වල ලියා සකස් කර ගන්න.
- කෙටිකතා ලක්ෂණ පිළිබඳ උදාහරණ සහිත ව සාරාංශයක් පිළියෙල කර ගන්න.

ii. **ප්‍රවේශය :**
- පාඩම සඳහා පහත සඳහන් ආකාරයේ ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා:* * කලා කෘති අතර කෙටිකතාවට හිමි තැන පැහැදිලි කරමින් ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කිරීම
  * කතන්දරයක සහ කෙටිකතාවක වෙනස උදාහරණ දක්වමින් කෙටියෙන් සාකච්ඡා කිරීම
  * ශිෂ්‍යයන් කියවූ කෙටිකතා පිළිබඳ විමසීම

iii. **ඉගෙනුම් සංවර්ධනය :**
- ඇමුණුම 1හි සඳහන් නිර්වචන සහ වෙනත් එවැනි නිර්වචන ඇතුළත් කාඩ්පත් ශිෂ්‍ය කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම නිර්වචන ඇසුරෙන් කෙටිකතාව යනු කුමක් දැයි හඳුනා ගැනීම සඳහා සංවාදයක් ගොඩ නගන්න.
- ශිෂ්‍යයන් විසින් කියවන ලද කෙටිකතා (පෙළපොත්වල හෝ වෙනත් පොතපතෙහි හෝ ඇතුළත්) කිහිපයක් ඇසුරින් කෙටිකතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- එහි දී පහත සඳහන් කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.
  * අද්දැකීම/අනුභූතිය
  * කතා ප්‍රවෘත්තිය
  * ඒකීය ධාරණාව
  * කතා වින්‍යාසය

* චරිතාංග නිරූපණය
* චෛතසික නිරූපණය
* පසුබිම් නිරූපණය/පරිසර වර්ණනා
* යථාර්ථ නිරූපණය
* සංකේත භාවිතය
* දෘෂ්ටිකෝණය
* ජීවන දෘෂ්ටිය
* නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
* ඒකාබද්ධතාව

- කෙටිකතාවක මේ ලක්ෂණ අඩු වැඩි වශයෙන් අන්තර්ගත වී ඇති ආකාරය කෙටිකතා ඇසුරෙන් පැහැදිලි කරන්න.
- කෙටිකතා විචාරයේ දී ඉහත සඳහන් කෙටිකතා ලක්ෂණ පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් වන බව පැහැදිලි කර දෙන්න.
- කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම සඳහා දේශීය, විදේශීය විවිධ කෙටිකතා කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදාගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- කෙටිකතාව යනු කුමක් දැයි පැහැදිලි කර කෙටිකතා ලක්ෂණ පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහා පැවරුම් ලබා දී ඇගයීමක යෙදෙන්න.

උදා:

* කෙටිකතාව යනු කුමක් ද යන්නට නිර්වචන ලැයිස්තු ගත කිරීමට යොමු කිරීම
* කෙටිකතාවක් ආශ්‍රයෙන් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් පැවරුමක් ලබා දීම
* කෙටිකතාව යනු කුමක් දැයි විස්තර කරමින් පුවත්පත් ලිපියක් සකස් කිරීමට අවස්ථාව ලබා දීම

**මුඛ්‍ය පද (Keywords) :**

**අනුභූතිය/වින්දනය (Experience)**

අනුභවය, භුක්තිවිඳීම යන අර්ථ යි. සාහිත්‍යකලා සම්බන්ධයෙන් විඳීම, අද්දැකීම යන අර්ථයන්හි යෙදේ. වින්දනය යනු අනුභූතිය යන්නට පර්යාය පදයකි.

Experience, Feeling යන ඉංග්‍රීසි වදන් දෙකෙහි සියුම් වෙනසක් ඇතත් එය පැහැදිලි කිරීම පහසු නො වේ. වේදිතය හෙවත් හැඟීම (Feeling) ඇති වන්නේ අනුභූතිය ආශ්‍රයෙන් විය හැකි ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 17 පි.

**කථාව (Story)**

කථාන්තරය, කතන්දරය, කථා වස්තුව, කථා ප්‍රවෘත්තිය යනාදි නම් අද භාවිත කෙරේ. කථාන්තර කීම පුරාණයේ සිට පැවතෙන්නකි. අන්තර්ගතය අනුව ඒවා විවිධ වේ. මිථ්‍යා කථා, දේව කථා, රාජ කථා, චෝර කථා, අද්භූත කථා, චරිත කථා, ඉතිහාස කථා ආදි වශයෙනි. මේ හැම එකක් ම කථාවක් වනුයේ සිද්ධි මාලාවක් එකට ගළපා ඇති බැවිනි. ඊ. එම්. ෆෝස්ටර් කථාව හැඳින්වූයේ ''කාලානුකූල ව එකට ගළපනු ලැබූ සිද්ධි ආඛ්‍යානයක්'' කියා ය. (*Aspects of the Novel,* p.27) නවකතාව සඳහා ද කථාවක් පදනම් වන බව ෆෝස්ටර් වැඩි දුරටත් සඳහන් කරයි. එසේ ම නාට්‍යය මෙන් ම ඇතැම් කාව්‍යාදි වෙනත්

සාහිත්‍යාංග සඳහා ද කථාවක් පදනම් වෙයි. කථාවක් සම්පූර්ණ වීම සඳහා සාමාන්‍යයෙන් මුල, මැද, අග යන අංග තුනක් තිබීම අපේක්ෂිත යි.

කථාවේ සාමාන්‍ය ලක්ෂණය නම් සිද්ධි අනුපිළිවෙළින් ගළපා ගොතනු ලැබීම බව කිව හැකි ය. එහි දී ඒ සිදුවීම් අතර හේතුඵල සම්බන්ධයක් තිබීම අවශ්‍ය නො වේ. ''රජ මළේය. ඉක්බිති බිසව මළා ය'' යන්න කථාවකට දළ උදාහරණයක් ලෙස ෆෝස්ටර් දැක්වූයේ එබැවිනි.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 62-63 පිටු

**කථාවින්‍යාසය - (Mythos)** (ග්‍රී.) ; **(Plot)** (ඉ.)

ඉංග්‍රීසි Plot යන්න බලා ගෙන සිංහලයේ කථාව, කථා වස්තුව, සැලැස්ම, මෝස්තරය, කථා රටාව යනාදි වශයෙන් නිශ්චිත අර්ථයක් නොසලකා විවිධ පද භාවිත කරනු පෙනේ. මේ සඳහා යෝග්‍යතම පදය 'කථාවින්‍යාසය' යනු යි. ඉංග්‍රීසියේ Story, Plot යන පාරිභාෂික පද දෙක යෙදෙනුයේ නිශ්චිත අර්ථ සලකා ගෙන ය. Story (කථාව) යනු හේතුඵල සම්බන්ධය ගැන නොසලකා සිද්ධි අනුපිළිවෙළින් ගැළපීමෙන් ලැබෙන්නකි. එම සිද්ධි මාලාව නව නිර්මාණයක් කරන ලේඛකයා විසින්, ස්වකීය අරමුණ ඉෂ්ට කර ගැනීමේ අපේක්ෂාවෙන් අභිමත පරිදි ගළපා සකස් කර ගැනීමේ ප්‍රතිඵලය නම් කථාවින්‍යාසය යි.

''රජ මළේ ය ඉක්බිති බිසව මළා ය'' යනු කථාවකට උදාහරණයක් ලෙස දක්වන ඊ. එම්. ෆෝස්ටර් ''රජ මළේ; ඉක්බිති ඒ ශෝකයෙන් බිසව මළා ය.'' යනු කථාවින්‍යාසයක් ලෙස දක්වයි. ෆෝස්ටර් මේ උදාහරණයෙන් අවධාරණය කරනුයේ කථාවින්‍යාසය ගොඩනැඟෙනුයේ හේතුඵල සම්බන්ධය මත බව ය. එහෙත් කථාවින්‍යාසය එතරම් සරල නො වන්නේ ය.

ඇතැම් විට කථාව සහ කථාවින්‍යාසය යන දෙකේ ම එන සිද්ධි සහ ක්‍රියාකාරිත්වය තුල්‍යරූප විය හැකි ය. ඇතැම් විට කථාවේ එන සිද්ධි සහ ක්‍රියාකාරිත්වය කථාවින්‍යාසයේ දී අනෙක් පිළිවෙළකට ගළපා තිබෙනු විය හැකි ය. කථාවින්‍යාසයේ දී ලේඛකයා ඒ නිදහස ලබා ගනී.

කථාවින්‍යාසය කෙරෙහි අවධානය දැක්වූ මුල් ම විචාරකයෙකු වශයෙන් ඇරිස්ටෝටල් සඳහන් කළ හැකි ය. ''ක්‍රියාවන්ගේ අනුකරණය නම් කථාවින්‍යාසය යි. මේ අනුව කථාවින්‍යාසය යන්නෙන් මා අදහස් කරන්නේ සිද්ධි ගැළපීමේ පිළිවෙළ යි'' යනු ඇරිස්ටෝටල් කථාවින්‍යාසය හැඳින්වූ අයුරු ය. (කාව්‍ය ශාස්ත්‍රය, 6 පරි.)

''එක් සිද්ධියක් අනෙක් තැනකට දමූ කල්හි හෝ ඉවත් කළ කල්හි හෝ කථාවේ ඒකීයභාවය හා පරිසමාප්තිය පළුදු වන පරිද්දෙන් කථාවින්‍යාසයේ අවයව සංස්ථාපනය සිද්ධ කළ මනා ය. යම් සිද්ධියක් ඇතුළුවීම හෝ නොවීම හෝ හේතු කොට ගෙන කථාවේ ප්‍රකට ලෙස වෙනසක් ඇති වන්නේ නම් ඒ සිද්ධිය සමස්තයේ නියම ඉන්ද්‍රියයක් නො වන්නේ ය'' (8 පරි. 50 පි) යන ඇරිස්ටෝටල් ප්‍රකාශය අදත් සම්පූර්ණයෙන් අර්ථවත් වෙයි. සරල කථාවින්‍යාසය, සංකීර්ණ කථාවින්‍යාසය යි, ප්‍රභේදද්වයක් ඇරිස්ටෝටල් විසින් දක්වන ලදි. සංකීර්ණ කථාවින්‍යාසයක ලක්ෂණය නම් ප්‍රත්‍යාවර්තනය, ප්‍රත්‍යභිඥානය යන කොටස් දෙකකින් යුක්ත වීම ය.

කථාවක් පාඨකයාගේ අවධානය රැකෙන අර්ථවත් නිර්මාණයක් වන්නේ කථාවින්‍යාසයේ මහිමයෙනි.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 63-64 පිටු

**ගුණාත්මක යෙදවුම්**

- කෙටිකතාව පිළිබඳ නිර්වචන ලියූ කාඩ්පත්
- පෙළපොත්වලින් හෝ කෙටිකතා සංග්‍රහවලින් උපුටාගත් කෙටිකතා කිහිපයක්
- ඇමුණුම 1

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- කෙටිකතාව පිළිබඳ නිර්වචන එකතුවක් සකස් කරයි.
- කෙටිකතාවක තිබිය යුතු ලක්ෂණ උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි.
- කෙටිකතා විචාරයේ දී සැලකිය යුතු කරුණු විස්තර කරයි.
- කෙටිකතාව පිළිබඳ පුවත් පත් ලිපියක් සකස් කරයි.
- කෙටිකතා කියවීමට පෙලඹෙයි

**පරිශීලනීය ග්‍රන්ථ**

කුමාරසිංහ, කුලතිලක - **කෙටිකතා විචාර මූලධර්ම**

වික්‍රමසිංහ, මාර්ටින් - **වහල්ලු (ප්‍රස්තාවනාව)**

සුරවීර, ඒ. වී. - **පිඹිත් නළා සුරාමතින්**

සුරවීර, ඒ. වී. - **බවතිමිර (ප්‍රස්තාවනාව)**

සේනානායක, ජී. බී. - **කෙටිකතා කලාව**

ඇමුණුම 1 : **කෙටිකතාව පිළිබඳ නිර්වචන**

* 'කෙටිකතාව යනු එක් මූලික චරිතයක් හෝ චරිතාංගයක් හෝ මූලික සිද්ධියක් හෝ උච්ච අවස්ථාවක් හෝ නිරූපණය කෙරෙන සාහිත්‍යාංගයකි.' - ඒ. වී. සුරවීර
* 'සමාජයෙන් බිංදු මාත්‍රයක් නිරූපිත කතාව' - කේ. ජයතිලක
* 'කෙටිකතාව ජීවිතයේ සමීප රූපයකි.' - දයාසේන ගුණසිංහ
* කෙටිකතාව මානව ජීවිතය විවරණය කරන කල්පිත ආඛ්‍යානයකි.' - අර්නස්ට් බේකර්
* 'කෙටිකතාව යනු ජීවිතයෙන් පෙත්තකි. (A Slice of Life)' - ඇන්ටන් චෙකොෆ්
* 'කෙටිකතාව වූ කලි අනෙකුත් සියලු සිද්ධීන් අභිභවා සිටින එක් ප්‍රබල සිද්ධියක් හා ඉස්මතු වී පෙනෙන එක් ප්‍රධාන චරිතයක් ද අනාවරණය කෙරෙන්නා වූ ද, කතා වින්‍යාසයෙකින් යුතු මනා අවයව සංවිධානයක් ඇත්තා වූ ද, ඒකීය ධාරණාවකින් යුතු කල්පිත ආඛ්‍යානයකි.'

  - ජෝසෆ් බර්ග් එසන්වීන්

# 7

## භාෂණය හා ලේඛනය අතර වෙනස හඳුනා ගැනීම

**නිපුණතාව** : 7.0 භාෂාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 භාෂාවේ සම්මත ව්‍යවහාරය හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- භාෂා භාවිතයේ ස්වරූප දෙක හඳුනා ගෙන විස්තර කරයි.
- භාෂණ ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.
- ලේඛන ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.
- භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් පැහැදිලි කරයි.
- ලේඛන ව්‍යවහාරය හා භාෂණ ව්‍යවහාරය වෙන් වෙන් ව භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- භාෂාව භාවිත වන ස්වරූප දෙක (1 කතාව හෙවත් භාෂණය 2. ලිවීම හෙවත් ලේඛනය) පිළිබඳ අවධානය යොමු කරන්න.
- ගුණාත්මක යෙදවුම් යටතේ දක්වා ඇති පරිශීලනීය ග්‍රන්ථ කියවා කරුණු එක්රැස් කර ගන්න.
- පහත සඳහන් ශීර්ෂ යටතේ භාෂණයේ හා ලේඛනයේ සුවිශේෂතා දැක්වෙන කරුණු ගොනුවක් සකස් කර ගන්න.
  1. භාෂණයේ ශබ්ද හා ලේඛනයේ අක්ෂර
  2. භාෂණ ව්‍යාකරණය හා ලේඛන ව්‍යාකරණය
  3. භාෂණ වාංමාලාව හා ලේඛන වාංමාලාව

ii. **ප්‍රවේශය :**

- භාෂණයේ හා ලේඛනයේ වෙනස පැහැදිලි කිරීම සඳහා සුදුසු ප්‍රවේශයක් භාවිත කරන්න.

  *උදා :* * භාෂණ ව්‍යවහාරයෙන් ලියවුණු පාඨයක් ලේඛන ව්‍යවහාරයට හරවා ලිවීමට අවස්ථාව දීම

  * ඇමුණුම 1හි සඳහන් වාක්‍ය ප්‍රදර්ශනය කිරීම

  * කථා ව්‍යවහාරයෙන් ලියැවුණු නවකතාවක කොටසක් ප්‍රදර්ශනය කිරීම (ඇමුණුම 2)

iii. **ඉගෙනුම සංවර්ධනය :**

- භාෂණ ව්‍යවහාරයේ හා ලේඛන ව්‍යවහාරයේ වෙනසක් ඇති බව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කිරීම
- මෙම වෙනස,
  * අක්ෂර හා ශබ්ද
  * ව්‍යාකරණ රීති හා වාක්‍ය රටා
  * වාංමාලාව යන අංශවලින් හඳුනා ගත හැකි බව පෙන්වා දෙන්න.

- භාෂණ ව්‍යවහාරයේ හා ලේඛන ව්‍යවහාරයේ ලක්ෂණ ගොනු කිරීම සඳහා කණ්ඩායම් පැවරුමක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න (ඇමුණුම 2හි සඳහන් ආකෘතිය වැනි ආකෘතියක් භාවිත කළ හැකි ය.)
- කණ්ඩායම් පැවරුම් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කළ කරුණු ඇගයීමට ලක් කරමින් පෙර සූදානම් අවස්ථාවේ දී ඔබ විසින් රැස් කරගන්නා ලද කරුණු ඉදිරිපත් කර සමාලෝචනයක යෙදෙන්න.
- භාෂා ව්‍යවහාරයේ දී භාෂණය සහ ලේඛනය පිළිබඳ රීති උචිත පරිදි භාවිත කළ යුතු බව අවධාරණය කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

  *උදා :* * භාෂණ ව්‍යවහාරයේ හා ලේඛන ව්‍යවහාරයේ වෙනස්කම් ඇතුළත් වගුවක් සකස් කිරීමට යොමු කිරීම

  * භාෂණය හා ලේඛනය අතර සමාන අසමානතා පිළිබඳ වාචික ප්‍රශ්න විමසීම

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 1, 2

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- භාෂණ ව්‍යවහාරයේ ලක්ෂණ වගුගත කරයි.
- ලේඛන ව්‍යවහාරයේ ලක්ෂණ වගුගත කරයි.
- භාෂණ ව්‍යවහාරයේ හා ලේඛන ව්‍යවහාරයේ වෙනස්කම් ප්‍රකාශ කරයි.
- භාෂණ හා ලේඛන ව්‍යවහාර රටා උචිත පරිදි භාවිත කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**


| | | |
|---|---|---|
| කෝපරහේවා, සඳගෝමි | - | **සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය** |
| ගුනසිංහ, සිරි | - | **හෙවනැල්ල** |
| ජාතික අධ්‍යාපන ආයතනය | - | **සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)** |
| දිසානායක, ජේ. බී. | - | **භාෂාවක භාවිතය හා විග්‍රහය** |
| දිසානායක, ජේ. බී. | - | **භාෂාවක රටා සමුදාය** |
| දිසානායක, ජේ. බී. | - | **මානව භාෂා ප්‍රවේශය** |
| ධර්මදාස, කේ. එන්. ඕ. | - | **භාෂා ද්විරූපතාව** |
| ධර්මදාස, කේ. එන්. ඕ. | - | **භාෂාව හා සමාජය** |
| පරණවිතාන, සෙනරත් | - | **සිංහලයෝ** |
| ප්‍රඥාරාම හිමි, යක්කඩුවේ | - | **වනකතා** |
| බලගල්ලේ, විමල් ජී. | - | **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** |
| බලගල්ලේ, විමල් ජී. | - | **සිංහල භාෂාධ්‍යයන ලිපි 1** |

රාජපක්ෂ, ආර්. එම්. ඩබ්ලිව්. - **භාෂණ සිංහල ව්‍යඤ්ජන ශබ්ද**

රාජපක්ෂ, ආර්. එම්. ඩබ්ලිව්. - **භාෂණ සිංහල ස්වර ශබ්ද**

සුරවීර, ඒ. වී. - **හෙයියම්මාරුව**

Karunathilake, W. S. - **An Introduction to Spoken Sinhala**


**ඇමුණුම 01**

| |
|---|
| මං තාත්තත්තෙක්ක ගෙදර ගියා (කථන භාෂාව)<br>මම පියා සමඟ නිවසට ගියෙමි. (ලිඛිත භාෂාව) |

**ඇමුණුම 02**

''තව ඩිංගෙන් මට මතක නැති වෙනවා. තමුසෙ එනව නේ ද සිංහල සමිතියෙ ට්‍රිප් එකට.''

''මොන කරදරයක් ද ඕයි, තමුසෙ සිංහල සමිතියෙ ලේකම් උනැයි කියල අපටයි වැසිල්ලක් නැත්තෙ.''

''තමුසෙට ඕන නං එනව. නැත්නං නිකං ඉන්නව. හැබැයි නාවොත් පාඩු තමුසෙට මයි.''

ගුනසිංහ, සිරි, **හෙවනැල්ල**, කොළඹ, 2008, 77 පි.

**ඇමුණුම 02** **භාෂණය හා ලේඛනය අතර වෙනස**

| | **භාෂණ ව්‍යවහාරයේ ලක්ෂණ** | **ලේඛන ව්‍යවහාරයේ ලක්ෂණ** |
|---|---|---|
| මූලික අක්ෂර හෝ ශබ්ද | • භාෂණය ඉදිරිපත් වන්නේ ශබ්ද මාධ්‍යයෙනි.<br>• සිංහල භාෂණයේ භාෂණ ශබ්ද 40ක් වේ.<br>අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ<br>එ ඒ ඔ ඕ<br>(අ)ං<br>ක ග ඟ<br>ච ජ ඤ ඦ<br>ට ඩ ඬ<br>ත ද න ඳ<br>ප බ ම ඹ<br>ය ර ල ව<br>ශ ස හ ෆ<br>• අද්‍යතන සිංහල භාෂණ ව්‍යවහාරයේ ෆ ශබ්දය හමු වේ.<br>• සංවෘත හ්‍රස්ව අකාරය සහ සංවෘත දීර්ඝ අකාරය සිංහල භාෂණ ව්‍යවහාරයේ හමු වේ. එහෙත් ඒවා ලියා දැක්වීමට අක්ෂර සංකේත නැත.<br>• ණ, න, ල, ළ භේදයඃ ශ, ෂ, භේදයඃ මහා ප්‍රාණ භේදයඃ ඍ, ඎ, ඏ, ඐ අක්ෂරඃ උච්චාරණයේ දී හඳුනා ගත නොහැකි ය. | • ලේඛනය ඉදිරිපත් වන්නේ අක්ෂර රූප මගිනි.<br>• සිංහල අක්ෂර මාලාවේ අක්ෂර 60කි.<br>අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ<br>ඍ ඎ ඏ ඐ<br>එ ඒ ඓ ඔ ඕ ඖ<br>(අ)ං (අ)ඃ<br>ක ඛ ග ඝ ඞ ඟ<br>ච ඡ ජ ඣ ඤ ඦ<br>ට ඨ ඩ ඪ ණ ඬ<br>ත ථ ද ධ න ඳ<br>ප ඵ බ භ ම ඹ<br>ය ර ල ව<br>ශ ෂ ස හ ළ ෆ<br>• ඏ, ඐ අක්ෂර අද්‍යතන ලේඛන ව්‍යවහාරයේ හමු නො වේ.<br>• ඍ අක්ෂරයෙන් ආරම්භ වන වචන අද්‍යතන ලේඛනයේ හමු නොවන අතර එය පිල්ලමක් ලෙස වචනයක මැද යෙදේ. |
| පද රටා | • වාක්‍යයක ජීව භේදය (ප්‍රාණවාචී, අප්‍රාණවාචී) උක්ත පදයේ වචන භේදය (ඒක, බහු,) ලිංග භේදය (පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග) අනුව සාමාන්‍යයෙන් ආඛ්‍යාතය වෙනස් නො වේ.<br>* ළමයා දුවනවා.<br>ළමයි දුවනවා.<br>* මිනිසා වැටෙනවා.<br>ගැහැනිය වැටෙනවා.<br>ගහ වැටෙනවා.<br>ගස් වැටෙනවා | • වාක්‍යයක උක්ත පදයේ වචන භේදය, ලිංග භේදය, සචේතන - අචේතන භේදය අනුව ආඛ්‍යාතය වෙනස් වේ.<br>* ළමයා දුවයි.<br>ළමයි දුවති.<br>* මිනිසා වැටෙයි/වැටෙන්නේ ය.<br>ගැහැනිය වැටෙයි/වැටෙන්නී ය.<br>ගස වැටෙයි.<br>ගස් වැටෙයි. |

| | භාෂණ ව්‍යවහාරයේ ලක්ෂණ | ලේඛන ව්‍යවහාරයේ ලක්ෂණ |
|---|---|---|
| | • ආඛ්‍යාතය පුරුෂයට අනුව යොදනු නො ලැබේ.<br>*උදා :* මම යනවා.<br>අපි යනවා.<br>එයා යනවා.<br>එයාලා යනවා. | • ආඛ්‍යාතය පුරුෂයට අනුව යොදනු ලැබේ.<br>*උදා :* මම යමි.<br>අපි යමු.<br>ඔහු යයි.<br>ඔවුහු යති. |
| | • ප්‍රාණවාචී නාම පදවල විභක්ති 5කි<br>* මිනිහා (ප්‍රථම)<br>* මිනිහාට (සම්ප්‍රදාන)<br>* මිනිහාගෙන් (අවධි)<br>* මිනිහාගේ (සම්බන්ධ)<br>* මිනිහෝ (ආලපන) | • ප්‍රාණවාචී නාම පදවල විභක්ති 9කි.<br>ඒකවචන බහුවචන<br>ප්‍රථමා - මිනිසා මිනිස්සු<br>කර්ම - මිනිසා මිනිසුන්<br>කර්තෘ - මිනිසා විසින් මිනිසුන් විසින්<br>කරණ - මිනිසා කරණ කොට ගෙන මිනිසුන් කරණ කොට ගෙන<br>සම්ප්‍රදාන - මිනිසාට මිනිසුන්ට<br>අවධි - මිනිසාගෙන් මිනිසුන්ගෙන්<br>සම්බන්ධ - මිනිසාගේ මිනිසුන්ගේ<br>ආධාර - මිනිසා කෙරෙහි මිනිසුන් කෙරෙහි<br>ආලපන - මිනිස මිනිසුනි |
| | • අනතීත කාලයට අයත් ක්‍රියා වර නැගීම<br>* බලනවා<br>* රකිනවා | • අනතීත කාලයට අයත් ක්‍රියා වර නැගීම<br>* බලයි - බලති බලන්නේ ය / බලන්නී ය<br>* රකියි - රකිති බලන්නෝ ය.<br>රකින්නේ ය /රකින්නී ය<br>රකින්නෝ ය. |
| | • අතීත කාලයට අයත් ක්‍රියා වර නැගීම<br>* බැලුවා<br>* දූක්කා<br>* මැරුණා | • අතීත කාලයට අයත් ක්‍රියා වර නැගීම<br>* බැලුවේ ය / බැලුවා ය<br>* රැක්කේ ය / රැක්කා ය<br>* මැරුණේ ය / මැරුණා ය |
| වාංමාලාව | • භාෂණ ව්‍යවහාරය යොදා ගැනේ.<br>* ගෙදර<br>* අම්මා<br>* තාත්තා<br><br>• ප්‍රාදේශීය හා පරිමිත වශයෙන් වාංමාලාවේ වෙනස්කම් පවතී. | • ලේඛන ව්‍යවහාරය යොදා ගැනේ.<br>* නිවස<br>* මව<br>* පියා<br><br>• ප්‍රාදේශීය හා පරිමිත වශයෙන් වාංමාලාවේ වෙනස්කම් නොපවතින අතර සම්මත වචන මාලාවක් යොදා ගැනේ. |

| | |
|---|---|
| • ප්‍රාදේශීය වහර<br>උදා- තාත්තා<br>* උඩරට - අප්පච්චි<br>* දකුණ - තාත්තා<br><br>• පරිමිත වහර<br>උදා - කමත් වහර -<br>* බැත (වී)<br>* යතුර (කුල්ල)<br>* කලවිට (කමත)<br><br>ධීවර බස -<br>* ලෙල්ලම (මාළු විකුණන තැන)<br>* වාරකන් (මුහුද රළු වන කාලය)<br>* දියඹ (ඈත මුහුද)<br><br>ශ්‍රී පාදය ආශ්‍රිත වහර -<br>* කරුණා කරනවා (ශ්‍රී පාදය නගිනවා)<br>* කිරිකෝඩු (පළමුවර ශ්‍රී පාදය නගින බාල දරුවා)<br>* දඬුකෝඩු (පළමුවර ශ්‍රී පාදය නගින වැඩිහිටියා) | |

# 8

# අක්ෂර මාලාව හැඳින්වීම හා අක්ෂර වර්ගීකරණය

**නිපුණතාව** : 7. 0 භාෂාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි.

**නිපුණතා මට්ටම** : 7.2 සිංහල අක්ෂර මාලාව පිළිබඳ දැනුම පාදක කර ගෙන අක්ෂර විචාරය කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- සිංහල අක්ෂර විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.
- සිංහල අක්ෂර නිවැරදි ව නම් කරයි.
- ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නො පැමිණි අක්ෂර සිංහල අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු පැහැදිලි කරයි.
- සිංහල 'අ'යන්නේ සංවෘත විවෘත භේදය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියා දක්වයි.
- රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර මොනවා දැයි පැහැදිලි කරයි.
- යංශය, රකාරාංශය හා රේඵය නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- සිංහල අක්ෂර මාලාව සම්බන්ධ පහත සඳහන් කරුණු පිළිබඳ දැනුවත් වන්න. (මේ සඳහා ගුණාත්මක යෙදවුම්වල දක්වා ඇති ග්‍රන්ථ පරිශීලනය කිරීම සුදුසු ය.)
  - * සිංහල අක්ෂර මාලාවේ අනුපිළිවෙළ
  - * සිංහල අකුරු නිවැරදි ව ලිවීම
  - * සිංහල අකුරුවල නිවැරදි උච්චාරණය
  - * සිංහල අකුරු නිවැරදි ව නම් කිරීම
  - * සිංහල අකුරු වර්ග කිරීම
  - * සිංහල ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නො පැමිණි අක්ෂර
  - * විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියන ආකාරය
  - * සිංහල 'අ'යන්නේ සංවෘත - විවෘත භේදය
  - * යංශය, රකාරාංශය හා රේඵයේ නිවැරදි භාවිතය

ii. **ප්‍රවේශය**

- පහත සඳහන් නිදසුන්වල දක්වා ඇති පරිදි සුදුසු ප්‍රවේශයක් භාවිත කරන්න.

  *උදා :* * සිංහල අක්ෂර මාලාව පිළිබඳ පෙර දැනුම විමසීම

  * සිංහල අක්ෂර මාලාව මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දීම

* සිංහල අක්ෂර මාලාව පිළිබඳ සැකසුණු බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ඉදිරිපත් කිරීමක්
* සිංහල අකුරු නම් කිරීමට අවස්ථාව ලබා දීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- සිංහල අක්ෂර මාලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- සිංහල අක්ෂර මාලාව ප්‍රදර්ශනය කරන්න. (ඇමුණුම 1) සිංහල ලේඛන රීතිය කෘතියේ නව සංස්කරණයේ ඇති අක්ෂර මාලාව මේ සඳහා යොදා ගන්න.
- සිංහල අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කරමින් මතකයෙන් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිංහල අකුරු නිවැරදි ව නම් කිරීමේ හා නිවැරදි ව ලිවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- අකුරු නිවැරදි ව නම් කිරීමේ අභ්‍යාසවල නිරත කරවන්න.
- සිංහල අක්ෂරවල විවිධ ප්‍රභේද හා අනුප්‍රභේද පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න. (ඇමුණුම 2)
- අධ්‍යයනය කළ කරුණු ඉවහල් කර ගනිමින් සිංහල අක්ෂර විවිධ ප්‍රභේද හා අනුප්‍රභේද යටතේ වර්ගීකරණය ගත කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. (ඇමුණුම 3)
- අක්ෂර මාලාවේ ඇතුළත් වෙතත් අද්‍යතන ව්‍යවහාරයේ හමු නොවන අකුරු හා ඒවා සිංහල අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න.

  *උදා :* ඎ , ඏ, ඐ
- සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්, රූප භේදයක් ඇතත් භාෂණයේ දී වෙනසක් නොමැති අක්ෂර පිළිබඳ සාකච්ඡා කරන්න.

  *උදා :* ණ, න

  ල, ළ

  ශ, ෂ

  අල්පප්‍රාණ - මහාප්‍රාණ
- යංශය, රකාරාංශය හා රේඵය බැඳි අකුරු බව පෙන්වා දී ඒවායේ නිවැරදි භාවිතය ප්‍රායෝගික ව හඳුනා ගැනීමට සලස්වන්න.

  *උදා :* වාක්‍යය, චිත්‍රය, ආචාර්ය්‍ය / ආචාර්ය
- සිංහල 'අ' යන්නේ සංවෘත - විවෘත භේදයක් පවතින බව උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

  *උදා :* මම - මේ අකුරු දෙක උච්චාරණය වන ආකාරය පෙන්වා දෙන්න.
- විදේශීය (අරාබි හා යුරෝපීය) භාෂාවලින් පැමිණි වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියන ආකාරය පැහැදිලි කරන්න.

  *උදා :* fan - ෆෑන්

  cracker - ක්‍රැකර්
- සිංහල අක්ෂර මාලාවට අලුතින් ඇතුළත් විය යුතු බවට ඇතැම් විද්වතුන් විසින් යෝජනා කෙරෙන අක්ෂර හා එම අක්ෂර සිංහල හෝඩියට ඇතුළත් කිරීමේ යෝග්‍ය අයෝග්‍ය භාවය විමසන්න. (ඇමුණුම 4)

  *උදා :* - 'ඥ' අක්ෂරය
  - සංවෘත 'අ'යන්න හා විවෘත 'අ'යන්න නියෝජනය සඳහා අක්ෂර
  - සංවෘත දීර්ඝ 'අ'යන්න නියෝජනය සඳහා අක්ෂර
  - 'z' ශබ්දය නියෝජනය සඳහා අක්ෂර

- ජ්‍යාත්‍යන්තතර සිංහල හෝඩිය පිළිබඳ සාකච්ඡා කරන්න. (ඇමුණුම 5)

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/තේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

  *උදා :* * සිංහල අක්ෂර නිවැරදි ව නම් කිරීම, නිවැරදි ව වර්ග කිරීම සඳහා අභ්‍යාස ලබා දීම

  * සිංහල අක්ෂර නිවැරදි ව ලිවීම සඳහා පැවරුම් ලබා දීම

  * සිංහල ලේඛනයේ බහුල භාවිතයට පැමිණි හා නො පැමිණි අක්ෂර පිළිබඳ අධ්‍යයනය කර පුවත්පත් ලිපියක් සකස් කිරීමට ලබා දීම

  * 'සිංහල අක්ෂර මාලාව සංශෝධනය විය යුතු ය/නො විය යුතු ය' යන මැයෙන් විවාදයක් පැවැත්වීමට යොමු කිරීම

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 1, 2 , 3, 4, 5

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සිංහල අක්ෂර වර්ගීකරණය කරයි.
- සිංහල අකුරු නිවැරදි ව නම් කරයි.
- සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් බහුල භාවිතයට පැමිණි හා නො පැමිණි අක්ෂර පිළිබඳ විස්තර කරයි.
- විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියා දක්වයි.
- සිංහල අක්ෂර මාලාව පිළිබඳ කරුණු ඇතුළත් පුවත්පත් ලිපියක් සකස් කරයි.

**අතිරේක පරිශීලනීය ග්‍රන්ථ**


කරුණාතිලක, ඩබ්. එස්. - **සිංහල භාෂා ව්‍යාකරණය**

ජාතික අධ්‍යාපන ආයතනය - **සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)**

ජාතික අධ්‍යාපන කොමිසම - **සිංහල අක්ෂර ලිවීමේ මාර්ගෝපදේශය**

දිසානායක, ජේ. බී. - **නූතන සිංහල ලේඛන ව්‍යාකරණය 1 අක්ෂර විචාරය**

දිසානායක, ජේ. බී. - **බසක මහිම 1 සිංහල හෝඩිය**

දිසානායක, ජේ. බී. - **සිංහල රීතිය 1 සිංහල අක්ෂර මාලාව**

දිසානායක, ජේ. බී. - **සිංහල රීතිය 2 අක්ෂර හා අක්ෂරාණු**

බලගල්ලේ, විමල් ජී. - **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය**

බලගල්ලේ, විමල් ජී. - **සිංහල භාෂාධ්‍යයන ලිපි 1**


මුනිදාස, කුමාරතුංග **ව්‍යාකරණ විවරණය**

විතාරණ, විනී - **පදය, වාක්‍යය හා ඡේදය**

සේනාධීර, ගුණපාල - **නිවැරදි වහර**

ඇමුණුම 1

# 1 සිංහල අක්ෂර මාලාව



උපුටාගැනීම - ජාතික අධ්‍යාපන ආයතනය, **සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)**, මහරගම, 2015, 1 පි.

## ඇමුණුම 2 සිංහල අක්ෂර වර්ගීකරණය

| | ස්වර | | | ව්‍යඤ්ජන | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වර්ගාක්ෂර | | | | | | අවර්ගාක්ෂර | | | |
| | හ්‍රස්ව | දීර්ඝ | * සංයුක්ත ස්වර | අඝෝෂ අල්පප්‍රාණ | අඝෝෂ මහාප්‍රාණ | ඝෝෂ අල්පප්‍රාණ | ඝෝෂ මහාප්‍රාණ | නාසික්‍ය | සඤ්ඤක | ඌෂ්ම | අන්තඃස්ථ | අනුස්වාර | විසර්ග |
| කණ්ඨජ | අ ඇ | ආ ඈ | | ක | ඛ | ග | ඝ | ඞ | ඟ | හ | | ං | ඃ |
| තාලුජ | ඉ | ඊ | | ච | ඡ | ජ | ඣ | ඤ | ඦ | ශ | ය | | |
| මූර්ධජ | ඍ | ඎ | | ට | ඨ | ඩ | ඪ | ණ | ඬ | ෂ | ර ළ | | |
| දන්තජ | ඏ | ඐ | | ත | ථ | ද | ධ | න | ඳ | ස | ල | | |
| ඕෂ්ඨජ | උ | ඌ | | ප | ඵ | බ | භ | ම | ඹ | | | | |
| කණ්ඨ තාලුජ | එ | ඒ | ඓ | | | | | | | | | | |
| කණ්ඨ ඕෂ්ඨජ | ඔ | ඕ | ඖ | | | | | | | | | | |
| දන්ත ඕෂ්ඨජ | | | | | | | | | | ෆ | ව | | |

* සියලු සංයුක්ත ස්වර දීර්ඝ ය.

ඇමුණුම 3 පැවරුම

| | ස්වර | | | ව්‍යඤ්ජන | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වර්ගාක්ෂර | | | | | | අවර්ගාක්ෂර | | | |
| | හ්‍රස්ව | දීර්ඝ | සංයුක්ත ස්වර | අඝෝෂ අල්පප්‍රාණ | අඝෝෂ මහාප්‍රාණ | ඝෝෂ අල්පප්‍රාණ | ඝෝෂ මහාප්‍රාණ | නාසික්‍ය | සඤ්ඤක | ඌෂ්ම | අන්තඃස්ථ | අනුස්වාර | විසර්ග |
| කණ්ඨජ | | | | | | | | | | | | | |
| තාලුජ | | | | | | | | | | | | | |
| මූර්ධජ | | | | | | | | | | | | | |
| දන්තජ | | | | | | | | | | | | | |
| ඕෂ්ඨජ | | | | | | | | | | | | | |
| කණ්ඨ තාලුජ | | | | | | | | | | | | | |
| කණ්ඨ ඕෂ්ඨජ | | | | | | | | | | | | | |
| දන්ත ඕෂ්ඨජ | | | | | | | | | | | | | |

**ඇමුණුම 4 - සිංහල අක්ෂර මාලාව පිළිබඳ විද්වත් මත**

**''සිංහලයෙහි අකාරයේ සංවෘත විවෘත භේදය :**

අකාරයේ සංවෘත - විවෘත භේදය සිංහලයට ආවේණික ව උරුම වූවකි. පුරාතන ඉන්දු - ආර්ය හෙවත් වෛදික සංස්කෘත අවධියෙහි පටන් ම විද්‍යමාන වූ එම ලක්ෂණය පාලි ඇතුළු මධ්‍ය ඉන්දු - ආර්ය භාෂාවන්හි ද සිංහල ප්‍රාකෘත යුගයෙහි සිට ම සිංහලයෙහි ද දක්නට ලැබෙන්නකි. අසන්දිග්ධ සන්නිවේදන කාර්යය සඳහා භාෂා සංස්ථිතියට මූලධාර ව සිටිනා ශබ්දයන්ගේ නිරවද්‍ය උච්චාරණයෙහි ඇති වැදගත්කම මැනවින් වටහා ගෙන සිටි පෞරාණික ශික්ෂා-ප්‍රාතිශාඛ්‍ය ආචාර්යවරුන් මෙන් ම, චන්ද්‍ර පාණිනාදි වියරණ ඇදුරෝ ද මූලාක්ෂර නිවැරදි ව හැඳින ගැනීමටත්, භාෂා සංස්ථිතිය තුළ ඒවායේ විස්තෘතිය සිදු වන අකාරය හා ප්‍රයුක්ත ශබ්ද පරිසරය අනුව ඒවායෙහි සියුම් වෙනස්කම් සිදු වන ආකාරය අධ්‍යයන කිරීමටත් සමත් වූහ. නූතන ශබ්දිම (phoneme) සංකල්පයට බෙහෙවින් සමාන වූ විදුහුරු සංකල්පයක් මත පිහිටා, සමස්ත භාෂාවෙහි යෙදෙන මූලාක්ෂර නිශ්චය කිරීමටත් තකුහුරු ලෙස ස්වර ව්‍යඤ්ජනාදි වශයෙන් ඒවා වර්ග කිරීමට හා සානුක්‍රමික ව පෙළ ගැස්වීමටත් ඔවුන්ට හැකි වූයේ එහෙයිනි. සාමාන්‍යයෙන් සිංහල භාෂක සමාජයේ සාක්ෂරතාවෙන් යුතු කවර සාමාජිකයකු වුව ද ප්‍රත්‍යක්ෂ ලෙස දන්නා අකාරයේ සංවෘත - විවෘත උච්චාරණ භේදය, ශබ්දයෝගයෙහි (phonology) අර්ථ වෛශේෂිකත්වය ඇති කරන මූලාක්ෂර පිළිබඳ වෙනස්කමක් නොව, පරිසර පාලිත ව එක ම මූලාක්ෂරයක සිදුවන උපශබ්දමය (allophonic) වෙනසකැයි ඔවුන් වටහා ගෙන සිටි බව, සංස්කෘත ශික්ෂා-ප්‍රාතිශාඛ්‍ය හා ව්‍යාකරණ ග්‍රන්ථකර්තෘවරුන් කරන විස්තරවලින් පැහැදිලි වේ. මේ අධ්‍යයනයෙහි දී ප්‍රථමයෙන් ම භාෂා සංස්ථිතිය තුළ අකාරයෙහි සංවෘත-විවෘත ශබ්දයන්ගේ විස්තෘතිය පිළිබඳ විග්‍රහයක් කිරීමෙන් පසු සංස්කෘත ශාබ්දිකයන් 'සමාන ස්වර' සංකල්පය හා ස්ථාන - කරණ - ප්‍රයත්නාදි නිර්ණායකයන් ඇසුරෙන් ඒ පිළිබඳ ව කරන ඉගැන්වීම් විමසුමට ලක් කෙරෙයි.

ඉන් අනතුරු ව, පැරණි සිංහල ලේඛනවල සංවෘත-විවෘත අකාරයන් නියෝජනය වී ඇති ආකාරයත් ඒ පිළිබඳ ස්වදේශීය ආචාර්ය මතත් පිළිබඳ සාකච්ඡාවක් එයි. එහි ලා නූතන ශබ්දිම (phoneme) හා උපශබ්ද (allophone) සංකල්ප පිළිබඳ හැඳින්වීමක් හා නූතන ශබ්දවිචාරයට අනුව කෙරෙන සිංහලයේ මූලික ස්වර ශබ්ද පිළිබඳ තුලනාත්මක විමර්ශනයක් ද මේ ලේඛකයා ඒ සම්බන්ධ ව නූතන ශබ්දවිචාර විද්‍යාගාර ආශ්‍රයෙන් කළ පරීක්ෂණවල ප්‍රතිඵල ද ඉදිරිපත් කෙරේ. මෙහි දැක්වෙන සිංහලයේ මූලික ස්වර පිළිබඳ ව ප්‍රභාවලීලේඛන, (spectrogram) ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනය සමහර විට, එබඳු අධ්‍යයනයක් කෙරෙන ප්‍රථම අවස්ථාව විය හැකි ය.

සිංහල භාෂාධ්‍යයන ඉතිහාසයෙහි අකාරයේ සංවෘත-විවෘත ප්‍රභේද ද්වයෙහි විස්තෘතිය පිළිබඳ ව ශබ්දයෝග විචාරාත්මක විස්තරයක් කෙරෙන ප්‍රථම නිබන්ධය මුදලි මැන්දිස් ගුණසේකරයන් විසින් ඉංග්‍රීසියෙන් ලියා 1892 දී ප්‍රකාශයට පත් කරන ලද සවිස්තර සිංහල ව්‍යාකරණය යි.

සංගෘහීත වූ කරුණු සියල්ල සමාලෝචනය කරමින් එළඹෙන නිගමනය වී ඇත්තේ අකාරයෙන් නියෝජනය කෙරෙන විවෘත සංවෘත උච්චාරණ ද්වය, එක ම ශබ්දිමයක ප්‍රභේද හෙවත් උපශබ්ද දෙකක් ලෙස පිළිගැනීමත් ලේඛනයෙහි ලා එදෙක නියෝජනය සඳහා, දැනට කෙරෙන පරිදි එක සලකුණක් (අකුරක්) යොදා ගැනීමත් ශාස්ත්‍රීය වන බව යි. එහෙත් ඇතැම් සෘණිත සංඥානාම හා විද්‍යාතාක්ෂණික පාරිභාෂික වචන ලිවීමේ දී, ඉහත කී ආවේණික ශබ්දයෝග රීතිවලට පටහැනි ව සිදු වන අකාරයේ සංවෘත හ්‍රස්ව-දීර්ඝ උච්චාරණ දැක්වීම සඳහා පමණක් විශේෂක ලකුණු (diacritical marks) දෙකක් සම්මත කරගැනීම යෝග්‍ය බව ද නිගමනය කෙරේ.

බලගල්ලේ, විමල් ජී, **සිංහල භාෂාධ්‍යයන ලිපි** 1, කොළඹ, 2004, 6 - 8 පිටු

5. 'ඥ' වර්ණමාලාවට ඇතුළත් කළ යුතුද?

'ඥ' යන්න මෑත කාලයෙහි වාග්වේදීන් දෙතුන්දෙනෙකුගේ කෘතිවල එන වර්ණමාලාවලට ඇතුළත් ව තිබීම ආධුනික විද්‍යාර්ථීන්ගේ කුකුසට හේතුවක් විය හැකි බැවින්, මෙහි දී ඒ පිළිබඳ යථා තත්ත්වය මඳක් පැහැදිලි කිරීම සුදුසුයැයි හැඟේ.

'ඥ' යන්න මධ්‍ය සිංහල යුගයෙහි පටන් සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි ප්‍රචුර ලෙස යෙදුණු ඍණිත සංස්කෘත වචන සමුදාය සමඟ සිංහලයට පිවිස ගත් සංයුක්තාක්ෂරයකි. සංස්කෘතය හැරුණු විට සිංහලය හා නිරන්තර සංස්කෘතික සංස්පර්ශයට පැමිණි අනෙක් භාෂා වන පාලියෙහි හෝ දෙමළෙහි හෝ නොයෙදෙන මෙම ව්‍යංජන සංයෝගය, ප්‍රාකෘත හෝ සිංහල තද්භව රීතිවලට යටත් නොවූ සංස්කෘත වචනවල පමණක් දක්නට ලැබෙන්නකි. පාණිනී යුගයටත් පෙර පටන් ම, ශික්ෂා ව්‍යාකරණ ආචාර්යවරුන් 'ඥ' යන්නේ සංයුතියත් උච්චාරණයත් පිළිබඳව පැහැදිලි විස්තර සපයා තිබේ. ලක්දිව පන්සල් අධ්‍යාපනය ද මේ උච්චාරණ සම්ප්‍රදාය තවමත් රැකගෙන ඇත. එසේ හෙයින් අද වුව ද 'ඥ' යන්නේ සංයුතිය හෝ උච්චාරණය පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් කළ හැක්කේ යථෝක්ත නිරුක්ති හා උච්චාරණ සම්ප්‍රදායන්ට අනුකූල වන පරිදි මිස, සංස්කෘත බැරි සාම්ප්‍රදායික උච්චාරණ ක්‍රමය ද නොදත් සිංහල භාෂකයන් ටික දෙනෙකු මේ මෙසේ විය යුතු යයි සිතන ආකාරය හෝ ඔවුන් එය වරදවා උසුරුවන ආකාරය පාදක කොට ගෙන නොවේ. 'ඥානවතී' 'ඥානතිලක' යන පුද්ගලනාම 'ඤාණවතී' 'ඤාණතිලක' යනුවෙන් ලියනු ලබන නාමයන්ගේ උච්චාරණයටත් 'ඥාති මිත්‍රාදීහු' යන්න 'ඤාති මිත්‍රාදීහු' යන්නටත් සමාන ව, 'ඥ' හා 'ඤ' අතර වෙනසක් නැතිව, උච්චාරණය කරන සිංහල භාෂකයන් මෙන් ම, වෙනසක් ඇති ව සම්ප්‍රදායානුකූල ව උච්චාරණය කරන සිංහල භාෂකයන් ද ඇති හෙයිනි. ඤාණ, ඤාති යන පාලි වචන මෙන්, ඥාන, ඥාති යන සංස්කෘත වචන ව්‍යක්ත සිංහල භාෂකයාගේ උච්චාරණයෙහි මිස සාමාන්‍ය සිංහල භාෂකයාගේ උච්චාරණයෙහි ලැබෙන්නක් නො වේ. යම්කිසිවකු සාමාන්‍ය සිංහල භාෂකයා ඤාණ, ඤාති, යනුවෙන් කරන උච්චාරණය ඥාන, ඥාති යනුවෙන් ලියා දක්වතොත් එය නිරවද්‍ය ලිපි ක්‍රමයක් නො වේ.

පාලි 'ඤ' කාරය ම සංස්කෘතයෙහි 'ඥ' යන්නෙන් නියෝජනය වෙතැයි සමහරුන් කියතත්, එය ද සැබෑ නො වේ. සංස්කෘතයෙහි 'ඥ' සංයෝගය මෙන් ම, කේවල 'ඤ' කාරය ද තිබේ. පාලියෙහි ඤ කාරය ඇතත් 'ඥ' සංයෝගය නැත. පාලියෙහි ඤාණ, විඤ්ඤාණ වූයේ සංස්කෘතයෙහි ඥාන, විඥාන යන රූප වුවත්, පාලියෙහි ඤාය, කඤ්ඤා වූයේ සංස්කෘතයෙහි න්‍යාය, කන්‍යා යන රූප යි.

ඒ හැරත්, සමහර සිංහල භාෂකයන් 'ඥ' යන්නෙහි අන්තර්ගත 'ජ් + ඤ සංයෝගය හරි හැටි උච්චාරණය නොකොට 'ඤ' යන්න හා අවිශේෂයෙන් උච්චාරණය කළ පමණින්, එදෙක එක ම ශබ්දයක් නියෝජනය කරන සංකේත දෙකක් සේ සැලකීම ද සාවද්‍ය ය. සංස්කෘත වචනෝච්චාරණය පිළිබඳ ප්‍රාමාණිකයකු විය යුත්තේ ප්‍රවීණ සංස්කෘත උගතකු මිස සංස්කෘත බැරි සිංහල භාෂකයෙක් නො වේ. සිංහලයෙහි ඍණිත සංස්කෘත පාලි වචනවල එන මහාප්‍රාණ අකුරු ද කියවීමේ අභ්‍යාසයක දී නැතහොත් සිංහල උගතුන්ගේ ඇතැම් ප්‍රාස්තාවික ව්‍යවහාරයක දී මිස, සාමාන්‍ය සිංහල උගතුන් උසුරුවන්නේ අල්පප්‍රාණ ලෙසිනි. ඒ නිසාම සංස්කෘතයෙහි අල්පප්‍රාණ මහාප්‍රාණ දෙක අතරෙහි වෙනසක් නැතැයි පවසන්නෙක් නැත.''

බලගල්ලේ, විමල් ජී., **සිංහල භාෂාධ්‍යයන ලිපි 1**, කොළඹ, 2004, 41 - 43 පිටු

''**විවෘත ස්වර හා සංවෘත ස්වර**

සිංහල ස්වර ශබ්ද අතර 'විවෘත හා සංවෘත ස්වර' යනුවෙන් ද ප්‍රභේදයක් දක්නට ලැබේ. එහෙත් මේ භේදය සියලු ම සිංහල ස්වර ශබ්ද කෙරේ බලපාන්නේ නැත. එය බලපාන්නේ 'අ' යන ස්වරය කෙරෙහි ය.

'මම' යන පදය සෑදී ඇත්තේ ශබ්ද හතරක් එක් වීමෙනි. එහි ඇතුළත් ශබ්ද මෙසේ වෙන් කොට දැක්විය හැකි ය.

| ම | ම |
|---|---|
| ම් - අ | ම් - අ |

මෙහි එන 'ම්' ශබ්ද දෙක ම එක ම හඬක් නිකුත් කරයි. එහෙත් 'අ' ශබ්ද දෙකින් නිකුත් වන්නේ එක සමාන හඬක් නොවේ. මුලින් එන 'අ' යන්නේ හඬ 'අර' 'අල' වැනි පදවල මුල එන 'අ' යන්නෙන් හඬට සමාන ය. එහෙත් දෙවෙනි 'අ' යන්නේ හඬ ඊට වඩා මදක් වෙනස් ය.

මේ වෙනස හඳුන්වනු පිණිස නූතන වාග්විද්‍යාඥයෝ නම් දෙකක් භාවිත කරති මුලින් එන 'අ' යන්න හැඳින්වීමට 'විවෘත අ-කාරය' හෝ 'විවෘත අ-යන්න' යන නම යෙදේ. දෙවෙනි 'අ' යන්න හැඳින්විමට 'සංවෘත අ - කාරය' හෝ 'සංවෘත අ- යන්න' යන නම යෙදේ.

විවෘත 'අ' යන්න කෙටි ස්වරයකි. ඊට අනුරූප දීක් ස්වරය 'ආ' යන්නයි. සංවෘත 'අ' යන්න ද කෙටි ස්වරයකි. ඊට ද අනුරූප දික් ස්වරයක් ඇත. එහෙත් මේ සංවෘත කෙටි ස්වරයත් දික් ස්වරයත් ලියා දැක්වීමට වෙන ම අකුරු දෙකක් අමුතුවෙන් නිර්මාණය කොටගැනීම අවශ්‍ය වේ.

ඒ සඳහා පහත දැක්වෙන අක්ෂර දෙක යෝජනා කරමි.

| සංවෘත කෙටි ස්වරය | සංවෘත දික් ස්වරය |
|---|---|
|  |  |

මේ අලුත් අකුරු දෙක අවශ්‍ය වන්නේ සිංහල පද ලිවීම සඳහා නොව ඉංග්‍රීසි, ජර්මන් වැනි යුරෝපීය භාෂාවලින් සිංහලයට එන තත්සම පද නිවැරදි ව ලිවීම සඳහා ය.''

දිසානායක, ජේ. බී., **බසක මහිම 1 සිංහල හෝඩිය,** කොළඹ, 2000, 38 පි.

ඇමුණුම 5 ජාත්‍යන්තර සිංහල කේතය

| | 0D8 | 0D9 | 0DA | 0DB | 0DC | 0DD | 0DE | 0DF |
|---|---|---|---|---|---|---|---|---|
| 0 | | ඐ 0D90 | ච 0DA0 | ධ 0DB0 | ව 0DC0 | ◌ැ 0DD0 | | |
| 1 | | එ 0D91 | ඡ 0DA1 | න 0DB1 | ශ 0DC1 | ◌ෑ 0DD1 | | |
| 2 | ◌ං 0D82 | ඒ 0D92 | ජ 0DA2 | | ෂ 0DC2 | ◌ි 0DD2 | | ◌ෲ 0DF2 |
| 3 | ◌ඃ 0D83 | ඓ 0D93 | ඣ 0DA3 | ඳ 0DB3 | ස 0DC3 | ◌ී 0DD3 | | ◌ෳ 0DF3 |
| 4 | | ඔ 0D94 | ඤ 0DA4 | ප 0DB4 | හ 0DC4 | ◌ු 0DD4 | | ෴ 0DF4 |
| 5 | අ 0D85 | ඕ 0D95 | ඥ 0DA5 | ඵ 0DB5 | ළ 0DC5 | | | |
| 6 | ආ 0D86 | ඖ 0D96 | ඦ 0DA6 | බ 0DB6 | ෆ 0DC6 | ◌ූ 0DD6 | | |
| 7 | ඇ 0D87 | | ට 0DA7 | භ 0DB7 | | | | |
| 8 | ඈ 0D88 | | ඨ 0DA8 | ම 0DB8 | | ◌ෘ 0DD8 | | |
| 9 | ඉ 0D89 | | ඩ 0DA9 | ඹ 0DB9 | | ෙ◌ 0DD9 | | |
| A | ඊ 0D8A | ක 0D9A | ඪ 0DAA | ය 0DBA | ◌් 0DCA | ◌ේ 0DDA | | |
| B | උ 0D8B | ඛ 0D9B | ණ 0DAB | ර 0DBB | | ෛ◌ 0DDB | | |
| C | ඌ 0D8C | ග 0D9C | ඬ 0DAC | | | ◌ො 0DDC | | |
| D | ඍ 0D8D | ඝ 0D9D | ත 0DAD | ල 0DBD | | ◌ෝ 0DDD | | |
| E | ඎ 0D8E | ඞ 0D9E | ථ 0DAE | | | ◌ෞ 0DDE | | |
| F | ඏ 0D8F | ඟ 0D9F | ද 0DAF | | ◌ා 0DCF | ◌ෟ 0DDF | | |

# 9

# නාම හා නාම ප්‍රභේද

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : 8.0 | ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | : 8.1 | පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි. |
| **කාලච්ඡේද** | : 10 යි. | |
| **ඉගෙනුම් පල** | : | • නාම ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>• නාම පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>• නාම පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• නාම පද ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.<br>• නාම ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් නාම විභක්තිවල වර නගයි. |

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- ගුණාත්මක යෙදවුම්වල සඳහන් පරිශීලනීය ග්‍රන්ථ කියවා පහත සඳහන් විෂය කරුණු එක්රැස් කර ගන්න.
  - * නාම පදය පිළිබඳ ව නිර්වචන
  - * නාම පදයක ප්‍රකෘතිය සොයා ගන්නා ක්‍රම
  - * නාම පදයක ලක්ෂණ
    - සංඛ්‍යා භේදය (වචන භේදය - ඒක වචන, බහුවචන)
    - ලිංග භේදය (පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග)
    - සචේතන/අචේතන භේදය
    - විභක්ති භේදය
    - නියත/අනියත භේදය (ඒක වචනයෙහි පමණක් ඇත.)
  - * නාම පද ප්‍රභේද
  - * නාම වරනැඟීම
- පාඩමට අදාළ ඉගෙනුම් ආධාරක පිළියෙල කර ගන්න.

  *උදා :* * නාම පදය පිළිබඳ නිර්වචන සහිත පත්‍රිකා, නාම පදයක ලක්ෂණ ඇතුළත් පත්‍රිකාවක්, ඇමුණුම්වල සඳහන් තොරතුරු

ii. **ප්‍රවේශය**

- පාඩම සඳහා පහත සඳහන් ආකාරයේ ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * නාම පදයක් යනු කුමක් ද යන්න පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම පිරික්සීම

  * නාම පදයක් යනු කුමක් දැයි නිර්වචනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම

iii. **ඉගෙනුම සංවර්ධනය**

- නාම පදයක ලක්ෂණ ඇසුරින් නිර්වචන ගොනු කරන්න. (මේ සඳහා ඇමුණුම 1හි සඳහන් ආකාරයේ වචන මාලා කිහිපයක් සහිත ක්‍රියාකාරකමක් සකස් කර ගන්න.)

- නාම පදයක් යනු කුමක් දැයි නිර්වචනය කරන්න. (මේ සඳහා මුඛ්‍ය පද/සංකල්පවල ඇති නිර්වචන යොදා ගන්න.)
- නාම පදයක ප්‍රකෘතිය සොයා ගන්නා ආකාරය විස්තර කරන්න. (මේ සඳහා ඇමුණුම 2හි සඳහන් ක්‍රමවේද යොදා ගන්න.)
- නාම පද ප්‍රභේද විස්තර කරන්න. (මේ සඳහා ඇමුණුම 3හි සඳහන් ප්‍රභේද උදාහරණ සහිත ව විස්තර කරන්න.)
- නාම පද කිහිපයක් වරනැඟීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් උපකරණ යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- මෙහි දී පහත ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරන්න.
  - * නාම පදයක ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කර ගැනීමේ හැකියාව
  - * නාම පද ප්‍රභේද පැහැදිලි කිරීමේ හැකියාව
  - * නාම වරනැඟීමේ හැකියාව

**මුඛ්‍ය පද (Keywords)**

- ''**නාම පද** - නමනුයේ නාම යි.''

  කුමාරතුංග, මුනිදාස., ***ව්‍යාකරණ විවරණය,*** කොළඹ, 2000, 59 පි.

- 'නාම ප්‍රත්‍යයක්' සහිත පදය 'නාම පද'යි මතු දැක්වෙන පද 'නාම පද' වශයෙන් සැලකෙන්නේ ඒවායෙහි ඇතුළත් වන 'නාම ප්‍රත්‍යය' නිසා ය.

| නාම ප්‍රත්‍යය | ප්‍රකෘතිය | ප්‍රත්‍යය | නාම පදය |
|---|---|---|---|
| ආ : | මිනිස් | ආ | මිනිසා |
| එක් : | මිනිස් | එක් | මිනිසෙක් |
| එකු : | මිනිස් | එකු | මිනිසෙකු |
| අකු : | මිනිස් | අකු | මිනිසකු |
| උ : | මිනිස් | උ | මිනිස්සු |
| උන්: | මිනිස් | උන් | මිනිසුන් |
| අ : | කාන්තා | අ | කාන්තාව |
| අක් : | කාන්තා | අක් | කාන්තාවක් |
| අක : | කාන්තා | අක | කාන්තාවක |
| ඕ : | කාන්තා | ඕ | කාන්තාවෝ |
| අන් : | කාන්තා | අන් | කාන්තාවන් |
| අ : | පොත් | අ | පොත |
| අක් : | පොත් | අක් | පොතක් |
| වල් : | රට | වල් | රටවල් |

දිසානායක, ජේ. බී., ***සිංහල රීතිය 7 පද නිර්මාණය,*** කොළඹ, 2014, 40 පි.

- ''නාම යනු ශබ්ද ප්‍රකෘති යි. විභක්ති ප්‍රත්‍යය, තද්ධිත ප්‍රත්‍යය ආදියට පෙරටු ව යෙදී නාම පද, තද්ධිත නාම ආදිය නිර්මාණයට මුල් වන්නේ නාම යි. 'විබතැනට ඇසුරු සද පියවි නම්' යනු සිදත් සඟරා පාඨ යි.

  මිනිස් + ආ - මිනිසා

  මිනිස් + ඉ - මිනිසි

  මෙහි ප්‍රත්‍යය යෝගයෙන් මිනිසා යන නාම පදයත් මිනිසි යන තද්ධිත නාමයත් තැනුනේ මිනිස් යන නාමයෙනි. ''

  පෙරේරා, පී. රූපසිංහ, පද්මා ලංකා රූපසිංහ, **සිංහල ව්‍යාකාරණ අකාරාදිය,** කොළඹ, 2000, 267පි.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1, 2 හා 3

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයෙහි යෙදෙන්න.

- නාම පදයක් යනු කුමක් දැයි නිර්වචනය කරයි.
- නාම පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වයි.
- නාම පද ප්‍රභේද උදාහරණ සහිත ව විස්තර කරයි.
- නාම පදයක් විභක්තිවල වරනැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

කරුණාතිලක, ඩබ්. එස්. - **සිංහල භාෂා ව්‍යාකරණය**

තිලකසිරි, සිරි - **සිංහල වියරණ විදි**

දිසානායක, ජේ. බී. - **නාම පදය**

පෙරේරා, පී. රූපසිංහ, පද්මාලංකා රූපසිංහ - **සිංහල ව්‍යාකාරණ අකාරාදිය**

ජාතික අධ්‍යාපන ආයතනය - **සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)**

**ඇමුණුම 01**

- පහත සඳහන් වගුවල ඇති නාමපද සඳහා උචිත මාතෘකාව වරහන් තුළින් තෝරා ලියන්න.
  (ස්ත්‍රී ලිංග නාම පද, පුරුෂ ලිංග නාම පද, නපුංසක ලිංග නාම පද, ඒක වචන නාම පද, සචේතන නාම පද, අචේතන නාම පද, නියත නාම පද, අනියත නාම පද, බහු වචන නාම පද)

| ................ | ................ | ................ | ................ | ................ | ................ | ................ | ................ | ................ |
|---|---|---|---|---|---|---|---|---|
| මිනිසා | කාන්තාව | ගස | මිනිස්සු | මිනිසා | මිනිසා | ගස | මිනිසා | මිනිසෙක් |
| වලස්සු | නංගිලා | මල | ගැහැනු | ගැහැනිය | ගැහැනිය | මල | ගැහැනිය | ගැහැනියක් |
| දෙවියා | දෙවඟන | බිම් | ගම් | ගම | කාන්තාව | බිම් | කාන්තාව | කාන්තාවක් |
| බමුණෝ | කිඳුරිය | ගම | බමුණෝ | බමුණා | බමුණා | ගම | බමුණා | බමුණෙක් |
| බල්ලා | කිරිල්ලී | මුහුද | ගස් | ගස | බල්ලා | මුහුද | ගස | ගසක් |

**ඇමුණුම 02 නාම පදයක ප්‍රකෘතිය සෙවීම**

''කිසියම් නාම පදයක ඇතුළත් වන 'නාම ප්‍රකෘතිය' වෙන් කොට හඳුනා ගන්නේ කෙසේද? යන ප්‍රශ්නය සාමාන්‍ය පාඨකයෙකුට ඇතිවිය හැකි ය. ඒ සඳහා භාවිත කළ හැකි එක් පිළිවෙතක් නම්, ඒ නාම පදයේ කවර කොටසක් සමාසයක මුල් කොටස වශයෙන් යෙදේ ද යනු විමසා බැලීම යි. සමාස පදයක ඇතුළත් වන පද අතුරින් මුල් ම පදය යෙදෙන්නේ ප්‍රකෘතියකින් පමණක් සැදුණු සරල නාම පදයක් වශයෙන් බැවිනි.

'ඇතා' 'ඇතෙක්' 'ඇත්තු' හෝ 'ඇතුන්' යන නාම පදවල ප්‍රකෘතිය වශයෙන් 'ඇත්' යන කොටස තෝරා ගත්තේ පහත දැක්වෙන සමාසවල මුල් කොටස වශයෙන් යෙදී ඇත්තේ 'ඇත්' යන කොටස බැවිනි.

ඇත් ගාල ඇත් දත්

ඇත් ගොව්වෙක් ඇත් පැටවා''

දිසානායක, ජේ. බී., **බසක මහිම: 6 ප්‍රකෘති,** කොළඹ, 2000, 14 පි.

# 10
# වාක්‍ය රචනය

**නිපුණතාව** : 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින්, ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින්, විචාරශීලී ව කරුණු සංවිධානය කරමින් ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි.

**කාලච්ඡේද** : 5 යි.

**ඉගෙනුම් පල** :
- මාතෘකානුකුල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.
- මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩ නගයි.
- රචනා ලිවීමේ දී තර්කානුකුල ව කරුණු සංවිධානය කරයි.
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථවල 'රචනා' සම්බන්ධ කොටස් හොඳින් කියවා දැනුවත් වන්න.
- ශිෂ්‍යයන්ගේ රචනා ලිවීමේ හැකියාව පිළිබඳ පූර්ව පරීක්ෂාවක යෙදෙන්න.
- ඒ අනුව ශිෂ්‍යයන්ට දිය යුතු උපදෙස් තීරණය කරන්න.

ii. **ප්‍රවේශය**
- සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * ආදර්ශ රචනාවක් පන්තියට ඉදිරිපත් කිරීම හා එමගින් රචනාවක ලක්ෂණ සාකච්ඡා කිරීම
  
  * රචනාවක තිබිය යුතු ගුණාංග පිළිබඳ ශිෂ්‍යයන් සමග බුද්ධි කලම්බන සාකච්ඡාවක් සිදු කිරීම (ඇමුණුම 01 සඳහන් කරුණු යොදා ගන්න.)
  
  * රචනාවක් ලිවීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ හඳුන්වා දීම

iii. **ඉගෙනුම සංවර්ධනය**
- නිදසුනක් ලෙස රචනා මාතෘකාවක් තෝරා ගෙන එය ලිවීමට සූදානම් වන ආකාරය පැහැදිලි කර දෙන්න. (මේ සඳහා ඇමුණුම 1හි සඳහන් රචනා මාතෘකා සහ රචනා සැකිලි භාවිත කරන්න.)
- ආරම්භය, මධ්‍යය හා අවසානය වශයෙන් රචනාවේ ප්‍රධාන කොටස් තුනක් පවතින බව පැහැදිලි කරන්න.
- රචනාවක් ආරම්භ කරන ආකාරය නිදසුන් කිහිපයක් ඇසුරින් ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරමින් මාතෘකාවකට අදාළ රචනා සැකිල්ලක් හුනු පුවරුවේ ගොඩනඟන්න. (මේ සඳහා ඇමුණුම 2 භාවිත කරන්න.)
- රචනාවක් අවසන් කරන ආකාරය නිදසුන් කිහිපයක් ඇසුරින් ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර එක් එක් කණ්ඩායමට රචනා මාතෘකා ලබා

දෙන්න. (ඇමුණුම 2හි මාතෘකා ද භාවිත කළ හැකි ය.)

- මාතෘකාවට අදාළ ව කරුණු එක්රැස් කිරීමටත්, රචනා සැකිලි ගොඩ නැගීමටත් කණ්ඩායම් මෙහෙයවන්න.
- ගොඩ නැගූ සැකිලි අනුව තනි තනි ව රචනා ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන් විසින් ලියන ලද සියලු රචනා නිරීක්ෂණයට ලක් කර අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- සාර්ථක රචනා පන්තියට ඉදිරිපත් කර ඇගයීමට ලක් කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- රචනා ලිවීමේ දී ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම් පරීක්ෂා කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  - * රචනාවක මූලික ලක්ෂණ මනා ව ග්‍රහණය කරන්නේ දැයි පරීක්ෂාකාරී වන්න.
  - * රචනා සැකිලි ගොඩ නැගීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - * රචනා ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
  - * ලියන ලද රචනා අගය කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- රචනාවක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ විස්තර කරයි.
- මාතෘකාවට අදාළ ව රචනා සැකිල්ලක් ගොඩ නගයි.
- කරුණු මනා ව සංවිධානය කරමින් රචනා ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සාර්ථක රචනා කියවා අගය කරයි.

- **අතිරේක පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| තේනබදු, පී. | - | **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** |
| මුනිදාස, කුමාරතුංග | - | **ප්‍රබන්ධෝපදේශය** |
| මුනිදාස, කුමාරතුංග | - | **ප්‍රබන්ධ සංග්‍රහය** |
| විතාරණ, විනී | - | **පද්‍ය, වාක්‍යය හා ඡේදය** |
| සරණංකර හිමි, ගණේගම | - | **රචනා රත්නය** |
| සිරි සීවලී හිමි, බඹරැන්දේ | - | **ලියන කලාව** |

**ඇමුණුම 1 රචනාවක අන්තර්ගත විය යුතු අංග**

1. ආරම්භය
2. සන්දර්භය
3. අවසානය

1. **ආරම්භය**
   * පාඨකයාගේ සිත් ඇදගන්නාසුලු විය යුතු ය.
   * කුතුහලය ඇති කරන්නක් හෝ රසවත් දෙයක් මතු කරන්නක් හෝ වීම සුදුසු ය.
   * අන්තර්ගතය වෙත ළඟා වීමට පහසු වන්නක් විය යුතු ය.

   පහත සඳහන් ආකාරයේ ප්‍රවේශයක් භාවිත කළ හැකි ය.
   - උපුටා ගැනීමක් (ප්‍රස්තාව පිරුළක්, ආප්තෝපදේශයක්, පඬිවරයෙකුගේ කියමනක්, කවියක්, ගීයක කොටසක් ආදිය)
   - තමාගේ මතයක්/අදහසක් ඉදිරිපත් කිරීම
   - යම් කිසි සිදුවීමක් හෝ අවස්ථාවක් පිළිබඳ මනශ්චිත්‍රයක් ගොඩ නැඟීම
   - මාතෘකාව පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කිරීම

2. **සන්දර්භය**
   * රචනාවේ වැදගත් ම කොටස යි.
   * තම මතය හෝ අදාළ අදහස හෝ සනාථ කිරීමට අවශ්‍ය කරුණු තර්කානුකූල ව ඉදිරිපත් කළ යුතු ය.
   * ඡේද හා අනුඡේද අතර මනා සම්බන්ධතාවක් තිබිය යුතු ය.

3. **අවසානය**
   * ඉදිරිපත් කළ කරුණු සංක්ෂිප්ත ව දැක්වීම
   * කරුණු සමාලෝචනය කිරීම
   * නිගමනවලට එළඹීම
   * පාඨකයා දිශානුගත කිරීම
   * කිසියම් ප්‍රාර්ථනයක් ඉදිරිපත් කිරීම

- **රචනාවක තිබිය යුතු ගුණාංග**
  1. නිවැරදි අක්ෂර වින්‍යාසය හා අකුරු පැහැදිලි වීම
  2. නිවැරදි හා අර්ථවත් වචන භාවිතය
  3. ග්‍රාම්‍ය, අශ්ලීල හෝ සංකර වචන නොයෙදීම
  4. නිරවුල් හා නිවැරදි වාක්‍ය භාවිතය
  5. ව්‍යාකරණානුකූල වීම
  6. වාක්‍ය ඒකාකාරී නොවීම
  7. දෝෂාරෝපණය කිරීම් ආදිය නොමැති වීම
  8. ඡේද හා අනුඡේද අතර මනා සම්බන්ධතාවක් තිබීම
  9. කරුණු තර්කානුකූල ව ඉදිරිපත් කිරීම
  10. මුල, මැද, අග අතර මනා සම්බන්ධතාවක් තිබීම

**ඇමුණුම 02 රචනා මාතෘකා**

1. තරගකාරී ජීවන රටාව හේතුවෙන් අභියෝගයට ලක් වන මානව සබඳතා
2. සාවද්‍ය ව්‍යවහාර නිසා සිංහල භාෂාවට සිදු වන බලපෑම
3. රටක සංවර්ධනය කෙරෙහි ජනතා ආකල්පවල වැදගත්කම
4. පරිසර හිතකාමී සංවර්ධන වැඩපිළිවෙළක කාලීන අවශ්‍යතාව
5. ස්ත්‍රී - පුරුෂ සමාජ භාවය හා වත්මන් රැකියා වෙළෙඳපොළ

**රචනා සැකිලි**

- **මාතෘකාව** **සාවද්‍ය ව්‍යවහාර නිසා සිංහල භාෂාවට සිදු වන බලපෑම**

ආරම්භය - * භාෂාවක සාවද්‍ය ව්‍යවහාර යනු කුමක් ද?
* විවිධ සාවද්‍ය ව්‍යවහාර පවත්නා බව

මධ්‍යය - * සාවද්‍ය ව්‍යවහාර - අකුරු ලිවීමේ වැරදි ක්‍රම, අක්ෂර වින්‍යාස දෝෂ, පද බෙදීමේ දුර්වලතා, වාක්‍ය දෝෂ
* සාවද්‍ය ව්‍යවහාර නිසා වැරදි සන්නිවේදන සිදු වන බව
* ඇතැම් සාවද්‍ය ව්‍යවහාර නිසා සන්නිවේදනයට බාධාවක් නො වුවත් භාෂාවේ ජීව ගුණය දුර්වල වන බව

අවසානය - * නිරවද්‍ය ව්‍යවහාරයේ අවශ්‍යතාව
* ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

# 11

# විවිධ ලේඛන වර්ග හඳුනා ගැනීම

**නිපුණතාව** : 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරින් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- විවිධ ලේඛනවල ආකෘති හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විවිධ ලේඛකයන්ගේ භාෂා රටා හඳුනා ගෙන විස්තර කරයි.
- විවිධ ලේඛන සඳහා උචිත භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.
- ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.
- පුවත්පත් වාර්තාවක ස්වරූපය විස්තර කරයි.
- උචිත ආකෘතියට අනුව නිවැරදි ව භාෂාව හසුරුවමින් පුවත්පත් වාර්තා රචනා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- පහත සඳහන් විවිධ ලේඛන වර්ග හොඳින් පරිශීලනය කරන්න.
  - * හෙළ හවුලේ ලේඛන
  - * විද්‍යා ලේඛන
  - * ශාස්ත්‍රීය ලේඛන
  - * ජන මාධ්‍ය ලේඛන (පුවත්පත් වාර්තා, තීරු ලිපි, කතුවැකි)
  - * කට වහර (භාෂණ ව්‍යවහාරය) භාවිත ලේඛන
- මෙම එක් එක් ලේඛනවලට උදාහරණ සැපයීම සඳහා සුදුසු නිදර්ශන ද එක්රැස් කරගන්න.

ii. **ප්‍රවේශය**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් පාඩම සඳහා යොදා ගන්න.

  *උදා :* * විවිධ වර්ගයේ ලේඛන කිහිපයක කොටස් ඇතුළත් පත්‍රිකා කිහිපයක් ශිෂ්‍යයන් අතර බෙදා දී ඒ ඇසුරින් සාකච්ඡාවක් ගොඩ නැඟීම

  * ජන වහරෙන් ලියන ලද ලේඛනයක කොටසක්, කට වහරෙන් ලියන ලද ලේඛනයක කොටසක් සහ ශාස්ත්‍රීය ලේඛනයක කොටසක් ශිෂ්‍යයන්ට අසන්නට සැලැස්වීම හෝ ප්‍රදර්ශනය කිරීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- ප්‍රවේශයෙන් මතු වූ කරුණු ඇසුරෙන් විවිධ ලේඛන වර්ග පවතින බවත්, ඒවායෙහි විවිධ ස්වරූප පවතින බවත් පෙන්වා දෙන්න.
- එම විවිධත්වය :
  - * ආකෘතිය
  - * භාෂා රටාව
  - * භාෂා ශෛලිය
  - * ලිවීමේ ක්‍රමය
  - * ලක්ෂ්‍යගත පාඨකයා

  යන අංශවලින් හඳුනා ගත හැකි බවත් සාකච්ඡා කරන්න.
- පහත සඳහන් විවිධ ලේඛන ශෛලි එකිනෙක ගෙන ඒවායේ විශේෂතා වෙන වෙන ම හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. (මේ සඳහා ඇමුණුම 1හි සඳහන් ලේඛන මෙන් ම වෙනත් සුදුසු ලේඛන ඉවහල් කර ගත හැකි ය.)
  - * හෙළ හවුලේ ලේඛන
  - * විද්‍යා ලේඛන
  - * ශාස්ත්‍රීය ලේඛන
  - * ජන මාධ්‍ය ලේඛන
  - * කට වහර (භාෂණ ව්‍යවහාරය) භාවිත ලේඛන
- ශිෂ්‍යයන් හඳුනා ගත් විශේෂතා වෙන වෙන ම පෙළ ගැස්වීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- විවිධ ලේඛන වර්ග තව දුරටත් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- කිසියම් ලේඛනයක සාර්ථකත්වය උදෙසා ලක්ෂ්‍යගත පාඨකයා නිවැරදි ව හඳුනා ගැනීමත්, උචිත ලේඛන ආකෘතිය, භාෂා රටාව, භාෂා ශෛලිය හා ලිවීමේ ක්‍රමය තෝරා ගැනීමත් වැදගත් බව ශිෂ්‍යයන්ට පෙන්වා දෙන්න.

**iv. තක්සේරුව හා ඇගයීම**

- විවිධ ලේඛන ශෛලි පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීමට මෙන් ම ඔවුන්ගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීමටත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * විවිධ ශෛලියෙන් ලියවුණු ලේඛන එක්රැස් කර පොත් පිංචක් සකස් කිරීමට යොමු කිරීම
  - * විවිධ ලේඛනවල ලක්ෂණ වගු ගත කිරීමට යොමු කිරීම
  - * 'උචිත ශෛලිය හා ආකෘතිය තෝරා ගෙන ලේඛනයේ යෙදීමේ වැදගත්කම' යන මැයෙන් නිදර්ශන සහිත පුවත්පත් ලිපියක් සකස් කිරීමට ලබා දීම
  - * උචිත ආකෘතියකට අනුව අභිමත ශෛලියකින් විවිධ ලේඛන සකස් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම (පුවත්පත් වාර්තා, පුවත්පත් ලිපි, ශාස්ත්‍රීය ලිපි, . . . ආදි වශයෙන්)

මුඛ්‍ය පද **(Keywords)** :

- **රීතිය**

ගද්‍ය හෝ පද්‍ය හෝ උසස් සාහිත්‍ය රචනාවක ඇතුළත් වියයුතු කාව්‍ය ලක්ෂණයකි. එනම් පදයන්ගේ වෙසෙසි ගැළපීම යි. ''විශිෂ්ට පදරචනා රීතිඃ '' යනු කාව්‍යාලංකාර සූත්‍රවෘත්ති පාඨ යි. රීතිය කාව්‍ය යේ ආත්මය බව ''රීතිරාත්මා කාව්‍යස්‍ය'' යනුවෙන් එහි ම දැක්වෙයි.
මේ රීතිය සංස්කෘතයේ කොටස් කීපයකට බෙදේ. වෛදර්භී, ගෞඩී, පාඤ්චාලී, මෛථිලී ආදි වශයෙනි.
විදර්භ, ගෞඩී, පාඤ්චාලි යනාදි ප්‍රදේශවල පවතින්නා වූ ඒ ඒ ගුණ හෙවත් ගතිස්වභා යථා ස්වරූපයෙන් ඒ ඒ ප්‍රදේශවල කිවීන් අතර ද පවත්නා බැවින් ඒ ඒ නාම ව්‍යවහාර කරනු ලැබේ. නො එසේ ව ඒ ඒ ප්‍රදේශ කාව්‍ය කෙරෙහි බල පවත්වන නිසා නොවන බව සැලකිය යුතු ය. දණ්ඩීහු ''රීති'' යන්න ''මාර්ග' යනුවෙන් ද හඳුන්වති. අද්‍යතන ලේඛනයෙහි ව්‍යවහාර වන ''ශෛලිය'' යන්න හා සසඳනු වටී.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 172 පි.

- **ශෛලිය**
**(Style)**

ශෛලිය නම් ප්‍රකාශන විලාසයයි.
ශෛලිය කථනයට මෙන් ම ලෝඛනයට ද අදාළ වේ. කථනයේ දී හෝ ලේඛනයේ දී කථකයා හෝ ලේඛකයා විසින් භාවිත කරනු ලබන වාංමාලාව, තානය, වාගාලංකරණ ආදිය ශෛලියට අයත් වේ. ශාස්ත්‍රීය ලේඛනයක දී විෂය කරුණුවලට මුල් තැන ලැබෙන බැවින් නිශ්චිතාර්ථවත් ශෛලියක් භාවිත කිරීම අපේක්ෂා කෙරේ. නිර්මාණාත්මක කෘතියක දී අදහස් පසුබා වින්දන සන්නිවේදනය ඉස්මතු වන බැවින් එකී කාර්යයට උචිත ශෛලියක් භාවිත කළමනා වෙයි. තව ද එක් එක් අවස්ථාව අනුව ශෛලිය වෙනස් කිරීමට ද සිදුවනු ඇත.
භාරතීය විචාරයෙහි සඳහන් වන ප්‍රාණ, ගුණ, රීති, අලංකාරය ආදි සියල්ල ශෛලියට අයත් වේ.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 203 පි.

- වාග්විලාසය
**(Diction)**

කථනයේ දී හෝ ලේඛනයේ දී හෝ වචන තෝරා ගළපාගනු ලබන ආකාරය. නාට්‍යයේ දී වාග්විලාසය වැදගත් වන බව ඇරිස්ටෝටල් විසින් ද සඳහන් කරන ලදි.
''ශෝකෝත්පාදක නාට්‍යයේ සවැදෑරුම් අංග අතුරින් සතර වැන්න නම් වාග්විලාසය යි ...... වාග්විලාසය යන්නේ අදහස් වනුයේ අර්ථ ප්‍රකාශනය සඳහා වචන භාවිත කිරීම යි. එහි කාර්යය ගද්‍ය පද්‍ය දෙකේහි දී ම එක් සමාන වන්නේ ය.''
(කාව්‍ය ශාස්ත්‍රය 6 පරි., 48 පි.)
වාග්විලාස භාවිතය ගැන ද ඇරිස්ටෝටල් කරුණු දක්වයි.
''ක්‍රියාකාරිත්වය, චරිත නිරූපණය සහ චින්තනය යන අංග කෙරෙහි අල්ප අවධානයක් දැක්වෙන අවස්ථාවන්හි විචිත්‍ර වාග්විලාසය යෝග්‍ය වෙයි. අතිශයින් විචිත්‍ර වාග්විලාසය චරිත නිරූපණයට මෙන් ම චින්තනයට ද බාධා පමුණුවයි.''
වාග්විලාසය සහ ශෛලිය අතර ඇත්තේ සමීප අර්ථ දෙකකි. වාග්විලාසයේ දී ශබ්දෝච්චාරණය, අවධාරණය, උදාත්තය ආදි අංශ වැදගත් වේ. ශෛලියේ දී වැඩි අවධානය යොමු වන්නේ භාෂා ප්‍රයෝග කෙරෙහි ය.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 182-183 පිටු

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ලේඛන වර්ග සඳහා නිදසුන් ඇතුළත් කාඩ් පත්
- පුවත් පත්, සඟරා, පොත් පත් ආදියෙන් උපුටාගත් විවිධ වර්ගයේ ලේඛන
- **අතිරේක පරිශීලනීය ග්‍රන්ථ**

| | |
|---|---|
| කෝපරහේවා, සඳගෝමි | - **විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය** |
| කෝපරහේවා, සඳගෝමි | - **සිංහල පුවත්පත් කලාවේ පුරෝගාමියෝ** |
| කෝපරහේවා, සඳගෝමි | - **සිංහල පුවත්පත් කලාවේ මෑත ඉතිහාසය** |
| දිසානායක, ජේ. බී. | - **කිච්චහම මොකද** |
| පරණවිතාන, සෙනරත් | - **සිංහලයෝ** |
| ප්‍රඥාරාම හිමි, යක්කඩුවේ | - **වන කතා** |
| මානවසිංහ, ශ්‍රී චන්ද්‍රරත්න | - **වගතුග** |
| මානික්කආරච්චි, සිසිර කුමාර | - **අපේ පොතේ එහෙම නැතේ** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - **සාහිත්‍ය විද්‍යාව** |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- විවිධ ලේඛන වර්ගවල ලක්ෂණ වෙන් වෙන් ව විස්තර කරයි.
- ලේඛනයක සාර්ථකත්වය සඳහා උචිත ආකෘතිය, භාෂා ශෛලිය හා භාෂා රටාව තෝරා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.
- විවිධ වර්ගයේ ලේඛන කියවීමට පෙලඹෙයි.
- විවිධ වර්ගවල ලේඛන එකතුවක් සකස් කරයි.

ඇමුණුම 1 විවිධ ලේඛන වර්ග

## i. හෙළ හවුලේ ලේඛන

## ප්‍රබන්ධ වස්තුව

අදහස් ප්‍රකාශ කිරීම සමාජ ජීවිතයෙහි ඉතා උත්තම කාර්යයෙකි. දත්තවුන් ගේ දැනුම් දැනැ, නොදත්තෝ ද දත්තෝ වෙති. සමාජය ගුණඥානාදි උත්තම මනුෂ්‍ය ධර්මයෙන් වැඩෙනුයේ ඒ මඟිනි. අධ්‍යාපනයේ උසස් මැ අංගයෙක් නම් එකකු ගේ අදහස් සෙස්සවුනට ඉඳුරා පවසන්නට පුරුදු කිරීම යි.

පැවැසීමේ ප්‍රධාන ක්‍රම දෙකෙකි. එකෙක් කීම යි. අනෙක ලියා දැක්වීම යි. එක් කාරණයක් අරමුණු කොටැ-ගෙනැ, ඒ පිළිබඳ වැ දැන්වියැ යුතු සියල්ල පිඬු කොටැ-ගෙනැ පිළිවෙළකට සකස් කොටැ, දන්වන්නහු ගේ ද දැන්වෙන්නවුන් ගේ ද ශක්තියට අනුරූප වන සේ කියා හෝ ලියා හෝ පාති. කියා පාන කලැ එයට දේශනාවෙකැ යි ද, ලියා පාන කලැ ප්‍රබන්ධයෙකැ යි ද කියත්. සත්‍ය වශයෙන් නම් දෙ තන්හි මැ වනුයේ එක මැ ප්‍රබන්ධය යි. වෙනස් වනුයේ ඒ ප්‍රබන්ධය ප්‍රකාශ කිරීමේ ක්‍රමය පමණෙකි.

'ප්‍ර' යන උපසර්ගය යැ, 'බන්ධ' යන්න යැ යන දෙක එක් වැ 'ප්‍රබන්ධ' යනු නිපන්නේ යැ. 'උසස් ලෙස' යනු යැ 'ප්‍ර' උපසර්ගයේ අර්ථය. 'බන්ධ' යනු 'බඳනා ලද' යන අර්ථ ඇත්තේ යැ. එ හෙයින් ප්‍රබන්ධයෙක් නම් උසස් කොටැ බඳනා ලද්දෙකි.

කිමෙක් බඳනා ලැබේ ද?

කෙසේ බඳනා ලැබේ ද?

කෙසේ උසස් කරනු ලැබේ ද?

යන ප්‍රශ්න තුනෙක් මෙහි ලා උපදී. ප්‍රබන්ධය නිසි පරිදි හැඳිනැ-ගන්නට නම් මේ ප්‍රශ්න තුනට සුදුසු උත්තර සැපැයියැ යුත්තේ යැ.

**කිමෙක් බඳනා ලැබේ ද?**

අනුන් විසින් දැනැ-ගත යුතු වූ අර්ථයෙන් බඳනා ලැබේ; සහල් නැළියක් මනන්නකු විසින් නැළිය ගන්නා තාක් සහල් එහි ලියැ යුතු යැ. අඩු වුව හොත් නැළියෙක් නො වේ. වැඩි වුව හොත් පිට යෙයි. අර්ථයක් ප්‍රකාශ කරන්නක්හු විසිනුත් එය අඩු නො කළ යුත්තේ යැ. වැඩි ද නො කළ යුත්තේ යැ. යම් සේ සහල් නැළිය අනූන කොටැ අනධික කොටැ මනනා ලද්දේ 'ප්‍රමිත' නම් වේ ද, එ සේ මැ අර්ථය අනූන කොටැ අනධික කොටැ බඳනා ලද්දේ 'ප්‍රබන්ධ' නම් වේ. එ සේ බඳනා ලබන අර්ථයට 'වස්තු' යනු නමි.

**කෙසේ බඳනා ලැබේ ද?**

වාක්‍යයෙන් බඳනා ලැබේ. මෙය කියවන්නෝ 'වාක්‍ය' නම් කිමෙක් ද යනු දනිති. වස්තුව අනූනාධික කොටැ පැවැසීමට යම් පමණ වාක්‍ය වුව මනා වේ ද, ඒ සියල්ලෙහි වස්තුව බඳනා ලද්දේ යැ. වාක්‍ය බන්ධනයට සන්දර්භ යැ යි කියත්. නිසි පරිදි එක් කොටැ ගොතන ලද්දේ 'සන්දර්භ' නමි.

**කෙසේ උසස් කරනු ලැබේ ද?**

ක්‍රමවත් කිරීමෙන්, නිදොස් කිරීමෙන්, රසවත් කිරීමෙන් උසස් බව (උත්කර්ෂණය) ඇති වේ. මේ සියල්ලට සාධාරණ ධර්මයෙකි. එ හෙයින් බන්ධනය උසස් වැ ප්‍රබන්ධ බවට පැමිණීමට නම්, වස්තුව ද, එය බැඳීමට ගන්නා වාක්‍ය ද, ක්‍රමවත් වියැ යුතු යැ, නිදොස් වියැ යුතු යැ, ගුණවත් වියැ යුතු යැ, රසවත් වියැ යුතු යැ. තව ද ඒ ඒ ස්ථානයට සුදුසු වූ ස්වභාවයෙක් වේ ද, එයිනුදු යුක්ත වියැ යුතු යැ. එ හෙයින් පුරාතනයෝ 'ප්‍රබන්ධයෙක් නම් සංඝටිත වූ නානා වාක්‍ය සමුදායයෙකි' යි කී හ.

මෙ සේ ප්‍රබන්ධයෙහි ලා කරුණු තුනක් උගත යුතු බව පෙනේ. එනම්,

1. වස්තු
2. සන්දර්භ
3. උත්කර්ෂණ

යන මේ තුන යි. මේ එක එක විස්තර වශයෙන් පිරික්සා බැලියැ යුතු වේ.

මුනිදාස, කුමාරතුංග, **ප්‍රබන්ධෝපදේශය**, කොළඹ, 2010, 09-11 පිටු

## සුනිලුන් මිහිඳුවට ගිය දා

1948 නිදහසේ අරුණ හෙළය පුරා පැතිරෙමින් තුබූ අවදියේ ගාල්ලේ මිහිඳු විදුහලේ ද මේ අරුම සිදුවීමෙක් වී. එ නම් ගුරුදෙව් කුමරතුඟු මුනිදසුන් ගේ වියොවින් පත් එම සතර වන වසරෙහි ගාල්ලේ මිහිඳු විදුහලෙහි පැවත්වුණු හෙළ හවුල් සමුළු රැස්වීම යි.

විරුසේකර වියත් හෙළ නයුවාණන් ගේ මුළු නයු බැවින් සැදෙන ඒ මුළුවට හවුල් වීම සඳහා රැයිපියෙල් තෙන්නකෝන්, අමරසිරි ගුණවඩු, ගම්හේවා ගුණවඩු, මොහොට්ටි දොණු දේවිඳු, වෙල්ලාල ජයමහ, කිත්සිරි කුමරසිහි ඈ දෙටු පෙළේ සුබැසියෝ ද කල් තියා ම පැමිණැ උන් හ. එහෙත් මේ මුළුයෙහි වෙසෙසි අමුත්ත වූයේ ගාලු පුරවරයෙහි ජන හමුවෙකැ පළමු වරට මේ අරුම පුදුම මහා ගීත

කෝකිලයාණන් ගේ ජන දැක්ම යි.

සුනිල් සාන්තයන් හඬින් හඳුනාගෙන රුවින් ද ඔවුන් හඳුනාගනු කැමැත්තෙන් ආ මිහිඳු විදුහලේ සිසුවන් ගෙන් මෙන් මැ අවටැ විදුහල් සිසුවන් ගෙන් ද මේ දිනැ මිහිඳු විදුහල් රැස්වීම් හලින් වැඩි ඉඩ පිරෙත් මැ පසු පසු වී ආවෝ හලේ පිල ද අවට මිදුල ද පුරවා ලූ හ.

මුළුව ඇරැඹුණේ හෙළ දජය එසැවීමෙනි. 1815 දී බානු ලැබූ සිංහල දජය නිල විසින් එසැවීමක් නො ලත් එ වන් යුගයෙකැ එය ඔසවනු ලැබීම කෙබඳු හැඟුම්හුරු මොහොතකට අප පත් කළා ද යනු විස්තර කළ නොහැකි තරම් යැ.

මිහිඳු විදුහල් පති ඊ. ඒ. විජේසූරිය සූරීන් විසින් රැස්වීම් හල ඉදිරියේ වූ කොඩි කණුව මුදුනට හෙළ දජය නඟද්දී රැස්වීම් හලෙහි කරළියෙන් නැගුණු මේ ගී රැවු සිසු නිවෙස් පිහිටි එහා කන්දේ ද පිළිරැව් දෙන්නට වී.

ඉදිරියට මැ යවු හෙළයනි
ඉදිරියට මැ යවු
මරුට සිනා සෙවු හෙළයනි
මරුට සිනා සෙවු

පෙරැ සිටි අප ගේ මුත්තෝ
දිවි දී දැය රැකැගත්තෝ
වමු ද ඉතින් අපි ගැත්තෝ
ඉදිරියට මැ යවු

අප ගේ රටෙහි මැ යැදැ යැදැ
ගැති වී තව තව හිඳිමු ද
නිදහස නැති දිවි කුමට ද
ඉදිරියට මැ යවු

අප බස හෙළ අප රැස හෙළ
අප දෙස හෙළ හෙළ හෙළ හෙළ
නුවණත් හෙළ නිවනත් හෙළ
ඉදිරියට මැ යවු

ගුත්තිල ඇදුරිඳු ගේ වෙණ නද ලොබින් සියොතුන් නුබ සර හැර උන් හයි ගුත්තිලකරු කළ වැනුම සැබෑ බව පළ කරන්නට මෙන් මහ මඟ (එලියට් පාරේ - අද වුඩ්වඩ් මාවතේ) ගමන් ගත් රිය පෙළ නවතා සුනිල් හඬට කන් දුන් බව ද, ඒ පිරිසින් ඇතැමකු යන ගමන නවතා මේ මහා ගයුවාණන් දැකැගැන්මේ රිසින් මිහිඳු විදුහල වෙත පිය නැගූ බව ද පසු වැ දැනැගන්නට ලැබිණ.

කුමරතුඟු මුනිදසුන් ගේ හෙළ විරු ගීය ද සුනිලුන් විසින් මේ මුළුයෙහි ගැයිණි.

පෙර හෙළයෝ රණ ගොසින්
ඉපිලැ නටති මහ තොසින්
අද සිංහළයෝ ඇසින්
තෙමෙති යුදෙකැ යන බසින්

ඇ විසින් සුනිලුන් විසින් විරු ගීයකට සුනිසි සේ තනුවක් කරනු ලැබූ ඒ ගීය මුළු සබය දැ ඔදින් රණ මතින් කුල්මත් කළා සේ වී.

'එඩිය' සඟරාව මඟින් පැවැත්වුණු දැ ගී තරග පැබැඳුම් අතුරින් මුල් තැන් ගත් ගීය සඳහා ද මේ මුළුයෙහි තැනක් ලැබීම වෙසෙසින් සඳහන් කළ යුතු දෙයකි.

මේ තරගයෙන් දිනූ දෑ ගී පබඳෙහි පබඳුවාණන් වූයේ එ වකැ මිහිඳු විදුහල්හි සරසවි පිවිසුම් පෙළෙහි උගැන්ම ලබමින් උන් කේ. පී. ඒ. නන්දදාස (අද නන්දදාස කෝදාගොඩ) නමැති සිසුවා යි.

හෙළ හවුල් සමුළුව බඳු උසස් සබයෙකැ සුනිල් සාන්තයන් බඳු අසම ගයුවාණ කෙනකුන් විසින් මිහිඳු සිසු දරුවකු ගේ පැබැඳුමක් ගයනු ලැබීම හැදෙන වැඩෙන සිසු පරපුරට කැරුණු ඉමහත් හරසර පිදුමක් මැ වූ බව සිසුන් එයට පිළිසර විසින් නැංවූ ඉමහත් අත් පොළසන් නදින් හැඟී ගියේ ය.

අහුබුදු, අරිසෙන්, **සුනිල් සමර සුනිල් සාන්ත උපහාර අංකය,** කොළඹ, 2001, 123 - 124 පිටු

## ii. විද්‍යා ලේඛන

### කුහුඹුවා

අපි කවුරුත් කුහුඹුවා අඳුනමු. උගේ පුදුම කථාව යම්තම් වත් දන්නා අය අප අතර බොහොම හිඟ ය. උගේ ගති පැවතුම් පරීක්ෂා කළ ශාස්ත්‍රඥයෝ මවිත වූහ. කුහුඹුවෝ මිනිසුන් මෙන්, සමාගම් වී වාසය කරති; වාසයට ගෙවල් සාදා ගනිති; ගෙවල් කාමරවලට බෙදා ගනිති.

මිනිසුන් පාලනය කරන්ට රජෙක් සිටියි. රජුට මිනිස්සු බොහොම ගෞරව ආදර දක්වති, සලකති. කුහුඹුවන්ට ද රජෙක් සිටියි. කුහුඹුවන්ගේ රජ ගැනු සතෙකි. එහෙයින් ඇයට 'කුහුඹු රැජින'යි කියති. අනෙක් කුහුඹුවෝ මේ කුහුඹු රැජිනට ගෞරව කරති. ඇය ආරක්ෂා කරති. කුහුඹුවන්ට මෙන් මීමැස්සන්ට ද රැජිනක් සිටියි.

පොල් ගසක අත්තක හෝ වෙන යම් කිසි ගසක අත්තක හෝ ඇතැම් විට මීමැස්සෝ රැස් වෙත්. මෙසේ එකා පිට එකා හිඳ ගැනීමෙන් රැස්වූ මීමැසි කැල (= රංචුව) පණ ඇති බෝලයක් වැන්න. පොල් අත්තේ එක තැනක ම මීමැස්සන් තෙරපි තෙරපී මෙසේ රැස්වීමට හේතුව කිම? ඔවුන්ගේ රැජින වට කොට සිට ගැනීම ඔවුන්ගේ පුරුද්ද ය. හේතුව එය යි. අත්තෙහි එල්ලුණු මීමැසි කැලගේ රජ මැස්සා ඉවත් කළහොත් අනෙක් මැස්සෝ ද වහා විසිර යෙති. රජ මැස්සා තබන තැනක ඔවුහු නැවතත් රැස්වෙති.

කුහුඹුවෝ ද ඔවුන්ගේ රැජිනට මෙසේ ගෞරව ආදර කරති. කුහුඹු රැජිනට පිහාටු ඇත්තේ ය. පසුව ඇගේ ඒ පිහාටු හැළේ. අනතුරු ව කුහුඹු රැජින කූඩුවක් සාදන්ට පටන් ගනියි. ඇතැම් විට ඈ බිම හාරා කූඩුව සාදයි; ඇතැම් විට ගසක් මුල කූඩුව සාදයි; නො එසේ නම් බිත්ති මුල්ලේ පස් බුරුල් වූ තැනක කූඩුව සාදයි. කූඩුව සාදන්නේ ඒ ඒ කුහුඹු වර්ගයන්ට පුරුදු වුණු පුරුදු වුණු හැටියෙනි.

ඇතැම් විට එක කූඩුවක කුහුඹු රැජිනෝ කීප දෙනෙක් වෙති. එවිට එක එක රැජිනට එක එක කුහුඹු පවුල බැගින් ඇත්තේ ය. ඒ කුහුඹු රැජිනන් හා ඔවුන්ගේ පවුල් ද එක ම කූඩුවේ වාසය කිරීම ඔවුන්ගේ සිරිත ය.

කුහුඹු රැජින කරන්නේ කූඩුව සෑදීමට යම්තම් මුල පිරීම පමණකි. ඇය කූඩුව සෑදීමට මුල පුරා බිත්තර දමයි. ඒ බිත්තර මේරීමෙන් පිළවු වෙති. කුහුඹු රැජින විසින් ම ඒ පිළවුන්ට කෑම සපයා දිය යුතු ය. ඒ පිළවු ක්‍රමයෙන් වැඩී කුහුඹුවෝ වෙති.

එතැන් සිට රැජින කූඩුවෙන් පිටත නොයයි. ඈ එහි නැවතී සිටගෙන බිත්තර දමන්ට පටන් ගනියි. පළමු බිත්තරවලින් උපන් කුහුඹුවෝ රැජින පසුව දමන බිත්තර ආරක්ෂා කරති; පුපුරා පිළවුන් වූ කල කෑම සොයා ගෙනැවිත් කවමින් ඔවුන්ට සාත්තු කරති. තවත් සමහරු ගෙය ලොකු කරමින් සාදති.

කුහුඹු රැජින මෙතැන් සිට බිත්තර දමන යන්ත්‍රයක් වැන්න. ඇගේ බඩ ද බිත්තරවලින් පිරී බෙරයක් මෙන් පිපෙයි.

ඇතැම් විට අප අකැමැත්තෙන් වුව ද කුහුඹුවෙක් අපේ අත ඔස්සේ බඩගාන්නේ ය. කකුල ඔස්සේ බඩගාන්නේ ය. කුහුඹුවා බඩගාන බව කියතත් ඌ කකුල් හයෙන් ගමන් කරන්නෙකි; සර්පයන් හා පණුවන් මෙන් බඩගාන්නෙක් නොවේ. අපේ අත ඔස්සේ ගමන් කරන කුඩා කුහුඹුවා, කළු නම් අප දෂ්ට නොකරයි. රතු පාටට හුරු කුහුඹුවකු නම් ඌ අප දෂ්ට කරයි.

කළු කුහුඹුවා අහිංසක සතෙකි. රතු කුහුඹුවා අපට ටිකක් රිදවන්නෙකි. අපට රිදවන කළු කුහුඹුවෙක් ද සිටියි. ඔවුන්ගෙන් එක් වර්ගයක් සාමාන්‍ය කුහුඹුවන්ට වඩා ලොකු ය. ඔවුන්ට 'කඩියෝ' ය කියති. සපා කන තවත් කළු කුහුඹු වර්ගයකට 'කොඩයෝ' ය කියති.

දකුණු පළාතේ ඇතැම් ගම්වල ළමයි රතු කුහුඹුවාට 'නයි හින්නා'යි කියති. ඌට ඒ නම දෙන්ට ඇත්තේ ඌ දෂ්ට කළ විට විස දැනෙන බැවිනි. කළු කුහුඹුවාට දකුණු පළාතේ සමහරු 'කළු හින්නා'ය කියති. සපා නොකන රතු පාටට හුරු කුහුඹු වර්ගයක් ද සිටියි. ඔවුන්ගේ කකුල් දික් ය. ඔවුහු පැණි රස දේට ඉතා ආශා ඇත්තෝ ය. ඔවුන්ට 'ඇඹිලයෝ'යි කියති. පැණිරස දේ කෑමට බොහෝ ආශා ඇති ළමයකුට ඇතැම් ගැනු 'හරියට මූ ඇඹිලයා වාගේ යි කියති.

කුරුමිණි සතුන්ට මෙන් කුහුඹුවාට ද හිසය, ළපැත්තය, උදරය යයි කොටස් තුනෙකි. කකුල් හයෙකි. හොස්සෙන් ඇදුණු අඬු දෙකෙකි. කුහුඹුවා මේ අඬු දෙක අතපත ගෑම සඳහා යොදයි.

මිනිසුන් අතර මෙන් කුහුඹුවන් අතර වැඩකාරයෝ ය, සාත්තු කාරයෝ ය, වාල්ලු ය, යුද්ධ කාරයෝ ය, යන ආදි වශයෙන් එක එක කාරියට වෙන වෙන ම පුරුදු වූවෝ සිටිති. ටිකක් සෙවිල්ලෙන් කුහුඹුවන් දෙස බැලුව හොත් සමහරුන්ගේ හිස් කුඩා බව පෙනී යයි. සමහරුන්ගේ හිස් ලොකු ය. සමහරුන්ට පිහාටු ඇතත් සමහරුන්ට පිහාටු නැත. වැඩ කරන කුහුඹුවාගේ හිස ලොකු ය; ඌට පිහාටු නැත. ඔක්කොම වැඩකාර කුහුඹුවෝ ගෑනු සත්තු වෙත්. යුද්ධකාරයන්ට අනික් කුහුඹුවන්ට වඩා ලොකු හකු ඇත්තේ ය. පිරිමි කුහුඹුවන්ට ගෑනු කුහුඹුවන්ට වඩා ලොකු ඇස් ඇත්තේ ය.

ඇගේ එල්ලුණ රතු කුහුඹුවා හකු දෙකෙන් හම විකයි. ඒ එක්කම ඌ උදරය නමා ගනියි. නමා ගත් විට උගේ යටි බඩ කෙළවර තුඩ හක්කට ම ළං වේ. කුහුඹුවකු සපා කෑ විට විසක් දැනෙන්නේ සපා කෑම නිසා ම නොවේ. හකු දෙකින් සපා කෑමෙන් වූ ඇබිති තුවාලයට කුහුඹුවා තමාගේ උදරය තුඩින් විස දෙයක් විදියි. වේදනාව දැනෙන්නේ මේ විස තුවාලයේ තැවරීමෙනි.

පැණි, මී පැණි. සීනි, ගෙඩි ජාති සහ කුඩා කුරුමිණි සත්තු කුහුඹුවන්ට ආහාර වෙති. ගෙමිදුලේ වැවෙන මල් පැළවලත් එලවුළු පැළවලත් ඇතැම් කාලවල කුඩා සත්තු වගයක් හටගනිත්. මොවුහු හැඩහුරු කමින් ඇඳ මකුණන්ට අසමාන නොවෙත්. පාටින් නම් ඇඳ මකුණන්ට සමාන නොවෙත්. කොළවලත්, කඳෙත්, ඉතිවලත්, නටුවලත්, ගෙඩිවලත් හටගන්නා මේ කුඩා සතුන්ට 'ලැටි' යයි කියති.

සමහර ලැටි අළු පාට ය; සමහරු සුදු පාට ය; සමහරු රතුපාටට හුරු ය. ගසක ලැටි සැදුණු විට එහි කුහුඹුවෝ පිරෙති. ලැටි සහිත ගසක වහන කුහුඹුවන් ලැටින් මරාගෙන කන බව සමහරු විශ්වාස කරති. එය වැරදි කල්පනාවකි. කුහුඹුවෝ ලැටින් නොමරති. ලැටියෝ කුහුඹුවන්ගේ කිරි එළදෙන්නු ය. මිනිස්සු එළදෙනුන් බැඳගෙන කවා පොවා සාත්තු කොට කිරි දොවාගෙන බොති. මෙය මිනිසුන් හැර අනෙක් සතුන් නොදන්නා කාරියකැ යි සමහරු පුරසාරම් දොඩති. මිනිසුන්ට මෙන් නුවණ නැතත් කුහුඹුවෝ ද, කිරි එළදෙනුන්ගෙන් ප්‍රයෝජන ගනිති. කුහුඹුවන්ගේ කිරි එළදෙන්නු ඉහත කියූ ලැටියෝ ය.

කිරි දොවින ස්ත්‍රිය එළදෙනගේ හිස අත ගා නැවත බුරුල්ල ද අත ගායි. එවිට කිරි එළදෙනගේ බුරුල්ලට කිරි එරෙන්නේ ය. කුහුඹුවා ද ලැටියාට ළංව උගේ හොස්සේ අඬු දෙකෙන් ලැටියාගේ යටි බඩ අතගායි. එවිට ලැටියා උදරය කෙළවර කුහරය සහිත තුඩකින් පැණි බින්දුවක් එවයි. කුහුඹුවා ඒ පැණි බින්දුව ලෙව කන්නේ ය. ඇතැම් කුහුඹුවෝ ලැටින්ගේ බිත්තර තමන්ගේ කුඩුවලට ගෙනයති; එහි දී බිත්තර මේරීමෙන් පැටියෝ හට ගැනෙති. ඒ පැටවුන් නැවත උස්සා ගෙන ගොස් අමු කොළවල තබති. ලැටි පැටවු කොළවල ඉස්ම උරා ගෙන බොමින් වැඩෙති. වැඩුණු පසු කුහුඹුවෝ ලැටින්ගෙන්

කිරි දොවා ගනිති. එනම්: ඉහත කී ලෙස කුහුඹුවෝ ලැටියා අත ගා පැණි බින්දුව බින්දුව මිරිකා ගෙන ලෙවකති.

වික්‍රමසිංහ, මාර්ටින්, **විද්‍යා විනෝද කථා**, නාවල, 1991, 149 - 152 පිටු

## මිනිසා උඩුගුවනේ පදිංචියට යයි...?

'වේගයෙන් වැඩි වන ලෝක ජනගහනය දෙස බලනා විට මිනිසාගේ උවමනාවන් සපුරාලීමට පෘථිවිය සමත් නොවන දිනයක් උදාවනු නොඅනුමාන ය. එවිට මානව වර්ගයා උභතෝකෝටික ගැටලුවකට මුහුණ දෙනු ඇත. ඒ ඒ රටවල පවතින සමාජ රටාව අනුව නො ව එක්සත් ව, සමගි ව, පොදු තීරණයකට එළඹීමට මිනිසාට සිදුවනු ඇත. පෘථිවි ගෝලයේ සම්පත් මුළුමනින් ම අවසාන වන දිනය ළඟා වීමට තව බොහෝ කල් ඇතත්, දැනටමත් සූර්ය ග්‍රහ මණ්ඩලයේ වෙනත් ග්‍රහ ලෝකයන් කරා මං එළිපෙහෙළි කිරීමට අපි සමත් වී සිටිමු. අභ්‍යවකාශය තුළ සිය වාසස්ථාන ඇති කර ගැනීමට නුදුරු දිනෙක මිනිසා ඉදිරිපත් වනු ඇතැයි සිතීම හුදෙක් හිතළුවක් නො වේ.'

සුප්‍රසිද්ධ සෝවියට් රුසියානු විද්‍යාඥයකු වන කොන්ස්තන්තීන් ෆ්යෝදරව් මිය යාමට ටික කලකට පෙරාතු ව මාධ්‍යවේදියකු සමඟ කළ සාකච්ඡාවක දී කරන ලද ප්‍රකාශයකි ඒ.

අභ්‍යවකාශය මිනිසාගේ මීළඟ නිවහන කර ගැනීම පිළිබඳ සංවාදය දැන් දශක කිහිපයක සිට විද්‍යාඥයන් අතර උණුසුම් ව කෙරෙමින් පවතින්නකි.

අසූව දශකයේ අගභාගයේ ඇමෙරිකානු නාසා ආයතනයේ අධ්‍යක්ෂවරයා ව සිටි ජේ. ෆ්ලෙචර් වරක් මෙසේ පැවසී ය; 'තව වසර සියයකට පසුව වර්තමාන යුගය අභ්‍යවකාශ ශිෂ්ටාචාරයේ ආරම්භය ලෙසින් හැඳින්වීමට ඉඩ ඇත. උඩුගුවනට දොර විවෘත වූ දා සිට මෙතෙක් ගත වූ කාලය තුළ අභ්‍යවකාශ ගවේෂණ තුළින් ලැබූ ජයග්‍රහණ අතිවිශාල වෙයි. අද නවීන විද්‍යාවේ දියුණුව බොහෝ දුරට අභ්‍යවකාශ විද්‍යාව මත රඳා පවතී. එය කෙතරම් ඉක්මනින් සිදුවන්නේ ද යත් අපි බොහෝ දෙනෙක් ඒ පිළිබඳ ව අවධානය යොමු කිරීමට පවා අසමත් වීමු. අභ්‍යවකාශ යුගයේ හැත්තෑ වැනි සංවත්සරය උදා වන ක්‍රි.ව. 2027 වන විට අභ්‍යවකාශයේ පළමු දරු උපත පිළිබඳ ව නාසා ආයතනයේ අනාගත අධ්‍යක්ෂවරයා විසින් ලොවට දැනුම් දීමට ඉඩ ඇත.'

හඳෙහි මිනිසා පදිංචි කරවීම, අඟහරු ලෝකය තරණය කිරීම වැනි තේමාවන් දැන් වසර ගණනාවක සිට අජටාකාශගාමීන්ගේ අන්තර්ජාතික සමුළු, සම්මන්ත්‍රණවල දී දැඩි සංවාදයකට බඳුන් වෙමින් පවතී. අජටාකාශගාමීන්ගේ මෙම අනාගත සැලසුම් හුදු මනඃකල්පිත ඒවා නො ව ක්‍රියාවට නැංවිය හැකි යථාර්ථවාදී ඒවා ලෙස සලකන විද්‍යාඥයන්ගේ ගණන විශාල ය. ඒ අතර ම, මෙම වැඩ සටහන් මායාවන් ලෙසින් සලකා දැඩි විවේචනයට ලක් කරන විශේෂඥයන්ගේ ගණන ද සුළුපටු නො වේ. මේ අනුව බලනා විට, අභ්‍යවකාශ තාක්ෂණයේ නූතන හැකියාවන් පදනම් කරගෙන මානව සංහතියේත් අප ග්‍රහ ලෝකයේත් අනාගත ඉරණම පිළිබඳ ව අනාවැකි පළකිරීම පහසු කටයුත්තක් නොවන බව පැහැදිලි ය.

ඇමෙරිකානු විද්‍යාඥයකු වන ජේ. ඕ. නීල් මේ සම්බන්ධයෙන් ස්වාධීන ආකල්පයක් දරයි. අභ්‍යවකාශයේ මිනිස් වාසස්ථාන තැනීමට නූතන තාක්ෂණයට හැකියාවක් ඇති බව නීල්ගේ අදහස යි. කිලෝමීටර් තුනක සිට තිහක් දක්වා වූ දිග ප්‍රමාණයකින් යුත් හා කිලෝමීටර් හයක් පමණ පළලැති සිලින්ඩරාකාර ආකෘතීන් තුළ මිනිස් වාසයට සුදුසු පරිසරයක් ගොඩ නැඟිය හැකි බවට ඇමෙරිකානු විද්‍යාඥ නීල් තර්ක කරයි. මෙබඳු ආකෘතීන් තුළ ගොඩනැගිලි පමණක් නොව ගංගා, වැව් ආදිය ද කෘත්‍රිම ව නිර්මාණය කළ හැකි ය. ඒ සඳහා කෘත්‍රිම ගුරුත්වාකර්ෂණ බලයක් ද සකස් කිරීමට සිදු වෙයි.

ඇමෙරිකානු විද්‍යාඥයා විසින් ගණන් බලා ඇති පරිදි, මෙම අපූරු සිලින්ඩර එකක් තුළ මිනිසුන් මිලියන 2ක් දක්වා පදිංචි කරවීමට ඉඩ ලැබෙනු ඇත.

අභ්‍යවකාශය තුළ මිනිස් ජීවයේ පැවැත්මට සුදුසු පසුබිමක් තිබේ ද යන්න මෙහි ලා පැන නගින ගැටලුව වෙයි. ගුරුත්වාකර්ෂණ බලයකින් තොර සැහැල්ලු අජටාකාශය තුළ මිනිසාට ජීවත් විය හැකි ද ? එසේ නැතිනම් ඊට හැඩ ගැසීමට අපගේ ශරීරයට හැකියාවක් තිබේ ද?

අභ්‍යවකාශයේ පරිසරයට සමාන ගුරුත්වාකර්ෂණයෙන් තොර ප්‍රදේශයක විවිධ ජීවීන් බිහි කරලීමට මිනිසා මේ වන විටත් සමත් වී සිටින බව රුසියානු විද්‍යා ඇකඩමියේ සාමාජිකයකු වන මහාචාර්ය අලෙග් ගාසෙන්කෝ පවසයි. ඒ ජීවීන් බොහෝ දුරට පොළොවේ වෙසෙන ඒ හා සමාන ජීවීන්ගෙන් වෙනස් නොවන බව මෙතෙක් කෙරුණු පරීක්ෂණවලින් හෙළි වී තිබේ. එමෙන් ම අභ්‍යවකාශය තුළ දරු උපත් ඇතිවීමට ස්වභාව ධර්මයා විසින් කිසි තහනමක් පනවා නැති බව මේ අනුව තහවුරු වෙමින් පවතී.

එහෙත් මෙහි දී වෙනත් ප්‍රශ්නයක් පැන නගී. එනම්, උඩු ගුවනේ උපත ලබන මිනිසා කවරකු වනු ඇද්ද? ඔහු දැනට පෘථිවි ගෝලයේ සාමාජිකයන් වන අපට සමාන වනු ඇද්ද? අභ්‍යවකාශයේ සැහැල්ලු බව නිසා ඔහු සදාකාලික ව වෙනස් ස්වරූපයක් ගනීවි ද?

මිනිසා දීර්ඝ කාලයක් අභ්‍යවකාශයේ රැඳී සිටින්නේ නම් අඩු ම තරමින් ඔහුගේ බාහිර පෙනුම හෝ වෙනස් විය යුතු බව මහාචාර්ය ගාසෙන්කෝගේ පිළිගැනීම යි. එවිට මිනිසාගේ අතපය වඩා සිහින් වීමට හා ඔහුගේ මාංශ පේශීන්වල බර ප්‍රමාණය අඩුවීමට ඉඩ ඇත. එහෙත් එවන් තත්ත්වයක් යටතේ වැඩ කිරීමටත් ශරීරය මෙහෙයවීමටත් මිනිසාට වඩා පහසු වනු ඇත. කෙටියෙන් කියතොත් අභ්‍යවකාශයේ පවත්නා වාතාවරණයට අනුව හැඩ ගැසීමට අපගේ ශරීර පද්ධතියට හැකියාවක් තිබේ. නමුදු කනගාටුවෙන් වුව ද ඒ සඳහා අතිවිශාල පරිත්‍යාගයක් කිරීමට මිනිසාට සිදු වෙයි. එනම් යළිත් ආදරණීය පෘථිවියට පැමිණීමෙන් වැළකී සිටීමට උඩුගුවනේ පදිංචියට යන මිනිසාට සිදු වනු ඇත.

දැනට විද්‍යාඥයන්ගේ උත්සාහය වී ඇත්තේ අභ්‍යවකාශ ගවේෂණ කටයුතුවල නිරත වන ගගනගාමීන් අභ්‍යවකාශයේ ජීවීන් ලෙසින් නො ව පෘථිවියේ සාමාජිකයන් ලෙස රඳවා ගැනීම යි. අජටාකාශ ගමන්වල කාලය දිගුවන තරමට ඒ කාර්යය ද දුෂ්කර වෙයි. නිදසුනක් ලෙස, පසුගිය සෝවියට් සමයේ රුසියානු ගගනගාමීන් අභ්‍යවකාශයේ රැඳී සිටින කාලය දින සියය ඉක්මවූ විට ඔවුන්ගේ රාජකාරි කාලය පැයකින් අඩු කිරීමට විද්‍යාඥයෝ උපදෙස් දුන්හ.

තවත් රුසියානු විද්‍යාඥයකු වන කේ. පයෝක්තිස්කොව් ද මහාචාර්ය ගාසෙන්කෝගේ අදහස සමඟ සම්පූර්ණයෙන් ම එකඟ ය. ඔහු පවසන අන්දමට අභ්‍යවකාශ යුගයේ ආරම්භය මිනිස් වාසය නව පරිසරයකට එළඹීම සංකේතවත් කරයි. මීට වසර කෝටි ගණනකට පෙරාතු ව අපේ මුතුන් මිත්තන් වතුරෙන් ගොඩබිමට ආ අන්දමට මිනිසා පෘථිවියේ සිට අභ්‍යවකාශයේ පදිංචියට යනු ඇත. රික්තය, විකිරණශීලීතාව, අධික උෂ්ණත්වය වැනි තත්ත්වයන් යටතේ ජීවත්විය හැකි නව මිනිස් වර්ගයක් බිහි වනු ඇත. ඔවුන් මිහිතලය මත වෙසෙන මානව වර්ගයාට සමාන නොවනු ඇතැයි අපේක්ෂා කළ යුතු ය. කල්පනා කිරීමේ ශක්තිය ප්‍රවේණි දායාදයක් ලෙසින් නූතන පරම්පරාවෙන් ඔවුනට ලැබෙනු ඇත. එමෙන් ම තම වර්ගයාගේ යහපත තකා ජීවත් වීමට ඔවුන් වෙර දරනු නොඅනුමාන ය.

මේ අනුව බලනා විට, නුදුරු අනාගතයේ දිනෙක මිනිසා උඩුගුවනේ පදිංචියට යාම මනඃකල්පිතයකට වඩා යථාර්ථවාදී බලාපොරොත්තුවක් ලෙසින් සැලකීම සාධාරණ ය. අභ්‍යවකාශ ශිෂ්ටාචාරය මානව සංහතියේ අනාගත වර්ධනයට රුකුලක් වනවා පමණක් නො ව, එය මිනිස් ජීවයට නව අත්හදා බැලීමක් ද වනු ඇත. අභ්‍යවකාශයේ එළිපත්ත කරා එළඹ සිටින මිනිසා ඉන් ඉදිරියට පා තබනු ඇද්දැයි තීරණය කෙරෙන්නේ ඔහුගේ දැනුම, ශක්තිය, කුසලතාවන් හා අද්දැකීම් මත ය. කාලයා විසින් මීට විසඳුම් සපයනු ඇත්තේ ය.

රත්නසේකර, ජයන්ත ලාල්, **විද්‍යා විත්ති**, කොළඹ, 2007, 27 -30 පිටු

## iii. ශාස්ත්‍රීය ලේඛන

# සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මනුෂ්‍ය භාෂාවේ ස්වභාවය

මනුෂ්‍ය සමාජයේ ක්‍රමවත් පැවැත්ම සඳහා එහි කටයුතු මනා සේ සංවිධානය වී තිබීම අවශ්‍ය ය. විධිමත් සංවිධානයකින් තොර ව ක්‍රමානුකූල සමාජ ජීවිතයක් පැවතිය නොහැකි ය. මෙය විශේෂයෙන් පැහැදිලි වන්නේ භෞතික කරුණු අතින් සංවර්ධනයට පත් සමාජයන් සම්බන්ධයෙනි. යන්ත්‍ර සූත්‍ර නිර්මාණය, ධන ධාන්‍ය රැස් කිරීම, පරිභෝජනය සඳහා විසිතුරු දෑ නිෂ්පාදනය කිරීම, අවි ආයුධ නිර්මාණය ආදි වශයෙන් භෞතික වශයෙන් මිනිසුන් දියුණු වත් ම ඔවුන්ගේ කටයුතු වඩ වඩාත් සංවිධානය වීම අවශ්‍ය වන්නේ ය. එසේ නොවුව හොත් අතිවිශාල ව්‍යාකූලතා ජාලාවකට මිනිසා මැදි වී මානව වර්ගයා විනාශයට පවා පත් වන්නට ඉඩ තිබේ. මෙයින් අපට පැහැදිලි වන්නේ කුමක් ද? මිනිසුන් ප්‍රාකෘතික තත්ත්වයෙන් ඈත්වී භෞතික සංවර්ධනාත්මක මාර්ගයක ගමන් කරන්නට පටන් ගත් දින සිට ඔවුන්ගේ කටයුතු සංවිධානාත්මක ව සැලසුම් කිරීම අවශ්‍ය වූ බව යි. ප්‍රාකෘතික මිනිසාට මෙබඳු ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදුවූයේ නැත. ඔහු තම පරිසරයේ ස්වාභාවික වශයෙන් ජනිත වූ ආහාර අනුභව කළේ ය. ධන ධාන්‍ය එක් රැස් කිරීමක් නො වූ හෙයින් අන්‍යයන් සමග ගැටුමක් ද නො වී ය. මේ නිසා අවි ආයුධ නිෂ්පාදනයක් සිදු නො වූ නිසා එබන්දක ප්‍රතිඵල වශයෙන් ගැටුම් වඩාත් උත්සන්න වීමක් එදා නො තිබුණි. එහෙත් භෞතික වශයෙන් මනුෂ්‍යයන් දියුණු වීමත් සමග ඔවුනොවුන් අතර මනා සබඳතා පවත්වා ගැනීම සඳහා සංවිධානාත්මක සැලසුම් අවශ්‍ය විය.

මෙසේ මනුෂ්‍යයන් අතර කටයුතු සංවිධානය කිරීම සඳහා ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කර ගැනීම අවශ්‍ය වන්නේ ය. එකිනෙකා කෙරෙහි පැවතිය යුත්තේ කෙසේ ද? පුද්ගලයාගේ අයිතිවාසිකම් කවරේ ද? යුතුකම් කවරේ ද? සමාජය පුද්ගලයාට කෙසේ උපකාරී විය යුතු ද? සමාජය පුද්ගලයාගෙන් කුමක් බලාපොරොත්තු වන්නේ ද? යනාදිය සාකච්ඡා මඟින් නිරාකරණය කරගත යුතු ය. මේ පිළිබඳ විවිධ මතිමතාන්තර රාශියක් හුවමාරුවෙන් පසු ව ය කිසියම් තීරණ මාලාවකට එළඹිය හැක්කේ. එබඳු අදහස් හුවමාරුවක් සඳහා මිනිසා උපයෝගි කරගන්නා මාධ්‍යය නම් භාෂාව යි. මනුෂ්‍යයාගේ සමාජ සංවිධානය ඉතා සරල අන්දමින් ආරම්භ වී අද පවතින සංකීර්ණ තත්ත්වයට පත් වූයේ විටින් විට සංශෝධනය වීමෙනි. මේ හැම පියවරක දී ම භාෂාව උපයෝගී කරගෙන සමාජ සංවිධානය සැලසුම් කිරීමට මිනිසාට හැකි විය. මේ අයුරින් සලකා බලන කල්හි මනුෂ්‍යයන් අතර අදහස් හුවමාරුව හෙවත් සන්නිවේදනය මනුෂ්‍ය සමාජය අද පවත්නා තත්ත්වයෙන් ගොඩනැඟීම සඳහා කෙතරම් උපකාරී වූයේ දැයි පැහැදිලි වන්නේ ය.

ඈත අතීතයේ සිට මනුෂ්‍යයන් විවිධාකාර සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන ඇති අයුරු මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ඉතිහාසය පිරික්සීමේ දී පෙනේ. සන්නිවේදනය යනු කිසිවකු විසින් කිසියම් අදහසක් අන්‍යයන්ට දැනුම් දීම යි. මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ මුල් අවධියේ දී මෙන් ම අදත් මේ කටයුත්ත විවිධාකාරයෙන් සිදු වේ. උදාහරණ වශයෙන් ලංකාවේ වැදි ජනතාව අතර පැවැති එක් සිරිතක් නම් කිසියම් වැදි පිරිසකට අයිති යැයි සලකන ලද ගොදුරු බිම වෙත අන්‍යයන් ඒම වැළැක්වීම සඳහා, එනම් එම ගොදුරු බිම තමන් සතු බව අන්‍ය වැදි පිරිස්වලට දැනුම්දීම සඳහා යම් යම් ප්‍රකට ස්ථානවල සලකුණු සටහන් කිරීම යි. මෙහි දී නියමිත මායිම්වල පිහිටි ගස් කඳන් මත කිසියම් සංකේතයක් කොටන ලදි. මෙවැනි අවස්ථාවකින් පැහැදිලි වන්නේ කිසියම් පණිවුඩයක් සන්නිවේදනය කිරීම සඳහා දෘශ්‍යමය සංකේතයක් යොදා ගැනුණු ආකාරය යි.

මෙබඳු තවත් ප්‍රාකෘතික සන්නිවේදන ක්‍රමයකි භේරී සංඥාව. විවිධාකාර බෙර තාල අනුව ඒ ඒ තාලය හා සම්බන්ධ අදහස් ඈතට දැන්විය හැකි යි. අප්‍රිකාවේ ඇතැම් ගෝත්‍රීය ජනතාවන් අතර මෙබඳු භේරී සංඥා ක්‍රම භාවිතා වූ සැටි අපි අසා ඇත්තෙමු. හදිසි යුද්ධයක් හෝ ආක්‍රමණයක්, නැතහොත් ඉක්මනින් ඈත සිටින්නන්ට දැන්විය යුතු වෙනත් කාරණයක් සන්නිවේදනය කිරීම සඳහා ඉතා ම කාර්යක්ෂම මාධ්‍යයක් හැටියට භේරී සංඥා ක්‍රමය සැලකිය හැකි ය. කඩින් කඩ දැන්වීම මඟින් ඉතා ඈත ප්‍රදේශ දක්වා මේ මඟින් පණිවිඩ සන්නිවේදනය කළ හැකි ය. පළමුවන පිරිස විසින් දන්වන ලද පණිවිඩය දෙවැනි

පිරිස තමාගේ බෙර වයා තුන්වන පිරිසකට දැන්වීම ද ඊළඟට තුන්වන පිරිස හතරවන පිරිසකට දැන්වීම ද ආදි වශයෙන් එම සන්නිවේදන උපක්‍රමය ඉතා කෙටි කලක් තුළ දී ඈත ප්‍රදේශ වෙත, විශේෂයෙන් ගමනාගමන පහසුකම් නැති දුර්ගමාර්ග ඔස්සේ පවා, විහිදවිය හැකි අයුරු පෙනේ. බෙර වාදනය අදහස් සන්නිවේදනය සඳහා ගැනෙන අයුරු සලකා බලන විට අපේ සංස්කෘතියේ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම අතර ඊට වැදගත් තැනක් ලැබී තිබුණු අයුරු පෙනේ. තව මත් අපේ ගම්වල අවශිෂ්ට වී තිබෙන ආකාරයට මරණයක්, දානයක්, පිරිතක්, විවාහ මංගල්‍යයක් ගැන ගම රටට දැනුම් දෙනු ලබන්නේ බෙර, හේවිසි, රබන් ආදි භේරී සංඥා උපක්‍රම මඟිනි.

ඉහතින් දැක්වුණු දෘශ්‍යමය හා ශ්‍රව්‍යමය සන්නිවේදන උපක්‍රම භාෂාමය නො වූ සන්නිවේදන ක්‍රම වන්නේ ය. එක් අතකින් ඒ වනාහි මනුෂ්‍යයා ප්‍රාකෘතික තත්ත්වයේ සිටිය දී යොදා ගන්නා ලද සන්නිවේදන ක්‍රම වේ. මනුෂ්‍ය සන්නිවේදන ක්‍රම අතර භාෂාව ඉහත කී ප්‍රාකෘතික සන්නිවේදන ක්‍රමවලට වඩා විශිෂ්ට වූ මාධ්‍යයකි. මන්ද? භාෂාව මඟින් ඒ අන්‍ය මාධ්‍යයන්ට වඩා ව්‍යක්ත ලෙස හා සවිස්තර ව අදහස් සන්නිවේදනය කළ හැකි බැවිනි.

ධර්මදාස, කේ. එන්. ඕ., **භාෂාවේ සම්භවය හා සංස්කෘතික මුහුණුවර,** කොළඹ, 1999, 11 - 13 පිටු

# ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදීම

**වර්තමාන යුගයේ විශේෂ ලක්ෂණ**

19 වැනි සියවසෙහි මැත භාගයෙහි ආරම්භ වූ කාල පරිච්ඡේදය සිංහල සාහිත්‍ය වංශයේ නව යුගයක් ලෙස සැලකීම යුක්ති සහගත සේ පෙනේ. ඒ තාක් සිංහල සාහිත්‍යය කෙරෙහි බලපෑවේ භාරතීය - එනම් සංස්කෘත හා ද්‍රවිඩ - සාහිත්‍ය විශේෂ යි. 16 වැනි ශත වර්ෂයෙහි සිට 19 වැනි ශත වර්ෂය දක්වා අප දිවයින පෘතුගීසීන්ගේ ද ලන්දේසීන්ගේ ද බලපෑමට ගොදුරු වූ නමුදු, එහි ප්‍රතිඵල, සමාජයෙහි කෙසේ වෙතත්, සාහිත්‍යයෙහි නම් දක්නට නො ලැබේ. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ කර්තෘත්වයෙන් 18 වැනි ශතවර්ෂයෙහි රෝමානු කතෝලික සාහිත්‍යයක් පහළ වූ නමුදු, එහි ව්‍යවහාර වන භාෂා විලාසය සලකන විට, එය, සිංහල සාහිත්‍ය වෘක්ෂයට පාස්සන ලද ආගන්තුක ශාඛාවක් සේ මිස, ස්වභාව ධර්මයෙන් එහි හටගත් ශාඛාවක් සේ හැඳින්වීම උගහට වේ. අපරදිග සාහිත්‍යයන් හා ගැටීම හේතු කොටගෙන සිංහල සාහිත්‍යයේ නියම විකාශනයක් සිදු වූයේ 19 වැනි සියවසෙහි ඉංග්‍රීසීන්ගේ පැමිණීමෙන් පසු යයි කිව හැකි ය.

වර්තමාන හින්දි, වංග ආදි භාරතීය සාහිත්‍යයන් මෙන් සිංහල සාහිත්‍යය ද නවීන ස්වරූපයකින් හැඩ ගැසෙන්නට වූයේ ඉංග්‍රීසි භාෂාවේ මාර්ගයෙන් පැමිණි නොයෙක් බටහිර සාහිත්‍යයන්ගේ ආශ්‍රය ලැබුණු නිසා යයි සිතීමට ඉඩ තිබේ. සංස්කෘත සාහිත්‍යයට අයත් නානාවිධ අංගයන්ගෙන් නොයෙක් නොයෙක් වකවානුවල ලත් පෝෂණය පැරණි සිංහල සාහිත්‍යයේ වර්ධනයට හේතු වූවාක් මෙන් ම, වර්තමාන සිංහල සාහිත්‍යයේ පෝෂණයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපරදිග සාහිත්‍යය බව ඉඳුරා පෙනෙන කරුණකි. සංස්කෘත සාහිත්‍යයෙන් හැකි තාක් සාරය උකහාගෙන පසු අවධියෙහි කවුරුත් පිපාසාවෙන් මෙන් මලානිකව ගිය සිංහල සාහිත්‍යයට, බටහිර සාහිත්‍යයෙන් ලැබුණේ විවිධ රසයෙන් යුත් ප්‍රණීත ආහාරයකි. මේ මාර්ගයෙන් අලුත් සම්ප්‍රදායන් ද අමුතු සිද්ධාන්ත ද, වෙනස් ශෛලි ද පළමු වරට හැඳිනගත් වර්තමාන ලේඛකයා ද, පැරණි සාහිත්‍යයෙන් නොලත් විරූ රස වෛචිත්‍ර්‍යයක් අපරදිග සාහිත්‍යයෙන් ලැබුවේ ය. මෙයින් වූයේ සිංහල සාහිත්‍යයේ පුනර්ජීවයකි. අතීත අවධිවල නොතිබුණු සාහිත්‍යාංග සිංහලයට පිවිසිණි. අප පැරණි කතුවරයන්ගේ දර්ශන පථයට හසු නො වූ ජීවිතයේ එක්තරා පක්ෂයක් නවීන ලේඛකයන්ගේ සැලකිල්ලට භාජනය විය. නොයෙක් රචනා ක්‍රම අත්හදා බැලීමට සිංහල භාෂාව අභ්‍යාස භූමියක් විය.

18 සහ 19 වැනි ශතවර්ෂයන්හි සිදු වූ ඇතැම් සමාජ විපර්යාස සාහිත්‍යය කෙරෙහි බලපෑ බව ද එය

අලුත් මුහුණුවරකින් සකස් කිරීමෙහි ලා උපකාරී වූ බව ද වර්තමාන සාහිත්‍යය දෙස විචාරාක්ෂියෙන් බලන විට පෙනී යයි. යාන්ත්‍රික යුගයකට සරිලන පරිදි සමාජය හැඩ ගැසීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අලුත් පන්තියක් පැන නැංගේය - එනම් නාගරික මැද පන්තිය ය. වර්තමාන ලේඛකයන් බොහෝ සෙයින් බිහි වූයේ මේ අලුතෙන් උද්ගත වූ මැද පන්තියෙන් ය. අතීතයෙහි සිට වැඩි වශයෙන් පැවිදි කතුවරයන්ට භාර ව තිබූ ලේඛන කලාව ක්‍රමයෙන් ඔවුන්ගේ අතින් ගිලිහී ගිහි ලේඛකයන්ගේ අතට පැමිණෙන්ට පටන් ගති. මේ වූ කලි සාහිත්‍ය ලෝකයෙහි එක්තරා විප්ලවයක් ඇති කිරීමෙහි ලා සමර්ථ වූ සිදුවීමකි. පැවිදි ලේඛකයන්ගේ කෘතිවලට සාමාන්‍යයෙන් විෂය නොවූ ඇතැම් මාතෘකා ගිහි ලේඛකයෝ තම රචනාවලට වස්තු කොට ගත්හ. බෙහෙවින් ආගමික ස්වරූපයක් දැරූ පැරණි සිංහල සාහිත්‍යය පොදු ජනයාගේ සාහිත්‍යයක් බවට පෙරළුණේ මේ සමාජ විපර්යාසයේ ප්‍රතිඵලයක් වශයෙනැයි කිව හැකි ය. කවියාගේ පුද්ගලික හැඟීම් ගැබ් කොට රචනා කරන ලද ශෘංගාරාත්මක පද්‍ය විශේෂයක් සිංහලයෙහි පහළ වූයේ මේ සමාජ විපර්යාසයට අප සාහිත්‍යය ගොදුරු වූ ප්‍රථම අවස්ථාවෙහි ය - එනම් මාතර අවධියෙහි ය. මේ පද්‍යයන් ලියූවෝ ගිහි පඬුවෝ වූහ. සංස්කෘත සාහිත්‍යයෙහි එන ශෘංගාර රසය හා සසඳන විට, ඔවුන්ගේ කෘතිවල ගැඹුරු රසයක් තිබෙතියි කිව නොහැකි නමුදු, ඔවුන් ගත් මාර්ගය සිංහල සාහිත්‍යයේ යට දක්වන ලද විප්ලවයේ මූලාරම්භය ලෙස ගිණිය හැකි ය.

වර්තමාන සාහිත්‍යය ගිහි ලේඛකයන්ගේ නිර්මාණයක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතය පිළිබඳ අමුතු දර්ශනයක් එහි පිළිබිඹු වී තිබෙන බව ද කිව හැකි ය. පොදු ජීවිතයේ ඇලුම් බැඳුම් කෙරෙහි ද, ඇතැම් අවස්ථාවන්හි තම සිතැඟි වසඟ කර ගත නො හී නොයෙක් වැසන විඳින පුහුදුන් මිනිසා දෙස ද වර්තමාන ලේඛකයා හෙළන්නේ සානුකම්ප දෘෂ්ටියකි. පැරණි ලේඛකයා ප්‍රේම කථා හා ඊට සමාන වෘත්තාන්ත විස්තර කෙළේ මනුෂ්‍යත්වයේ දුර්වලකම්වලට නිදර්ශන සැපයීමේ පරමාර්ථයෙනි; නැතහොත් ස්ත්‍රීන්ගේ වසඟයට පැමිණි කාමී පුරුෂයන් විඳින දුක් ගැහැට කියා පෑම සඳහා ය. එහෙත් මනුෂ්‍ය සංසර්ගයෙන් හට ගන්නා රාග ද්වේෂාදිය ද ඒවායින් සිදුවන පුද්ගලික ආපදා හා සාමාජික අවුල් වියවුල් ද වර්තමාන ලේඛකයා වර්ණනා කරන්නේ, පැරණි ගත්කරුවා නොදක් වූ දයානුකම්පාවකිනි. පැරණි කුස ජාතක කතාවෙහි ද එය පද්‍යයට නැඟූ ලේඛකයන්ගේ කෘතිවල ද පබාවතිය කෙරෙහි කුස රජුන් තුළ හටගත් ප්‍රේමය හා ඇය නිසා ඔහු විඳි දුක් ගැහැට ආදිය කෙලෙස් සතුරන්ගෙන් මිදෙන තුරු මනුෂ්‍යයාට සිදුවන අනර්ථදායී ව්‍යසන ලෙස ය දක්වා තිබෙන්නේ. එහෙත් 'වාසනාවන්ත විවාහයෙහි' පියදාස සිරිසේන මහතා ජයතිස්ස හා රොසලින් අතර පැන නැඟි ප්‍රේමය වනන්නේ සැපවත් ජීවිතයක පදනම වශයෙනි. මෙසේ එක සමාන සිද්ධියක් දෙස වර්තමාන ලේඛකයා බලන්නේ පැරණි ලේඛකයා බැලූ ආකාරයෙන් ම නොව, අමුතු දෘෂ්ටියකිනි.

සරච්චන්ද්‍ර, එදිරිවීර, **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය,** කොළඹ, 2009, 09 - 11 පිටු

## iv. ජනමාධ්‍ය ලේඛන

### වගතුග 1948 පෙබරවාරි මස 3 වෙනි දින

**වචන ගණන**

මහත්මා ගාන්ධි ජීවත්ව සිටි කාලය තුළ එතුමන් ගැන ලිව් කිව් වචන ගණන කොපමණ වේද? මහත්මා ගැන කතා නොකළ භාෂාව කුමක් ද?

**අඳුනන්නා**

දණට ඉහළින් රෙදි කඩක් ඇඳ උග්‍ර තවුස් ජීවිතයක් ගත කළ මහත්මා තරම් ජීවිත කාලයේ ලෝකයා

අතර ප්‍රකට වූ වෙන කිසිවෙක් නැත. දැනටම දේවත්වයෙන් මහත්මා පුදන කෝටි සංඛ්‍යාත ජනකායක් ඇත්තේය.

**අසමර්ථ ශිෂ්‍යයා.**

මෝහන්දාස් ගාන්ධි කුඩා කාලයේ වෙන ළමයින් වාගේ පාඨශාලාවට ගියේය. ඉහළ බාලාංශයේ පාඨ පරීක්ෂණයට පෙනී සිටි කුඩා ගාන්ධිට 'කේතලය' යන වචනය ලියන්නට බැරිව තතනනවා දුටු ගුරුවරයා පරීක්ෂකයාට මුවා වී එය ලියන හැටි ඇඟිල්ලෙන් අහසේ ඇඳ පෙන්නුවේ ය. ගාන්ධි එය නොලීවේය. නොලීවේ එය කොපි කිරීමකැයි තමාට සිතුණු නිසා බව පසුව පියා සමග කීවේය.

**මනමාලි**

මහත්මා ගාන්ධි අහිංසක දරුවකු මෙන් ප්‍රීති වීමට පුරුදුව සිටියේය. එසේම උපහාසයේ අති දක්ෂව සිටියේය. මින් වර්ෂ 15කට කලින් දවසක මහත්මා ශාන්ති නිකේතනයට පැමිණෙන බව විද්‍යාලය තුළ ප්‍රසිද්ධ විය. විද්‍යාලයේ කා අතරත් බලවත් උද්යෝගයෙක් ඇති කළ මේ ප්‍රවෘත්තියෙන් උනන්දු වූ සංගීතඥයෝ, චිත්‍රඥයෝ කවුරුත් ස්වකීය උසස් දෙයින් මහත්මාට සංග්‍රහ කිරීමට කටයුතු පිළියෙල කළහ.

රවීන්ද්‍රනාත් තාගෝර් තුමා, නන්දලාල් බෝස් මහතා ප්‍රමුඛ චිත්‍රඥයන් මෙහෙයවා මහත්මා පිළිගැනීමට සුදුසු සැරසිලි කළහ. රාත්‍රී නැවතීම සඳහා වෙන් කළ මන්දිරය මල්කම් ආදියෙන් මොනවට සරසන ලද්දේ විය. මහත්මා පැමිණියේය. නැවතීමට පිළියෙල කළ මැදුරේ දොරටුව ළඟට ගිය මහත්මා 'කෝ මනමාලි' කියා අසමින් ආපසු හැරුණේය. එදා එතුමා රාත්‍රිය ගත කළේ ගසක් මුල ය.

**එකමුතුව**

මහත්මා ගාන්ධි සිහි කිරීම පිණිස ගෝල්පේස් පිට්ටනියේ එක්රැස් වූ කවීකයන් අතර විවිධ අය වූහ. වෙනදා මොනම කරුණකටවත් එකම වේදිකාවකදී දක්නට නොලැබෙන අය මෙදින එක තැනකදී දක්නා ල දී. දේශපාලන වෙනස්කම් හා අනික් අතින් වාදභේද අමතක කොට වම දකුණ එකට එක් වූ මේ අවස්ථාව කාගේත් ප්‍රමෝදයට හේතු වුණා විය හැකිය. එදා ගෝල්පේස් පිට්ටනිය එකම හිස් ගොඩක් විය. එහි රැස් වූවන්ගේ මුහුණුවල පැවැත්තේ අර උදාර පුරුෂයාගේ අභාවයෙන් මතු වී ගිය දුක්බර බවය. වෙනදා පිට්ටනියක සභාවකට අඩිය නොතියන අයත් මෙදින කවීකයන් අතර සිටිනු දුටු ඇතැම් මිනිසුන් කීවේ දැන් දැන් ඒ ඇත්තනුත් 'පිට්ටනි සෝෂාකාරයන්' බවට පත්වේගන යන බවය. කාලය වෙනස් වේ. එබැවින් මෙවන් සුළු කරුණුවල වෙනසක් ඇතිවීම පුදුමයක් නොවේ. 'පිට්ටනි සෝෂාව' හෝ 'පිට්ටනි සෝෂාකාරයන්' එන්න එන්නම වැඩි වෙනවා මිස අඩුවිය නොහේ. ඒ පිරිසට තව පිරිස එකතුවනවා ඇත.

මානවසිංහ, ශ්‍රී චන්ද්‍රරත්න, **වගතුග 2**, කොළඹ, 69 - 71 පිටු

## අහෝ ඒ වන් රස විපුල් !

මේ මස 14 වැනි දා කොළඹ ඇල්ෆින්ස්ටන් රඟහලට වන් රසිකයන් හට සුපසන් සැඳෑවක් උදා විය. ඒ සැඳෑව ගෙන ආයේ එදින එහි රැඟුණු සිංහබාහු නාටකයේ අභිනව ප්‍රයුංජනයේ මංගල රැඟුමයි.

වායු සමීකෘත, කිරි බබළන විදුලි ආලෝකයෙන් ආලෝකිත සුවිසල් සාලාව නා නා වර්ණ වස්ත්‍ර විභූෂිත, නාට්‍ය රසාභිලාෂී ජනීජනයාගෙන් පිරී ඉතිර යයි.

සැම දෙනාගේ ම නෙත් සිත් වේදිකාව වෙත ඒකාග්‍ර ව පවතී. නො ඉවසිල්ල රජයයි. ප්‍රේක්ෂා ගෘහය පොතේ ගුරුගේ වේදිකාගමනය පුල පුලා බලා සිටී.

නො ඉවසිල්ල ආක්‍රමණය කොට බලවත් නුරුස්නාවක් මතු වෙයි. ඊට හේතුව සිංහල විෂයෙහි මහාචාර්යවරුන් හා ලේඛකයන් ද සහිත විද්වද් සබගැබ අබියස පූර්ණාලෝකය මධ්‍යයේ නැඟී සිටි කඩවසම් යෞවනයෙක් ඉතා මත් අවියත් බසින් ලියූ හාස්‍යජනක හැල්ලක් වනපොත් කොට විත් ගිරා පෝතකයෙකු මෙන් ඇද බෑම යි.

ඔහුගේ ඒ හැල්ල ලියූ තැනැත්තා මට පට බැඳ තිබූ මහ ගත්කරු යන අපනාමයෙන් මම කෙතරම් විළි වැනෙම් ද යත් පොල්තෙල් පහන් දැල්වීමට කෙරුණු ඇරයුමට ප්‍රතිචාර දැක්වීමට බොහෝ පසු බැවෙමි. පොල්තෙල් පහන් පෝළිම දැල්වීමේ දීර්ඝ තෝත්තරය ද නුරුස්සාව රුස්නාවක් බවට පත් නො කළේ ය.

රසය භංග කරන මේ සියලු පූර්ව කෘත්‍යයන් නිමා වත් ම රසික ජන මන සැනසුම් සුසුම් සලයි. මද්දල නද නැඟෙයි. තිරය ඇරෙයි. ධාරාලෝකයෙහි සංකේන්ද්‍රිත පොතේ ගුරු රංග පීඨාවතරණය කරයි. සිත්සතන් සුපහන් වෙයි.

ප්‍රේක්ෂා ගෘහයෙහි අසුන් ගෙන සිටි මා ද ඇතුළු වෘද්ධතරයන් ස්වල්ප දෙනාගේ සිත් සැමරුම් පටුවතෙහි 1961 අගෝස්තු 30 වැනි දා තෙක් පසු ගමන් කොට පේරාදෙණි සරසවියේ තුරු සිදුරින් පෙරී එන නිමල් සඳ රැසින් ද වම් පසින් ගලා බස්නා මහවැලි නදියෙන් මතු ව තුරුලතා පිස හමා එන මඳ නලින් ද සිහිල් වූ එළිමහන් රඟ මඬල වෙත සැපත් වෙයි. සිංහබාහු නාටකයේ ප්‍රථම ප්‍රකට ප්‍රදර්ශනය පැවැත්වුණේ එදින ය.

එකල අද මෙන් සව් සැපත් සපිරි සුපිරි රඟහල් නැත. නැති සියල්ල මැඬ ගෙන දෘශ්‍ය කාව්‍යයට ම ආවේණික ඒ සුවිශිෂ්ට නාට්‍ය රසය නැඟ ආවේ ය. අහෝ ! යළිදු කිකල් ඒද එකල් !

මේ සිංහබාහු නව ප්‍රයුංජනය අධ්‍යක්ෂණය කොට කලඑළි බස්වන ලද්දේ ලලිතා සරච්චන්ද්‍ර ශ්‍රීමතිය විසින් බව ප්‍රශංසාපූර්වක ව සඳහන් කළ යුතු ය. කලකින් එහි රැඟුමක් දක්නට නො ලැබිණ. සඳකිඳුරු හා මුහුදු පුත්තු වැනි ඒ පැරණි නාට්‍ය කීපයකට ම ලබා ඇති අභාවය නමැති දුර්දශාව සිංහබාහුට ද ලබා හෝ ලබත් හෝ දැයි අපි සෝබර ව සිටියෙමු.

සදා සම්මානනීය මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මේ නිර්මාණය ශ්‍රී ලංකාවේ කව්සිළුමිණ යි. මේ සමග සමතැන් බෙජෙන්නේ කලිකල් සවැනි පැරැකුම්බාවන්ගේ කව්සිළුමිණ යි.

නාට්‍ය කලාවේ ද රංග කලාවේ ද කාව්‍ය කලාවේ ද සංගීත කලාවේ ද රූපණ කලාවේ ද අභූතපූර්ව සංකලනයක් එහි නිරූපිත යි. සරච්චන්ද්‍රයන් දිගු කලක් තිස්සේ සතතාභ්‍යාසයෙන් පෙර අපර දෙදිග නාට්‍ය හා රංග කලාවෙහි ද සාහිත්‍ය කලාවෙහි ද ලත් පාරප්‍රාප්තිය ද ඔවුන්ගේ ආදර්ශවත් ව්‍යුත්පත්තිය හා ප්‍රතිභාව ද යන මේ අංගයන්ගෙන් එය ඔපවත් ව දිදුලයි.

අඹුසැමි ප්‍රේමය, වත්සල ප්‍රේමය, මාතෘපිතෘ ප්‍රේමය ඈ සියලු අංශවලින් පරිපූර්ණ ගේහසිත ප්‍රේමය අනූන ව ප්‍රතිනිර්මාණය කරන, අධ්‍යාත්මයෙහි පත්ල ම ස්පර්ශ කරන ගිරිලෙන් වාසය නම් වූ පළමු අංගයෙන් ඇරඹී එය නා නා අවුල් වියවුල් හරහා විකසිත ව කුරිරු දරුණු පීතෘ ඝාතනයෙන් කූටප්‍රාප්ත වත් ම සකල සන්තානය කම්පිත ප්‍රකම්පිත වෙයි. කරුණ රසයෙන් හදවත ආකර්ෂිත, පරිකර්ෂිත, සම්පරිකර්ෂිත වෙයි.

ප්‍රේක්ෂකයා අසුනින් නැඟෙන්නේ වත්මන් පරම්පරා පරතරය විනිවිද දිවෙන්නා වූ ආලෝක ධාරාවන්ගෙන් සපිරි ශ්‍රේය මණ්ඩලයෙන් යුතු ව ය.

වත්මන් මවුපිය පරපුර දූදරු පරපුරින් ද දූදරු පරපුර මවුපිය පරපුරින් ද දූරස්ථ යි; පරාරෝපිත යි. මේ දෙපරපුර අතර සන්නිවේදනය බිඳ වැටී ඇති සේ ය. ඔවුන්ට අන්තර් ක්‍රියාව සඳහා පොදු භාෂාවක් නැත්තාක් මෙනි.

මවුපියන් සිතන සේ පෙනෙන්නේ දූදරුවන්ට ආහාරපාන, ඉඳුම් හිටුම් ඈ සැප සපයා දුන් කල්හි ඔවුන්ට එයින් ඔබ්බෙහි අවශ්‍යතා නැති කලෙක මෙනි. දූදරුවන් පැරණි පරපුර තම ආත්මයන් කුසුමිත

වීමට බාධාවක් සේ දක්නා සැටියක් දිස් වේ. මේ ගැටුම අතිප්‍රබල ශෝකසන්තාපයන්ට තුඩු නො දේ ද?

ශ්‍රී ලංකාවේ වැඩිහිටි පරපුර නැඟී එන නව පරපුරට මේ දේශය ප්‍රතිරූප දේශයක් බවට පත් කිරීම සඳහා වූ සැම ශක්‍යතාවක් ම මකා දැමී ය. දකුණේත් උතුරෙත් තරුණ පරපුර වල්මත් ව හසරක් නො දක තම විමුක්තිය සඳහා ගලකටස්, තුවක්කු, බෝම්බ ආදියෙහි සිට පාර්ලිමේන්තුව තෙක් ඇති සියලු බොරු විසඳුම් අත්හදා බලයි.

අතිපුරාණ ජන ප්‍රවාදයක් මාධ්‍යය කොට ගන්නා සිංහබාහු හැඟීම් නමැති ආලෝකය මඟින් අප සිත්සතන් මේ ඛේදවාචකය දෙසට මෙහෙයවයි. එය සුවිශාල අන්‍යාලාපයකි.

දිරාපත් වූ පැරණි ලොව යා යුතු ය. අපිරිමිත යෞවනයෙන් පූර්ණ වූ ජීවශක්ත නව ලොවක් ආ යුතු ය. එහෙත් මේ නව ලොව උදා විය යුත්තේ පැරණි ලොව පැවති නරක දෑ හළා, හොඳ දේ අලුත් හොඳ දේ ද එකතු කොට ඔසවා තබමිනි.

සිංහයා මරා දැමීමට සිංහබාහුට නාට්‍ය සන්දර්භය තුළ හේතු තිබුණා විය හැකි ය. එහෙත් මේ දෙවැන්නා සිංහයාගේ ප්‍රබල ගේහසිත ප්‍රේමය ස්වීකරණය කළ යුතු විය. එසේ නො කෙරිණ.

ඒ අයුරින් වෙනස් නො කෙරෙන සමාජ වැනසී යනු කියනු ම කවරේ ද?

සැම දෙයක් තුළ ම අරගළයේ යෙදී එකමුතු ව පවත්නා ප්‍රතිපක්ෂයෝ වෙති. මේ ලියන මම ජීවිතය හා මරණය යන ප්‍රතිපක්ෂ දෙකේ එකමුතුවක් වෙමි. මා ජීවත් වීමට සටන් කරන අතර මරණය මා ගිල ගැනීමට අරගළ කරයි. අවසානයේ ජය ගන්නා මරණය යනු ශූන්‍යතාවක් නො ව මම නමැති කාබනික ද්‍රව්‍ය වෙනත් අකාබනික රූපයකට පෙරළීම යි.

ප්‍රතිපක්ෂයන්ගේ අරගළයෙන් යුතු එකමුතුව එක් ප්‍රතිපක්ෂයක් අනෙකේ නිෂේධනීය දෑ හළා සාධනීය ලක්‍ෂණ උකහා ගෙන ඒවා නව ලක්ෂණ හා සංකලනය කොට ඔසවා තැබීමෙන් මඳකට සන්සිඳී ඉහළ අදියරකින් යළි ඇරඹේ. මේ මඳකට සන්සිඳීම සමතික්‍රමණය නම් වන්නේ ය. මෙසේ නො සිදු වුව හොත් ප්‍රතිපක්ෂ දෙකේ ම විනාශයෙන් ඒ ප්‍රතිපක්ෂයෝ වැනසෙත්.

සිංහබාහු නාටකය ආධ්‍යාත්මික හැඟීම්වලින් සසල කිරීම මඟින් අපගේ නුවණැසට ගෝචර කරන සත්‍යය මෙය නොවන්නේ ද ?

ගම්ලත්, සුචරිත, **සති සිතුම්ණි** 3, කොළඹ, 2013, 67 - 70 පිටු

## v. කටවහර භාවිත ලේඛන

## සිංහලයින් මේ දිවයිනේ පදිංචිවීම

පුරාණ සංස්කෘත පොතපතේ මේ දිවයින සඳහන් වෙල ඇත්තේ සිංහලයින්ගෙ දූපත යන අරුත ඇති සිංහලද්වීප යන නමිනුයි. මේ නම දුරු මිනිස්සු ඉතිහාසගත මුල් ම අවදියේ පටන් ම මේ දිවයිනේ හිටිය. දන්කාලෙ පිටරට ජනයා මේ දූපත අඳුන්වන්නෙ 'සිංහල' පදයෙන් බිඳිල ආපු නමකිනු යි.

ලෝකයේ වෙනත් ජනතාවන් පිළිබඳව වගේ ම සිංහලයනුත් තමන්ගෙ මුල ගැන පවසන කතාපුවත් නොයෙක් අන්දමේ අද්භූත සිද්දීන්ගෙන් ගහන යි. සත්වලාංඡන ඇසුරෙන් ඇතිවෙල තියෙන මේ කතාපුවත් දැනගන්න ලැබෙන්නෙ හවැනි සතකය පමණෙ දි ලියූ වංසකතාවලිනු යි. සිංහලයින් ඇතිවුණු හැටි දක්වන පුවත් අද්භූත සිද්දිවලින් අලංකාර වෙල ඇති නමුත් ක්‍රිස්තු කාලය පටන්ගැන්මට සතක පහකට පමණ පෙර උතුරුබාරතේ ඉඳල ආරියබාසාවක් කතා කළ ජනතාවක් මේ දිවයිනේ පදිංචිවීමට පැමුනුණු බව ඒවායින් නිගමන්න පුලුවන්ය යනු පඬුවන්ගෙ පිළිගැනීම යි. ඉන්දු - ආරිය ජනතාවක් මේ

දිවයින තමන්ගෙ නිවාසය කරගැනීම පිළිබඳව පුරාණ බාරතයේ පැතිරිල පැවතුණු කතාපුවත් සකු බවුද්ද පොත්වල දීල තියෙනව, ඒ අනුව ඉන්දු - ආරිය වගාව මේ දිවයිනේ පිහිටුවීමට පුරෝගාමීවූවෝ වෙළෙන්දෝ ය යන තීරණයට බහින්න පුලුවනි. මේ වෙළෙන්දන් දිවයිනේ වයඹ වෙරල අසල උපදින මුතු නිසා එහාටත් නුදුරු ගොඩබිමේ ලැබෙන මැණික් නිසා ගිනිකොණ වෙරලටත් ඇදිල ආව යි හිතන්න පුලුවනි. සකු බවුද්ද පොත්පත්වල මේ දිවයිනට දීපු නම්වලින් පැරණි ම එකක් තමයි රුවන් උපදින දූපත යන අරුත ඇති රත්නද්වීප යන්න. මේ වෙළෙන්දො මෙහාට ඇවිත් ආපහු ගමරටවලට ගොහින් මේ දිවයින ගැන පුදුම කතාවල් පැවසුව. රත්නද්වීපයේ අලංකාර පහයවල්වල හිතුනු රූපයක් මවාගන්න පුලුවන් යස්සයොත් රාස්සියොත් විසූ බවත් මුන් බොහෝවිට මිනිසුන් අල්ලගන කෑ බවත් මෙහේ හිටිය රුවින් අගතැන් පත් රකුසියො ගෑනුමායමෙන් පුරුසයන් පොළඹවගෙන කලක් වල්ලබයන් හැටියට තියන් ඉඳල අන්තිමේ දි කාල දමාපු බවත් මේ පුවත්වලින් සමහරක්. මේ දිවයිනට වෙන වෙළන්දන්ගෙ පැමිණීම වලක්වල මෙහෙන් ලැබෙන වටිනා වෙළෙඳබඩුවල අයිතිය තමන්ට තහවුරු කරගන්න අදහසින් මේ බියකරු කතාපුවත් පුරෝගාමීන් ගෙතුවයි කියල හිතන්න පුලුවනි.

ඉන්දු - ආරිය ජනයා මේ දිවයිනේ වාසයට පැමිණෙන කාලෙදි පමණ උතුරු බාරතේ බැරෑරුම් සිද්දි ගණනාවක් ඇති වුණා. අවුරුදු සිය ගණනක් මුළුල්ලේ මහණ බමුණු පරම්පරාවන් වත්පිළිවෙත්වලත් තතු දැක්මෙහිත් නිරත වීමෙන් පසුව බුදුදහම මගදදේසයේ පහළ වුණා. යම්කිසි දෙවියෙකුගෙ පිහිටක් නැතිව මිනිසුන්ට තමන්ගෙ ම වීරියෙන් මෙලෝ පරලෝ සුබසිද්දියත් අවසානයේ අකාලික සාන්තියක් පිළිලැබිය හැකි ය යි පැවසුවාවුත් යුක්තියට නියම තැන දෙන්නාවූත් මේ දහමෙහි පැහැදි අයට එයින් ලැබිය හැකි සෙත මුළුලොව පතළ කිරීම පැවරිල තිබුණ. ආරිය ජනතාවක් විසින් පළමුවරට පිහිටෙවු මහාරාජ්ජය වුනාවූත් ඊට පෙර ඇතිවූ හැම මහාරාජ්ජයකට වඩා විසාලවූත් පාරසික මහාරාජ්ජයට දූනට බටහිර පකිස්තානයට ඇතුළත් පුරාණ ඉන්දියාවේ වයඹ පෙදෙස් යටත් වෙල තිබුණ. බුදුදහම පහළවුනු මගද නම් ආරිය රාජ්ජෙ පුරාණකාලෙදි ගංගානදිය දෙපැත්තේ පිහිටි ජනපද එක්කොම යටත් කරගෙන මහා බලඇණියකුයි කාරියට දස්ස පාලනතන්තරයකුයි පදනම වසයෙන් ඇති මහාරාජ්ජයක් බවට පත්වුනා. පාරසික මහාරාජ්ජෙ පරද්දල ඒ රාජ්ජෙ නැගෙනහිර සීමාවත් ඉක්මවල බාරතෙට ආ අලක්සන්දර යවනරජු ආපසු ගියාම යවනයන් යටතට ගොහින් තිබුණ පුරාණ ඉන්දියාවෙ පෙදෙසුයි ඊට බටහිරින් පිහිටි තවත් විසාල පෙදෙසුයි චන්ද්‍රගුප්ත පිහිටෙවු මොරිය මහාරාජ්ජෙට යටත්ව තිබුණ.

බටහිර ආසියාවෙ අලක්සන්දර රජුගෙ විජිත අයිති කරගෙන හිටිය සෙලෙවුකස් නිකතෝර රජුත් චන්ද්‍රගුප්ත මහීපාලයාත් අතර දූතයන් මගින් සබඳතා ඇතිවුනා. මේ රජපවුල් දෙක විවාහයකිනුත් බැඳිල තිබුණලු.

මොරිය මහාරාජ්ජෙ සියලු ම පෙදෙස් තමන් අතට අයත් කරගත් අසොක නම් චන්ද්‍රගුප්ත රජුගෙ මුනුබුරා තමන්ගෙ රාජ්ජකාලයේ මුල් අවුරුදු කීපය තුල දී තවත් අමුතු පෙදෙස් ඒ මහාරාජ්ජෙට එක් කළා. ඒ කාලෙදි අසොක රජු පිළිපැද්ද දණ්ඩොපායෙන් හටගැනුණු යුද්දවලින් මිනිසුන්ට වුණු විපැත්ති දැකල සංවෙගයට පත්වුණු ඒ මහීපාලය යුද්දකිරීම අත ඇරල දැහැමෙන් දිනීම තමන්ගෙ නිතිය කරන්න ඉටාගත්ත. ලොකානුකම්පා සහිත බුදුදහමට මේ අයුරින් අසොක රජු ඇදිල ආව. මීට පස්සෙ ඒ රජ්ජුරුවො මුළු රාජ්ජබලයම තමන්ගෙ විසාල විජිතවල පමණක් නොව ඉන් පිටතත් බුදුදහම පතුරුවල ඇරීමට යෙදුව. මෙලෝ පරලෝ දෙකේ සුබසිද්දියට මිනිසුන්ට ඉවහල්වන බුද්දදේසනා ඒ රජ්ජුරුවන්ගෙ වචනවලින් මහජනයට වැටහෙන බාසාවෙන් පවසල ඇති දහම්ලිපි රාජ්ජෙ නොයෙක් තැන්වල පිහිටි පරුවත මත්තෙත් ගල්කණුවලත් කෙටෙවුව. සිරියාව, මිසරෙ, ග්‍රීසිය යන යවනරාජ්ජ සමග පැවතුණු දූත සම්බන්දතා ඒ දේසවලත් බුදුදහම ගැන දැනුමක් ඇති කරවීමට උපයෝගි කරගත්ත. මොරියරාජ්ජෙ පසල්දනවුවලටත් ඉන් බැහැර රටවලටත් දහම්දේසකයන් යැවීමට සඟතෙරුන් ගත් තීරණය අසොක රජ්ජුරුවො තමන්ගෙ සහාය නොමසුරුව දුන්න. මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන් පිටදේස බුදුදහමෙ පැහැදවීමට ඇරිය පාමොක් තෙරනමක් තවත් තෙරුන් හතර නමක් සමගයි වැඩියෙ.

එහෙම කෙළේ ඒ ගිය රටවල යමෙක් මහණ වීමට කැමැත්ත දැක්කුවොත් එයාට පැවිද්ද දෙන්න පස් නමකින් පිරුණු විනයානුකූල ගණයක් ඇතිවෙන්න ඕනෑ නිසයි. අසොක රජු කාලෙදි දහම්දෙසකයන් එවාපු මොරියරාජ්ජෙන් බැහැර රටවලින් එකක් තමයි එසමයේ තම්බපණ්ණි නමින් ව්‍යවහාරවුණු සීහලදීපෙ. ලංකාවට එවූ ගණයෙ පාමොක්තෙරණුවන් හැටියට වැඩියෙ අසොක සක්විති රජුගේම පුතෙක් වුත් රජසැප ඇරල පැවිදිබිමට පැමිණිල හිටියාවුත් මිහිඳු මහරහතන් වහන්සෙ. සීහලදීපෙ බුදුසසුන පිහිටුවීම ඉතාමත් ම වැදගත් කටයුත්තක් හැටියට සලකපු බව මෙයින් පේනව.

පරණවිතාන, සෙනරත්, **සිංහලයෝ**, කොළඹ, 1998 1 - 2 පිටු

## ඇසළට සෙංකඩගල නුවර කරන පෙරහැර

ඇහැළ මහේ දී ලංකාවෙ හැම දේවාලයක ම වගේ පෙරහැරක් පැවැත්වෙනවා 'ඇසළ පෙරහැර' කියලා. ඇහැළ මහ කියන්නේ ලංකාවේ නියං සමය අවසන් කරන මාසෙ. නියං කාලෙ පෑවිල්ල නිසා ගස් කොළන්වලටත්, සතා සීපාවුන්ටත් කෙත් වතුවලටත් ලොකු අලාභ හානි සිද්ධ වෙනවා.

මේ නිසා වැස්ස ඉල්ලලා දෙවියන්ට කන්නලවු කිරීම ආදි කාලෙ සිට ම සිංහලයන්ගෙ සිරිතක්. ඒ අරමුණින් කළ එක් දෙයක් තම යි අලි ඇතුන් ගෙන්නලා, දේවාභරණ වඩම්මලා, දිය කපලා, පෙරහැරක් පවත්වලා, දෙවියන්ට පින් දීලා වැස්ස ප්‍රාර්ථනා කිරීම. බෞද්ධයන් සිතන විදියට වැස්ස ලබා දෙන්නේ 'වැස්ස වලාහක දෙවියො'.

මහනුවර මහ දේවාල හතරක් තියෙනවා ; නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන දෙවිවරුන් හතර දෙනාට. මේ දේවාල හතරේ ඇහැළ පෙරහැර ඉස්සර සිට ම පැවැත්වුණා. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ඒ දේවාල පෙරහැර හතර දළදා පෙරහැරට එකතු කළා. අද මහනුවර ඇසළ පෙරහැරේ මුලින් ම ගමන් කරන්නේ 'දළදා මාලිගාවේ පෙරහැර'.

දේවාල පෙරහැරවල් එන්නේ එක්තරා අනුපිළිවෙළකට. මුලින් ම එන්නේ 'නාථ දේවාලෙ පෙරහැර'. නාථ දෙවියො තමයි මෛත්‍රී බුදු හාමුදුරුවන් වශයෙන් අනාගතේ දී බුදු වන්නෙ. දෙවනුව විෂ්ණු දේවාල පෙරහැරත්, තුන්වනුව කතරගම දේවාල පෙරහැරත් අන්තිමට ම පත්තිනි දේවාල පෙරහැරත් ගමන් කරනවා.

ඇසළ පෙරහැර දවස් දහයක් නැත්නම් රෑ දහයක් පැවැත්වෙනවා. මුල් දවස් පහේ දී යන පෙරහැර 'කුඹල් පෙරහැර' ඊළඟ දවස් පහේ දී යන්නේ 'රන්දෝලි පෙරහැර'. අන්තිමදා රෑ පැවැත්වෙන 'දියකැපුම් පෙරහැරත්' පසුදා පැවැත්වෙන 'දවල් පෙරහැරත්' ගෙවදිනවාත් එක්ක ම පෙරහැර අවසන් වෙනවා.

පෙරහැර ආරම්භ කරන්නේ සුබ නැකත් බලලා. මුලින් ම කෙරෙන්නේ දේවාල හතරෙ 'කප් හිටවීම'. 'කප්' කියන්නේ කප් රුකට නැත්නම් කල්ප වෘක්ෂයට; සිතූ පැතූ සියල්ල දෙන වෘක්ෂයට. කොස් ගහක් වැනි කිරි ගහක අතු කැබලි කප් හිටවන්ට ගන්නේ. පෙරහැර අවසන් වුණු හැටියෙ ම 'වලි යක් නැටුම' නැත්නම් 'වලි යක් මංගල්ලෙ' නම් ශාන්ති කර්මයක් පැවැත්වෙනවා. විෂ්ණු දේවාලෙ පෙරහැරට සම්බන්ධ වූ සියලු දෙනාගේ ම වස් දොස් යන්ට යි මේ මංගල්ලෙ පවත්වන්නෙ.

කුඹල් පෙරහැර රන්දෝලි පෙරහැර තරම් දැකුම්කලු නෑ. එහි ගමන් කරන බස්නායක නිලමේලාත් අලි ඇතුනුත් සැරසී ඉන්නෙ චාම් ඇඳුම් පැලඳුම්වලින්. දේවාභරණ ගෙන යන්නේ ලීයෙන් කරපු 'රන්හිලි ගෙවල්වල'. කුඹල් පෙරහැරේ 'රන් දෝලි' ගෙන යන්නේ නෑ. රන්දෝලි ගෙන ගියේ රජතුමාගෙ අග බිසෝවරුන් සඳහා.

රන්දෝලි පෙරහැරේ නිලමේලාත් අලි ඇතුනුත් ගමන් කරන්නෙ වර්ණවත් ඇඳුම් ආයිත්තම් ඇඳගෙන. දේවාභරණ ගෙන යන්නේ රිදියෙන් කළ 'රන්හිලි ගෙවල්වල'. මේ පෙරහැරට 'රන්දෝලි පෙරහැර' කියා කියන්නේ එහි 'රන්දෝලි' ගෙන යන හින්දා. රජතුමාගේ අග බිසෝවරුන්ටත් 'රන්දෝලි'

කියා කීවා.

දිය කැපුම් පෙරහැර පටන් ගන්නෙ මහ රෑට. ඒ පෙරහැර මුලින් ම එන්නෙ අස්ගිරි විහාරෙ ආදාහන මළුවෙ ගෙඩිගේ විහාරෙට. දළදා කරඬුව එහි තැන්පත් කරලා පේරාදෙණියෙ ගැටඹේ තොටට යනවා. ගැටඹේ තොට තියෙන්නේ මහවැලි ගං ඉවුරෙ. එහි දී ගඟ මැදට ගිහින් 'දිය කැපීමේ මංගල්ලෙ' සිද්ධ කරනවා.

මේ පෙරහැර ආපසු එන අතරතුරේ දී ගණ දෙවි කෝවිල ළඟ නවත්තලා ගණ දෙවියන්ට පුද පූජා පවත්වනවා. එතැන් සිට ඒ පෙරහැර මාලිගාවට එන්නේ 'දවල් පෙරහැර' හැටියට. මේ පෙරහැරවල් ඒ ඒ දේවාලවලට ගෙවදුණාට පස්සෙ පෙරහැර අවසන් වෙනවා.

පෙරහැරේ මුලින් ම ගමන් කරන්නේ කසකාරයො. ඊළඟට කොඩි ගෙන යන්නො. පළමු වන ඇතා පිට නැග එන්නේ 'පෙරමුණෙ රාල'. ඊට පස්සේ ඇතෙකු පිට එනවා 'ගජනායක නිලමේ'. ඔය විදිහට බස්නායක නිලමේවරුත්, දියවඩන නිලමේතුමාත් පෙරහැරේ ගමන් කරනවා නැටුම් කණ්ඩායම් පෙරටු කරගෙන.

පෙරහැරේ කොඩි ගෙන යන අනුපිළිවෙළකුත් තියෙනවා. මුලින් ම හතර කෝරළේ ඉර හඳ කොඩිය. ඊළඟට හත් කෝරළේ කොඩිය. ඔය විදිහට ඌව, මාතලේ, සබරගමුව, වලපනේ, උඩ පළාත ආදි පළාත්වල කොඩි ගත් අය ගමන් කරනවා. දළදා කරඬුව රැගත් මාලිගාවේ ඇතා පෙරහැරේ ගමන් කරන්නේ බොහොම ගරු ගාම්භීරව.

ඇසළ පෙරහැර පවත්වන්නේ වැස්ස වලාහක දෙවියන්ගෙන් වැසි ඉල්ලලා. ඒ කන්නලව්ව දෙවියන්ට ඇහිලා වගේ ගැටඹේ තොටේ දිය කපන මොහොතෙ වැසි පොදක් වැටෙනවා. ගඟක් මැදට ගිහින් රන් කඩුවකින් 'දිය කපලා' රන් කෙණ්ඩියක් පුරවා ගන්න කොට වහින්නෙ කොහොමද කියලා විද්‍යාඥයන්ට කියන්ට බැරි වුණාට එය සිද්ධ වෙන්නෙ දළදා හාමුදුරුවන්ගෙ අනුහසින් බව සිංහල බෞද්ධයන්ට විශ්වාස යි.

දිසානායක, ජේ. බී., **සිරි දළදා මාලිගාව**, කොළඹ, 2014, 52 - 53 පිටු

## ව්‍යවහාර සිංහලය ලිවීමට හැකි ද?

''සිංහල ප්‍රාකෘතය වැඩට ගත යුතුය' කියන මාතෘකාවෙන් 1957 අවුරුද්දේ පියවර සඟරාවට සෙනරත් පරණවිතාන තුමා බොහොම වැදගත් ලිපියක් ලීවා ඔබට මතක ඇති. ඒ ලිපිය භාෂා විපරිණාමය පිළිබඳව ඉතාම පැහැදිලි විවරණයක් හැටියට සලකන්න පුළුවනි. ව්‍යවහාර සිංහල භාෂාව ලිවීමට ගත යුතුය යන ආන්දෝලනය පටන්ගත්තේ ඉටත් අවුරුදු දහයකට විතර ඉස්සරයි. 1947 දී යක්කඩුවේ ප්‍රඥාරාම හාමුදුරුවන් පළ කළ මිතුරන් කෙටවීම කියන වනකතාපොත් පෙළේ පළමුවන පොතේ ව්‍යවහාර සිංහලයෙ ව්‍යාකරණයක් නැතෙයි කියන්නන්ට තදේට පහරදීලා තියෙනවා. මාර්ටින් වික්‍රමසිංහ තුමා සාහිත්‍ය කලාව කියන නමින් පළ කළ සාහිත්‍ය විචාර පොතේ යක්කඩුවේ හාමුදුරුවන්ගේ අර කියමන් බොහොම ප්‍රශංසාවට ලක් කරලා තියෙනවා. මම ලියලා පළකරපු 'සිංහල සාහිත්‍ය භාෂාවේ අනාගතය', 'සිංහල ගද්‍ය සාහිත්‍යයේ භාෂාව', 'ශිෂ්ට ප්‍රයෝග යනු මොනවා ද', 'සිංහල සාහිත්‍යයට හිතකර භාෂා මාධ්‍යයක්'යනා දි ලිපිවලිනුත් සම්මත ග්‍රන්ථ භාෂාවේ තිබෙන සමහර දරදඬු ගති හුඟක් දුරට විවේචනය වුණු බව පාඨක ලෝකය දන්නවා. යක්කඩුවේ හාමුදුරුවොත් පරණවිතාන තුමාත් ඉදිරිපත් කෙළේ ව්‍යවහාර සිංහලය මුළුමනින්ම ලිවීමට ගත හැකිය කියන තර්කයයි. මම කෙළේ ඊට වඩා ටිකක් 'ප්‍රතිගාමී' හැටියට සමහරුන් සලකන වැඩක්; ඒ කියන්නෙ මුළු මහත් ව්‍යවහාර භාෂාවෙන් ලියමු කියන එක කරන්න බැරි වැඩක්ය, නුමුත් ලියන භාෂාවෙ තිබෙන විශේෂ ව්‍යාකරණ නීති නම් බොහොම පහසුවෙන් ඉවතලන්න පුළුවන්ය යන අදහසක් පැහැදිලි කරලා දීමයි. මේ ඡේදයෙ නම් කරපු කවුරුත්

ලියන භාෂාවෙ දූනට පවත්වාගෙන යන්නාවූ දරදඬු ලක්ෂණවලට විරුද්ධ වූ අය නිසා මේ සියල්ලන්ම එක්තරා ආන්දෝලනයක් එකහෙළා ඉදිරිපත් කළ කොට්ටාසයක් හැටියට සැලකුවාට වරදක් නැහැ. ඇරත්, මේ අදහස්වලට විරුද්ධව සැලකියයුතු ලිපියක් ලේඛනයක් පළ නොවීම නිසා පෙනෙන්නෙ, කොහොම ලිව්වත් කිව්වත් රටේ කවුරුත් පාහෙ ඒ ආන්දෝලනයට විරුද්ධත්වයක් එළිපිට නොදක්වන වගයි. ව්‍යවහාර සිංහලය ලිවීමට ගත හැකිද කියන මේ ලිපියෙන් මම අදහස් කරන්නෙ මේ අයගේ කීම් තවදුරටත් පරීක්ෂා කර බලාලා ව්‍යවහාර සිංහලයෙන් ලිවීමට ගත හැක්කේ කෙබඳු කොටසක් ද කියන එක පැහැදිලි කර දීමයි. මේ ආන්දෝලනයේ පුරෝගාමී වියතා යක්කඩුවේ හාමුදුරුවන් නිසා උන්වහන්සේට පිරිනමන සඟරා කලාපයක මේ විෂය සම්බන්ධව ලිපියක් පළ කරවීම සුදුසු බව සිතූ කර්තෘවරුන්ට මම ඉස්තුතිවන්ත වෙන්න ඕනෑ.

භාෂාව කියන්නෙ කුමක්ද කියන ප්‍රශ්නය පළමුවෙන් ම සලකා බලමු. අපි නිතරම සිංහල භාෂාව, ඉංගිරිසි භාෂාව, හින්දි භාෂාව ආදී නම් පාවිච්චි කරනවා. සිංහල වූ කවුරුත් කථා කරන්නෙ එකම සිංහල භාෂාව ය. ඉංගිරිසි වූ කවුරුත් කථා කරන්නෙ එකම ඉංගිරිසි භාෂාවය යනාදී අදහස් අපි පිළිගෙන තියෙන්නෙ භාෂාවල යථා තත්වය අපි හරිහැටි විභාග කර නැති නිසයි. පළමුවෙන්ම, හැම භාෂාවකම නොයෙක් ප්‍රාදේශික ප්‍රභෙද තියෙනවා; මේ ප්‍රභෙද හුදෙක් ශබ්දකෝෂයට පමණක් සීමා වී නැහැ. උච්චාරණ තනු වෙනස්; ශබ්දෝච්චාරණයේ නොයෙක් වෙනස් කම් තියෙනවා. මේ වෙනස්කමුයි ශබ්දකෝෂයේ ඇති වෙනස්කමුයි එකතුවට ගත්තාම විවිධ ප්‍රාදේශික භාෂා අතර ඇති පරතරය කෙබඳුද කියන එක පැහැදිලිව බලාගන්න පුළුවනි. එපමණක් නොවෙයි. අවස්ථාවෙන් අවස්ථාවට භාෂා ප්‍රයෝග වෙනස් කර යොදන්න සිද්ධවෙනවා. හාමුදුරුවො බණ කියන කොට පාවිච්චි කරන භාෂාව හෝ පාදිලි උන්නාන්සේ දේශනා කරන කොට පාවිච්චි කරන භාෂාව හෝ ඒ හාමුදුරුවො හරි පාදිලි උන්නාන්සෙ හරි සාමාන්‍ය කථා ව්‍යවහාරයේදී යොදන භාෂාවට වඩා වෙනස්. ගුරුතුමා පාසැලේ ළමුන්ට උගන්නන කොට යොදන භාෂාව උන්නැහේ ගෙදර පවුලේ අයට කථා කරන කොට පාවිච්චි කරන භාෂාවට වඩා විලාසයෙන් වෙනස්. දේශපාලකයා මහජන වේදිකාවෙන් කර කථාවෙ භාෂාව මන්ත්‍රීතුමා තානායමට ගියාම පාවිච්චි කරන භාෂාවෙන් වෙනස්. මේ ආදි වශයෙන් අවස්ථාවෙන් අවස්ථාවට සිද්ධියෙන් සිද්ධියට වෙනස් වෙනස් පරිද්දෙන් භාෂා විධි යොදා ගැනීම හුදෙක් ශබ්දකෝෂයට පමණක් සීමාවී නැහැ. ශබ්දකෝෂය භාෂාවේ ප්‍රබල අංගයක් නිසා ශබ්දකෝෂය අතින් දක්නා ලැබෙන වෙනස්කම් ප්‍රබල වෙනස් කම් තමයි; නුමුත් ඒ ඒ අවස්ථාවෙන් අවස්ථාවට ගැලපෙන පරිදි උච්චාරණවිධිත් වෙනස් කරනවා සිරිත් වශයෙන්. හාමුදුරුවො බණ කියන කොට උච්චාරණය කරන මහාප්‍රාණ, බොහෝ දේශපාලකයන් වේදිකාවෙන් උච්චාරණය කරන තාලුජ, ඌෂ්ම ශබ්ද හාමුදුරුවො හෝ දේශපාලකයො සාමාන්‍ය ව්‍යවහාරයේදී පාවිච්චි කරන්නේ නෑ, පාදිලිතැන පල්ලියේ දේසනාවෙදි පාවිච්චි කරන උච්චාරණ තනු විධි ඒ අවස්ථාවට ම සීමා වූ උච්චාරණ තනු විධියි. වියරණ අතිනුත් මේ උප භාෂාවිධි අතර ඇතැම් වෙනස් කම් දූක්ක හැකියි. සමහරු, මම දූකලා තියෙනවා, සමහර අවස්ථාවලදී 'මම යනවා' කියනවා; සමහර අවස්ථාවලදී 'මා යනවා' කියනවා. මම මේ කරන්නෙ ඒ යෙදුම්වල හරි වැරදි සොයන එක නොවෙයි; මිනිස්සු භාෂාව භාවිතා කරන විදිය විපරම්කර බැලීමයි. මේ ආදි වශයෙන් එකම භාෂා සමාජය තුළ විවිධ ප්‍රාදේශික භාෂාත් අවස්ථානුගත භාෂාත් ගණනාවක් තිබෙන බව පරීක්ෂාකර බැලීමේදී හොඳින්ම පෙනීයනවා. එකම පුද්ගලයාට විවිධ අවස්ථාවෙන් අවස්ථාවට භාෂා ප්‍රයෝග සුදුසු පරිදි වෙනස් කර යෙදීමට ශක්තියක් තිබෙනවා. මේ නම් භාෂාවේ පවත්නා නිර්මාණක ශක්තිය නිසයි. භාෂාවේ නිර්මාණක ශක්තිය දූක්වීමට හොඳම නිදර්ශනයක් තමයි අපිට කවදාවත් නාහපු, නොකියපු වාසගම් සම්මත රීති අනුව කියන්න පුළුවන් වීම. 'සුගතපාල ද සිල්වා උන්නැහෙ මේ ලිපිය ලියන්නෙ යෝක් විශ්වවිද්‍යාලයෙ ඉඳගනයි' කියන වාක්‍යය ඔබ මීට පෙර අහල නෑ; කියලත් නෑ. නුමුත් ඒ වාක්‍යය දූන් ඇහුණාම තේරුම් ගන්න ඔබට පුළුවන්, ඒ විදිහෙ පෙර නොකියූ විරූ වාක්‍ය කියා අනුන්ට තේරුම් ගන්නන්නත් ඔබට පුළුවන්. මීට හේතුව, දළ වශයෙන් එක්තරා ව්‍යාකරණ රීති සමුදායක් පදනම් කරගෙන, සම්මත ශබ්දකෝෂයෙන් වචන තෝරාගන නොයෙකුත් අලුත් වාක්‍ය නිර්මාණය කළහැකිවීමයි. සීමාසහිත රීති සමුදායක් සීමාරහිත ශබ්ද කෝෂයක් සමග යොදා සීමාරහිත වාක්‍ය සමුදායක් නිර්මාණය

කළ හැකි වීමයි මම භාෂාවේ නිර්මාණක ශක්තිය කියා කිව්වෙ.

මෙයින් අපට පෙනෙන ප්‍රධාන කරුණු මෙන්න මේවායි; මුළු භාෂා සමාජයට තබා එකම පුද්ගලයාට වත් එකම භාෂා විධියක් ඇත්තේ නැහැ. භාෂා ප්‍රයෝග අවස්ථානුගතව වෙනස් වන නිසා එකම පුද්ගලයා වුවත් ඒ අනුව වෙනස් වෙනවා. එකම පුද්ගලයා තුළ ඒ ඒ ප්‍රයෝග සඳහා පොදුවේ ඇත්තේ පොදු වියරණ රීති මාලාවක් පමණයි. පොදු සීමාසහිත වියරණ රීති මාලාවක් පදනම් කරගෙන විවිධ අවස්ථාවලට අනුව භාෂාව හසුරුවමින් කථා කළ හැකි වී තිබෙන්නේ උච්චාරණ විධි පිළිබඳ සාමාන්‍ය වෙනස් කමුත් ශබ්දකෝෂය අතින් දක්නා ලැබෙන ප්‍රබල වෙනස් කමුත් නිසයි. වියරණය අතිනුත් වෙනස් කම් දක්නට ලැබෙන බව මම කිව්වා. නුමුත් ඒ වෙනස් කම් ගණනින් ස්වල්පයයි; ශබ්දකෝෂයේ වෙනස් කම් මෙන් බහුල නැහැ. එකම වචනය උනත් අවස්ථාවෙන් අවස්ථාවට විවිධ අර්ථ ජනනය කරන නිසා ශබ්දකෝෂය අතින් භාෂාවේ පොදු කමක් නැහැ.''

ද සිල්වා, ම.ව. සුගතපාල, **යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම උපහාර අංකය**, කොළඹ, 2001, 202 - 205 පිටු

# 12

# ගුත්තිල කාව්‍යයේ පසුබිම හඳුනා ගැනීම

**නිපුණතාව** : 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 2.2 නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ ආකෘතිය, අර්ථාවබෝධයෙන් යුතු ව කියවා එහි ස්වභාවය හා සමාජ සංස්කෘතික පසුබිම පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :
- ගුත්තිල කාව්‍යයෙහි කතුවරයා කාලය හා සමකාලීන සාහිත්‍ය පසුබිම විස්තර කරයි.
- ගුත්තිල කාව්‍යයෙහි තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- ගුත්තිල කාව්‍යයෙහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- ගුත්තිල කාව්‍යයෙහි නිර්දිෂ්ට කවිවල අර්ථ පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- ගුත්තිල කාව්‍යයෙහි කතුවරයා, කාලය හා සමකාලීන සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු රැස් කරගන්න.
- මේ සඳහා අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.

ii **ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

*උදා :* * ගුත්තිල කාව්‍යය පිළිබඳ පෙර දැනුම විමසීම

* ගුත්තිල කාව්‍යය රචනා වීම පිළිබඳ ජනප්‍රවාදයේ එන කතාන්දරයක් සිහිපත් කිරීම

* දෙන සග සැප නැ තක්
  සිහි කළවුන්ට මොහො තක්
  මොක් පුර මහ ව තක්
  කියම් මුනි රජුගෙ පෙර සිරි තක් (ගුත්තිල කාව්‍යය, 13 කවිය)

  යන පද්‍යය ගායනා කොට ගුත්තිල කතුවරයාගේ අරමුණ හා වස්තු විෂය පැහැදිලි කිරීම

iii **ඉගෙනුම සංවර්ධනය**

- ගුත්තිල කාව්‍යයේ පසුබිම සහ කෝට්ටේ යුගයේ සාහිත්‍ය පසුබිම පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නඟන්න. එහි දී පහත අංශ පිළිබඳ අවධානය යොමු කරන්න.
  - කෝට්ටේ යුගයේ සමාජ, දේශපාලනික හා සාහිත්‍ය පසුබිම
    * රාජ්‍යානුග්‍රහය සහ දේශපාලන සංහිඳියාව - සවන පැරකුම්බා රාජ්‍ය සමය (1412 - 1467)
    * කෝට්ටේ යුගයේ සාහිත්‍යික පසුබිම
      - විවිධ කාව්‍ය ග්‍රන්ථ රචනා වීම

- කවියට මුල් තැන හිමි වීම
- ගිහි පැවිදි උගතුන් සාහිත්‍යකරණයට යොමු වීම

* බෞද්ධ හා හින්දු ආගම් අතර ආගමික අනුකලනය
* අධ්‍යාපන විද්‍යායතන (පිරිවෙන්) බිහි වීම
* ආර්ථික සමෘද්ධිමත් භාවය

- ගුත්තිල කාව්‍යයේ පසුබිම -
  * කාලය : කෝට්ටේ රාජධානි සමය සහ වෙළෙඳ ආර්ථිකයේ වර්ධනය
  * කතුවරයා - වෑත්තෑවේ හිමි
- ගුත්තිල කාව්‍යය හා එහි කතුවර හිමි පිළිබඳ ජන ප්‍රවාදයේ එන පුවත් ද සිහිපත් කරන්න.

*උදා :* * සිරි රහල් හිමියන් ගෝල හිමි නමක වශයෙන් විසූ අවධියේ සිදු වීම්
  * පල නොකියා පලා බෙදීමේ පුවත
  * ගුරු ද්‍රෝහී වීමේ විපාක දන්නා බව තම ගුරුවරයාට හැඟවීම සඳහා ගුත්තිල කාව්‍යය රචනා කළ බව
  * ගුරු ද්‍රෝහී වීමෙන් මහත් ව්‍යසනයට පත්වන බව

- ගුත්තිල කාව්‍යයේ තේමාව හඳුන්වා දෙන්න.
- ගුත්තිල කාව්‍යයේ අන්තර්ගතය පිළිබඳ කෙටියෙන් හඳුන්වා දෙන්න.
  * වර්තමාන කතාව
  * 01 - 90 කවි - තෙරුවන් නැමදීම, ආරාධනය, බුදුගුණ වැනීම, දෙව්දත්ගේ නුගුණ, දම්සබා මණ්ඩපයේ කතා
  * අතීත කතාව

| | | |
|---|---|---|
| 91 - 107 | කවි - | බරණැස් හා බඹදත් රජු වැනුම |
| 108 - 113 | කවි - | ගුත්තිල ඇදුරු හඳුන්වා දීම |
| 114 - 131 | කවි - | උදේනි නුවර සැණකෙළි වැනුම |
| 132 - 170 | කවි - | මූසිල වෙළෙඳ හමුව, ගුත්තිල වැනුම, මූසිල බරණැසට පැමිණීම හා ශිල්ප ඉගැනීම |
| 171 - 224 | කවි - | වාදයට එළැඹීම, ගුත්තිලගේ කලකිරීම, ශක්‍රයාගේ පැමිණීම |
| 225 - 264 | කවි - | වාද මණ්ඩපය ඉදි කිරීම, වාදය ඇසීමට පැමිණි පිරිස |
| 265 - 308 | කවි - | ගුත්තිල ඇදුරු පැමිණීම - වීණා තරගය |
| 309 - 313 | කවි - | සුරඟන රැඟුම |
| 314 - 337 | කවි - | ගුත්තිල ඇදුරු උපහාරය - ජයකෙළි |
| 338 - 346 | කවි - | නිශා වර්ණනය |
| 347 - 414 | කවි - | දෙව්ලෝ ගමන |
| 415 - 466 | කවි - | දෙවියන්ට වීණා ගැයීම |
| 467 - 476 | කවි - | ගුත්තිල ඇදුරු මිනිසුන්ට බණ කීම |

- ගුත්තිල කාව්‍යයේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
  * ආකෘතිය - සිවුපද, සඳැස්, ස්වාධීන කාව්‍ය ආකෘතිය
  * ඖචිත්‍ය ගුණය
  * ධ්වනි පූර්ණ බව
  * අලංකාර

  * චරිත නිරූපණ
  * වර්ණනාවන්හි නිර්ව්‍යාජත්වය
  * කතුවරයාගේ ස්වීයත්වය

- ගුත්තිල කාව්‍ය කෘතිය කියවා රස විඳීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.
- ගුත්තිල කාව්‍යය පිළිබඳ වැඩිදුර පසුබිම් තොරතුරු ගවේෂණයට සහ ඒ පිළිබඳ ලියැවුණු විචාර කෘති කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම අතරතුර ශිෂ්‍ය සාධනය මැන බැලීමට සුදුසු ඇගයීම් ක්‍රම යොදා ගනිමින් තක්සේරුකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

  *උදා :* * ගුත්තිල කාව්‍යයේ කතුවරයා, කාලය, අරමුණ හා තේමාව පිළිබඳ වාචික ප්‍රශ්න ඇසීම
  * ගුත්තිල කාව්‍යය සඳහා පදනම් කර ගත් ජාතක කතාව කෙටියෙන් ලිවීමට අවස්ථාව දීම
  * කෝට්ටේ රාජධානි සමයේ ලියැවුණු කාව්‍ය ග්‍රන්ථ හා කතුවරුන් ඇතුළත් නාමාවලියක් සකස් කිරීමට යොමු කිරීම
  * කෝට්ටේ රාජධානි සමයේ සාහිත්‍ය උන්නතියට හේතු වූ කරුණු ලැයිස්තු ගත කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- ගුත්තිල කාව්‍යය පිළිබඳ ජනප්‍රවාද
- ගුත්තිල කාව්‍යය පිළිබඳ විචාර කෘති

**මුඛ්‍ය පද (Keywords) :**

- **ඖචිත්‍යය** - උචිත බව හෙවත් යෝග්‍ය බව
  **(Congruity)**
  කවර සාහිත්‍යාංගයක දී වුව ලේඛකයා විසින් උපයෝගි කෙරෙන අදහස්, වචන, කාව්‍යෝක්ති, නිරූපණය කෙරෙන චරිත ආදි සියලු අංගෝපාංගයන් පිළිබඳ ඖචිත්‍යය රැකීම අත්‍යවශ්‍ය බවත් අනෞචිත්‍යය හෙවත් අනුචිත බව නිර්මාණයක සාර්ථකත්වයට හානිකර බවත් පිළිගැනේ.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 59-60 පිටු

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ගුත්තිල කාව්‍යයේ කතුවරයා හා කාලය නම් කරයි.
- ගුත්තිල කාව්‍යයේ අරමුණු හා තේමාව පැහැදිලි කරයි.
- ගුත්තිල කාව්‍යය සඳහා පදනම් කර ගත් ජාතක කතාව කෙටියෙන් විස්තර කරයි.
- සිංහල සාහිත්‍ය කෘති අතර ගුත්තිල කාව්‍යයේ සුවිශේෂත්වය විස්තර කරයි.
- කෝට්ටේ අවධියෙහි සාහිත්‍ය උන්නතියට හේතු වූ කරුණු පැහැදිලි කරයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

ගුණවර්ධන, ඩබ්ලිව්. එෆ්. - **ගුත්තිල කාව්‍ය වර්ණනා**
ජයතිලක, කේ. - **සිංහල කතා කලාවේ විකාසනය**
ප්‍රඥාරාම, යක්කඩුවේ - **ගුත්තිල විචාර විචාරය**
වික්‍රමසිංහ, කේ. ඩී. පී. - **කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍ය විකාශනය**
වික්‍රමසිංහ, මාර්ටින් - **ගුත්තිල ගීතය**
වික්‍රමසිංහ, මාර්ටින් - **සිංහල සාහිත්‍යයේ නැගීම**
සූරවීර, ඒ. වී. - **සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය**

# 13

## නූතන සිංහල කාව්‍ය රසාස්වාදය හා විචාරය
**(ආනන්ද රාජකරුණා සිට සාගර පලන්සූරිය තෙක්)**

**නිපුණතාව** : 6.0 නූතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.2 කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 13 යි.

**ඉගෙනුම් පල** :
- නූතන කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නූතන පද්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- නූතන කාව්‍ය රසාස්වාදය හා විචාරය සඳහා යොදා ගන්නා නූතන විචාර ක්‍රම පිළිබඳ තොරතුරු රැස් කර ගන්න. ඒ සඳහා පරිශීලනීය ග්‍රන්ථ භාවිත කරන්න.
- නිර්දිෂ්ට සිංහල කාව්‍ය නිර්මාණවල රචකයන්, ඔවුන් විසූ කාලය, සාහිත්‍යික පසුබිම, නිර්දිෂ්ට පද්‍ය පන්ති හා ඔවුන්ගේ වෙනත් නිර්මාණ ආදිය පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.
- පහත සඳහන් නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල තේමාව/වස්තු විෂය, භාෂාව, ආකෘතිය, අලංකාර භාවිතය, කාව්‍යෝපක්‍රම ආදි තොරතුරු අධ්‍යයනය කරන්න.
- මෙම පාඩම සඳහා නිර්දිෂ්ට නූතන සිංහල කාව්‍ය නිර්මාණ:
  - කොළඹ කවියේ ප්‍රථම තරංගය
    - * ආනන්ද රාජකරුණා - සමනලයා
    - * ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ
  - කොළඹ කවියේ ද්විතීය තරංගය
    - * පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ
    - * සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින

ii **ප්‍රවේශය**

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.

  උදා:

  * කොළඹ කවියේ ප්‍රථම තරංගය හෝ ද්විතීය තරංගය හෝ නියෝජනය කෙරෙන අනිර්දිෂ්ට කාව්‍ය නිර්මාණයක් ඇසුරින් සංවාදයක් ගොඩ නැගීම (ඇමුණුම 01)

* ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලවා කාව්‍ය නිර්මාණයක් කියවීමට (Reciting) සැලැස්වීම
* නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධත්වය පිළිබඳ සුදුසු ක්‍රමවේදයක් ඇසුරෙන් ඉදිරිපත් කිරීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ එකිනෙක ගෙන ඒවායේ කතුවරයා, කාලය, සාහිත්‍ය පසුබිම, කතුවරයාගේ වෙනත් නිර්මාණ ආදි තොරතුරු ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ පිළිබඳ රසාස්වාදයක නිරත වන්න. මේ සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්, රස වින්දන සංවාද, දේශන, සාකච්ඡා ආදි ක්‍රම යොදා ගත හැකි ය.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.
  * තේමාව/වස්තු විෂය
  * කවියාගේ දෘෂ්ටිය
  * අරමුණ
  * කාව්‍යෝපක්‍රම
  * භාෂාව භාවිතයේ සුවිශේෂතා
  * විරිත
  * ආකෘතිය

**iv. තක්සේරුව හා ඇගයීම**

- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි ඇගයීම් හා තක්සේරු ක්‍රම ඉවහල් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- මෙහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.
  * නූතන කාව්‍ය විචාර මතවාද පිළිබඳ දැනුම
  * කාව්‍ය රසවින්දන හැකියාව
  * විචාර පූර්වක ව කාව්‍ය රසාස්වාදයක් ලිවීමේ හැකියාව

**ගුණාත්මක යෙදවුම්**

- අනිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණ කිහිපයක්
- නූතන පද්‍ය පිළිබඳ විචාර ග්‍රන්ථ
- ඇමුණුම 01

මුඛ්‍ය පද **(Keywords)** :

- **උත්ප්‍රාසය**
  **(Irony)** — වචන මඟින් කියවෙන අදහසට හාත්පසින් වෙනස් අර්ථ පැවසෙන ප්‍රකාශය. බොහෝ විට මෙහි උපහාසාත්මක අර්ථයක් ගැබ් වේ. සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 45 පි.

- **උත්ප්‍රේක්ෂාලංකාරය** — පන්තිස් අලංකාරයන්ගෙන් එකකි. සිදත් සඟරාව මෙය 'උපේලකර' යි නම් කරයි. මෙය සියබස්ලකරෙහි නම් කර ඇත්තේ 'අයල සිත්' යනුවෙනි. සචේතනික හෝ අචේතනික යම් වස්තුවක අන්‍යාකාර ප්‍රවෘත්තියක් තදන්‍යාකාරයකින් කල්පනා කරතොත් ඒ අයථා චින්තාව උත්ප්‍රේක්ෂාලංකාරය යි. උදාහරණ;

''සුලකළ මිණි මෙවුල්
රත සක ලෙසින් සුවිපුල්
පුළුලුකුළ මනකල්
යොවුන් මිණි ගඟ වැලිතලා තුල්''
කාව්‍යශේඛරය

උත්ප්‍රාසය මෙයින් වෙනස් වන්නේ එහි අවශ්‍යයෙන් ම උපහාසාත්මක ස්වරයක් ගැබ් වීමෙනි.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 45-46 පිටු

- **ඉෂ්ටාර්ථය/තේමාව (Theme)**

සාහිත්‍ය කෘතියක අන්තර්ගත වන හෝ ඉන් ප්‍රකාශ කෙරෙන හෝ සමස්ත අර්ථය. ...
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 43 පි.

- **ස්වරූපය/ආකෘතිය (Form)**

ගද්‍ය, පද්‍ය, නාට්‍ය ආදි සාහිත්‍යාංග පමණක් නො ව සෑම කලා නිර්මාණයක් ම අන්තර්ගතය (Content) ස්වරූපය (Form) යන අංග දෙකෙන් සමන්විත වන බව සාම්ප්‍රදායික පිළිගැනීම යි. සාහිත්‍ය නිර්මාණයක් සම්බන්ධයෙන්, එහි අන්තර්ගතය වෙන් කර ගත් කල්හි ඉතිරි වන සියලු දෑ ස්වරූපයට අයත් වේ. උදාහරණයක් වශයෙන්, කාව්‍යය යන සාහිත්‍යාංගය ගත හොත් වෘත්තය, තාලය, යතිය ආදියත්, එළිය, රිද්මය, අනුප්‍රාස, පාද සංඛ්‍යාව, උපමා, රූපක, අලංකාර, සංකේත, සංකල්පරූප, භාෂා ප්‍රයෝග ආදි වශයෙන් එහි අන්තර්ගතය කාව්‍ය නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීම සඳහා කවියා විසින් භාවිත කරනු ලබන සියලු ශිල්ප විධි සහ භාෂා විධි ස්වරූපයට අයත් කළ හැකි ය.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 244 පි.

- **කවිත්වය**

'කවිය' යන්න කාව්‍යය, කාව්‍ය රචකයා, පණ්ඩිතයා හෙවත් උගතා, ප්‍රතිභා ශක්තියෙන් යුක්තයා යන අර්ථයන්හි යෙදේ. කවිත්වය නම් ඒ තත්ත්වය යි.
'නරත්වං දුර්ලභං ලෝකෙ - විද්‍යා තත්‍ර සුදුර්ලභා
කවිත්වං දුර්ලභං තත්‍ර - ශක්තිස්තත්‍ර සුදුර්ලභා - අග්නිපුරාණ
(මනුෂ්‍යත්වය ලෝකයේ දුර්ලභ ය. එහිදු විද්‍යාව අතිශය දුර්ලභ ය. එහිදු කවිත්වය දුර්ලභ ය. එහිදු කවි ශක්තිය අතිශය දුර්ලභ ය.) මේ කියමන අනුව කවිත්වය අතිශයින් ම දුර්ලභ තත්වයක් බව පැවසේ.
ඇතැම් විට කවිත්වය යන්න ප්‍රතිභානය යන අර්ථයෙහි ම යෙදෙන බව පෙනේ.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 68 පි.

- උපමාව/උපමාලංකාරය

**(Simile)**

උපමාව නම් යම් වස්තුවක් වඩා හොඳින් පැහැදිලි කිරීම සඳහා හෝ තේරුම් කිරීම සඳහා තවත් වස්තුවකට සමාන කොට දක්වීම ය. උපමාවක් දක්වීමේ දී අවශ්‍යයෙන් ම 'මෙන්', 'සේ', 'වැනි', 'එව්' ආදි උපමා වාචක නිපාත පදයක් සමඟ යෙදේ. උදා: ''ඔහුගේ හද ගලක් මෙන් දැඩි ය.'' ''උපමාලංකාරය කාව්‍යයේ ඉතාමත් ප්‍රකට වූ ද ප්‍රධාන වූ ද අලංකාර විශේෂය යි. එක් පදාර්ථයක් අනෙක් පදාර්ථයක් හා සමාන කොට දැක්වීම හෙවත් උපමානෝපමේයයන්ගේ සාම්‍යය ප්‍රකාශ කිරීම උපමාලංකාරය යි. යම් වස්තුවක ස්වභාවය කීමට ඒ හා සමාන වූ හෝ එයට වඩා උසස් වස්තුවක් බැහැරින් ගෙන හැර දක්වීම මෙයින් අදහස් කෙරේ.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 50 පි.

- එළිසමය

'එළිවැට' යි ද යෙදේ. පද්‍යයක සතර පාදය ම සමාන අකුරකින් අවසන් කිරීම. එළිසමය පද්‍යයේ අග පමණක් නො ව මුල හා අනෙක් තන්හි ද තැබිය හැකි ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 54 පි.

- චමත්කාරය

**(Aesthetic Delight)**

චමත්කාර යන සංස්කෘත පදයෙන් අද්භූත, විස්මය ආදි අර්ථ ලැබේ. මීට සමාන ඉංග්‍රීසි පදයක් දක්වීම අපහසු වෙතත් Aesthetic delight යන යෙදුම ඉදිරිපත් කළ හැකි ය. විස්මය නම් භාවය නොහොත් ස්ථායිභාවය මුල් කර ගෙන අද්භූත රසය හට ගන්නා බව භරතමුනි ආදි විචාරකයන් දක්වා ඇතත් පසු කාලයේ දී ඇතැම් විචාරකයෝ සියලු රසයන්ගේ සාරය චමත්කාරය බව ප්‍රකාශ කළහ.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 89 පි.

- පරිකල්පනය

**(Imagination)**

සාහිත්‍යකලා නිර්මාණ සඳහා අවශ්‍ය දෑ සිතින් මවාගැනීම.
කලා නිර්මාණ සඳහා සත්‍යයෙන් යම් ප්‍රමාණයක් සහ සිතින් මවා ගනු ලැබූ දෙයින් යම් ප්‍රමාණයක් ද සංයෝග කිරීම කලාකරුවන් අනුගමනය කරන මාර්ගය යි. නිර්මාණයක් කෙරෙනුයේ ප්‍රධාන වශයෙන් මේ දෙක්හි සංකලනයෙනි. ලොව කිසි දාක කොතැනක වත් නො වූ, නො තිබූ, නො ඇසූ විරූ අමුතු දෑ නොහොත් අද්භූතය පමණක් පරිකල්පනයට විෂය වන බව සිතීම සත්‍යයෙන් තොර ය. තමන් ඇසූ දුටු සත්‍යය වුව වෙනස් ආකාරයකින් ඉදිරිපත් කිරීම පරිකල්පනයට අයත් වේ.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 128-129පිටු

- රිද්මය

**(Rhythm)**

ගද්‍ය, පද්‍ය, රචනයේ දී ශබ්ද සංඝටනාව මඟින් ඇති වන උස් පහත් වේගය.
නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි දී ද රිද්මය දැකිය හැකි ය. ලය,

තාලය යන පද යෙදෙනුයේ ද මීට සමීප අර්ථ බලා ගෙන ය.
සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 171-172 පිටු.

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල පසුබිම් තොරතුරු විස්තර කරයි.
- නූතන කාව්‍ය විචාර සංකල්ප පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල තේමාව, ආකෘතිය, අන්තර්ගතය හා සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.
- වෙනත් නූතන කාව්‍ය නිර්මාණ රසවිඳීමට පෙලඹෙයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| කරුණාරත්න, අශෝක | - | **සාහිත්‍ය විවේචනය** |
| කරුණාරත්න, කුසුමා, සරත් විජේසූරිය | - | **නවකවි සංග්‍රහය** |
| දිසානායක, විමල් | - | **නවකවි සරණිය** |
| දිසානායක, විමල් | - | **නිර්මාණය හා විචාරය** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **නව පද්‍ය සිංහලය** |
| සුරවීර, ඒ. වී. | - | **නිර්මාණ පසුබිම** |
| සුරවීර, ඒ. වී. | - | **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා** |

ඇමුණුම 1

- **කොළඹ කවියේ ප්‍රථම තරංගය නියෝජනය කෙරෙන අනිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ**

**හඳ**

රන් පිඟාන ලෙස වටකු රූ
දිලිහි දිලිහි තිබෙන අපූ රූ
හඳහාමියෙ! හඳහාමියෙ!
කිරිත් පැණිත් දියෝ! දියෝ!

එම පිඟාන මැද හිඳින්නෙ
හාවෙකි, කිරි පැණි ද කන්නෙ
හඳහාමියෙ! හඳහාමියෙ!
කිරිත් පැණිත් දියෝ! දියෝ!
අමාවක යි නුඹ නැති දා
අටවක නැම් පනාව දා
හඳහාමියෙ! හඳහාමියෙ!
කිරිත් පැණිත් දියෝ! දියෝ!
පසළොස්වක පිඟාන දා
නුඹට මගේ දෝත ඉඳා
හඳහාමියෙ! හඳහාමියෙ!
කිරිත් පැණිත් දියෝ! දියෝ!

**ආනන්ද රාජකරුණා**

- **කොළඹ කවියේ ද්විතීය තරංගය නියෝජනය කෙරෙන අනිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ**

**අන්ධ කවියා**

සිරුරේ දාහය සනසන නලවැල් සිසිලස ගත් බව දනිමි වැවේ
රත්සර හෙලැඹුලු නිලුපුල් මී ගඳ නැහැ පුඩු අතරින් ළයට කැවේ
මායා සිහිනය මැද්දේ පිහිනමි එනමුදු නොදකිමි එළිය ලොවේ
හදවත කොඳුරයි එහි සටහන් ළඟ හිඳ පිටපත් කළ හැකි ද දුවේ?

විසිතුරු සිතිවිලි අතරින් පැනයති මීමැස්සෝ ගුමු ගුමුව දිදී
අසරණ මා දැක අමතන විලසින් සුළඟින් තුරුපත් එකට වදී
වන විහඟුන්ගේ ගීතය ඉහිරෙයි විලිකුන් පලතුරු සමග බිඳී
ලෝකය පිබිදී දොඩමලු වී ඇත මා පමණක් නෙත් අඳ ව නිදී

වැව් බන්දේසිය සොබා සොඳුරි වෙත පිළිගන්වන විට ඇඹුල තබා
පෙර මෙන් අහසේ පායන රන් හිරු වගුරන්නෙ ද මිණි කිරණ පබා
වදුලේ පරඬැල් අතුල කැදැල්ලේ තනිය ම පසුවන කුරුලු බබා
මව නැති අතරේ ''කිචි බිචි' ගෑවේ ඉගිලෙන පිණිස ද ළඟදි නොබා

අංකුර පහරින් ඉවුරේ ගස් බිඳ ගවයෝ දිය බී යති ද දොළින්
කඩි පෙරහැර වැල නොකැඩී ඇදෙති ද තවමත් නිල් තණ බිඩැලි වලින්
දියණිය ඔබ මව මට අමතන්නි ය සැඟවී හිඳ උණ පඳුර තුළින්
අමුනා මල්දම් මා ගෙල සරසනු ඈ වැළලූ තැන පිපුණ මලින්

උණුසුම සිහිල ද හඳුනමි ගුණයෙන් රෑ දාවල එක පරිදි ගෙවේ
කැලඹී පාවෙමි දුම් රොටුවක් මෙන් යට ගිය මතකෙහි සිහින ලොවේ
මවගේ කටහඬ වෙනසක් නොමැති ව සැඟවී ඇත ඔබ මුවෙහි දුවේ
ඈ දුන් රන්මල් මදහස එපරිදි ඇද්දැයි අතගා බලමි මුවේ

ඔබගේ මව සහ මා එක් දවසක් අවරඹරෙහි හිරු ගිලෙන පැයේ
හිඳගෙන හුන්විට පුලින තලාවක ඈ විමසූවා වැතිර ළයේ
'සැන්දෑ වෙල පෙති පරයන තොල් ඇති දූ මැණිකක් ඔබ රිසි ද පියේ
ඈ කී වදනෙහි සැබෑව දක්නට පෙර මගෙ නෙත් දෙක නැතිව ගියේ

මදුමල් පෙතිවල සිනිඳු මොළොක් බව මව ගේ අත්වල තිබුණු එදා
ඈ නැති වූයේ ඒවා කැටිකොට පොඩි දුවගේ අත් දෙකට පුදා
නා රොන් වැනි මුදු කෙහෙරැළි පීරා සුවඳ අලෙව් දී පොකුරු බෙදා
සරසන හැටි ඔබ දක්නට නොලැබී ඇතිවෙයි අඳ ඇස්වලට රුදා

ආලය උල්පත් දෙතැනක පිපිරී මහ ගංගාවක් පරිදි සෙනේ
උතුරා යද්දී නැංවූ සේතුව නොදකී ඇස්දෙක, සිතට පෙනේ
ඇයි මෙතරම් තෙත පොඩි කම්මුල්වල සුරතල් දුව අඬනව ද අනේ
දුව ගේ කඳුළැලි අතගැවෙන විට ලේ තැවරෙන මෙන් අතට දැනේ



**පී. බී. අල්විස් පෙරේරා**

# 14

# සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :
- සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පුරෝගාමී සිංහල නාට්‍යකරුවන්ගේ නිර්මාණ වගු ගත කරයි.
- පුරෝගාමී නාට්‍යකරුවන්ගෙන් දේශීය නාට්‍යයට සිදු වූ සේවාව අගය කරයි.
- විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳ ලියැවී ඇති පොත්පත් ඇසුරින් නිවැරදි තොරතුරු එක්රැස් කර ගන්න.
- ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගනිමින් ශිෂ්‍යයන් සඳහා ලබා දෙන තොරතුරු සහ ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.
- සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය සහ විකාසනය පිළිබඳ ව පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ තොරතුරු, ඡායාරූප, සංයුක්ත තැටි (ශ්‍රව්‍ය/දෘශ්‍ය) එක්රැස් කරගන්න.
    1. පුරෝගාමී සිංහල නාට්‍යකරුවෝ
    2. සිංහල නාට්‍යවල විවිධ ප්‍රභේද
    4. සිංහල නාට්‍ය නිෂ්පාදන/නාට්‍ය පිටපත්

ii. **ප්‍රවේශය**

- පාඩම සඳහා පහත දැක්වෙන එක් ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * සිංහල නාට්‍යයේ ආරම්භක යුගයේ නාට්‍යයකින් උපුටාගත් සංවාද ඛණ්ඩයක් නාට්‍යානුසාරයෙන් කියවීම (*උදා :* සොකරි, කෝලම්, නාඩගම් වැනි ජන නාටක කොටසක්)
  - * නාට්‍යයක ගීතයක් ඉදිරිපත් කිරීම
  - * සිංහල නාට්‍ය සාහිත්‍යයේ ඉතිහාසය පිළිබඳ කෙරෙන කෙටි නාට්‍යමය සංවාදයක් වීදි නාට්‍ය ආකෘතියෙන් ඉදිරිපත් කිරීම
  - * සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් නැරඹීමට ශිෂ්‍යයන් යොමු කිරීම
  - * පුරෝගාමී නාට්‍යකරුවකු හෝ නාට්‍යයක චරිතයක් ලෙස ශිෂ්‍යයකු පැමිණ දේශීය නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය ගැන කෙටි විස්තරයක් ඉදිරිපත් කිරීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- දේශීය සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳ පිටු පෙරළනය/කළුලෑල්ල/පවර් පොයින්ට් භාවිතයෙන් සාකච්ඡාවක් ගොඩ නඟන්න.
- සිංහල නාට්‍ය කලාවෙහි ආරම්භයට හා විකාසනයට අදාළ පහත සඳහන් අංශ පිළිබඳ නිර්මාණශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ශිල්ප සහිත ක්‍රියාකාරකම් නිර්මාණය කර ගන්න.
  - * නූතන නාට්‍ය කලාවට පෙර පැවති දේශීය ජන නාට්‍ය කලාව (දොරකඩ අස්න, ශාන්ති කර්ම, සොකරි, කෝලම්, නාඩගම්) පිළිබඳ හැඳින්වීම
  - * පුරෝගාමී සිංහල නාට්‍යකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ කෙටියෙන් හැඳින්වීම (ජෝන් ද සිල්වා, චාල්ස් ඩයස්, එදිරිවීර සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන, හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, සෝමලතා සුබසිංහ, ජයලත් මනෝරත්න, ධර්මසිරි බණ්ඩාරනායක)
- මෙතෙක් උගත් කරුණු පිළිබඳ ප්‍රතිපෝෂණයක් හා සමාලෝචනයක් සිදු කරන්න.

**iv. තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඇගයීම් කරන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- සිංහල නාට්‍යයේ ආරම්භය සහ විකාසනය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තව දුරටත් තහවුරු කිරීම සඳහාත් ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * සිංහල නාට්‍ය සාහිත්‍යයේ ප්‍රභවය, විකාසනය පිළිබඳ මිනිත්තු 02 - 03 කතාවක් පැවැත්වීම (කේවල වශයෙන්) අවස්ථාව ලබා දීම
  - * සිංහල නාට්‍යකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ වගු ගත කිරීමට (ඇමුණුම 1) යොමු කිරීම
  - * සිංහල නාට්‍ය කෘතියකින් උපුටාගත් කොටසක් රඟ දැක්වීමට අවස්ථාව ලබා දීම
  - * සිංහල නාට්‍ය සාහිත්‍යය පිළිබඳ නිර්මාණාත්මක විග්‍රහයකට (නාට්‍ය ගීත/රංගනය/පවර් පොයින්ට්/පිටු පෙරළන/පුවරු ඇසුරින්) ශිෂ්‍යයන් යොමු කිරීම
  - * සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය සහ විකාසනය පිළිබඳ කෙටි විස්තර සහිත පොත් පිංචක් සකස් කිරීමට අවස්ථාව ලබා දීම

- **මුඛ්‍ය පද (Keywords) :**

  * **අභිනය**

  නාට්‍ය පිටපතක් ප්‍රේක්ෂකයන් වෙත පැමිණවීමේ දී භාවිත කරනු ලබන මාධ්‍යය,නාට්‍ය පෙළ ප්‍රේක්ෂකයන් අබියස සජීව තත්ත්වයට පත් කෙරෙනුයේ අභිනය මඟිනි. අභිනය වූකලි ආංගික, වාචික, සාත්වික, ආහාර්ය යි සිව්වැදෑරුම් වේ.

  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 22 පි.

  * සංඝට්ටනය/ගැටුම **(Conflict)**

  ප්‍රබන්ධකථා, නවකතා, කෙටිකතා, කථාකාව්‍ය, නාට්‍ය ආදි සාහිත්‍යාංගයන් හා සම්බන්ධ කථාවින්‍යාසයෙහි සංඝට්ටනයක්

අන්තර්ගත කිරීම සාමාන්‍ය ක්‍රමය යි. 'ගැටුමක් නැති කල්හි නාට්‍යයක් ඇති නො වේ' යන කියුම නාට්‍යය සම්බන්ධයෙන් පමණක් නො ව නවකතා, කෙටිකතා ආදි අනෙක් සාහිත්‍යාංගයන් සම්බන්ධයෙන් ද සැබෑ වන්නේ ය. මේ ගැටුම යම් බලවේග දෙකක් හෝ කීපයක් අතර හෝ චරිත දෙකක් හෝ කීපයක් අතර හෝ එසේත් නැති නම් එක ම චරිතයේ අදහස් හා ආකල්ප අතර හෝ විය හැකි ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 210-211 පිටු.

- **ගුණාත්මක යෙදවුම් :**
  - * ඇමුණුම 1
  - * සිංහල නාට්‍ය සාහිත්‍යය පිළිබඳ පිටු පෙරළන/ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම
  - * දේශීය නාට්‍යකරුවන්, ඔවුන්ගේ නිර්මාණ කෘති, ඡායාරූප සහ සංයුක්ත තැටි

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය සහ විකාසනය පිළිබඳ පැහැදිලි කරයි.
- සිංහල නාට්‍යකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- සිංහල නාට්‍ය සාහිත්‍යය පිළිබඳ රචිත පොතපත කියවා තොරතුරු එක්රැස් කරයි.
- විවිධ නාට්‍ය පෙළ කියවා අගය කරයි.

- **අතිරේක පරිශීලනීය ග්‍රන්ථ**

කාරියවසම්, තිස්ස - **සිංහල නාට්‍යයේ විකාශනය**

ධර්මකීර්ති, රන්ජිත් - **නාට්‍ය ප්‍රවේශය**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහල ගැමි නාටකය**

හපුආරච්චි, ඩී. වී. - **සිංහල නාට්‍යයේ ඉතිහාසය**

ඇමුණුම 1

| නාට්‍යකරුවා | අවධිය | ඔහුගේ නිර්මාණ |
|---|---|---|
| | | |

# 15

## පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රසවින්දනය (මට්ටකුණ්ඩලී වස්තුව හා අනුරුද්ධ කුමාර කථාව)

**නිපුණතාව** : 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 1.2 නිර්දිෂ්ට කෘතිවල විශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි.

**කාලච්ඡේද** : 13 යි.

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට කෘතිවල පසුබිම පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

### i. පෙර සූදානම

- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය නිර්මාණ කියවා ඒවායේ දුරවබෝධ වචන පිළිබඳ අවබෝධය ඇති කර ගන්න.
- නිර්දිෂ්ට කතා උපුටාගත් මුල් කෘති හා කතුවරුන් පිළිබඳ පසුබිම් තොරතුරු ගවේෂණය කරන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා තව දුරටත් දැනුවත් වන්න.

### ii. ප්‍රවේශය

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.

*උදා :* * සද්ධර්ම රත්නාවලියේ හෝ පූජාවලියේ අනිර්දිෂ්ට කතාවකින් රසවත් කොටසක් කියවීම.

* සද්ධර්ම රත්නාවලියේ හෝ පූජාවලියේ සිසුන් කියවා ඇති කතාවක සාරාංශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.

### iii. ඉගෙනුම් සංවර්ධනය

- නිර්දිෂ්ට කතාවල කතුවරයා, කාලය, අරමුණ, තේමාව වැනි පසුබිම් තොරතුරු ප්‍රවේශයේ දී මතු වූ කරුණු ඇසුරෙන් හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට කතා හොඳින් කියවා ඒවායේ දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගැනීමට යොමු කරන්න. (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ඇසුරෙන්)

- නිර්දිෂ්ට කතා රසවින්දනයට හා විචාරයට අවස්ථාව ලබා දෙන්න.
- එහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

**මට්ටකුණ්ඩලී වස්තුව** (සද්ධර්ම රත්නාවලිය)

**තේමාව** : පුද්ගල මසුරු බව හෙළි කිරීම

**අන්තර්ගතය** :
* අදින්නපුබ්බක බමුණාගේ චරිත ස්වභාවය
* අදින්නපුබ්බක මට්ටකුණ්ඩලී සඳහා කුණ්ඩලාභරණ සෑදීම
* මට්ටකුණ්ඩලී රෝගාතුර වීම
* නිසි ප්‍රතිකාර නො ලැබීමෙන් මට්ටකුණ්ඩලී අසාධ්‍ය තත්ත්වයට පත් වීම
* මට්ටකුණ්ඩලී ඇතුළු ගෙයින් පිට කිරීම
* බුදුරදුන්ගේ මහා කරුණාව හා මට්ටකුණ්ඩලී බුදුන් දැකීම
* මට්ටකුණ්ඩලී සිත් පහදවා ගත් පිනෙන් දෙව්ලොව ඉපදීම
* අදින්නපුබ්බක, පුතුගේ සිරුර දවා සොහොනෙහි වැලපීම
* මට්ටකුණ්ඩලී දෙව්පුතුගේ පැමිණීම
* අදින්නපුබ්බක හා මට්ටකුණ්ඩලී දෙව්පුත් අතර සංවාදය
* අදින්නපුබ්බක බුදුපාමොක් මහ සඟනට දන් දීම
* අදින්නපුබ්බක සෝවාන් වීම

**අවබෝධය** :
* දුරවබෝධ වචන පැහැදිලි කරමින් සමස්ත අර්ථය ඉදිරිපත් කිරීම
* කතා වස්තුව අවබෝධයෙන් කියවීම
* නිර්දිෂ්ට පාඨ ලිහිල් බසින් ලිවීම

**රසාස්වාදය හා විචාරය :**

* තේමාවේ සනාතනික අගය
* කතා කලාවේ සුවිශේෂ ලක්ෂණ
* චරිත නිරූපණය
* වර්ණනා
* අවස්ථා නිරූපණය
* උපමා හා පිරුළු භාවිතය
* භාෂාවේ සුවිශේෂ ලක්ෂණ
* කතු හිමියන්ගේ ජීවන දර්ශනය

**අනුරුද්ධ කුමාර කථාව** (පූජාවලිය)

**තේමාව** :
* ගෘහ ජීවිතයේ කම්කටොලු හා සසර භය අවබෝධ කොට ගෙන රජ සැප වුවත් අතහැර නිවන් මඟට යොමු වීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම

**අන්තර්ගතය** :
* අනුරුද්ධ කුමාරයාගේ පෙළපත හා එහි ආචාර ධර්ම
* අනුරුද්ධ කුමරු කැවුම් ඔට්ටුවට තබා තම යහළුවන් සමඟ ක්‍රීඩා කිරීම
* 'නැති කැවුම්' ඇති වූ ආකාරයත්, ඒ සඳහා බලපෑ කුමරුගේ අතීත පිනත් පැහැදිලි කිරීම
* අනුරුද්ධ, භද්දිය, කිම්බිල යන කුමාරවරුන් බත් ඉපදුණු හැටි විස්තර කිරීම
* පැවිදි හා ගිහි ජීවිතවල පවත්නා යථා ස්වභාවය පැහැදිලි කිරීම

* කොතරම් සැප වින්දත් යම් කාලයක දුක් විඳීමට ද සිදු විය හැකි බව පෙන්වා දීම
* අනුරුද්ධ, භද්දිය, භගු, කිම්බිල හා දේවදත්ත යන කුමාරවරුනුත්, උපාලි කපුවාත් පැවිදි බිමට පත් ව රහත් වීම

**අවබෝධය** :
* දුෂ්කරාර්ථ සහිත වචන පැහැදිලි කරමින් සමස්ත අර්ථය ඉදිරිපත් කිරීම
* කතාව අවබෝධයෙන් යුතු ව කියවීම
* මෙහි එන අතුරු කතා වෙන වෙන ම ගෙන අවබෝධ කරවීම
* නිර්දිෂ්ට කොටස් ලිහිල් බසින් ලිවීම

**රසාස්වාදය හා විචාරය :**

* කතා තේමාව සර්වකාලීන අගයක් ගන්නා බව
* කතාව ඉදිරිපත් කිරීමට යොදාගත් විශේෂ උපක්‍රම
* චරිත නිරූපණය (අද්භූතජනක ලෙස හා යථාර්ථවාදී ලෙස)
* අවස්ථා හා සිද්ධි නිරූපණය
* වාක්‍ය නිර්මාණයේ විශේෂ ලක්ෂණ
* විශේෂිත රචනා ප්‍රයෝග
* ප්‍රධාන කතා තුළ පවත්නා අතුරු කතා

iv. **තක්සේරුව හා ඇගයීම**

- ඉහත දැක්වූ තේමාව, අන්තර්ගතය, අවබෝධය, රසාස්වාදය හා විචාරය සම්බන්ධයෙන් ශිෂ්‍යයා උගත් කරුණු තහවුරු කිරීමට සුදුසු ඇගැයීම් යොදා ගනිමින් ඔවුන්ගේ සාධනය තක්සේරු කරන්න. එහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  * කතා තේමාවල සර්වකාලීන බව සාකච්ඡා කිරීම
  * කතාවල සාරාංශය ගොඩ නැංවීම
  * අතුරු කතා වෙන් වෙන් ව අවබෝධ කර ගැනීම
  * දුරවබෝධ වචන හා පාඨවල අර්ථ ලිහිල් බසින් ලිවීම
  * චරිත නිරූපණයහි ලා කතුවරුන්ගේ දක්ෂතාව පැහැදිලි කිරීම
  * සිද්ධි හා අවස්ථා නිරූපණයේ කුසලතා පැහැදිලි කිරීම
  * කතුවරුන් යොදා ගත් විවිධ භාෂා ප්‍රයෝග අවබෝධ කරගැනීම

- **ගුණාත්මක යෙදවුම් :**
  * සද්ධර්ම රත්නාවලියේ හෝ පූජාවලියේ අනිර්දිෂ්ට කතා
  * සමකාලීන සෙසු ගද්‍ය නිර්මාණ

- **තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* කතුවරුන්ගේ වර්ණනා චාතුර්යය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
* කතුවරුන්ගේ භාෂා භාවිතයෙහි පවත්නා විශේෂතා නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
* විවිධ චරිතවල සුවිශේෂ දක්ෂතා විග්‍රහ කරයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| කුලසූරිය, ආනන්ද | - | **සිංහල සාහිත්‍යය II** |
| ජයතිලක, කේ. | - | **සිංහල කතා කලාවේ විකාශනය** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **බණකතා සාහිත්‍යය** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **සිංහල සාහිත්‍යයේ නැගීම** |

# 16

# සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම** : 3.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදුණු ආකාරය විස්තර කරයි.
- සිංහල නවකතාවේ පුරෝගාමී කර්තෘවරුන් හා ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.
- පුරෝගාමී කර්තෘවරුන්ගෙන් සිංහල නවකතාවට සිදු වූ සේවාව අගය කරයි.
- සිංහල නවකතාවේ විවිධ තේමා හා ව්‍යූහාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- සිංහල නවකතාවේ ප්‍රවණතා පිළිබඳ විස්තර කරයි.
- පරිවර්තන නවකතා නිසා සිංහල සාහිත්‍යය පෝෂණය වූ අයුරු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම :**
- සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය පිළිබඳ පොතපත ඇසුරෙන් තොරතුරු සොයා එක්රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති සම්පත් උපයෝගි කර ගන්න.
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථ යටතේ අදාළ කෘති කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.
- සිංහල නවකතාවට අදාළ ව පහත සඳහන් තොරතුරු යටතේ කරුණු එක්රැස් කිරීමට ශිෂ්‍යයන්ට (පාඩම ආරම්භයට පෙර) දැනුම් දෙන්න.
  - * 18, 19 වන ශත වර්ෂවල මෙරට ඇති වූ ශාස්ත්‍රීය ප්‍රබෝධය
  - * පුවත්පත් සඟරා බිහිවීමේ ප්‍රවණතා
  - * පරිවර්තන නවකතා සිංහල සාහිත්‍යයට එක් වීම
  - * මුල් යුගයේ නවකතා කතුවරුන්
    - සයිමන් ද සිල්වා
    - පියදාස සිරිසේන
    - ඩබ්. ඒ. සිල්වා
  - * විදේශීය නවකතා පරිවර්තනය කළ ලේඛකයන් පිළිබඳ විස්තර

ii. **ප්‍රවේශය :**
- සුදුසු ප්‍රවේශයක් භාවිත කර පාඩම ආරම්භ කරන්න.

  *උදා :* * නවකතාව නම් සාහිත්‍යාංගය පිළිබඳ පෙර දැනුම විමසීම

* මුල් යුගයේ නවකතා කිහිපයක් කතුවරුන්ගේ ඡායාරූප සමඟ ඉදිරිපත් කර ඒ පිළිබඳ සංවාදයක නිරත වීම
* සිංහල නවකතාවේ ප්‍රභවයට හා විකාසනයට අදාළ ග්‍රන්ථ සහ කතුවරුන් පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත වීම - ඇමුණුම 1
* පරිවර්තන නවකතා සිංහල සාහිත්‍යයට එක් වීම පිළිබඳ සාකච්ඡා කිරීම

iii. **ඉගෙනුම සංවර්ධනය :**

- සාකච්ඡාවෙන් මතු වූ කරුණු පදනම් කර ගනිමින් නවකතාවේ ප්‍රභවයට හා විකාසනයට අදාළ පහත සඳහන් කරුණු යටතේ ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දෙන්න.
  * 19 සියවසේ ලාංකේය සාහිත්‍ය ප්‍රබෝධය
  * වාද විවාද
  * මුද්‍රණ ශිල්පයේ පැමිණීම
  * ආගමික පොතපත බිහි වීම
  * ද්විභාෂා උගතුන් හා පරිවර්තන සාහිත්‍යය බිහි වීම
  * ප්‍රබන්ධ සාහිත්‍යයක් බිහි වීම
  * පරිවර්තන සාහිත්‍යයක් බිහි වීම
- නවකතාවේ ප්‍රභවය යටතේ පහත සඳහන් කරුණු ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
  * මුල් කාලීන නවකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ
  * එම නවකතාවල තේමාව හා වස්තු විෂය
  * නවකතාකරුවන්ගේ අරමුණු
  * සිංහල නවකතාවේ අරමුණු, වස්තු විෂය, ආකෘතිය හා භාෂාව ක්‍රමයෙන් විකාසයය වූ ආකාරය
  * එයට බලපෑ කාලීන සමාජ පසුබිම
  * මුල් කාලීන නවකතා අතර කැපී පෙනෙන සන්ධිස්ථාන (සයිමන් ද සිල්වා - ආගමික තේමා රැගත් නවකතා, ඩබ්ලිව්. ඒ. සිල්වා - ඓතිහාසික නවකතා, මාර්ටින් වික්‍රමසිංහ - කලාත්මක නවකතා)
  * පරිවර්තන නවකතා
  * අරාබි නිසොල්ලාසය
- කලාත්මක නවකතා බිහිවීමෙන් පසු අවධිය පිළිබඳ තවදුරටත් සාකච්ඡා කරන්න.
  * මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරළියෙන් පසු යුගය
  * විරාගයෙන් පසු සංකීර්ණ චරිත නිරූපණ සහිත නවකතා බිහිවීම
  * සමාජය පිළිබඳ ගැඹුරින් විග්‍රහ කෙරෙන යථාර්ථවාදී නවකතා
  * වර්තමාන නවකතා/පරිවර්තන නවකතා
- පරිවර්තන සාහිත්‍යය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
- බැද්දේගම නවකතාව පරිවර්තිත නවකතාවක් බව පෙන්වා දෙන්න.

iv. **තක්සේරුකරණය හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය. එහි දී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය

යොමු කරන්න.

* ශිෂ්‍යයන් කණ්ඩායම් කර නවකතාවේ අවධි පිළිබඳ කරුණු රැස් කිරීම
* සිංහල නවකතාවට පසුබිම් වූ කරුණු ගොනුකර ලිපියක් සැකසීම
* පරිවර්තන නවකතාකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණ වගුවක් සැකසීම
* සෙසු උසස් පරිවර්තන කෘති ඇගයීමට ලක් කිරීම

මුඛ්‍ය පද : **(Keywords)**

* **ප්‍රබන්ධකතාව/ කල්පිත කථාව**
  **(Fiction)** - ප්‍රකර්ෂයෙන් බන්ධනය කෙරුණු කථාව යන අර්ථ යි. ''සද්ධර්මරත්නාවලී සහ නම් ප්‍රබන්ධයක් කරම්හ. පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි'' යනුවෙන් සද්ධර්මරත්නාවලී ආදි සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථ සඳහා පෙර දවස 'ප්‍රබන්ධ' යන පදය යෙදිණ. සම්භාව්‍ය ග්‍රීක සහ රෝම සාහිත්‍යයන්හි ද ප්‍රබන්ධකථා දක්නට ලැබේ.
  වර්තමාන සාහිත්‍යයෙහි ප්‍රබන්ධ/ ප්‍රබන්ධකථා යන පද යෙදෙනුයේ 'අමුතුවෙන් ගොතනු ලැබූ හෙවත් ප්‍රබන්ධ කරනු ලැබූ කථාව' යන අර්ථයෙනි.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 143-144 පිටු

* **ඓතිහාසික නවකතාව**
  **(Historical Novel)** ඓතිහාසික පසුබිමක හෙවත් නිශ්චිත අතීත යුගයක පිහිටුවා සම්පාදනය කරනු ලැබූ නවකතාව. මෙහි ඓතිහාසිකත්වය ගණන් ගනු ලබන්නේ කෘතිය සම්පාදනය කෙරුණ කාලය ආශ්‍රයෙනි. මෙම ගණයේ නවකතාවක් සම්පාදනයේ දී අතීතයේ විසූ බව සැලකෙන ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ පුද්ගලයන් මෙන් ම කල්පිත චරිත ද යොදා ගත හැකි වුව කතාව පිහිටුවිය යුත්තේ අතීත කාලපරිච්ඡේදයක ය. ඉතිහාස කථාවකත්, ඓතිහාසික නවකතාවකත් වෙනස නම් ඉතිහාස කථාවේ දී ලේඛකයා විසින් ආශ්‍රය කර ගනු ලබන මූලාශ්‍රය පදනම් කරගෙන තර්කානුකූල ව අතීත සිද්ධි හා පුද්ගලයන් පිළිබඳ කරුණු වාර්තා කෙරෙන අතර ඓතිහාසික නවකතාවේ දී සිද්ධිවලට වඩා චරිත සහ පුද්ගල සම්බන්ධතා විවරණය කිරීම වැදගත් කොට සැලකීම හා කල්පිත චරිතවලට ද ඉඩ ලැබීම ය.
  සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 57-58 පිටු.

* **පරිවර්තනය**
  **(Translation)** සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි පරිවර්තනය යන්නෙහි සාමාන්‍ය අර්ථය නම් භාෂාවකින් පවත්නා යමක් අනෙක් භාෂාවකින් පැවසීම ය. පෙර'පර දෙදිග ම සම්භාව්‍ය සාහිත්‍යයන් පෝෂණය සඳහා පරිවර්තන බෙහෙවින් ඉවහල් වූයේ ය...
  වර්තමාන සිංහල ව්‍යවහාරය අනුව ඉංග්‍රීසි Translation යන්න බලා ගෙන පරිවර්තනය, අනුවාදය, අනුවර්තනය, ඡායානුවාදය යනාදි වචන යෙදේ. මෙයිනුදු පරිවර්තනය (Translation), අනුවර්තනය (Adaptation) යන දෙක ප්‍රධාන වේ. මුල් කෘතිය අඩු වැඩි නොකර

අනෙක් භාෂාවකින් ඉදිරිපත් කිරීම පරිවර්තනය නමින් ද, මුල් කෘතිය ආශ්‍රයෙන් ලේඛකයාගේ අභිමතය පරිදි යම් යම් දෑ අඩු වැඩි සහිත ව සකස් කොට අනෙක් භාෂාවකින් ඉදිරිපත් කිරීම අනුවර්තනය නමින් ද සැලකීම සාමාන්‍ය සිරිත ය. එසේ ම, ශාස්ත්‍රීය ලිපි ලේඛන සම්බන්ධයෙන් පරිවර්තනය යෝග්‍ය වන බවත් සාහිත්‍ය කෘතියක් සම්බන්ධයෙන් පරිවර්තන හෝ අනුවර්තන හෝ මාර්ග තෝරා ගැනීම ලේඛකයාගේ අභිමතය පරිදි සිදු කළ මනා බවත් සාමාන්‍යයෙන් පිළිගැනේ.

ශාස්ත්‍රීය කෘතියක් පරිවර්තනයේ දී අන්තර්ගතය හෙවත් විෂය කරුණු කෙරෙහි විශේෂාවධානය යොමු කිරීම අපේක්ෂිත ය. එය ඉදිරිපත් කෙරෙන ශෛලිය, ස්වරය ආදිය ගැන ද සැලකිලිමත් විය හැකි ය. මේ අනුව එය ඍජු පරිවර්තනයක් වනු ඇත. එහෙත් සාහිත්‍ය කෘතිය ඊට වෙනස් ය. එහි වස්තු විෂයට අමතර ව ඒ හා තරම් ම වැදගත් ආකෘතියක් මෙන් ම දර්ශනය, වින්දනය වැනි දෑ ද අන්තර්ගත වෙයි. එබැවින් මේ සියලු දෑ වෙනත් භාෂාවකින් ඉදිරිපත් කිරීම සඳහා ඍජු පරිවර්තන මාර්ගය ප්‍රමාණවත් නො වේ. මෙහි දී ලේඛකයාගේ අභිමතය පරිදි යම් යම් දේ වෙනස් කිරීමට අනිවාර්යයෙන් ම සිද්ධ වනු ඇත. කාව්‍යය සම්බන්ධයෙන් මේ කරුණ විශේෂයෙන් අදාළ වේ. මේ අනුව සලකන කල, සාහිත්‍ය කෘති සම්බන්ධයෙන් පරිවර්තනය, අනුවර්තනය යන ඖලාරික බෙදීම එතරම් සාධාරණ නොවන බවක් ද පෙනේ.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 131-132 පිටු

- **ගුණාත්මක යෙදවුම්**
  - * මුල් කාලීන සිංහල නවකතා හා පරිවර්තන සාහිත්‍ය කෘති කිහිපයක්
  - * පුරෝගාමී සිංහල නවකතාකරුවන්ගේ ඡායාරූප, ආලේඛ්‍ය චිත්‍ර, ඔවුන් පිළිබඳ තොරතුරු ඇතුළත් පොතපත

**පරිශීලනීය ග්‍රන්ථ**


ගුනසිංහ, සිරි - **හෙවනැල්ල**

ජයතිලක, කේ. - **නූතන සිංහල නවකතාවට සංස්කෘතික පසුබිම**

ජයතිලක, කේ. - **සිංහල කතා කලාවේ විකාශනය**

රාජකරුණා, ආරිය - **දහනව වන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍යය**

රාජකරුණා, ආරිය - **සිංහල නවකතාවේ ආරම්භය**

වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර - **නවකතා විවරණය**

වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර - **සිංහල නවකතාවේ නැගීම**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**

සුරවීර, ඒ. වී. - **නවකතා නිර්මාණය හා අවබෝධය**

සේකර, මහගම - **තුං මං හංදිය**

හේමාලෝක හිමි, උඩරාපොල, හේමපාල විජේවර්ධන - **සාරභූමි**

-

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක පදනම් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* 19 වන සියවසේ ශාස්ත්‍රීය ප්‍රබෝධය පිළිබඳ ලිපියක් සකස් කරයි.

* සිංහල නවකතාවේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

* සිංහල නවකතාවේ පුරෝගාමී කර්තෘවරුන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ වගුවක් සකස් කරයි.

* සිංහල නවකතාවේ තේමාව හා වස්තු විෂය වෙනස් වූ ආකාරය පැහැදිලි කරයි.

* පරිවර්තන සාහිත්‍ය කෘති පිළිබඳ පොත් පිංචක් සකස් කරයි.

ඇමුණුම 1 : **පුරෝගාමී සිංහල නවකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ**

| නවකතාකරුවා | නවකතාව | කාලය | තේමාව |
|---|---|---|---|
| | | | |

# 17

# සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය

**නිපුණතාව** : 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලධර්ම හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන, කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- සිංහල කෙටිකතාවේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සිංහල කෙටිකතාවේ පුරෝගාමී කර්තෘවරුන් හා ඔවුන්ගේ නිර්මාණ අගය කරයි.
- දේශීය කෙටිකතාවේ විවිධ තේමා ආකෘති සහ ප්‍රවණතා පැහැදිලි කරයි.
- විවිධ තේමා සහ ආකෘති සහිත කෙටිකතා කියවීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**i. පෙර සූදානම**

- සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ පොතපත ඇසුරෙන් අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.
- සිංහල කෙටිකතාවට අදාළ ව පහත මාතෘකා ඔස්සේ තොරතුරු එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න. (පාඩමට පිවිසීමට පෙර)
  1. ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදීම (19 වන සියවසේ සිදු වූ සාහිත්‍ය ප්‍රබෝධය)
  2. සිංහල කෙටිකතාවේ ප්‍රභවය
  3. සිංහල කෙටිකතාවේ විකාසනය

**ii. ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.
  *උදා :* * අනිර්දිෂ්ට කෙටිකතාවකින් කොටසක් කියවීම
  * කෙටිකතාවේ ඉතිහාසය පවර් පොයින්ට් /පිටු පෙරළන මඟින් කෙටියෙන් ඉදිරිපත් කිරීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නඟමින් ශිෂ්‍යයන්ගේ දැනුම අවදි කරන්න.
- ශිෂ්‍යයන් එක්රැස් කරගත් තොරතුරු සහ ගුරුවරයාගේ ප්‍රතිපෝෂණ ද ලබා දෙමින් සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනයට අදාළ පහත සඳහන් අංශ පිළිබඳ ශිෂ්‍යයන්ට පුළුල්

අවබෝධයක් ලබා දීමට කටයුතු කරන්න.

1. 19 වන සියවසේ සිදු වූ සාහිත්‍ය ප්‍රබෝධය (ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදීම)
   * වාද විවාද ඇතිවීම
   * මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත වීම
   * ආගම් ප්‍රචාරක පත්‍රිකා සහ පොත පත බිහිවීම
   * පරිවර්තන සාහිත්‍යයක් බිහිවීම

2. සිංහල කෙටිකතාවේ ප්‍රභවය
   * පුවත්පත්වල හා සඟරාවල කෙටිකතා පළවීම
   * මුල් ම කෙටිකතා සංග්‍රහය බිහිවීම
   * ආරම්භක යුගයේ කෙටිකතාවල අරමුණු, තේමා, වස්තු විෂය, භාෂාව හා ආකෘති
   * මුල් කාලීන කෙටිකතාකරුවන් විදේශීය කෙටිකතාවලින් ලද ආභාසය

3. සිංහල කෙටිකතාවේ විකාසනය
   * සිංහල කෙටිකතාවේ විවිධ අවධි
   * ඒ ඒ අවධිවල පුරෝගාමී කෙටිකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ
   * එම කෙටිකතාවල අරමුණු, තේමා, වස්තු විෂය, භාෂාව හා ආකෘති
   * සිංහල කෙටිකතාවට විදේශීය කෙටිකතාවලින් ලද ආභාසය
   * පරිවර්තන කෙටිකතා බිහිවීමේ ප්‍රවණතා

iv. **තක්සේරුව හා ඇගයීම**

- සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත් ශිෂ්‍යයාගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * දේශීය ප්‍රබන්ධ සාහිත්‍යයට මඟ පෑදුණු ආකාරය පිළිබඳ පුවත් පතකට ලිපියක් සකස් කිරීමට යොමු කිරීම

  * මුල් කාලීන සිංහල කෙටිකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණවලට අදාළ තොරතුරු ඇතුළත් වගුවක් සකස් කිරීමට ලබා දීම (මේ සඳහා ඇමුණුම 1හි ඇතුළත් ආදර්ශ වගුව යොදා ගත හැකි ය.)
  * සිංහල කෙටිකතාවේ විවිධ අවධි සහ ප්‍රවණතා පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු, ඡායාරූප, රූප සටහන් ආදිය ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට අවස්ථාව ලබා දීම

- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කරගෙන ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.
- මෙතෙක් උගත් විෂය කරුණු පිළිබඳ අවසන් සමාලෝචනයක් සිදු කරන්න.
- සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනයට අදාළ වැඩිදුර තොරතුරු ගවේෂණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

- **ගුණාත්මක යෙදවුම්**
  * පුරෝගාමී කෙටිකතාකරුවන්ගේ නිර්මාණ
  * ඇමුණුම 1හි සඳහන් ආදර්ශ වගුව

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

  පහත සඳහන් නිර්ණායක පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

  * 19 වන සියවසේ සාහිත්‍ය ප්‍රබෝධය පිළිබඳ පුවත් පත් ලිපියක් සකස් කරයි.
  * ආරම්භක කෙටිකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු නිරූපණය වන වගුවක් සකස් කරයි.
  * සිංහල කෙටිකතාවේ විවිධ අවධි හා ප්‍රවණතා පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.
  * සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය පිළිබඳ ලියැවුණු පොත පත කියැවීමට පෙලඹෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ**


ජයතිලක, කේ. - **නූතන සිංහල නවකතාවට සංස්කෘතික පසුබිම**

ජයතිලක, කේ. - **සිංහල කතා කලාවේ විකාශනය**

ධර්මකීර්ති, රංජිත් - **කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම**

වික්‍රමසිංහ, මාර්ටින් - **වහල්ලු (ප්‍රස්තාවනාව)**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**

සුරවීර, ඒ. වී. - **භවතිමිර (ප්‍රස්තාවනාව)**

සුරවීර, ඒ. වී. - **සිංහල කෙටිකතාවේ විකාශනය**


ඇමුණුම 1 - ආදර්ශ වගුව

**සිංහලයේ ආරම්භක කෙටිකතාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ**

| කෙටිකතාකරුවා | කෙටිකතාව | කාලය | තේමාව | වස්තු විෂය | අරමුණ |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

# 18
# අක්ෂර වින්‍යාසය

**නිපුණතාව** : 7.0 භාෂාවේ ස්වරූපය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි.

**නිපුණතාව** : 7.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.

**කාලච්ඡේද** : 08 යි.

**නිපුණතා මට්ටම** :
- අක්ෂර වින්‍යාස රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- අක්ෂර වින්‍යාස රීති විමර්ශනය කරන්න.
- එම රීතිවලට සුදුසු නිදර්ශන වචන ගොනුවක් පිළියෙල කර ගන්න.
- ඒ සඳහා මෙහි දක්වා ඇති පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.
- අක්ෂර වින්‍යාසයට අදාළ එක් එක් රීති යටතේ වචන එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

  *උදා :* i. අල්පප්‍රාණ - මහාප්‍රාණ භාවිතය
  ii. ණ, න, ල, ළ අක්ෂර භාවිතය
  iii. ශ, ෂ. ස අක්ෂර භාවිතය
  iv. ඟ, ඦ, ඬ, ඳ, ඹ (සඤ්ඤක) අක්ෂර භාවිතය

- එදිනෙදා ව්‍යවහාරයේ භාවිත වන සාවද්‍ය අක්ෂර වින්‍යාසය සහිත වචන හඳුනා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

  *උදා :* දෘෂ්ඨි, කාර්යාල, සියළු, කුරුළු, විරෝධාර, සමස්ථ

ii. **ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් භාවිත කොට පාඩමට පිවිසෙන්න.

  *උදා :* * කෙටි ඡේදයක අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම
  * වර්තමාන භාෂා ව්‍යවහාරයේ දී භාවිත වන නිරවද්‍ය වචන සාවද්‍ය ව යෙදෙන අවස්ථා කිහිපයක් ශිෂ්‍යයන්ට පෙන්වා දීම.

| නිරවද්‍ය | සාවද්‍ය |
|---|---|
| ත්‍යාග ප්‍රදානෝත්සවය | ත්‍යාග ප්‍රධානෝත්සවය |
| සමස්ත ලංකා | සමස්ථ ලංකා |
| අංක දරන | අංක දරණ |
| ප්‍රස්තාව පිරුළ | ප්‍රස්ථාව පිරුළ |
| ඖෂධ සංස්ථාව | ඖෟෂධ සංස්ථාව |
| අපරාධ මර්දනය | අපරාධ මර්ධනය |

iii. **ඉගෙනුම සංවර්ධනය**

- ප්‍රවේශයේ දී මතු වූ කරුණු ඉවහල් කර ගෙන භාෂාව භාවිත කරන සෑම අවස්ථාවක දී ම නිවැරදි අක්ෂර වින්‍යාස රීති යොදා ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- නිවැරදි භාෂා භාවිතය තම භාෂා ඥානය ප්‍රදර්ශනය කරන්නක් බව පැහැදිලි කරන්න.
- අක්ෂර වින්‍යාස රීතිවලට අදාළ පැවරුම්වල ශිෂ්‍යයන් යොදවන්න.
- දෙන ලද ලේඛනවල අක්ෂර වින්‍යාස දෝෂ නිවැරදි කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

  *උදා :* * සාවද්‍ය අක්ෂර වින්‍යාසය සහිත වචනය බැගින් ලියූ තුණ්ඩු කැබලි බහාලූ පෙට්ටියක් ශිෂ්‍යයන් ඉදිරියේ තබා එයින් අහඹු ලෙස තෝරා ගත් වචනයක අක්ෂර වින්‍යාසය නිවැරදි කර හුනු පුවරුවේ ලිවීමට එක් එක් ශිෂ්‍යයාට අවස්ථාව ලබා දීම

  * සාවද්‍ය අක්ෂර වින්‍යාසයෙන් ලියන ලද ඡේද සහිත කාඩ් පත් ශිෂ්‍යයන් අතර බෙදා දී ඒවා නිවැරදි කර ලිවීමට අවස්ථාව ලබා දීම
  * දිනපතා පුවත් පතක පිටුවක් බැගින් ශිෂ්‍ය කණ්ඩායම් අතර බෙදා දී ඒවායෙහි සාවද්‍ය අක්ෂර වින්‍යාසය සහිත වචන තිබේ නම් ඒවා හඳුනා ගැනීමට සැලැස්වීම
  * අක්ෂර වින්‍යාස රීති සඳහා නිදර්ශන වචන සහිත වගුවක් සකස් කිරීමට යොමු කිරීම

- **ගුණාත්මක යෙදවුම් :**
  * අක්ෂර වින්‍යාස රීති ලියන ලද දෘශ්‍යාධාරකයක් හෝ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක්
  * තක්සේරුව හා ඇගයීම සඳහා යොදා ගන්නා කාඩ්පත්
  * පැවරුම් පත්‍රිකා

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

  පහත සඳහන් නිර්ණායක යොදා ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
  * සාවද්‍ය අක්ෂර වින්‍යාසය සහිත වචන නිවැරදි කරයි.
  * නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුත් ලේඛන සකස් කරයි.
  * අක්ෂර වින්‍යාස රීති සඳහා නිදසුන් වචන සහිත වගු සකස් කරයි.
  * එදිනෙදා හමු වන දැන්වීම් පුවරු, පුවත්පත්, සඟරා, විවිධ ලේඛන ආදියේ දක්නට ලැබෙන සාවද්‍ය අක්ෂර වින්‍යාසය වචන එකතු කිරීමට පෙලඹෙයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**


අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - **සිංහල ලේඛන ව්‍යවහාරය උපදේශ සංග්‍රහය**

කෝපරහේවා, සඳගෝමි - **සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය**

ජාතික අධ්‍යාපන ආයතනය - **සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)**

දිසානායක, ජේ. බී. - **නූතන සිංහල ලේඛන ව්‍යාකරණය අක්ෂර වින්‍යාසය**

බලගල්ලේ, විමල් ජී. - **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය**

# 19

# නිෂ්පන්න, තත්සම, තද්භව

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : 7.0 | භාෂාවේ ස්වරූපය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි. |
| **නිපුණතා මට්ටම** | : 7.4 | අනුරූප පද සංයෝගය, නිවැරදි භාෂා ව්‍යවහාරය සඳහා යොදා ගනියි. |
| **කාලච්ඡේද** | : 08 යි. | |

**ඉගෙනුම් පල** :
- අනුරූප පද සංයෝගය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- නිෂ්පන්න, තත්සම, තද්භව පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.
- නිෂ්පන්න, තත්සම හා තද්භව පද අනුරූප ලෙස සංයෝග කිරීමේ වැදගත්කම විස්තර කරයි.
- අනුරූප පද නිවැරදි ලෙස සංයෝග කරමින් භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i **පෙර සූදානම**

- පරිශීලනීය ග්‍රන්ථ කියවා පහත කරුණු පිළිබඳ අර්ථ දැක්වීම් (නිර්වචන) සකස් කර ගන්න (මුඛ්‍ය පද බලන්න.)
    i. නිෂ්පන්න පද
    ii. තත්සම පද
    iii. තද්භව පද
- අනුරූප පද සංයෝගය යනු කුමක් ද යන්න මැනවින් අවබෝධ කර ගන්න.
- ඒ සඳහා සුදුසු නිදර්ශන වචන ගොනු සකස් කරන්න. (ඇමුණුම 1)
- පුර්තුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි, ද්‍රවිඩ ආදි භාෂාවලින් බිඳී ආ තද්භව වචන ගොනු ද මේ ලෙස සකස් කර ගන්න.
- ලේඛනයේ දී හෝ භාෂණයේ දී තත්සම පද තත්සම පද සමඟත්, තද්භව පද තද්භව පද සමඟත්, සුදුසු පරිදි ගැළපීම අනුරූප පද සංයෝගය බව අවබෝධ කර ගන්න.
- පදවල නිරුක්තිය පිළිබඳ අවබෝධය ඇති කර ගන්න.
- භාෂාවක ප්‍රභවය හා විකාසනයට සම්බන්ධ ව පවත්නා සම්ප්‍රදායන් දෙකක් ඇති බව
    1. මූල භාෂා හෙවත් මාතෘ භාෂා සම්ප්‍රදාය
    2. පෝෂක භාෂා සම්ප්‍රදාය (භාෂාව, වැඩීමේ දී බලපාන විවිධ භාෂා සම්ප්‍රදාය)

ii. **ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගනිමින් පාඩමට පිවිසෙන්න.
    * නිවැරදි ලෙස අනුරූප පද සංයෝග කර භාෂාව භාවිත කළ අවස්ථා කීපයක් ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| කනිටු විදුහල | විදෙස් පුවත් |
| අමාත්‍ය මණ්ඩලය | ධර්ම දේශනය |
| සමුද්‍ර බාදනය | ගගන යාත්‍රාව |

*උදා :* * සාවද්‍ය ලෙස අනුරූප පද සංයෝග කර භාෂාව භාවිත කළ අවස්ථා කීපයක් ඉදිරිපත් කිරීම.

මවු භූමිය

සුබ ප්‍රාර්ථනා

**iii. ඉගෙනුම් සංවර්ධනය**

- තත්සම පද හා තද්භව පද සැකසී ඇති ආකාරය ඉගෙනුම් ආධාරක උපයෝගි කර ගනිමින් පැහැදිලි කරන්න.
- සිංහල මාතෘ භාෂා (මූල භාෂා) පිළිබඳ ව දැනුමක් ලැබෙන පරිදි සාකච්ඡාවක් ගොඩ නඟන්න.
    - * පාලි භාෂාවෙන් සිංහල භාෂාවට තත්සම හෝ තද්භව වූ වචන
    - * සංස්කෘත භාෂාවෙන් සිංහල භාෂාවට තත්සම හෝ තද්භව වූ වචන
- පුර්තුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි, ද්‍රවිඩ ආදි පෝෂක භාෂාවලින් තද්භව හෝ තත්සම වූ වචන
- වර්තමාන භාෂණයේ හා ලේඛනයේ දී භාවිත වන පද කවර භාෂාවලින් ප්‍රභවය වූ ඒවා දැයි සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනුරූප වචන සංයෝගය වැරදි ලෙසත්, නිවැරදි ලෙසත් භාවිත වූ ලේඛන ඉදිරිපත් කරමින් දැනුම හා අවබෝධය තහවුරු කරන්න.
- අනුරූප වචන සංයෝගය යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ඇමුණුම 2)
- මෙම පද හඳුනා ගෙන අනුරූප වචන භාවිතයෙන් ලේඛනයේ යෙදීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**iv. තක්සේරුව හා ඇගයුම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය. එහි දී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරන්න.
    - * නිෂ්පන්න, තත්සම, තද්භව පද හැකිතාක් රැස් කිරීම
    - * ඒවා මූල භාෂා අනුව වෙන වෙන ම ගොනුගත කිරීම
    - * ඒ ඇසුරින් අනුරූප වචන සංයෝග සකස් කිරීම
    - * වචන ගොනුවක් ඉදිරිපත් කර එම වචන මූල භාෂා හා පෝෂක භාෂා අනුව තත්සම හෝ තද්භව වශයෙන් වෙන් කිරීම

* ශිෂ්‍යයන් යම් ලේඛන කාර්යයක යොදවා එම ලේඛනවල වචන අනුරූප වන සේ සංයෝග වී ඇත්දැයි විමසා බැලීමට යොමු කිරීම

මුඛ්‍ය පද **(Keywords)** :

* **නිෂ්පන්න** - නිපදුණු, ඉපදුණු, දේශයෙහි පහළ වුණ, නිපන්.
  විජයතුංග, හරිස්චන්ද්‍ර, **ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය,** කොළඹ, 2012, 1005 පි.
  ''කිසි අන් බසින් නුමුසු හෙළදිවැ පළ නිපන් නම්'' - **සිදත් සඟරාව**
* **තත්සම** - වෙනත් භාෂාවල වචන ඒ ඒ රූපවලට සමාන ලෙස ම ව්‍යවහාර වන පද
  'මගද සකු ඈ බණ සම වූ බස තසම නම්' - **සිදත් සඟරාව**
* **තද්භව** - මූල භාෂාවලින් (මාතෘ භාෂා) සිංහල භාෂාවට බිඳී ආ වචන යි.
  'බිඳුණේ තබව නම් වී' - **සිදත් සඟරාව**
* **නිරුක්තිය** - කිසියම් වචනයක් භාෂාත්මක ව හා ඓතිහාසික ව සකස් වී ඇති ආකාරය දැක්වීම

- **ගුණාත්මක යෙදවුම්**
  * ඇමුණුම 1, 2

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* නිෂ්පන්න, තත්සම හා තද්භව වචන සොයා ඒවා වගු ගත කරයි.
* අනුරූප පද සංයෝග කරමින් ලේඛන කාර්යයෙහි යෙදෙයි.
* අනුරූප පද සාවද්‍ය ලෙස සංයෝග කර ඇති ලේඛන නිවැරදි කරයි.
* අනුරූප පද නිවැරදි ව යොදා ඇති ලේඛන අගය කරයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| කරුණාතිලක, ඩබ්. එස්. | - | **සිංහල භාෂා ව්‍යාකරණය** |
| කෝපරහේවා, සඳගෝමී | - | **සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය** |
| පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ | - | **සිදත්සඟරා විමසුම** |
| පෙරේරා, පී. රූපසිංහ, පද්මා ලංකා රූපසිංහ | - | **සිංහල ව්‍යාකරණ අකාරාදිය** |

ඇමුණුම 1

- තද්භව වචන භාවිතය පිළිබඳ උදාහරණ :

| සංස්කෘත භාෂාව | පාලි භාෂාව | සිංහල භාෂාව |
|---|---|---|
| මාතෘ | මාතා | මව |
| පිතෘ | පිතා | පියා |
| පුස්තක | පොත්ථක | පොත |
| මාර්ග | මග්ග | මග |
| භූමි | භූමි | බිම |
| හස්ත | හත්ථ | අත් |
| ආචාර්ය | ආචරිය | ඇදුරු |

- තත්සම වචන භාවිතය පිළිබඳ උදාහරණ :

| සංස්කෘත | පාලි | සිංහල |
|---|---|---|
| භාෂාව | භාසාව | භාෂාව/භාසාව |
| මාතෘ | මාතා | මාතෘ/මාතා (ලංකා මාතා) |
| උපාසක | උපාසක | උපාසක |
| පුස්තක | පොත්ථක | පුස්තක (පුස්තකාලය) |
| භූමි | භූමි | භූමි (මාතෘ භූමි) |

- නිෂ්පන්න වචන භාවිතය පිළිබඳ උදාහරණ

| | | | |
|---|---|---|---|
| කොළ, | අළු, | ළඳ | නරඹ |
| ඔළුව | කකුල | කලව | කොළඹ |

ඇමුණුම 2

- අනුරූප පද සංයෝගයට නිදසුන්

| තත්සම | තද්භව |
|---|---|
| මාතෘ භූමි | මවු බිම |
| මාතෘ භාෂාව | මවු බස |
| ප්‍රවෘත්ති විමර්ශනය | පුවත් විමසුම |
| ශිෂ්‍ය සම්බන්ධතා | සිසු සබඳතා |
| ආඥා චක්‍රය | අණ සක |
| ප්‍රවෘත්ති පත්‍ර | පුවත් පත් |
| ඥාණ සාගරය | නැණ සයුර |
| ශුභ ප්‍රාර්ථනා | සුබ පැතුම් |
| ස්වර්ණ භූමි | රන් බිම |

# 20

# සන්ධි විධි

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 7.0 | භාෂාවේ ස්වරූපය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි. |
| **නිපුණතා මට්ටම** | : | 7.5 | සන්ධි විධි භාවිත කරමින් සුබනම්‍ය ලෙස භාෂාව හසුරුවයි. |
| **කාලච්ඡේද** | : | 15 යි. | |

**ඉගෙනුම් පල** :
- සන්ධි යනු කුමක් දැයි නිර්වචනය කරයි.
- උදාහරණ දක්වමින් සන්ධි විධි පැහැදිලි කරයි.
- සුබනම්‍ය භාෂා භාවිතය සඳහා සන්ධිවල වැදගත්කම පැහැදිලි කරයි.
- සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**i. පෙර සූදානම**

- සන්ධි පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගන්න. මේ සඳහා පරිශීලනීය ග්‍රන්ථ යටතේ ඉදිරිපත් කර ඇති පොත පත ඉවහල් කර ගත හැකි ය.
- දෘශ්‍යාධාරක සඳහා අවශ්‍ය පත්‍රිකා සකස් කර ගන්න.
  - * සන්ධි පද ලයිස්තුවක්
  - * විසන්ධි පද ලයිස්තුවක්

**ii. ප්‍රවේශය**

- පාඩම සඳහා සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

  *උදා :* * සන්ධි නො වූ පද සහිත ඡේදයක එම පද සන්ධි කර ඉදිරිපත් කිරීම (ඇමුණුම 1)

  * සන්ධි වූ පද සහිත කවියක් ඉදිරිපත් කිරීම (ඇමුණුම 2)

**iii. ඉගෙනුම සංවර්ධනය**

- භාෂාවේ සුබනම්‍ය භාවිතය සඳහා පද සන්ධි කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- පද සන්ධි කිරීමේ දැනුම මෙන් ම සන්ධි කරන ලද පද විසන්ධි කිරීමේ අවබෝධය ද භාෂා භාවිතයේ දී වැදගත් වන බව පෙන්වා දෙන්න.
- ප්‍රධාන සන්ධි විධි සහ සන්ධි ප්‍රභේද පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරන්න.
- උදාහරණ සහිත ව ඒවා පැහැදිලි කරමින් ශිෂ්‍ය අවබෝධය තහවුරු කරන්න.
- සිංහලයේ දස වැදෑරුම් සන්ධි ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
- සන්ධි වර්ග කොට දක්වන්න.

  - පූර්ව ස්වර ලෝප සන්ධි
  - පර ස්වර ලෝප සන්ධි
  - ස්වර සන්ධි

- ස්වරාදේශ සන්ධි
- ගාත්‍රාදේශ සන්ධි
- පූර්ව රූප සන්ධි
- පර රූප සන්ධි
- ගාත්‍රාක්ෂර ලෝප සන්ධි
- ආගම සන්ධි
- ද්විත්ව රූප සන්ධි

- එක් එක් සන්ධි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ඇමුණුම 3 යොදා ගන්න.)
- මෙතෙක් උගත් කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

මුඛ්‍ය පද **(Keywords)** :

''පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්'' - **සිදත් සඟරාව**

* ලෝපය : වර්ණයන්ගේ අදර්ශනය

''වණන් අනුසුරුවීම් ලොප් නම්'' (වර්ණ උච්චාරණය නො වී යෑම ලෝප නම් වේ.)

**- සිදත් සඟරාව -**

රිය + ඇදුරු

රිය් + අ + ඇදුරු

රියැදුරු

* ආදේශ

''වණක්හු ලොපා වණක්හු කිරිම් අදෙස් නම්''

(වර්ණයක් ලොප් කොට වර්ණයක් පැමිණවීම ආදේශ නම් වේ.)

**- සිදත් සඟරාව -**

| | |
|---|---|
| දෙ + අවුරුදු | දෙ+ අත |
| දැවුරුදු | දැත |

* ආගම

''වණක්හු නිසා ඔහු නො ලොපා වනුයේ අගම් නම්''

(වර්ණයක් ආශ්‍රය කොට එය ලොප් නො කොට වන්නේ ආගම නම්.)

මිත්‍රවදාගමඃ (ආගම මිත්‍රයකු වැනි ය.)

**- සාරස්වත -**

දෙ + උර　　　　　　　　දෙ + ආකාරයෙන්

දෙවුර　　　　　　　　　දෙයාකාරයෙන්

* අභ්‍යන්තර සන්ධි

වඳුරු + ඕ

වඳුර් + උ + ඕ

වඳුරෝ

- **ගුණාත්මක යෙදවුම්**
  * සන්ධි පද ගොනුවක්
  * විසන්ධි පද ගොනුවක්
  * ඇමුණුම 1, 2, හා 3

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

  පහත සඳහන් නිර්ණායක පදනම් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
  * සන්ධි යනු කුමක් දැයි පැහැදිලි කරයි.
  * සන්ධි ප්‍රභේද විස්තර කරයි.
  * එක් එක් සන්ධි ප්‍රභේදය සඳහා උදාහරණ සපයයි.
  * ව්‍යක්ත ලේඛනයේ දී සන්ධි භාවිතයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
  * නිවැරදි ව පද සන්ධි කර, භාෂා කාර්යයේ යෙදෙයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| දිසානායක, ජේ. බී. | - | **සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය : සන්ධි විග්‍රහය** |
| පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ | - | **සිදත්සඟරා විමසුම** |
| පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ | - | **සිංහල ව්‍යාකරණ අකාරාදිය** |

ඇමුණුම 1

(අ) ''විද්‍යාලයේ ස්වර්ණ ජයන්තිය සැමරීම සඳහා **මහා උත්සවයක්** සංවිධානය කළ යුතු බව විදුහල්පතිතුමාගේ අදහස විය. ඒ සඳහා **ප්‍රවීණ ආචාර්යවරුන්ගෙන්** සමන්විත කමිටුවක් පත් කෙරිණි. එම උත්සවය **අති උත්කර්ෂවත්** ලෙස පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම එම කමිටුවේ කාර්යභාරය විය. ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් අධ්‍යාපන ප්‍රදර්ශනයක් හා **අති අලංකාර** විවිධ ප්‍රසංගයක් පැවැත්වීමට යෝජනා විය. ආදි ශිෂ්‍යයන්, අධ්‍යාපන නිලධාරීන් හා පළාතේ මන්ත්‍රී **අමාත්‍ය ආදීන්ට** ආරාධනා කිරීමට ද තීරණය විය.''

(ආ) ''විද්‍යාලයේ ස්වර්ණ ජයන්තිය සැමරීම සඳහා **මහෝත්සවයක්** සංවිධානය කළ යුතු බව විදුහල්පතිතුමාගේ අදහස විය. ඒ සඳහා **ප්‍රවීණාචාර්යවරුන්ගෙන්** සමන්විත කමිටුවක් පත් කෙරිණි. එම උත්සවය **අත්‍යුත්කර්ෂවත්** ලෙස පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම එම කමිටුවේ කාර්යභාරය විය. ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් අධ්‍යාපන ප්‍රදර්ශනයක් හා **අත්‍යලංකාර** විවිධ ප්‍රසංගයක්

පැවැත්වීමට යෝජනා විය. ආදි ශිෂ්‍යයන්, අධ්‍යාපන නිලධාරීන් හා පළාතේ මන්ත්‍රී අමාත්‍යාදීන්ට ආරාධනා කිරීමට ද තීරණය විය.''

**ඇමුණුම 2**

උදා ගිරි කසුන් රිටි වැට හිසැ     බැබැළී
එදා සහසකර **පහනෙව්** කරත     හෙළී
යොදා නුවන් ඉසුරුට කරන පුද     කෙළී
විදා පියා **නිලඹර** යන් නො වී     මැළී

**සැළලිහිණි සන්දේශය**

* පහනෙව් - පහන එව් (පහන වැනි)
* නිලඹර - නිල් අඹර (නිල් අහස)

**ඇමුණුම 3**

**1. පූර්ව ස්වර ලෝප සන්ධි**

පූර්ව ස්වරය ලොප් කොට පරස්වරය පූර්ව පදයේ අග පිහිටි ව්‍යඤ්ජනයට එකතු කිරීමෙන් සිදු වන සන්ධි පූර්වස්වර ලෝප සන්ධි නම් වේ.

| | |
|---|---|
| *උදා :* යන + එන | වෙද + ඇදුරු |
| යන් + අ + එන | වෙද් + අ + ඇදුරු |
| ය නෙ න | වෙ දැ දුරු |
| යනෙන | වෙදැදුරු |

**2. පරස්වර ලෝප සන්ධි**

පසු පදයේ මුලින් ඇති ස්වරය ලොප් කොට පෙර පදය හා ගැළපීම පරස්වර ලෝප සන්ධි නම්.

| | |
|---|---|
| *උදා :* පිළි + උතුරු | ගුරු + උතුමා |
| පිළි + තුරු | ගුරු + තුමා |
| පිළිතුරු | ගුරුතුමා |

**3. ස්වර සන්ධි**

පූර්ව පදයේ අග ඇති ස්වර රහිත ව්‍යඤ්ජනයට පසු පදයේ මුල ඇති ස්වරය පැමිණවීමෙන් සිදු වනුයේ ස්වර සන්ධි වේ.

| | | |
|---|---|---|
| *උදා :* අතින් + ඇද | පින් + ඇති | දුක් + අඳුර |
| අතිනැද | පිනැති | දුකඳුර |

**4. ස්වරාදේශ සන්ධි**

'අ', 'ඉ', 'උ' ස්වර ලොප් කොට ඒ වෙනුවට 'එ', 'ඔ', 'ඕ' ස්වර ආදේශ කිරීමෙන් සිදු වන සන්ධි ස්වරාදේශ සන්ධි නම්.

| | | |
|---|---|---|
| *උදා :* අ + ඉ > එ | සූර්ය + උදය | ශ්‍රවණ + ඉන්ද්‍රිය |
| අ + උ > ඔ/ඕ | සූර්ය් + අ + උදය | ශ්‍රවණ් + අ + ඉන්ද්‍රිය |
| | සූර්ය් + ඕ + දය | ශ්‍රවණ් + ඒ + න්ද්‍රිය |
| | සූර්යෝදය | ශ්‍රවණේන්ද්‍රිය |

**5. ගාත්‍රාදේශ සන්ධි**

ව්‍යඤ්ජනයක් වෙනුවට වෙනත් ව්‍යඤ්ජනයක් ආදේශ කිරීම ගාත්‍රාදේශය යි. පසු පදයේ මුලට යෙදන 'ක්' වෙනුවට 'ව්' හා 'ය්' ව්‍යඤ්ජනාක්ෂර යෙදේ.

| | |
|---|---|
| *උදා :* සුණු + කම් | ගිනි + කම් |
| සුණුවම් | ගිනියම් |

**6. පූර්ව රූප සන්ධි**

පසු පදයේ මුල ඇති 'ක', 'හ' යන ව්‍යඤ්ජනාක්ෂර පෙර පදයේ අග ඇති ව්‍යඤ්ජනාක්ෂරයේ රූපය ගැනීම පූර්ව රූප නම් වේ.

| | |
|---|---|
| *උදා :* අත් + කම් | කම් + හල |
| අත්තම් | කම්මල |

**7. පර රූප සන්ධි**

පූර්ව පදයෙහි අගට යෙදෙන අකුර පර පදයේ මුලට යෙදෙන අකුරේ රූපය ගැනීම පර රූප නම් වේ.

| | |
|---|---|
| *උදා :* ලිප් + ගල | දුක් + පත් |
| ලිග්ගල | දුප්පත් |

**8. ගාත්‍රාක්ෂර ලෝප සන්ධි**

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ව්‍යඤ්ජනය ස්වරය සමඟ ලෝපයට පමුණුවා ඉතිරි වන අර්ධ ව්‍යඤ්ජනය පූර්ණත්වයට පත් කිරීමෙන් ගළපන සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප සන්ධි නම්.

| | |
|---|---|
| *උදා :* අඹ + මල් | ගඟ + රන් |
| අම්මල් | ගංරන් |

**9. ආගම සන්ධි**

පූර්ව ස්වරය ලොප් නොකොට ය්, ව්, ර් යන ව්‍යඤ්ජන ආගම කිරීම ආගම නම් වේ.

| | | |
|---|---|---|
| *උදා :* පිරි + අත් | තුනු + අඟ | පුන + උත් |
| පිරි + ය් + අත් | තුනු + ව් + අඟ | පුන + ර් + උත් |
| පිරියත් | තුනුවඟ | පුනරුත් |

**10. ද්විත්ව රූප සන්ධි**

පෙර පදයේ අග ස්වරය ලොප් කොට ව්‍යඤ්ජනය ද්විත්ව කිරීමෙන් ද්විත්ව රූප සන්ධිය සෑදෙයි. පෙර පදයේ අගට යෙදෙන ස්වර රහිත ව්‍යඤ්ජනාක්ෂර ද ද්විත්ව වේ.

*උදා :* වැලි + අවුරු = වැල්ලවුරු
කුලු + එව් = කුල්ලෙව්
පත් + ඉරු = පත්තිරු
වල් + අම්බලම = වල්ලම්බලම

**මිශ්‍ර සිංහලයේ යෙදෙන වෙනත් සන්ධි**

**සමාන ස්වර දීර්ඝ සන්ධිය**

| | | |
|---|---|---|
| අ + අ = ආ | ඉ + ඉ = ඊ | උ + උ = ඌ |
| ආ + අ = ආ | ඉ + ඊ = ඊ | ඌ + උ = ඌ |
| අ + ආ = ආ | ඊ + ඉ = ඊ | උ + ඌ = ඌ |
| ආ + ආ = ආ | ඊ + ඊ = ඊ | ඌ + ඌ = ඌ |

පූර්ව + අපර - පූර්වාපර
දයා + අනුකම්පා - දයානුකම්පා
මුනි + ඉන්ද්‍ර - මුනීන්ද්‍ර
මහී + ඊශ්වර - මහීශ්වර
ගුරු + උපදේශ - ගුරූපදේශ

# 21

# ක්‍රියා හා ක්‍රියා ප්‍රභේද

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- ක්‍රියා ප්‍රකෘතියක් (ධාතු ප්‍රකෘතියක්) යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.
- ක්‍රියා පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.
- ක්‍රියා පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.
- ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ක්‍රියා ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නඟමින් ක්‍රියා පද වරනඟයි.
- අවසාන ක්‍රියා හා අනවසාන ක්‍රියා යන්න පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

i. **පෙර සූදානම**

- පහත සඳහන් මාතෘකා යටතේ විෂය කරුණු එක්රැස් කර ගන්න. පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති ග්‍රන්ථවල ක්‍රියාපදවලට අදාළ පරිච්ඡේදය ඉවහල් කර ගත හැකි ය.
  - * ක්‍රියා පදයක් යනු කුමක් දැයි නිර්වචනය කිරීම
  - * ක්‍රියා ප්‍රකෘතියක් (මූලයක්) සොයා ගන්නා විධි ක්‍රම
  - * ක්‍රියා පදයක ව්‍යාකරණ ලක්ෂණ
    - වචන භේදය (ඒක, බහු)
    - පුරුෂ භේදය (ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ)
    - කාල භේදය (අතීත, අනතීත)
    - කර්තෘකාරක සහ කර්මකාරක භේදය
  - * ක්‍රියා පද ප්‍රභේද
  - * ක්‍රියා වරනැඟීම
- ඔබේ සැලසුමට අදාළ ඉගෙනුම් ආධාරක හා ක්‍රියාකාරකම් පිළියෙල කර ගන්න.

ii. **ප්‍රවේශය**

- පාඩමට සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * සුදුසු ඡේදයක් ලබා දී එහි ඇතුළත් ක්‍රියා පද හඳුනා ගැනීමට සැලැස්වීම

  * කවියක හෝ ගීතයක හෝ ඇතුළත් ක්‍රියා පද හඳුනා ගැනීමට සැලැස්වීම

iii. **ඉගෙනුම සංවර්ධනය**

- ප්‍රවේශයෙන් මතු වන කරුණු ඇසුරෙන් ක්‍රියා පද පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නඟන්න.
- ක්‍රියා පදයක ලක්ෂණ හඳු නාගැනීම සඳහා ඇමුණුම 1හි සඳහන් ආකාරයේ ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් නිරත කර වන්න.
- ශිෂ්‍යයන් ද සහභාගි කර ගනිමින් ක්‍රියා පදයක් යනු කුමක් දැයි නිර්වචනය කරන්න. (ඇමුණුම 2)
- ක්‍රියා පදයක ප්‍රකෘතිය සොයා ගත හැකි විවිධ ක්‍රම විස්තර කරන්න. (මේ සඳහා ඇමුණුම 3 යොදා ගන්න.)
- ක්‍රියා පද ප්‍රභේද විස්තර කරන්න. (මේ සඳහා ඇමුණුම 1හි සඳහන් ප්‍රභේද උදාහරණ සහිත ව යොදා ගන්න.)
- ක්‍රියා මූලයකට ප්‍රත්‍යය එකතු වීමෙන් විවිධ රූප ගන්නා (වරනැඟෙන) ආකාරය නිදර්ශන සහිත ව පෙන්වා දී සුදුසු අභ්‍යාසවල නිරත කරවන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- මෙහි දී පහත ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරන්න.
  - * ක්‍රියා පදයක ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කර ගැනීමේ හැකියාව
  - * ක්‍රියා පද ප්‍රභේද පැහැදිලි කිරීමේ හැකියාව
  - * ක්‍රියා වරනැඟීමේ හැකියාව

**මුඛ්‍ය පද (Keywords) :**

**''ක්‍රියා පද**

'**ක්‍රියා පදය**' යනු '**ක්‍රියා ප්‍රත්‍යයක්**' සහිත පදය යි.
මතු දැක්වෙන පද 'ක්‍රියා පද' වශයෙන් සැලකෙන්නේ ඒවායෙහි ඇතුළත් වන 'ක්‍රියා ප්‍රත්‍ය' නිසා ය.

| ක්‍රියා ප්‍රත්‍යය | ප්‍රකෘතිය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
|---|---|---|---|
| යි : | බල | යි | බලයි |
| ති : | බල | ති | බලති |
| මි : | බල | මි | බලමි |
| මු : | බල | මු | බලමු |
| නː | බල | න | බලන |
| නු : | බල | නු | බලනු |
| ත්ම : | බල | ත්ම | බලත්ම |
| ද්දි : | බල | ද්දි | බලද්දි |
| මින් : | බල | මින් | බලමින් |
| තොත් | බල | තොත් | බලතොත් |
| තත් : | බල | තත් | බලතත් |
| ආ : | බල | ආ | බලා'' |

දිසානායක, ජේ. බී., **සිංහල රීතිය 7 පද නිර්මාණය,** කොළඹ, 2014, 41 පි.

''**කිරිය**

ධාතුවකින් තැනෙන්නේ කිරිය (ක්‍රියා) යි. 'දා මුව වැ සිදු කිරිය නම්' යනු සිදත් සඟරා පාඨ යි.

| | | |
|---|---|---|
| බල + ඉ | - | බලයි |
| බල + ආ | - | බලා |
| බල + මින් | - | බලමින් |
| බල + න | - | බලන |

ශුද්ධ ක්‍රියා (තෙකල් කිරිය), නාම ක්‍රියා (කිරිය සද - හව් කිරිය, අරුත් කිරිය), නිපාත ක්‍රියා (පෙර කිරිය, මුසු කිරිය, අසබහව් කිරිය) යනුවෙන් ක්‍රියා ප්‍රභේද වේ.''

පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ, **සිංහල ව්‍යාකරණ අකාරාදිය**, කොළඹ, 2000, 211 පි.

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 1, 2, 3, 4

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක පදනම් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* ක්‍රියා පදයක් යනු කුමක් දැයි නිර්වචනය කරයි.
* ක්‍රියා පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වයි.
* ක්‍රියා පද ප්‍රභේද උදාහරණ සහිත ව විස්තර කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| තිලකසිරි, සිරි | - | **සිංහල වියරණ විදි** |
| දිසානායක, ජේ. බී. | - | **බසක මහිම 11 ක්‍රියා පදය** |
| දිසානායක, ජේ. බී. | - | **සිංහල රීතිය 7 පද නිර්මාණය** |
| පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ | - | **සිංහල ව්‍යාකරණ අකාරාදිය** |
| මුනිදාස, කුමාරතුංග | - | **ක්‍රියා විවරණය** |

**ඇමුණුම 01 ක්‍රියා පදයක ඇති ලක්ෂණ පැහැදිලි කිරීම සඳහා වචන මාලා**

- පහත වගුවෙහි සඳහන් ක්‍රියා පද සඳහා උචිත මාතෘකාව වරහන් තුළින් තෝරා ලියන්න.
  (ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ, ඒක වචන, බහු වචන)

**'කර ධාතුව'** වරනැඟීම - වර්තමාන කාල

| **පුරුෂ භේදය** | **වචන භේදය** | |
|---|---|---|
| | .................... | .................... |
| .................... | කරයි | කරති |
| .................... | කරහි | කරහු |
| .................... | කරමි | කරමු |

- පහත වගුවෙහි සඳහන් ක්‍රියා පද සඳහා උචිත මාතෘකාව වරහන් තුළින් තෝරා ලියන්න.
  (ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ, ඒක වචන, බහු වචන)

  '**කර ධාතුව**' - වරනැඟීම - අතීත කාල

| පුරුෂ භේදය | වචන භේදය | |
|---|---|---|
| | .................... | .................... |
| .................... | කළේ ය | කළෝ ය/කළහ |
| .................... | කළෙහි | කළෙහු |
| .................... | කළෙමි | කළෙමු |

ඇමුණුම 02 - **ක්‍රියා පදයක ප්‍රකෘතිය සෙවීම**

''කිසියම් ක්‍රියා පදයක ඇතුළත් වන 'ක්‍රියා ප්‍රකෘතිය' වෙන් කොට හඳුනා ගන්නේ කෙසේ ද? යන ප්‍රශ්නය සාමාන්‍ය පාඨකයෙකුට ඇතිවිය හැකි ය. ඒ සඳහා අනුගමනය කළ හැකි එක් පිළිවෙතක් නම් ඒ ක්‍රියා පදයට අනුරූප 'නවා' යන්න සහිත ක්‍රියා පදය තෝරා ගෙන එහි අවසානයෙහි එන 'නවා' යන්න ඉවත් කොට ඊට පූර්වයෙන් ඇති කොටස ක්‍රියා ප්‍රකෘතිය සේ පිළිගැනීම යි.

'බලමි' 'බලති' 'බලද්දී' 'බලතත්' යන ක්‍රියා පදවල 'ක්‍රියා ප්‍රකෘතිය' වශයෙන් 'බල' යන කොටස තෝරාගත්තේ 'නවා' යන කොටස සහිත ක්‍රියා පදය 'බලනවා' යන්න වීමත්, එහි එන 'නවා' යන කොටස ඉවත් කිරීමෙන් පසු ශේෂ වන්නේ බල යන්න වීමත් නිසා ය.

දිසානායක ජේ. බී., **බසක මහිම : 6 ප්‍රකෘති,** කොළඹ, 2000, 16 පි.

ඇමුණුම 03 - **ක්‍රියා පද ප්‍රභේද**

**අවසාන ක්‍රියා**

* ආඛ්‍යාත - කරයි, බලයි, දුවමි, බලමු
* කෘදන්ත ක්‍රියා - කරන්නේ ය/බලන්නී ය/බලන්නාහු
* නාම ක්‍රියා - ශිෂ්‍යයෙක්මි, ගුරුවරයෙක්මි, ගසකි
* ආශීර්වාද ක්‍රියා (ප්‍රාර්ථනා ක්‍රියා) - වේවා ! වෙත්වා !
  වෙම්වා ! කරත්වා !
  බලත්වා !
* විධි ක්‍රියා - කරව්, බලව්, ගන්න, බලනු මැනවි
* ප්‍රයෝජ්‍ය ක්‍රියා - කරවයි, බලවයි, දුවවති, අරවමි

**අනවසාන ක්‍රියා**

* පූර්ව ක්‍රියා - කර, බලා, දැක, ගෙන
* අපර ක්‍රියා - බලනුව, කරනුව
* මිශ්‍ර ක්‍රියා - කරමින්, බලමින්, දකිමින්, ගනිමින්
  කර කර, බල බලා, කරමින්, බලමින්

* අසම්භාව්‍ය ක්‍රියා

i. කාලාර්ථයේ - කරද්දී, බලද්දී, දකිද්දී, ගනිද්දී, බලත, කියත

ii. අනියමාර්ථයේ - කළොත්, බැලුවොත්, දුටුවොත්, ගෙනාවොත්, කළහොත්

# 22

# අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ)

**නිපුණතාව** : 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.4 අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.
- ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවිය යුතු බව පිළිගනියි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ප්‍රකාශ කරයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

i. **පෙර සූදානම :**

- අනිර්දිෂ්ට ගද්‍ය ඡේද කිහිපයක් හා එම ඡේද ඇසුරෙන් අවබෝධය ඇගයිය හැකි ප්‍රශ්න සූදානම් කර ගන්න.
- ඒවා ශිෂ්‍යයන් අතරේ බෙදා දීමට අවශ්‍ය පහසුකම් සකසා ගන්න.

ii. **ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ක්‍රමයක් ආශ්‍රයෙන් පාඩම ආරම්භ කරන්න.

  *උදා :* * කෙටි ඡේදයක් ප්‍රදර්ශනය කර එයින් ප්‍රශ්න කිහිපයක් විමසීම

  * කියවන ලද දෙයක් වැරදියට අවබෝධ කර ගැනීමෙන් ගැටලුවක් ඇති වූ අවස්ථාවක් භූමිකා රංගනයකින් ඉදිරිපත් කිරීම

iii. **ඉගෙනුම් සංවර්ධනය**

- කියවා අවබෝධ කර ගැනීමේ වටිනාකම පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එහි දී පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
  * කියවීමේ වටිනාකම යනු කියවන දෙයෙහි අර්ථය වටහා ගැනීම බව
  * කියවූ බවට සාක්ෂිය අවබෝධය බව
  * අවබෝධයෙන් තොර ව කියවීම පල රහිත ක්‍රියාවක් බව
  * අවබෝධයෙන් යුතු ව කියවීමෙන් දැනුම හා තොරතුරු ලැබෙන බව
- කියවා අවබෝධ කර ගැනීම පුහුණු විය යුතු ක්‍රියාවලියක් බව පැහැදිලි කරන්න.
  * අභ්‍යාසයෙන් පුහුණු විය යුතු බව
  * නිරන්තර අභ්‍යාසය අවබෝධය තීව්‍ර කරන බව
- අවබෝධය ප්‍රශ්නවලට උත්තර ලිවීමේ දී අනුගමනය කළ යුතු පියවර විස්තර කරන්න.

1. මුලින් ම ප්‍රශ්න කියවා අවබෝධ කර ගන්න.
2. ඡේදය පළමුවන වර කියවන්න.
3. ඡේදය දෙවන වර කියවමින් ප්‍රශ්නවලට අදාළ උත්තර සලකුණු කර ගන්න.
4. ප්‍රශ්න නැවත කියවා උත්තර නිවැරදි දැයි තහවුරු කර ගන්න.
5. ප්‍රශ්නවලට අදාළ උත්තරය පමණක් ලියන්න.

- ඇමුණුම 1හි සඳහන් ඡේද ශිෂ්‍යයන්ට ලබා දී අවබෝධය ප්‍රශ්නවලට උත්තර ලිවීමට අවස්ථාව දෙන්න.
- ලියන ලද උත්තර පිළිබඳ සාකච්ඡා කරන්න.
- මෙවන් අභ්‍යාස කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී අවබෝධ ප්‍රශ්නවලට නිතර ලිවීමට පුහුණු කරවන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.

  *උදා :* * අනිර්දිෂ්ට ඡේදයක් කියවා එහි ඇති දුරවබෝධ වචනවල අර්ථය ලිවීමට ලබා දීම
  * අනිර්දිෂ්ට ඡේද කිහිපයක් ශිෂ්‍ය කණ්ඩායම් අතර බෙදා දී ඒවායේ මූලික අදහස ප්‍රකාශ කිරීම සඳහා කණ්ඩායම් පැවරුමක් ලබා දීම
  * අනිර්දිෂ්ට ඡේදයක් කියවීමට ලබා දී ඒ ඇසුරින් වාචික ප්‍රශ්න විමසීම/ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට යොමු කිරීම

- **ගුණාත්මක යෙදවුම්**

  * අභ්‍යාසය සඳහා අවශ්‍ය අනිර්දිෂ්ට ඡේද කිහිපයක්

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

  පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

  * ඡේද කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.
  * ඡේද කියවා එහි මූලික අදහස ලියයි.
  * ඡේදයක් කියවා ඒ ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නවලට උත්තර ලියයි.
  * ඡේදයක් කියවා එහි අදහස සරල බසින් ලියයි.

**ඇමුණුම 1**

ආර්ථික වර්ධන වේගය තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහි කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සැලකිය යුතු ලෙස නවීකරණයකට ලක් විය යුතු බව පැහැදිලි ව හඳුනාගෙන ඇත. අධ්‍යාපනයේ නිසි ප්‍රතිලාභ ලැබෙනුයේ, අධ්‍යාපන සේවා ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට ගැළපුණහොත් පමණි. එම නිසා, අධ්‍යාපන ක්‍රමය විභාග මූලික කරගත් විෂය කරුණු මත පදනම් වූ විෂය මාලාවලින් පරිබාහිර ව ශිෂ්‍යයන්ට ජීවිතයට අවශ්‍ය කුසලතා සහ ස්වාධීන ව සිතීමේ හැකියාව ලබා දෙන ආකාරයෙන් නිපුණතා මත පදනම් වූ විෂය මාලාවක් බවට වෙනස් කළ යුතු ව තිබේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ මගින්, ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා සහ උපාධිධාරීන්ගේ කුසලතා අතර පවතින නොගැළපීම අඩු කළ යුතු අතර, එය තරුණ කොටස් අතර සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට හේතු වනු ඇත. රජය, උසස් අධ්‍යාපනය සඳහා කරනු ලබන ආයෝජන ප්‍රමාණය ඉහළ ගිය ද, ශ්‍රී ලංකාවට දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස නැඟී සිටීමට නම්, පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ ව ආයෝජන ධෛර්යවත් කිරීම මඟින් අධ්‍යාපන අංශය වැඩි දියුණු කළ යුතු ව ඇත. අන්තර්ජාල පහසුකම් ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ ව ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩල හුවමාරු කිරීමේ වැඩසටහන්, පශ්චාත් උපාධි පාඨමාලා විදේශීය සිසුන් සඳහා විවෘත කිරීම, මෑතක දී උසස් අධ්‍යාපන අධිකාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රශස්ත ක්‍රියා මාර්ග වේ. මේ අතර ම, ශ්‍රී ලංකාවේ දැනට පවත්නා සමහර තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතන තරුණ කොටස් අතර සේවා වියුක්තිය යම්තාක් දුරකට අඩු කිරීමට හේතු වී ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් නො ලබන ශිෂ්‍යයන් පාසල් අධ්‍යාපනයෙන් පසු ව රැකියාවක් සඳහා යොමු කිරීමට පහසුකම් සලසන ආකාරයෙන් එම ආයතන සැලකිය යුතු ලෙස ව්‍යාප්ත විය යුතු ව ඇත. අධ්‍යාපනය වසරකින් දිගු වීම හේතුවෙන් අත්වන ආන්තික ප්‍රතිලාභය තාක්ෂණික හා වෘත්තීය පුහුණු අධ්‍යාපනය සම්බන්ධයෙන් ද ඉතා ඉහළ අගයක් ගන්නා බැවින්, මෙම තාක්ෂණික හා වෘත්තීය පුහුණු අවශ්‍යතා තවදුරටත් වැඩි දියුණු කිරීම ධෛර්යවත් කළ යුතු ව තිබේ.

**මහ බැංකු වාර්ෂික වාර්තාව, 2011.**

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය නවීකරණය විය යුත්තේ කුමක් සඳහා ද?
2. නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට අධ්‍යාපනය සකස් විය යුත්තේ කෙසේ ද?
3. සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට කුමක් කළ යුතු ද?
4. ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස නැඟී සිටීමක් සඳහා ගත යුතු පියවර ලෙස යෝජනා කරන්නේ කුමක් ද?
5. තාක්ෂණික හා වෘත්තීය පුහුණු අවශ්‍යතා වැඩි දියුණු කිරීම ධෛර්යවත් කළ යුත්තේ ඇයි?

ඓතිහාසික සාහිත්‍යයෙහි ආධාරය නොමැති ව හුදෙක් සෙල්ලිපි ම පදනම් කොට ගෙන මෙරට ආධ්‍යාපනික ප්‍රතිපත්ති හා ව්‍යවහාරය පිළිබඳ ව ක්‍රමානුකූල වෘත්තාන්තයක් ඉදිරිපත් කළ නො හැකි තරම් ය. බෞද්ධ විහාරස්ථානය සාමාන්‍යයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණස්ථානය විය. මෙහි දී බෞද්ධ ශික්ෂාපද සහ වත් පිළිවෙත් පමණක් නො ව අධ්‍යාපනයට අයත් ලෞකික විෂයයන් ද සැලැකිල්ල ලද්දේ ය. ශිෂ්‍යයනට විඳින්නට සිදු වූ දුක් කරදර නොතකා හුදෙක් තමනට සැලැසෙන අභිවෘද්ධිය ම තකා මහත් උද්යෝගයෙන් හා උනන්දුවෙන් අනුරාධපුරයෙහි මේ අධ්‍යාපන ආයතනයන්ට ශිෂ්‍යයන් ඇතුළු වීම වූකලී ඒවායෙහි විශිෂ්ටත්වය හුවා දක්වන ප්‍රත්‍යක්ෂ සාධකයකි. බුද්ධ ධර්මය රාජ්‍යාගම ලෙස ප්‍රතිෂ්ඨාපිත වූ පසු මහජනයා බෞද්ධ දිවිපෙවෙත පිළිගෙන ඒ අනුව ජීවත් වූහ. මනුෂ්‍යයන්ගේ පමණක් නො ව, කෘමී, සිවුපා, සියොත් ආදීන්ගේ ද ජීවිතය අගය කිරීමට ඉගැන්වීමෙන් බුදු සමය, ක්ෂුද්‍රතම ජීවියකුට පවා ස්වභාව ධර්මයෙන් ඉඩ ලැබෙන තාක් ජීවත් වීමට ඇති ඒකාන්ත අයිතිය පිළිගත්තේ ය. බුදු සමය වැළඳ ගත් සැදැහැවතුනට උගන්වන ලද්දේ දෙවි, මිනිස්, සත්ත්ව හැම කොට්ඨාසයක් ම සංසාර චක්‍රයෙහි බැඳී ඇති බව යි. එම නිසා ආගමික ශික්ෂාපද තරමට ම උද්යෝගයකින් වෛද්‍ය විද්‍යාවත් ශල්‍යකර්මයත් ඉගෙන ප්‍රගුණ කිරීම පුදුමයට කරුණක් නො වේ. අගනුවර පමණක් නො ව රටේ බොහෝ තැන්වල ද මිනිසුනටත් සත්වයනටත් ආරෝග්‍යශාලා පිහිටුවන ලදි. වෛද්‍ය විද්‍යාවෙහි හා ශල්‍ය කර්මයෙහි හා විශාරදයකු වූ සුප්‍රකට බුද්ධදාස රජතුමා ලක්දිව ආරෝග්‍යශාලා ක්‍රමය සම්පූර්ණයෙන් සංශෝධනය කොට සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රයෙන් ම ඉගැන්වීම අනිවාර්ය කරමින් නියෝග පැනැවී. ආයුර්වේදය හදාරන්නන් අද පවා භාවිත කරන කීර්තිධර මේ රජුගේ '**සාරාර්ථ සංග්‍රහය**' නම් වෛද්‍ය ග්‍රන්ථය එතුමාගේ අමරණීය ස්මාරකයක් ලෙස පවතිනු ඇත. සෙල්ලිපිවල මේ රජ බුද්ධදාස මහාසේන නමින් හැඳින්වේ.

**සියවස අධ්‍යාපන ප්‍රකාශනය, පළමු වෙළුම,** 35 පි.

1. මෙහි දැක්වෙන ආකාරයට ආධ්‍යාපනික ප්‍රතිපත්ති හා ව්‍යවහාරය පිළිබඳ තොරතුරු දැක්වීමට ඇති සාධකය කුමක් ද?
2. 'බෞද්ධ විහාරස්ථානය සාමාන්‍යයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණ ස්ථානය විය' යන්නෙන් අදහස් කළේ කුමක් ද?
3. අනුරාධපුරයෙහි අධ්‍යාපන ආයතනවල විශිෂ්ටත්වය කියා පාන්නේ කුමන කරුණකින් ද?
4. ස්වභාව ධර්මය හා සත්ත්වයා අතර ඇති සබඳතාව ගැන බුදු දහමේ කියැවෙන සිද්ධාන්තය කුමක් ද?
5. බෞද්ධ ශික්ෂා පද තරමට ම බෞද්ධයා වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම කෙරෙහි නැඹුරු වූයේ ඇයි?

# 23

# ගුත්තිල කාව්‍යය රසවින්දනය හා විචාරය
## (91-147 කවි)

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 2.0 | පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. |
| **නිපුණතා මට්ටම** | : | 2.3 | නූතන කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. |
| **කාලච්ඡේද** | : | 12 යි. | |

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට පද්‍ය කියවා අර්ථ පැහැදිලි කරයි.
- පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍යික අගය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.
- ගුත්තිල කාව්‍යය රස වින්දනයට හා විචාරයට අදාළ ව යොදා ගත හැකි කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගන්න.
- ගුත්තිල කාව්‍යය සම්පූර්ණයෙන් කියවා සමස්තය අවබෝධ කර ගන්න.
- ගුත්තිල කාව්‍යයේ යෙදී ඇති විවිධ විරිත් හඳුනා ගන්න.
- ගුත්තිල කාව්‍යය කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

ii. **ප්‍රවේශය**
- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.

  *උදා :* * ගුත්තිල කාව්‍යයේ එන විරිත් කිහිපයකට අදාළ කවි කිහිපයක් මියුරු ලෙස ගායනා කිරීමට සලස්වා සාකච්ඡාවක් මෙහෙය වීම

  * අභිමත කාව්‍ය විචාර මූලධර්මයක් හෝ කිහිපයක් ඉස්මතු වන ආකාරයේ ඉදිරිපත් කිරීමක් කරමින් රස වින්දන සාකච්ඡාවක් මෙහෙය වීම

iii. **ඉගෙනුම් සංවර්ධනය**
- සාහිත්‍ය නිර්මාණයක් රස වින්දනයේ දී පෙරදිග විචාරකයන් පාදක කරගත යුතු මූලික කරුණු හෙවත් කාව්‍ය විචාර මූලිකාංග පිළිබඳ හඳුන්වා දෙන්න.

  * තේමාව
  * වස්තු විෂය
  * අරමුණු

* ආකෘතිය

* කාව්‍යෝපක්‍රම : භාෂාව - අර්ථ ධ්වනිය, ශබ්ද ධ්වනිය
  සංකල්ප රූප - උපමා, රූපක
* කවියාගේ සහජ කවි ශක්තිය
* අවස්ථා හා සිද්ධි නිරූපණය
* නිර්ව්‍යාජත්වය
* චරිත නිරූපණය
* ඖචිත්‍ය ගුණය - උචිත තැන්හි උචිත වර්ණනා, අලංකාර යෙදීම/උචිත බව

- ඉහත සඳහන් කරුණු පාදක කර ගනිමින් ගුත්තිල කාව්‍යයේ සාහිත්‍යමය අගය හඳුනා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

- එහි දී පහත වැනුම් පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  * බරණැස් පුර වැනුම - (91 - 99)
  * බරණැස් රජු වැනුම - (100 - 107)
  * ගුත්තිල ඇදුරු හැඳින්වීම - (108 - 113)

- මෙකී වැනුම් පිළිබඳ ව පහත දැක්වෙන කරුණු ඔස්සේ රස වින්දනයට හා විචාරයට යොමු කරන්න.
  * ආකෘතිය
  * වර්ණනාවට හසු කර ගන්නා ප්‍රස්තුත
  * යොදා ගෙන ඇති අලංකාරෝක්තිවල උචිත, අනුචිත භාවය
  * විශේෂ වාක්‍ප්‍රයෝග
  * ශබ්දාලංකාර
  * සාම්ප්‍රදායික ලක්ෂණ
  * ස්වාධීන ලක්ෂණ

- 'සැණකෙළි වැනුම' හා 'මූසිල වෙළෙඳු හමුව' යන අවස්ථා පිළිබඳ ව ද සාකච්ඡා කරන්න.

**සැණකෙළි වැනුම (114 - 130)**
* ආකෘතිය
* ප්‍රස්තුතය : - සැණකෙළි භූමිය සැලසුම් කිරීම
  - සැණකෙළියෙහි නිරත වූවන්ගේ විවිධ චර්යා, සජීව බව
* ශබ්ද ධ්වනි
* අර්ථ ධ්වනි
* අවම අලංකාර භාවිතය
* ස්වභාවෝක්තිය
* චිත්ත රූප

* කවියාගේ ප්‍රතිභාව
* ඖචිත්‍ය ගුණය

**මූසිල වෙළෙඳු හමුව (131 - 147)**

* ආකෘතිය
* සංවාද සහිත නාටකීය අවස්ථා නිරූපණය
* මූසිල අපහාසයට ලක් කිරීම
* අලංකාරෝක්තිවල උචිත අනුචිත භාවය
* චරිත නිරූපණය
* කවියෙන් කතන්දර කීමේ කුසලතාව

- නිර්දිෂ්ට කවිවල ඇතුළත් දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

* පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධනය මැන බැලීමට හා ප්‍රතිපෝෂණය ලබා දීම සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීමක යෙදෙන්න.

*උදා :* - රස වින්දනයේ හා විචාරයේ දී පාදක කොට ගත යුතු මූලික කරුණු නම් කිරීමට යොමු කිරීම

- එක් එක් වැනුම පිළිබඳ රසවින්දනාත්මක විචාරයක් සිදු කිරීමට අවස්ථාව ලබා දීම

- **ගුණාත්මක යෙදවුම්**
  * ගුත්තිල කාව්‍යය පිළිබඳ විචාර ග්‍රන්ථ

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායකඃ**

පහත සඳහන් නිර්ණායක පදනම් කර ගෙන ඇගැයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම අනුව ගුත්තිල කාව්‍යයේ සාහිත්‍යමය අගය සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරයි.
- ගුත්තිල කාව්‍යය මඟින් වෑත්තෑවේ හිමියන්ගේ නිර්ව්‍යාජ කවිත්වය ඉස්මතු වන ආකාරය නිදසුන් දක්වමින් ඉදිරිපත් කරයි.
- ගුත්තිලය ඖචිත්‍ය ගුණයෙන් පිරිපුන් කාව්‍යයක් බව නිදසුන් දෙමින් පැහැදිලි කරයි.

- **පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| ප්‍රඥාරාම හිමි, යක්කඩුවේ | - | **ගුත්තිල විචාර විචාරය** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **ගුත්තිල ගීතය** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - | **සාහිත්‍ය විද්‍යාව** |

# 24

# නූතන සිංහල කාව්‍ය - රස වින්දනය හා විචාරය

**(මීමන ප්‍රේමතිලක සිට ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ තෙක්)**

**නිපුණතාව** : 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර මූලධර්ම අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.2 කාව්‍ය නිර්මාණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 09 යි.

**ඉගෙනුම් පල** :
- නූතන කාව්‍ය විචාර ක්‍රම අනුග්‍රහයෙන් නිර්දිෂ්ට කෘති හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල කර්තෘවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නූතන පද්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- පහත සඳහන් නිර්දිෂ්ට කාව්‍ය පන්තිවල රචකයන්, ඔවුන් විසූ කාලය, සාහිත්‍යික පසුබිම හා ඔවුන්ගේ වෙනත් නිර්මාණ ආදිය පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.
  - කොළඹ කවියේ ද්විතීය තරංගය
    * මීමන ප්‍රේමතිලක - අඩසඳ
    * විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව
    * එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය
    * ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළඳරු හැඟුම්
- නිර්දිෂ්ට පද්‍ය පන්තිවල තේමාව/වස්තු විෂය, භාෂාව, ආකෘතිය, අලංකාර භාවිතය, කාව්‍යෝපක්‍රම ආදි තොරතුරු එක්රැස් කර ගන්න.

ii. **ප්‍රවේශය**

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.
  * ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලවා තමා රසවිඳි අනිර්දිෂ්ට පද්‍ය පන්තියක් ඉදිරිපත් කරවීම
  * සිංහල කාව්‍යයේ විවිධත්වය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීම (පවර් පොයින්ට් මඟින්)
  * කොළඹ කවියේ ද්විතීය තරංගයට අයත් අනිර්දිෂ්ට කවියක් ඉදිරිපත් කර ඒ පිළිබඳ ව සංවාදයක් ගොඩ නැඟීම (ඇමුණුම 01)
  * ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක විසින් නිර්මාණය කරන ලද පද්‍ය පන්තියක් ඉදිරිපත් කර ඒ පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නැඟීම

iii. **ඉගෙනුම් සංවර්ධනය**

* නිර්දිෂ්ට පද්‍ය පන්තිවල රචකයන්, ලියැවුණු කාලය, රචකයන්ගේ වෙනත් නිර්මාණ ආදි පසුබිම් තොරතුරු හඳුන්වා දෙන්න.
* නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල පහත සඳහන් කරුණු පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  * තේමාව/වස්තු විෂය
  * කවියාගේ දෘෂ්ටිය
  * අරමුණ
  * කාව්‍යෝපක්‍රම
  * භාෂාව භාවිතයේ සුවිශේෂතා
  * විරිත
  * ආකෘතිය
* නිර්දිෂ්ට පද්‍ය පන්ති පිළිබඳ රසාස්වාදයක නිරත වන්න. මේ සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්, රස වින්දන සංවාද, දේශන, සාකච්ඡා ආදි ක්‍රම යොදා ගත හැකි ය.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- මෙහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.
  * නූතන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ දැනුම
  * කාව්‍ය රස වින්දන හැකියාව
  * සංවිධානාත්මක ව කාව්‍ය රසාස්වාදයක් ඉදිරිපත් කිරීමේ හැකියාව

- **ගුණාත්මක යෙදවුම්**
  * ඇමුණුම 1
  * කවිය පිළිබඳ ව සකස් කරන ලද පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම්
  * නිර්දිෂ්ට කවි උපුටා ගත් මුල් කෘති
  * නිර්දිෂ්ට කවිවල රචකයන් පිළිබඳ තොරතුරු, ඡායාරූප
  * අනිර්දිෂ්ට කවි කිහිපයක්

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල පසුබිම් තොරතුරු දැක්වෙන වගුවක් සකස් කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල තේමාව හා කවියාගේ අරමුණු හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල භාෂාවේ සුවිශේෂතා අගය කරයි.
- නිර්දිෂ්ට කවි රස විඳිමින් විචාරය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| කරුණාරත්න, අශෝක | - | **සාහිත්‍ය විවේචනය** |
| කරුණාරත්න, කුසුමා, සරත් විජේසූරිය | - | **නවකවි සංග්‍රහය** |
| දිසානායක, විමල් | - | **නවකවි සරණිය** |
| රාජකරුණා, ආරිය | - | **නූතන සිංහල කාව්‍ය I, II** |
| වික්‍රමසිංහ, මාර්ටින් | - | **නව පද්‍ය සිංහල** |
| සරච්චන්ද්‍ර, එදිරිවීර | - | **සාහිත්‍ය විද්‍යාව** - |
| සුරවීර, ඒ. වී. | - | **නිර්මාණ පසුබිම** |
| සුරවීර, ඒ. වී. | - | **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා** |

ඇමුණුම 1

**සිය බස**

බටහිරට හැරීලා - වෙස් මවා ගත්තවුන් ගෙන්
ලොකු වැඩෙක සිතාලා - උන්ට ඇස් ලූ දනන් ගෙන්
සට කපට නිසාවෙන් - සිංහල ද්වීපයේ දී
සිය බසට අනේ දූන් සිද්දවන්නේ වැරැද්දයි

අදර යුතු පියා 'පාදර්' වෙලා මව් 'මදර්' වී
සොඳුරට 'මයි ඩාලින්! කම්හියර්' යී දෙඩේවී
ගෙදර හිරමනේ පොල් ගෑම ඉංග්‍රීසි තාලෙන්
මජරකම නොවේ නම් මේ මොකක් දූ යි ඉලව්වේ

නගරවල පටන්ගත් මේ ලෙඩේ ගම්වලත් දූන්
පැතිර යන විලාසේ අත්හිටෙව්වේ නොමැත්නම්
ගෙවල හෙට අනිද්දා වන්නි බිම්තැන්න පැත්තේ
නිතර කන වැකේවී 'ද-ඩිනරිස් - ඔන් - ද ටේබල් -

සිහළ අණ මෙ දෙස් මෙන් නෙක් විදෙස්හී සදන්ටත්
පුවළ මුනි වදන් එක්වන් අරුත්ලා තබන්ටත්
මෙකලට දෙදහස් වස් කල් කියන්ටත් ලියන්ටත්
නිමල රිය සිරිත් සිත්හී රඳන්ටත් රකින්ටත්

කොමල දරුවන්වත් රන් රිදීයෙන් හදන්ටත්
කකුල උඩ තබා උන් ''දොයි බබොයි දොයි'' කියන්ටත්
මඟුලට අමතන්ටත් අන්තිමේ දී අඬන්ටත්
සිහළ බස සමත් නම් ඇයි මෙසේ පාත ලන්නේ

මොළය පපුව ඇත්නම් සෝයුරෝ මේ සිතත්වා
කෙළ හැළුම් විදෙස් බස්හී මඳක්වත් නවත්වා
පළමුව සිය බස් වෙත් දිවි විලස් පෙම් වඩත්වා
සැලසෙන සෙත ඒ පාරෙන්ය ඉන් වෙන් නො වෙත්වා

**ජී. එච්. පෙරේරා**

## 25

# නාට්‍ය ප්‍රවර්ග හඳුනා ගැනීම හා ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීම

**නිපුණතාව** : 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම** : 5.3 නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- පෙර අපර දෙදිග නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි.
- නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- නාට්‍ය ප්‍රභේද පිළිබඳ ලියැවී ඇති පොත්පත් ඇසුරින් නිවැරදි තොරතුරු රැස් කර ගන්න.
- නිර්දිෂ්ට නාට්‍යයේ පෙළ කියවා ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගන්න. එම නාට්‍ය නිෂ්පාදනය සජීව ලෙස නැරඹීම මේ පිළිබඳ අවබෝධය පුළුල් වීමට හේතු වනු ඇත.
- ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ කියවා අවශ්‍ය තොරතුරු රැස් කර ගන්න.
- නාට්‍ය ප්‍රභේද හා නිර්දිෂ්ට පෙළ රස විඳීමට අදාළ ව පහත මාතෘකා ඔස්සේ අදාළ නිවැරදි තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
  1. නාට්‍ය ප්‍රභේද පිළිබඳ විචාර ලිපි/ග්‍රන්ථ
     * පෙරදිග - භරතමුනිවරයාගේ ''නාට්‍ය ශාස්ත්‍රය''
     * අපරදිග - ග්‍රීක පඬිවර ඇරිස්ටෝටල්ගේ ''කාව්‍ය ශාස්ත්‍රය''
  2. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ජීවන තොරතුරු සහ නාට්‍ය නිර්මාණ පිළිබඳ තොරතුරු
  3. ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යය පෙළ
  4. ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යය පිළිබඳ විචාර ලිපි/ඡායාරූප

ii. **ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * නාට්‍ය කලාවේ මූලිකාංග ගැන කෙටි ප්‍රකාශයක් (විචාරක කියමන්) සහිත පුවරු/පිටු පෙරළනයක්/පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම

  * ''පේමතෝ ජායතී සෝකෝ''නාට්‍යයේ ගීතයක් ගුරු ආදර්ශන සහිත ව ශිෂ්‍යයන් සමඟ ගායනා කිරීම

  * ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යයේ චරිතයක් සඳහා සූදානම් කළ සිසුවකු/සිසුවියක ලවා කෙටි රංගනයක් ඉදිරිපත් කරවීම

**iii. ඉගෙනුම් සංවර්ධනය**

- නාට්‍ය විචාර මූලිකාංග පිළිබඳ අපරදිග (ඇරිස්ටෝටල් මතය) සහ පෙරදිග (භරතමුනි මතය) පිළිබඳ සාකච්ඡාවක් සිදු කරන්න.
- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ගේ ජීවන තොරතුරු සහ නිර්මාණ පිළිබඳ මෙන් ම ''පේමතෝ ජායතී සොකෝ'' නාට්‍යයේ නිර්මාණ පසුබිම පිළිබඳ ව ද සාකච්ඡා කරන්න.
- නාට්‍ය විචාර මූලධර්ම සහ ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යය පිළිබඳ ව පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළ ව පුළුල් අවබෝධයක් ශිෂ්‍යයන් තුළ ඇති වන පරිදි විවිධ නිර්මාණශීලී ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ගේ ජීවන තොරතුරු
- ඔහුගේ වෙනත් නිර්මාණ
- ඒ අතර සුවිශේෂ වන ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යය සහ එහි නිර්මාණ පසුබිම
  * නාට්‍යයේ තේමාව
  * කතා වස්තුව
  * නාට්‍ය භාෂාව
  * නිර්මාණයට බල පෑ දේශීය විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා වෙනත් නිර්මාණ, ආභාසය

    *උදා :* * ආසියාතික නාට්‍ය කලාවන්ගේ රංග වස්ත්‍ර, අංග රචනය

    * නාඩගම් කලාව, බෞද්ධාගමික පොත්පත් සහ බෞද්ධ දර්ශනය
- පෙරදිග සහ අපරදිග නාට්‍ය විචාර මූලධර්ම
  * අපරදිග ''කාව්‍ය ශාස්ත්‍රයේ''ඇරිස්ටෝටල් විග්‍රහය
    - කතා වින්‍යාසය (මුල, මැද අග කොටස් තුන) හෙවත් සිද්ධි ගැළපීමේ කාර්යය
    - ෂඩ්වැදෑරුම් අංග (කතා වින්‍යාසය, චරිත, වාග්විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය)
    - කතා වින්‍යාසයක ලක්ෂණ (සම්භාව්‍යතාව, භවිතව්‍යතාව, අවශ්‍යතාව, ත්‍රිවිධ ඒකත්වය)
  * පෙරදිග''නාට්‍ය ශාස්ත්‍රයේ'' භරතමුනි විග්‍රහය
    - නාට්‍ය වස්තුව (ඉතිවෘත්තයඃ ඉති - මෙසේ, වෘත්ත - සිදුවිය)
    - නාට්‍ය ශරීරයේ කොටස් තුන
    - ප්‍රඛ්‍යාත - වීර කතා, සාහිත්‍යය වැනි ප්‍රකට මූලාශ්‍රයකින් උපුටාගත් කතා
    - උත්පාද්‍ය - රචකයා විසින් ම නිර්මිත
    - මිශ්‍ර වස්තු - (ප්‍රසිද්ධ හෝ ඓතිහාසික කතාවක් නිර්මිත සිද්ධීන් සමඟ මනා ලෙස ගළපා සකස් කළ)
    - නාට්‍ය වස්තුවක අංග පහ (අර්ථ ප්‍රකෘති, බීජ, බිංදු පතාකා, ප්‍රකරී, කාර්යය)
    - නාට්‍ය කාර්යයේ අවස්ථා පහ (ආරම්භ, ප්‍රයත්න, ප්‍රාප්ත්‍යාශා, නියතාප්ති, ඵලාගම)
- මෙතෙක් උගත් විෂය කරුණු පිළිබඳ අවසන් සමාලෝචනයක් සිදු කරන්න.
- මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ''පේමතෝ ජායතී සෝකෝ'' ඇතුළු නාට්‍යවලින් ඔපවත් වූ දේශීය නාට්‍ය සාහිත්‍යය පිළිබඳ වැඩි දුර තොරතුරු ගවේෂණයට ශිෂ්‍යයන් යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- නාට්‍ය ප්‍රවර්ග හඳුනා ගැනීම හා ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීමට අදාළ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත් ශිෂ්‍යයාගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් (ප්‍රායෝගික/ලිඛිත) ලබා දෙන්න.

  *උදා :* * මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ''පේමතෝ ජායතී සෝකෝ'' ඇතුළු නාට්‍ය නිර්මාණ පිළිබඳ තොරතුරු වගු ගත කිරීම (ඇමුණුමෙහි ඇතුළත් ආදර්ශ වගුව යොදා ගන්න.)

  * නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන ගුවන්විදුලි හෝ රූපවාහිනී සංවාදයක ස්වරූපයෙන් සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන සාකච්ඡා වැඩසටහනක්

  * ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යයේ විවිධ භූමිකා (සූත්‍රධාර, උද්දාල බමුණා, අග්නිදත්ත, පිංගල, ස්වර්ණතිලකා, දප්පුල) විග්‍රහයක් කිරීමට අවස්ථාව ලබා දීම

  * ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍ය පිළිබඳ ව ලියැවුණු පොත් පිංචක් (රූප සටහන් සහිත ව) නිර්මාණය කරවීම

- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගෙන ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

මුඛ්‍ය පද **(Keywords) :**

**කතා වින්‍යාසය** -''ක්‍රියාවන්ගේ අනුකරණය නම් කතා වින්‍යාසය යි. මේ අනුව කතා වින්‍යාසය යන්නෙන් මා අදහස් කරන්නේ සිද්ධි ගැළපීමේ පිළිවෙළ යි.

සුරවීර, ඒ. වී., **ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය,** කොළඹ, 1996, 16 පි.

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 1 හා 2

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක පදනම් කරගෙන තක්සේරුකරණයේ සහ ඇගයීමේ යෙදෙන්න

* මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ජීවන තොරතුරු සහ නිර්මාණ පිළිබඳ පුවත්පත් ලිපියක් සකස් කරයි.
* පෙර අපර දෙදිග නාට්‍ය විචාර මූලධර්ම පිළිබඳ විග්‍රහ කෙරෙන විවාදයක යෙදෙයි.
* නිර්දිෂ්ට නාට්‍යය පිළිබඳ සාකච්ඡා වැඩසටහනක් පවත්වයි.
* නිර්දිෂ්ට නාට්‍යයේ අන්තර්ගත නාට්‍ය ගී ගායනයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ**


ද සිල්වා, සුගතපාල - **සොඳුරු ආශ්වාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක**

මාරසිංහ, වෝල්ටර් - **භරතමුණි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍රය**

මාරසිංහ, වෝල්ටර් - **සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය සහ රත්නාවලී**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **වෙස්මුහුණ ද සැබෑ මුහුණ ද**

සරච්චන්ද්‍ර, එදිරිවීර - **සිංහල ගැමි නාටකය**

සුරවීර, ඒ. වී. - **ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය**

ඇමුණුම 1 - **මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ**

| නාට්‍යයේ නම | නිෂ්පාදිත වසර | ප්‍රධාන චරිත | ශෛලිය | තේමාව |
|---|---|---|---|---|
| | | | | |

## 26

# පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රස වින්දනය (චන්දකින්නර ජාතකය හා ස්වර්ණතිලකා වස්තුව)

**නිපුණතාව** : 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණ ධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස විඳීමේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 1.2 නිර්දිෂ්ට කෘතිවල විශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට කෘතිවල පසුබිම පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් කියවයි.
- නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- චන්දකින්නර ජාතකය සහ ස්වර්ණතිලකා වස්තුව කියවා අවබෝධ කර ගන්න.
- ඒවායේ ඇති දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කර ගන්න.
- ඉගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සහ ගුණාත්මක යෙදවුම් සූදානම් කර ගන්න.

ii. **ප්‍රවේශය**
- පාඩම සඳහා සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * ශ්‍රුතිගෝචර ශෛලියෙන් ජාතක කතාවක හෝ සද්ධර්මාලංකාරයේ කතාවක කොටසක් කියවීම
  * බණ කතා සාහිත්‍යය පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කොට ඇති අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම
  * පන්සිය පනස් ජාතක පොත සහ සද්ධර්මාලංකාරය කෘතිවල පසුබිම විස්තර කිරීම

iii. **ඉගෙනුම් සංවර්ධනය**
- ජාතක පොතට හා සද්ධර්මාලංකාරයට අදාළ ව පහත සඳහන් අංශ ඔස්සේ තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  * කතුවරයා
  * කාලය
  * මූලාශ්‍රය ග්‍රන්ථ
  * අරමුණ

  * අන්තර්ගතය
  * රචනා රීතිය
  * භාෂා ලක්ෂණ
- නිර්දිෂ්ට කතා පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කරන්න.
- නිර්දිෂ්ට කතා කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කර ගැනීමට මඟ පෙන්වන්න.
- ඇමුණුම 1හි සඳහන් තොරතුරු ද ඉවහල් කර ගෙන නිර්දිෂ්ට කතා පිළිබඳ රසාස්වාදයක් හා විචාරයක් සිදු කිරීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- ජාතක කතා යනු මොනවා ද? නිර්දිෂ්ට ජාතක කතා අර්ථාවබෝධය හා විචාරය යන අංශ පිළිබඳ ශිෂ්‍ය දැනුම, අවබෝධය හා සාධන මට්ටම තක්සේරුවටත්, ඇගයීමටත් සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගන්න.

  *උදා :* * ජාතක පොත හා සද්ධර්මාලංකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කිරීම
  * ජාතක කතාවක මූලික ලක්ෂණ පෙළ ගැස්වීමට අවස්ථාව ලබා දීම හෝ ඒ පිළිබඳ වාචික ප්‍රශ්න විමසීම
  * නිර්දිෂ්ට කතාවල දුරවබෝධ වචන ලිහිල් බසින් ලිවීමේ අභ්‍යාස ලබා දීම
  * නිර්දිෂ්ට කතාවල කථා සාරය වාචික ව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම
  * නිර්දිෂ්ට කතාවල සාහිත්‍යික අගය පිළිබඳ බිත්ති පුවත් පත් ලිපි සකස් කිරීමට යොමු කිරීම

මුඛ්‍ය පද **(Keywords)**

  * **ජාතක කථා** - බෝසත් සිරිත ඇතුළත් කථා

    විජේතුංග, හරිශ්චන්ද්‍ර, **ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය,** කොළඹ, 2012, 759 පි.

**ගුණාත්මක යෙදවුම්**

  * ඇමුණුම 1
  * ජාතක පොත
  * සද්ධර්මාලංකාරය
  * ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවන ලද ජාතක කතාවක කොටසක් ඇතුළත් සංයුක්ත තැටියක්

- **තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

  පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

  * සද්ධර්මාලංකාරය පිළිබඳ තොරතුරු රැස් කරයි.
  * ජාතක පොත පිළිබඳ පසුබිම් තොරතුරු රැස් කර වගු ගත කරයි.
  * පැරණි කතා කලාවේ ලක්ෂණ නිර්දිෂ්ට කතා ඇසුරින් විස්තර කරයි.
  * නිර්දිෂ්ට පෙළ කියවා අවබෝධ කර ගෙන අර්ථය ලිහිල් බසින් ලියයි.
  * නිර්දිෂ්ට ජාතක කතාවල සාහිත්‍යික අගය විමසමින් පුවත් පත් ලිපියක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

කුලසූරිය, ආනන්ද - **සිංහල සාහිත්‍යය - 4**

වික්‍රමසිංහ, මාර්ටින් - **ජාතක කතා විමසුම**

වික්‍රමසිංහ, මාර්ටින් - **බණ කතා සාහිත්‍යය**

ඇමුණුම 1

- **චන්දකින්නර ජාතකය** (ජාතක පොත)

**තේමාව** : පතිව්‍රතා ධර්මයෙහි අගය ප්‍රකාශ කිරීම

**අන්තර්ගතය** :

වර්තමාන කතාව :
- බුද්ධත්වයෙන් පසු කිඹුල්වත් පුරයට වැඩමවීම දක්වා සිද්ධීන් ලුහුඬින්
- කිඹුල්වත් පුරයට වැඩමවීම
- සුදොවුන් මාලිගාවේ දී දන් වැලදීම හා දම් දෙසීම
- අනතුරු ව දෑගසවුවන් සමඟ යසෝදරාවන්ගේ මාලිගයට වැඩමවීම
- යසෝදරාවන් බුදුන් පාමුල වැටී ශෝක සංසිඳුවා ගැනීම
- සුදොවුන් රජු යසෝදරාවන්ගේ පතිව්‍රතා ගුණය වර්ණනා කිරීම
- ඒ මුල් කොට ගෙන අතීත කතාව දේශනා කිරීම

අතීත කතාව :
- සඳකිඳුරු යුවළ හිමාලයෙහි ගත කල ජීවිතය
- බඹදත් රජු දඩකෙළි පිණිස යාම
- කිඳුරියගේ රුව හා රංගනය දැක පිළිබඳ සිතක් ඇති කර ගැනීම
- කිඳුරිය ලබා ගැනීමේ අදහසින් කිඳුරා විද මැරීමට උත්සාහ කිරීම
- කිඳුරියගේ විලාපය හා ශාපය
- බඹදත් රජු කිඳුරිය අත හැර යාම
- කිඳුරිය දෙවියන් යැදීම
- ශක්‍රයාගේ පැමිණීම හා කිඳුරා සුවපත් කිරීම

**අර්ථාවබෝධය** :
- කතාවේ පෙළ අවබෝධයෙන් යුතු ව කියවීම
- නිර්දිෂ්ට පාඨ ලිහිල් බසින් ලිවීම

**රස විඳීම හා විචාරය** :
- පැරණි කතා කලාවේ ලක්ෂණ හඳුනා ගැනීම
- තේමාවේ සර්වකාලීන අගය
- චරිත නිරූපණ
- අවස්ථා නිරූපණ
- භාෂාවේ විශේෂ ලක්ෂණ

- **ස්වර්ණතිලකා වස්තුව** (සද්ධර්මාලංකාරය)

**තේමාව** : ප්‍රේමය නිසා ශෝකය හා භය ඇති වන බව ප්‍රකාශ කිරීම

**අන්තර්ගතය** :
- ස්වර්ණතිලකා පෙර භවයෙහි කරන ලද කුසලාකුසල කර්ම හා ඇගේ ප්‍රාර්ථනාව
- කර්මානුරූප ව අභිරූප සෞන්දර්යයෙන් යුතු ව චණ්ඩාල කුලයක ඉපදීම
- උත්තර මධුරා නුවර නායක චණ්ඩාලයාගේ පුතු විසින් කරන ලද විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම
- ලජ්ජාවට පත් ඔහු ඇගේ හැසිරීම පිළිබඳ රජුට පැමිණිලි කිරීම
- රජු පඤ්චමධුරා පුර සිටි, ස්ත්‍රීන් පිළිකුල් කළ උද්දාල බමුණාට ඇය විවාහ කර දෙන ලෙස ස්වර්ණතිලකාගේ පියාට කියා සිටීම
- ඒ අනුව උද්දාල සොයා යන ගමනේ හමු වූ රාජධානි පහක රජුන් ස්වර්ණතිලකාට වසඟ ව චණ්ඩාල බව දැන සිය දිවි නසා ගැනීම
- පඤ්චමධුරා නුවර දී රජු සමඟ සිටි උද්දාල බමුණා ඇගේ රූප සෞන්දර්යයෙන් මූර්ඡාවට පත් ව, සිහි එළවා, නින්දාව ගැන නොතකා ඇය විවාහ කර ගැනීම
- උද්දාලගේ සිසුන් වූ රජකුමරුවන් ඇතකු ලවා ස්වර්ණතිලකා ඝාතනයට තැත් කිරීම හා එය අසාර්ථක වීම
- රැයෙහි මිනිසුන් යොදවා ඇය ඝාතනය කිරීම
- උද්දාල බමුණා එම ශෝකයෙන් රජාංගණයෙහි දර සෑයක් බැඳ ගිනි වැද මිය යෑම

**අවබෝධය** :
- දුරවබෝධ වචන පැහැදිලි කර ගනිමින් කතාවේ සමස්ත අර්ථය ඉදිරිපත් කිරීම
- කතා වස්තුව අවබෝධයෙන් යුතු ව කියවීම
- නිර්දිෂ්ට පාඨ ලිහිල් බසින් ලිවීම

**රස විඳීම හා විචාරය** :
- තේමාවේ සර්වකාලීන අගය
- කතා කලාවේ සුවිශේෂ ලක්ෂණ
- චරිත නිරූපණ
- අවස්ථා නිරූපණ
- වර්ණනා
- භාෂාවේ සුවිශේෂ ලක්ෂණ
- කතුවරයාගේ ජීවන දෘෂ්ටිය

## 27

# 'බැද්දේගම' නවකතාවේ පසුබිම හඳුනා ගැනීම

**නිපුණතාව** : 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම** : 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නවකතාවේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**i. පෙර සූදානම**

- බැද්දේගම නවකතාවේ කතුවරයා, පරිවර්තකයා හා කාලය පිළිබඳ තොරතුරු එක්රැස් කර ගන්න.
- පරිවර්තන සාහිත්‍යය පිළිබඳ තොරතුරු එක්රැස් කර ගන්න.
- බැද්දේගම නවකතාව හා අතිරේක පරිශීලනීය ග්‍රන්ථ කියවා පුළුල් අවබෝධයක් ඇති කර ගන්න.
- බැද්දේගම නවකතාව කියවා එහි චරිත, අන්තර්ගතය හා තේමාව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න. (පාඩමට පිවිසීමට පෙර)

**ii. ප්‍රවේශය**

- පාඩමට සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  * බැද්දේගම නවකතාවේ සිදුවීම් සිහිපත් කිරීම
  * බැද්දේගම නවකතාවේ තෝරා ගත් කොටසක් ශිෂ්‍යයන් ලවා කියවීම
  * වෙනත් පරිවර්තන කෘතියක් පිළිබඳ සිහිපත් කිරීම

    *උදා :* සුදුගෝනා, සාරභූමි, මනුතාපය, අම්මා

**iii. ඉගෙනුම සංවර්ධනය**

- පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගමින් ශිෂ්‍යයන්ගේ දැනුම අවදි කරන්න.
  * පරිවර්තන සාහිත්‍යයක් බිහි වීම
  * පරිවර්තන සාහිත්‍යයේ විශේෂතා
  * පරිවර්තනය සහ අනුවාදය අතර වෙනස

* වෙනත් පරිවර්තන කෘති කිහිපයක් පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න.

*උදා :* - මනුතාපය (ප්‍රංශ) - අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල
- අම්මා (රුසියන්) - දැදිගම වි. රුද්‍රිගු
- සුදුගෝනා (ඉංග්‍රීසි) - ඒ. පී. ගුණරත්න
- සාරභූමි (ඉංග්‍රීසි) - උඩරාපොල හේමාලෝක හිමි, හේමපාල විජේවර්ධන
- හිම බිම (ජපන්) - ජයන්ත විමලසේන
- මුහුද ගොඩගලා (අප්‍රිකානු) - ආරියදාස සෝමවීර

- බැද්දේගම නවකතාවට පාදක වූ සමාජ පසුබිම සාකච්ඡා කරන්න.
- බැද්දේගම නවකතාවේ තේමාව, කතා ප්‍රවෘත්තිය හා ප්‍රධාන චරිත පිළිබඳ ශිෂ්‍යයන් තුළ මූලික අවබෝධයක් ඇති වන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- බැද්දේගම නවකතාව සහ එහි පසුබිම පිළිබඳ පුළුල් අවබෝධයක් ගොඩ නඟා ගැනීමට ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් යොමු කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම :**

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- බැද්දේගම නවකතාව හා එහි පසුබිම පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහා සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * බැද්දේගම නවකතාව ඇතුළත් ව වෙනත් පරිවර්තන සාහිත්‍ය කෘති හා ඒ අතර බැද්දේගමට හිමි වන තැන පිළිබඳ කේවල පැවරුමක් දෙන්න.

  * කණ්ඩායම් පැවරුමක් ලෙස,
  - බැද්දේගම නවකතාවේ කතුවරයා සහ පරිවර්තකයා
  - බැද්දේගම නවකතාවේ කාලය, පසුබිම් වූ ප්‍රදේශය හා සමාජ පරිසරය
  - බැද්දේගම නවකතාවේ තේමාව, කතා පුවත හා චරිත යන කරුණු පිළිබඳ තොරතුරු ඇතුළත් වාචික/ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමකට අවස්ථාව ලබා දීම

- ශිෂ්‍යයන්ගේ ඉදිරිපත් කිරීම්, පසු ඇගයීමට ලක් කරන්න.
- සමාලෝචනයක යෙදෙන්න.

**මුඛ්‍ය පද (Keywords)**

* **යථාර්ථවාදය (Realism)** - එදිරිවීර සරච්චන්ද්‍ර විසින් සිංහල නවකතා (1951) කෘතියෙහි real, realistic යන අරුත් සලකාගෙන 'තාත්ත්වික' යන වචනය භාවිත කරනු ලැබීමෙන් පසු Realism යන්න සඳහා බොහෝ ලේඛකයෝ 'තාත්ත්වික වාදය' යන පදය යොදන්නට පටන් ගත්හ. එහෙත් 'තාත්ත්වික' යන්න වඩාත් ළං වන්නේ නවකතා ලක්ෂණයක් ලෙස පසු කාලයේ සකස් ව Naturalism යන්නට ය. මාර්ටින් වික්‍රමසිංහ සිංහල සාහිත්‍යයේ නැගීම කෘතියෙහි, 1946 පටන් 'යථාර්ථය', 'යථාර්ථවාදය' යන පද භාවිත කර ඇත. Realism යන්නට යෝග්‍ය වචනය 'යථාර්ථවාදය' යනු ය.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 166 පි.

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 1

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* පරිවර්තන සාහිත්‍ය නිර්මාණ පිළිබඳ වගුවක් සකස් කරයි.
* බැද්දේගම නවකතාවට පසුබිම් වූ සමාජ පරිසරය පැහැදිලි කරයි.
* බැද්දේගම නවකතාවේ තේමාව විස්තර කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

ඒකනායක, ධර්මසිරි - **සාහිත්‍ය කලාව**

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - **පරිවර්තන සාහිත්‍යය**

ඇමුණුම 1 : **පහත සඳහන් පරිවර්තන නවකතා ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.**

| සිංහල පරිවර්තනයේ නම | විදේශීය නවකතාවේ නම | මුල් කතුවරයා | පරිවර්තකයා | තේමාව කෙටියෙන් | ප්‍රධාන චරිත |
|---|---|---|---|---|---|
| • අපරාධය හා දඬුවම<br>• මනුතාපය<br>• සුදුගෝනා<br>• අම්මා<br>• සාරභූමි<br>• මහල්ලා සහ මුහුද | | | | | |

# 28

## කෙටිකතා රස වින්දනය හා විචාරය
## (මාර්ටින් වික්‍රමසිංහ සිට සයිමන් නවගත්තේගම තෙක්)

**නිපුණතාව** : 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලධර්ම හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද** : 17 යි.

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**
- නිර්දිෂ්ට කෙටිකතා කියවා හොඳින් අවබෝධ කර ගන්න.
- එම කෙටිකතාවල කාලය, කතුවරයා හා වෙනත් පසුබිම් තොරතුරු අධ්‍යයනය කරන්න.
- සමකාලීන වෙනත් කතුවරුන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ ව ද අවබෝධයක් ලබා ගන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා දැනුවත් වන්න.
- නිර්දිෂ්ට නිර්මාණයන්හි කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවධාරණය කරන්න.
- පාඩමට පිවිසීමට පෙර නිර්දිෂ්ට කෙටිකතා කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

ii. **ප්‍රවේශය**
- පාඩම සඳහා සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  *උදා :* * නිර්දිෂ්ට කෙටිකතාවක කොටසක් කියවීම
  * නිර්දිෂ්ට කෙටිකතාවල පසුබිම් තොරතුරු ඇතුළත් පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම

iii. **ඉගෙනුම් සංවර්ධනය**
- නිර්දිෂ්ට කෙටිකතා, ඒවායේ කතුවරුන් හා ඔවුන්ගේ වෙනත් නිර්මාණ පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නඟන්න.
- ශිෂ්‍යයන් සමඟ කෙටිකතා සාහිත්‍යාංගය පිළිබඳ බුද්ධි කලම්බන සාකච්ඡාවක යෙදෙන්න.
- කෙටිකතා ලක්ෂණ පැහැදිලි කර දෙන්න. පෙර දැනුම යොදා ගන්න.

- පහත සඳහන් කෙටිකතා ශිෂ්‍ය කණ්ඩායම්වලට ලබා දී නැවත කියවීමට අවස්ථාව දෙන්න.

  * වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ
  * වෙසක් පහන - පී. බී. සේනානායක
  * දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර
  * නොනිමි සිත්තම - කේ. ජයතිලක
  * නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර
  * අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර
  * ස්නේහය - සයිමන් නවගත්තේගම

- ඒ ඒ කෙටිකතාවේ පහත සඳහන් ලක්ෂණ මතු කර සටහන් කර ගැනීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න. සටහන් කර ගත් තොරතුරු ඇසුරෙන් අනෙකුත් කෙටිකතා පිළිබඳ ව ඇමුණුම 1හි වගුව සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  * කතුවරයා
  * දෘෂ්ටි කෝණය
  * චරිත
  * අන්තර්ගතය
  * භාෂාවේ විශේෂතා
  * කලාත්මක ලක්ෂණ
- ශිෂ්‍යයන්ගේ අදහස් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.
- ගුරුවරයාගේ මැදිහත් වීම මත ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- කෙටිකතා හත තෝරාගත් කණ්ඩායම්වලට ලබා දී තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- තක්සේරුවක හා ඇගැයීමක යෙදෙන්න.
- සිසුන් සඳහා පොදු පැවරුමක් ලබා දෙන්න.
- කෙටිකතා විචාරයක් ලිවීමට අවස්ථාව දෙන්න.
- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගනිමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 1

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගැයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* නිර්දිෂ්ට කෙටිකතාවල සාහිත්‍ය පසුබිම පැහැදිලි කරයි.
* නිර්දිෂ්ට කෙටිකතාවල ලක්ෂණ පැහැදිලි කරයි.
* අන්තර්ගතය පිළිබඳ ව අදහස් දක්වයි.
* කෙටිකතා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව කෙටිකතා රස වින්දනයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

ධර්මකීර්ති, රංජිත් - **කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම**

සේනානායක, ජී. බී. - **විචාර ප්‍රවේශය**

ඇමුණුම 1

වගුව

| කතුවරයා සහ කෙටිකතාව | දෘෂ්ටි කෝණය | චරිත | අන්තර්ගතය | භාෂාවේ විශේෂතා | කලාත්මක ලක්ෂණ |
|---|---|---|---|---|---|
| | | | | | |

# 29

# නිපාත සහ උපසර්ග

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :
- නිපාත හඳුනා ගෙන විස්තර කරයි.
- නිපාත විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.
- නිපාත වෙන් කොට ලිවිය යුතු බව පැහැදිලි කරයි.
- භාෂා භාවිතයේ දී නිපාත උචිත පරිදි යොදා ගනියි.
- උපසර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.
- උපසර්ගවලින් ඉටු වන විවිධ කාර්යයන් සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- භාෂා භාවිතයේ දී උපසර්ග අර්ථවත් ලෙස යොදා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i **පෙර සූදානම**
- නිපාත සහ උපසර්ග පිළිබඳ නිර්වචන සහ නිදර්ශන එක්රැස් කර ගන්න.
- පොත පත කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.

ii. **ප්‍රවේශය**
- පහත ආකාරයේ සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  උදා : * නිපාත සහ උපසර්ග සහිත ඡේද දෙකක් වෙන වෙන ම ලබා දී ඒවායේ ඇතුළත් නිපාත සහ උපසර්ග වෙන් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම

  * නිපාත සහ උපසර්ග අතර වෙනස පැහැදිලි කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම

  * නිපාත සහ උපසර්ග නිර්වචනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම

iii. **ඉගෙනුම සංවර්ධනය**
- නිපාත සහ උපසර්ග පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
- නිපාත සහ උපසර්ග වෙන් වෙන් ව හඳුනා ගැනීම සඳහා ඒවායේ අනන්‍යතා ලක්ෂණ පැහැදිලි කරන්න.
- ශිෂ්‍ය අදහස් ද විමසමින් නිපාත සහ උපසර්ග පිළිබඳ නිර්වචන ගොඩ නඟන්න.
- නිපාත ප්‍රභේද රාශියක් ඇති බව උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ඇමුණුම 1)
- තවත් ප්‍රභේද හා උදාහරණ සැපයීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිපාතවල එක් එක් ප්‍රභේද භාවිත වන විවිධ අවස්ථා පැහැදිලි කරන්න.
- උපසර්ගවල කාර්යය පැහැදිලි කරන්න.
- භාෂා භාවිතයේ දී විවිධ උපසර්ග හමු වන බව පෙන්වා දෙන්න.
- හෙළ බසෙහි හමු වන උපසර්ග සහ සකු බසින් පැමිණි උපසර්ග වෙන් වෙන් ව හඳුන්වා දෙන්න. (ඇමුණුම 2)

- එක් එක් උපසර්ග සඳහා නිදසුන් සැපයීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

iii. **තක්සේරුව හා ඇගැයීම**

- නිපාත සහ උපසර්ග පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * නිපාත සහ උපසර්ග පිළිබඳ දැනුම විමසන වාචික ප්‍රශ්න යොමු කිරීම

  * නිපාත සහ උපසර්ග ඇතුළත් වාක්‍ය සහ ඡේද නිර්මාණය කිරීම සඳහා අභ්‍යාස ලබා දීම

  * නිපාත සහ උපසර්ග ප්‍රභේද පිළිබඳ නිදර්ශන සහිත සවිස්තරාත්මක පොත් පිංචක් නිර්මාණය කිරීම සඳහා කණ්ඩායම් පැවරුමක් ලබා දීම

**මුඛ්‍ය පද (Keywords)**

**නිපාත**

''අර්ථමාත්‍රයක් ප්‍රකාශ කරන පුරුෂ, සංඛ්‍යා ආදි භේදයක් නැති අව්‍යය නිපාත නමි.''

පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ, **සිංහල ව්‍යාකරණ අකාරාදිය,** කොළඹ, 2000, 126 පි.

**උපසර්ග**

''ක්‍රියාවාචක ශබ්දයක පූර්වයෙන් යෙදී කියැවෙන ශබ්ද, උපසර්ගයි. 'උපසමීපෙ සෘජ්‍යතෙ උච්චාර්යතෙ ක්‍රියාවාචකස්‍ය ශබ්දස්‍යෙති උපසර්ගඃ' යනු නිරුක්තියි.''

පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ, **සිංහල ව්‍යාකරණ අකාරාදිය,** කොළඹ, 2000, 125 පි.

**ගුණාත්මක යෙදවුම් :**

* නිපාත සහ උපසර්ග ඇතුළත් ඡේද
* නිපාත සහ උපසර්ග පිළිබඳ නිර්වචන සහ නිදර්ශන

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගැයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* නිපාත සහ උපසර්ග හඳුනා ගෙන නිර්වචනය කරයි.
* විවිධ නිපාත සහ උපසර්ග ප්‍රභේද සඳහා උදාහරණ සපයයි.
* නිපාත සහ උපසර්ග ඇතුළත් වාක්‍ය සහ ඡේද නිර්මාණය කරයි.
* නිපාත සහ උපසර්ග පිළිබඳ නිදර්ශන හා විස්තර ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

කරුණාතිලක, ඩබ්. එස්. - **සිංහල භාෂා ව්‍යාකරණය**

පඤ්ඤාසාර හිමි. ඔක්කම්පිටියේ - **සිදත්සඟරා විමසුම**

පෙරේරා, රූපසිංහ පී., පද්මා ලංකා රූපසිංහ - **සිංහල ව්‍යාකරණ අකාරාදිය**

**ඇමුණුම 1 - විවිධ අර්ථ දෙන නිපාත ප්‍රභේද කිහිපයක්**

| | | |
|---|---|---|
| 1. කාලාර්ථය | - | අද, එදා, හෙට, ඊයේ |
| 2. වාරාර්ථය | - | යළි, නැවත |
| 3. කර්තෘර්ථය | - | විසින් |
| 4. හේත්වර්ථය | - | නිසා |
| 5. වාර්තාර්ථය (ශ්‍රැති සූචනාර්ථය) | - | ල, ලු |
| 6.අවධාරණාර්ථය | - | වනාහී, වූකලී, ම |
| 7. පර්යායාර්ථය | - | හෙවත් |
| 8. විකල්පාර්ථය | - | හෝ, නොහොත් |
| 9. සමුච්චයාර්ථය | - | ද |
| 10. සීමාර්ථය | - | තෙක්, දක්වා, තුරු, පටන් |
| 11. ආමන්ත්‍රණාර්ථය | - | එම්බා, කොල |
| 12. සමාප්ත්‍යාර්ථය | - | ය, හ, යි |
| 13. සම්බන්ධාර්ථය | - | හා, සහ, සමග, කැටුව |
| 14. විනාර්ථය | - | විනා, මිස, මුත් |

ආදි වශයෙනි.

**ඇමුණුම 2**

**හෙළ බසෙහි හමුවන (සිදත් සඟරාවෙහි ඇතුළත් ) උපසර්ග**

ප, පර, අව,ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පිරි, උප/උව, අප, පස්, පිළි, අති/ඉ, පි

**සකු බසින් පැමිණි උපසර්ග**

ප්‍ර, පරා, අප, සම්, අනු, අව, නිර්/නිස්, දුර්/දුස්, වි, ආ, නි, අධි, අපි, අති, සු, උත්, අභි, ප්‍රති, පරි, උප

# 30

# විශේෂණ පද

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 පද සාධනය හා පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යනු මොනවා දැයි පැහැදිලි කරයි.
- නාම විශේෂණ සඳහා නිදසුන් දක්වයි.
- ක්‍රියා විශේෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- විශේෂණ පද උචිත පරිදි භාෂාවේ භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i **පෙර සූදානම**
- විශේෂණ පද පිළිබඳ ව අවශ්‍ය තොරතුරු රැස් කර ගන්න.
- ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති පරිශීලනීය ග්‍රන්ථ ද ඒ සඳහා ඉවහල් කර ගන්න.

ii **ප්‍රවේශය**
- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද සහිත කෙටි දෙබසක් ඉදිරිපත් කිරීම

  * නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යෙදුණු ඡේදයක් ඉදිරිපත් කොට විශේෂණ විශේෂ්‍ය පද වෙන් කොට හඳුනා ගැනීමේ සාකච්ඡාවක යෙදීම

iii **ඉගෙනුම සංවර්ධනය**
- විශේෂණ යනු නාම පදයක් හෝ ක්‍රියා පදයක් වෙසෙසා දක්වන නැතහොත් විස්තර කරන පදයක් බව පැහැදිලි කරන්න.
- නාම පදයක් හෝ ක්‍රියා පදයක් හෝ විස්තර කරන පදය විශේෂණය වන බවත් විස්තරයට බඳුන් වන පදය විශේෂ්‍යය වන බවත් පැහැදිලි කරන්න.

| නාම පදයකට විශේෂණයක් යෙදීම | ක්‍රියා පදයකට විශේෂණයක් යෙදීම |
|---|---|
| *උදා :* * පිරිසිදු ජලය | *උදා :* * වේගයෙන් දුවයි. |
| විශේෂණය - පිරිසිදු | විශේෂණය - වේගයෙන් |
| විශේෂ්‍යය - ජලය | විශේෂ්‍යය - දුවයි. |

- නාම විශේෂණ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ඇමුණුම 1)
- නාම විශේෂණ වශයෙන්,
  * නාම නාම
  * සර්ව නාම
  * සංඛ්‍යා නාම
  * සමාස නාම
  * තද්ධිත නාම
  * කෘදන්ත නාම යෙදෙන ආකාරය විස්තර කරන්න.

- ක්‍රියා පදයකට විශේෂණයක් වශයෙන් යෙදෙන පද ක්‍රියා විශේෂණ යනුවෙන් හඳුන්වා දෙන්න.
- ක්‍රියා විශේෂණ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ඇමුණුම 2)
- ක්‍රියා පදයකට විශේෂණ වීම් වශයෙන් ප්‍රධාන අර්ථ හතරකින් ක්‍රියා විශේෂණ යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.

    ආකාරාර්ථය

    කාලාර්ථය

    ස්ථානාර්ථය

    හේත්වර්ථය

- මෙතෙක් උගත් කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**iv. තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහා ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

    *උදා :* * නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ඇතුළත් ඡේදයක් හෝ කවියක් ඇසුරෙන් නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ හඳුනා ගෙන පෙළ ගැස්වීම

    * නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ඇතුළත් කාව්‍ය නිර්මාණයක් හෝ කතාන්දරයක් හෝ සකස් කිරීම

    * නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ එක් එක් ප්‍රභේද යටතේ ඇතුළත් වන සේ පොත් පිංචක් සකස් කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

* ඇමුණුම 1, 2

* නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ඇතුළත් කවි, ගීත, කතන්දර, ගද්‍ය පාඨ

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක :**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ වෙන් වෙන් ව හඳුන්වයි.

* නාම විශේෂණ පද යෙදෙන විවිධ ආකාර සඳහා උදාහරණ සපයයි.

* ක්‍රියා විශේෂණ පද යෙදෙන විවිධ අර්ථ සඳහා උදාහරණ දක්වයි.

* විවිධ ප්‍රභේද යටතේ නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද වගු ගත කරයි.

* නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද එක්රැස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

* කරුණාතිලක, ඩබ්. එස්. - **සිංහල භාෂා ව්‍යාකරණය**

* පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ - **සිදත්සඟරා විමසුම**

ඇමුණුම 1

**නාම විශේෂණ**

i. නාම නාම
ජාති - කිඹුල් දත්
ද්‍රව්‍ය - මැටි වැඩ
ගුණ - සිසිල් ජලය
සංඥා - පැරකුම් රජතුමා

ii. සර්ව නාම
මේ උරුමය
තම නිවස

iii. සංඛ්‍යා නාම
දෙවන සංගායනාව
තිසරණ ගුණ

vi. තද්ධිත නාම
රූමත් කතුන්
නැණවත් සිසුන්

v. කෘදන්ත නාම
පලදින කිරුළ
දුවන අසු

vi. සමාස නාම
මිනිස්ගතිය
සොරබිය

ඇමුණුම 2:

**ක්‍රියා විශේෂණ**

ප්‍රධාන අර්ථ සතරකින් ක්‍රියා විශේෂණ යෙදෙයි.

i. ආකාරාර්ථ (ආකාර + අර්ථය) : ක්‍රියාවක් සිදුවන්නේ කෙසේ ද?
වහා, සෙමින්, වේගයෙන් ආදි
*උදා :* හාවා **වේගයෙන්** දුවයි.

ii. කාලාර්ථ : ක්‍රියාවක් සිදු වන කාලය/අවස්ථාව ප්‍රකාශ කිරීම
පසුව, ඉනික්බිති, එවෙලෙහි ආදි
*උදා :* **පසු ව** ඔහු පැමිණියේ ය.

iii. ස්ථානාර්ථය : ක්‍රියාවක් සිදු වන ස්ථානය
අසපුවෙහි, නිවසෙහි, පාසලෙහි ආදි
*උදා :* **නිවසෙහි** මිනිස්සු වෙසෙති.

iv. හේත්වර්ථ : ක්‍රියාවක් සිදුවීමට තුඩු දුන් හේතුව
බියෙන්, සතුටින් ආදි
*උදා :* ප්‍රේක්ෂකයෝ **සතුටින්** කැගසති.

## 31

## සමාස

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- සමාස යනු කුමක් දැයි විස්තර කරයි.
- සමාස ප්‍රභේද සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- සමාස භාවිතයේ ප්‍රයෝජන විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම**

- සමාස පාඩමට අදාළ නිවැරදි තොරතුරු රැස් කර ගන්න.
- ඒ සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති ග්‍රන්ථ ඉවහල් කර ගන්න.

ii. **ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * සමාස ඇතුළත් කෙටි ඡේදයක් ලබා දී එහි ඇති සමාස හඳුනා ගැනීමට යොමු කිරීම
  * සමාස සහිත කවියක් හෝ කතන්දරයක් හෝ ඉදිරිපත් කිරීම

iii. **ඉගෙනුම සංවර්ධනය**

- සමාස යනු කුමක් දැයි හඳුන්වා දී සමාස මඟින් භාෂාව පෝෂණය වන අයුරු පැහැදිලි කරන්න.
  * නොයෙක් අර්ථ ඇති ශබ්ද සම්බන්ධ වී එක් අර්ථයක් දීම සමාස නම් වේ.
- සමාස ප්‍රභේද නිදසුන් සහිත ව විස්තර කරන්න. (ඇමුණුම 1)

  අව්‍යය සමාසය
  විභක්ති සමාසය
  විශේෂණ සමාසය
  අන්‍යාර්ථ සමාසය
  දකාරාර්ථ සමාසය

- සමාස භාවිතයේ ප්‍රයෝජන උදාහරණ සහිත ව පැහැදිලි කිරීමක නිරත වන්න.
  * එක් වන පද කෙටි වීම
  * උච්චාරණය පහසු වීම
- සමාස පිළිබඳ උගත් විෂය කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

iv. **තක්සේරුව හා ඇගයීම**

- පාඩමට අදාළ විෂය කරුණු පිළිබඳ ව ශිෂ්‍ය සාධනය මැන බැලීමට සුදුසු නිර්ණායක මූලික ඇගයීම්

ක්‍රම යොදා ගනිමින් තක්සේරුකරණයෙහි යෙදෙන්න.

*උදා :* * සමාස පිළිබඳ වාචික ප්‍රශ්න ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීම

* එක් එක් සමාස වර්ග සඳහා උදාහරණ ඇතුළත් වගුවක්/පොත් පිංචක් සකස් කිරීමට යොමු කිරීම
* සමාස ඇතුළත් කරමින් කවියක්/කතාන්දරයක් නිර්මාණය කිරීමට යොමු කිරීම
* ඡේදයක ඇතුළත් සමාස හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 1
* සමාස පද ගොනුවක්
* සමාස ඇතුළත් කවි, ගීත, කතන්දර, ගද්‍ය පාඨ

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* සමාස යනු කුමක් දැයි නිර්වචනය කරයි.
* එක් එක් සමාස විධිය සඳහා උදාහරණ සපයයි.
* දෙන ලද ඡේදයක ඇතුළත් සමාස පද උපුටා දක්වයි.
* සමාස ඇතුළත් කවියක්/කතන්දරයක් නිර්මාණය කරයි.
* සමාස පද ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

කරුණාතිලක, ඩබ්. එස්. - **සිංහල භාෂාවේ ව්‍යාකරණය**

දිසානායක, ජේ. බී. - **සිංහල රීතිය 7: පද නිර්මාණය**

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ - **සිදත්සඟරා විමසුම**

**ඇමුණුම 1 සමාස ප්‍රභේද**

1. අව්‍යය සමාසය
   - යව් ආදි ගණය - යාවජීව
   - කු ආදි ගණය - කුපුරිස්/දුදන
   - ප ආදි ගණය - පබල, ප්‍රබල
   - න ආදි ගණය - අනවශ්‍ය/අකුසල්

2. විභක්ති සමාසය
   - කර්ම විභක්ති සමාසය
   - කර්තෘ විභක්ති සමාසය
   - කරණ විභක්ති සමාසය
   - සම්ප්‍රදාන විභක්ති සමාසය
   - අවධි විභක්ති සමාසය
   - සම්බන්ධ විභක්ති සමාසය
   - ආධාර විභක්ති සමාසය

3. විශේෂණ සමාසය
   - විශේෂණ පූර්ව පද සමාසය
   - විශේෂණ අපර පද සමාසය
   - සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය
   - උපමාන පූර්ව පද විශේෂණ සමාසය
   - උපමාන අපර පද විශේෂණ සමාසය

4. අන්‍යාර්ථ සමාසය
   - කර්ම විභක්ති අන්‍යාර්ථ සමාසය
   - කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසය
   - කරණ විභක්ති අන්‍යාර්ථ සමාසය
   - සම්ප්‍රදාන විභක්ති අන්‍යාර්ථ සමාසය
   - අවධි විභක්ති අන්‍යාර්ථ සමාසය
   - සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ සමාසය
   - ආධාර විභක්ති අන්‍යාර්ථ සමාසය

5. දකාරාර්ථ සමාසය
   - අවයව ප්‍රධාන දකාරාර්ථ සමාසය
   - සමුදාය ප්‍රධාන දකාරාර්ථ සමාසය

# 32
# ප්‍රත්‍යයාර්ථ නාම (තද්ධිත නාම හා කෘදන්ත නාම)

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් ඵල** :
- ප්‍රත්‍යයාර්ථ නාම යනු මොනවා දැයි විස්තර කරයි.
- තද්ධිත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- තද්ධිත නාමයක ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වයි.
- විවිධ අර්ථ ගෙන දෙන තද්ධිත ප්‍රත්‍ය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.
- කෘදන්ත ප්‍රභේද හඳුනා ගෙන උදාහරණ දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**i. පෙර සූදානම**
- ගුණාත්මක යෙදවුම්වල සඳහන් පරිශීලනීය ග්‍රන්ථ කියවා අදාළ විෂය කරුණු එක්රැස් කර ගන්න.
- ඔබේ සැලසුමට අදාළ ව ඉගෙනුම් ආධාරක හා ක්‍රියාකාරකම් පිළියෙල කර ගන්න.

**ii. ප්‍රවේශය**
- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැයි නිර්වචනයක් කළුලෑල්ලේ ඉදිරිපත් කිරීම
  * ප්‍රත්‍යයාර්ථ නාම සහිත කෙටි ඡේදයක් ශිෂ්‍යයන්ට ලබා දී එහි ඇතුළත් ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගැනීමට යොමු කිරීම
  * පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් මගින් ප්‍රත්‍යයාර්ථ නාම පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කිරීම

**iii. ඉගෙනුම් සංවර්ධනය**
- ප්‍රවේශයේ දී මතු කරගත් කරුණු ද උපයෝගී කර ගෙන ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
- ප්‍රත්‍යයාර්ථ නාම කොටස් දෙකකි.
  1. තද්ධිත නාම
  2. කෘදන්ත නාම

  **1. තද්ධිත නාම**

  ශබ්ද ප්‍රකෘතියකට තද්ධිත ප්‍රත්‍යයක් එක් කිරීම මගින් ඊට විශේෂ වූ අර්ථයක් ගෙන සෑදෙන්නේ තද්ධිත නාම යි.

  *උදා :* * ගම් + ඉ = ගැමි
  * නැව් + ඉ = නැවි

2. **කෘදන්ත නාම**

ක්‍රියා මූලයකට (ධාතුවකට) කෘදන්ත ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන නාම කෘදන්ත නාම නම් වෙයි.

*උදා :* * බල + නු = බලනු

* කිය + නු = කියනු

- අගට යෙදෙන ප්‍රත්‍යයෙහි අර්ථය ප්‍රධාන වන නිසා ප්‍රත්‍යයාර්ථ නාම නමින් හැඳින්වෙන බව පැහැදිලි කරන්න.
- විවිධ අර්ථ ගෙන දෙන තද්ධිත ප්‍රත්‍යය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

*උදා :* ඉ ප්‍රත්‍යය - * ගමෙහි වසන්නේ - ගැමි

* තොටෙහි නියුක්ත වූයේ - තොටි

* සභාවට සුදුසු වූයේ - සැබි

* දහමෙහි හැසිරෙනුයේ - දැහැමි

ආදි වශයෙන් තද්ධිත ප්‍රත්‍යය විවිධ අර්ථවල යෙදෙන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

- ධාතුවකට හෙවත් ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් එක් වීමෙන් කෘදන්ත නාම සෑදෙන අයුරු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න..

'කර' ධාතුවට 'නු' එක් වීමෙන් (කර + නු) කරනු යන කෘදන්ත නාමය සෑදේ. කරනු යන පදයට විභක්ති ප්‍රත්‍යය ගැන්වීමෙන් නාම පදයක් සේ වර නැගේ.

*උදා :* කරනු + ආ = කරන්නා කරනු + ඕ = කරන්නෝ

- කෘදන්ත ප්‍රභේද උදාහරණ සහිත ව හඳුන්වා දෙන්න.

1. කර්තෘ කාරක කෘදන්ත

* වර්තමාන කාල කෘදන්ත ප්‍රත්‍යය - නු, න, නා

* අතීත කාල කෘදන්ත ප්‍රත්‍යය - ඉ, උ, උෟ, ඇ

2. කර්මකාරක කෘදන්ත

* වර්තමාන කාල කෘදන්ත ප්‍රත්‍යය - නු, න, නා

* අතීතකාල කෘදන්ත ප්‍රත්‍යය - උණු, උණ

3. භාව කාරක කෘදන්ත

ක්‍රියා භාවය පමණක් යෙදෙන කෘදන්ත නාම භාව කාරක කෘදන්ත වේ.

නු, උම්, ඊම්, ඉලි, මන් ප්‍රත්‍යයන් යෙදේ.

*උදා :* කියනු, කියුම්, කීම්, කියවිලි, කියමන්

. 4. කරණ කාරක කෘදන්ත

* න, නා ප්‍රත්‍යය යෙදේ. එය කරණකොට ගෙන ක්‍රියාව සිදු වේ නම් කරණ කාරක වේ.

එයින් බලනු යි - බල + න = දුරබලනය

එයින් දවටනු යි - දවට + න = දවටනය

iv. **තක්සේරුව හා ඇගයීම**

පාඩම අතරතුර ශිෂ්‍ය සාධනය තක්සේරු කිරීම සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගැයීම් උපකරණ යොදා ගන්න.

*උදා :* * ප්‍රත්‍යයාර්ථ නාම යනු මොනවා දැයි විස්තරාත්මක ව ඉදිරිපත් කෙරෙන සටහනක්/වගුවක් පිළියෙල කිරීමට යොමු කිරීම

* තද්ධිත හා කෘදන්ත ප්‍රභේද සහිත පොත් පිංචක් සකස් කිරීම සඳහා පැවරුමක් ලබා දීම

**ගුණාත්මක යෙදවුම්**

* ප්‍රත්‍යයාර්ථ නාම ඇතුළත් ඡේදයක්
* ප්‍රත්‍යයාර්ථ නාම පිළිබඳ හැඳින්වීමක් සහිත පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* තද්ධිත ප්‍රත්‍යය යෙදෙන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරයි.
* කාරක භේදය අනුව කෘදන්ත පද සෑදෙන ආකාරය නිදර්ශන මඟින් පැහැදිලි කරයි.
* විවිධාර්ථ ගෙන දෙන තද්ධිත හා කෘදන්ත ප්‍රත්‍යය ඇතුළත් වගුවක් සකස් කරයි.
* තද්ධිත හා කෘදන්ත ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

කරුණාතිලක ඩබ්. එස් - **සිංහල භාෂාවේ ව්‍යාකරණය**

දිසානායක, ජේ. බී. - **සිංහල රීතිය 7: පද නිර්මාණය**

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ - **සිදත්සඟරා විමසුම**

# 33

# උක්ත අනුක්ත භේදය
# (වාක්‍ය රීති)

**නිපුණතාව** : 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.2 උක්ත ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :
- උක්ත අනුක්ත භේදය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වාක්‍ය වින්‍යාස රීති නිවැරදි ව භාවිතයේ වැදගත්කම විස්තර කරයි.
- උක්ත අනුක්ත භේදය පිළිබඳ රීති නිවැරදි ව අනුගමනය කරමින් වාක්‍ය ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

i. **පෙර සූදානම :**

- වාක්‍ය නිර්මාණයේ දී උක්ත - අනුක්ත භේදය යෙදෙන ආකාරය පහත දැක්වෙන කරුණු ආශ්‍රයෙන් අධ්‍යයනය කරන්න. (මේ සඳහා අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.)
    1. ප්‍රාණවාචී ඒක වචන හා බහු වචන පද සහිත වාක්‍ය
    2. ප්‍රාණවාචී අනියමාර්ථ ඒක වචන පද සහිත වාක්‍ය
    3. ප්‍රණවාචී සර්වනාම පද සහිත වාක්‍ය
    4. අප්‍රාණවාචී ඒක වචන හා බහු වචන පද සහිත වාක්‍ය
    5. ප්‍රාණවාචී රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද සහිත වාක්‍ය
- එක් එක් වාක්‍ය ප්‍රභේදය සඳහා උදාහරණ වාක්‍ය එක්රැස් කර ගන්න.

ii. **ප්‍රවේශය :**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * එක් එක් වාක්‍ය ප්‍රභේදය සඳහා උදාහරණ වාක්‍යය බැගින් ප්‍රදර්ශනය කර ඒ ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩ නැඟීම

  * සුදුසු ඡේදයක් ලබා දී එහි ඇතුළත් වාක්‍යවල ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද සහිත වාක්‍ය හඳුනා ගැනීමට සැලැස්වීම

iii. **ඉගෙනුම සංවර්ධනය**

- වාක්‍යයක උක්ත - අනුක්ත භේදය යෙදෙන ආකාරය ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- උක්ත පද ප්‍රථමා විභක්තියේ ද අනුක්ත පද අනෙකුත් විභක්තිවල ද යෙදෙන බව අවබෝධ කරවන්න.
- වාක්‍යයක උක්ත පද යෙදෙන අවස්ථා හා අනුක්ත පද යෙදෙන අවස්ථා හඳුන්වා දෙන්න.
- උක්ත අනුක්ත නාම පද ඒක වචනයේ දී බොහෝ දුරට සම රූපී ව යෙදෙන බවත් ප්‍රාණවාචී බහු වචන නාම පදවල දී හා සර්ව නාම පදවල දී සමරූපී ව නොයෙදෙන බවත් තහවුරු කර ගන්න.

- ප්‍රාණවාචී අනියමාර්ථ ඒක වචන පද වාක්‍යවල යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- ප්‍රාණවාචී ඒක වචන හා බහු වචන, උක්ත අනුක්ත නාම පද වාක්‍යයන්හි යෙදෙන ආකාරය හා අප්‍රාණවාචී ඒක වචන හා බහු වචන, උක්ත අනුක්ත නාම පද වාක්‍යවල යෙදෙන ආකාරය පිළිබඳ රීති උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.
- උක්ත අනුක්ත නාම පද වාක්‍යයන්හි යෙදී ඇති ආකාරය අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- අප්‍රාණවාචී නාම පද ප්‍රාණවාචී රූප ගන්වන අයුරු නිදසුන් සහිත ව තහවුරු කරන්න.
- මෙතෙක් උගත් කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**iv. තක්සේරුව හා ඇගයීම**

- නාම පදවල උක්ත අනුක්ත භේදය පිළිබඳවත් ඒ ආශ්‍රයෙන් වාක්‍ය නිර්මාණය කිරීම පිළිබඳවත් ශිෂ්‍යයන් තුළ ඇති දැනුම හා අවබෝධය තහවුරු කර ගැනීමට සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* i. වාක්‍යයක උක්තය - ආඛ්‍යාතය අතර ඇති සම්බන්ධතාව අවබෝධ වන සේ සැකසූ අභ්‍යාසවල නිරත කරවීම

  ii. ආඛ්‍යාතය ලෙස ශුද්ධ ක්‍රියා පද සහ කෘදන්ත ක්‍රියා යෙදෙන වාක්‍ය නිර්මාණය කරවීම.

  iii. දෙන ලද ඒක වචන උක්ත නාම පදවලට අනුරූප බහු වචන, අනුක්ත රූප අනියමාර්ථ රූප ලිවීමට සැලැස්වීම

  iv. උක්ත පදත් අනුක්ත පදත් භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ආදර්ශ වාක්‍ය (එක් එක් වාක්‍ය රීතිය සඳහා)
- ප්‍රවේශය සඳහා යොදා ගැනීමට ගද්‍ය ඡේදයක්

- **තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

* උක්ත රූප, අනුක්ත රූප හා අනියමාර්ථ රූප වෙන් වෙන් ව වගු ගත කරයි.

* ප්‍රාණවාචී හා අප්‍රාණවාචී උක්ත - අනුක්ත රූප යොදා නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි.

* සර්ව නාම උක්ත - අනුක්ත රූප යොදා නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි.

* ප්‍රාණවාචී රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද නිවැරදි ව යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

**සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)** - ජාතික අධ්‍යාපන ආයතනය

**සිංහල ලේඛන ව්‍යවහාරය : උපදේශ සංග්‍රහය** - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# 34

# සාරාංශකරණය

**නිපුණතාව** : 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :
- සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.
- සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.
- ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**i පෙර සූදානම**

- සාරාංශකරණය පිළිබඳ පොත්, ලිපි ඇසුරෙන් තොරතුරු එක්රැස් කර ගන්න. ඒ සඳහා අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ද ඉවහල් කර ගන්න.
- ඇමුණුම 1ට අනුව සුදුසු ආදර්ශනයන් සකස් කර ගන්න.

**ii. ප්‍රවේශය**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * ඡේදයක් හා එහි සාරාංශය ඇතුළත් ආදර්ශනයක් ඉදිරිපත් කිරීම (ඇමුණුම 1)

  * භූමිකා රංගනයක් ආශ්‍රයෙන් දීර්ඝ විස්තරයක් කෙටියෙන් කියන ආකෘතිය නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කිරීම

**iii. ඉගෙනුම සංවර්ධනය**

- සාරාංශකරණයේ අවශ්‍යතාව සහ වැදගත්කම පැහැදිලි කරන්න. (ඇමුණුම 2)
- සාරාංශකරණයේ දී සැලකිය යුතු කරුණු ඉදිරිපත් කරන්න. (ඇමුණුම 3)
- සාරාංශකරණ අභ්‍යාසවල යොදවන්න.
  * කෙටි ඡේදයක අදහස එක් වැකියකින් ලිවීම
  * ඡේදයක අදහස එහි අන්තර්ගත වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කිරීම
  * දේශනයකට සවන් දී එහි මූලික අදහස සාරාංශ කොට ලිවීම
- සාරාංශකරණ කුසලතාව සංවර්ධනයට අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- මෙතෙක් උගත් කරුණු පිළිබඳ සමාලෝචනයක් සිදු කරන්න.

**iii. තක්සේරුව හා ඇගැයීම**

- සාරාංශකරණය පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* * සාරාංශ කිරීමේ ප්‍රයෝජන පිළිබඳ වාචික ප්‍රශ්න යොමු කිරීම

  * සාරාංශය යොදා ගත හැකි අවස්ථා ප්‍රායෝගික උදාහරණ ඇසුරින් පැහැදිලි කිරීම සඳහා පැවරුමක් ලබා දීම

* රූපවාහිනී හෝ ගුවන්විදුලි හෝ ප්‍රවෘත්ති විකාසනයට සවන් දී ප්‍රධාන පුවත් සාරාංශ කොට ලිවීමට අවස්ථාව ලබා දීම
* සති අන්ත පුවත් පත් කිහිපයක කතුවැකි කිහිපයක් තෝරා ගෙන ඒවායේ මුඛ්‍ය අදහස සාරාංශ කිරීමට යොමු කිරීම
* ශාස්ත්‍රීය කෘතියකින් උපුටා ගත් ඡේද කිහිපයක් සාරාංශ කිරීමට ලබා දීම

**ගුණාත්මක යෙදවුම් :**

* සාරාංශකරණයට සුදුසු පාඨ, පුවත් පත් ලිපි

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

පහත සඳහන් නිර්ණායක ඉවහල් කර ගෙන ඇගැයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

* සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරමින් පුවත්පත් ලිපියක් ලියයි.
* සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරමින් කථනයේ යෙදෙයි.
* සාරාංශකරණයේ යෙදෙමින් විවිධ ලිපි, රචනාවන්හි හරය වටහා ගෙන ප්‍රකාශ කරයි.
* ගද්‍ය පාඨ සාරාංශ කොට ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ**

තේනබදු, පී. - **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය**

ඇමුණුම 1 ආදර්ශනය

**ඡේදය**

රටක සැබෑ දියුණුවක් ඇති වීමට නම් එරට පුරවැසියන් බුද්ධිමත් අය විය යුතු අතර නීරෝගී අය ද විය යුතු ය. ඔවුන් අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබිය යුතු ය. අංග සම්පූර්ණ අධ්‍යාපනයෙන් අදහස් කරන්නේ උපාධි ලැබීම හෝ නොයෙක් නොයෙක් විෂයන් ගැන තොරතුරු ඉගෙනීම හෝ නො වේ. අධ්‍යාපනය නම් සෑම අතින් ම ජීවිතයට සූදානම් කිරීම ය.

**සාරාංශය**

රටක් දියුණු වීමට එහි වැසියන් නියම ඉගෙනීමක් ද බුද්ධිය සහ නිරෝගීභාවය ද ලැබූ අය විය යුතු ය.

තේනබදු. පී, **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය,** කොළඹ, 1963, 291 පි.

**ඇමුණුම 2 - සාරාංශකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම**

- විචාර බුද්ධියත් තීක්ෂ්ණ බුද්ධියත් යොදා ගෙන මානසික ව්‍යායාමයක යෙදීමෙන් සංශ්ලේෂණ හැකියාව වර්ධනය වීම
- කියවූ දේ හෝ ඇසූ දේ හෝ වහා වටහා ගැනීමේ හැකියාව දියුණු වීම
- හරය අවබෝධ කර ගැනීමෙන් වහා නිවැරදි තීරණ ගැනීමේ හා ප්‍රතිචාර දක්වීමේ හැකියාව දියුණු වීම
- අනවශ්‍ය දේ බැහැර කොට අවශ්‍ය දේ පමණක් තෝරා බේරා ගැනීමේ හැකියාව දියුණු වීම
- හරය වටහා ගෙන නිවැරදි ව සන්නිවේදනය කිරීමේ හැකියාව වර්ධනය වීම
- භාෂා කුසලතා දියුණු කර ගැනීමේ හැකියාව ලැබීම

**ඇමුණුම 3 - සාරාංශකරණයේ දී සැලකිය යුතු කරුණු**

1. ඡේදය පළමු වර සම්පූර්ණයෙන් කියවා මුඛ්‍ය අදහස් වටහා ගැනීම
2. දෙවන වර කියවීමේ දී මුඛ්‍ය අදහස ප්‍රකාශ වන වචන, වාක්‍ය, වාක්‍යාංශ යටින් ඉරි ඇඳ ගැනීම
3. තුන් වන වර කියවීමේ දී මුඛ්‍ය අදහසට අදාළ අනෙකුත් අදහස් ඇත්නම් ඒවාට අංක යොදා ගැනීම
4. ලකුණු කර ගත් වාක්‍ය ඛණ්ඩ කියවීම
5. උපමා, අලංකාර, නිර්වචන, පුනරුක්ති, විවරණ, නිදර්ශන කපා හැරීම
6. අදහස් පෙළ ගස්වා සකස් කර ගැනීම
7. භාවාර්ථය හඳුනා ගැනීම
8. ඡේදය පසෙකින් තබා අදහස් ගළපා මතකයෙන් සාරාංශය ලිවීම
9. ලියූ සාරාංශයෙන් මුල් ඡේදයේ අදහස ප්‍රකාශ වී ඇද්දැයි විමසීම
10. මුල් ඡේදයේ වචන වෙනුවට හැකිතාක් දුරට තමාගේ ම වචන අදාළ පරිදි යොදා ගැනීම
11. මුල් පාඨයේ ඡේද කිහිපයක් තිබුණත් සාරාංශය එක් ඡේදයක් වශයෙන් ලිවීම
12. සාරාංශයෙහි ද ඡේදයක තිබිය යුතු ලක්ෂණ ඇතුළත් වීම
13. සාරාංශය මුල් ඡේදයෙන් තුනෙන් එකක් පමණ වීම
14. මුල් ඡේදයෙන් බැහැර ව තම අදහස් ඇතුළත් නොකිරීම
15. ප්‍රකෘති කථන විකෘති කථනයෙන් ලිවීම
16. මුල් ඡේදයෙහි පද බෙදා ඇති ආකාරය අනුව සාරාංශයෙහි ද පද බෙදීම
17. කාලය කළමනාකරණය කර ගැනීම